274 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 274 - இல. 2
Volume 274 - No. 2

2019 සැප්තැම්බර් 04 වන බදාදා
2019 செப்ரெம்பர் 04, புதன்கிழமை
Wednesday, 04th September, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත**
පළමුවන වර කියවන ලදී

**අමාත්‍යාංශීය උපදේශක කාරක සභා**

**කල් තැබීමේ යෝජනාව:**
මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අයුතු ලෙස මුදා හැරීම

---

# பிரதான உள்ளடக்கம்

**தேர்தல் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**குடிவருவோர், குடியகல்வோர் (திருத்தம்) சட்டமூலம்:**
முதன் முறை மதிப்பிடப்பட்டது

**அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்**

**ஒத்திவைப்புப் பிரேரணை:**
மத்திய கலாசார நிதியத்தின் பணத்தொகையை முறைகேடாக விடுவித்தமை

---

# PRINCIPAL CONTENTS

PERFORMANCE REPORT OF THE ELECTION COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

IMMIGRANTS AND EMIGRANTS (AMENDMENT) BILL:
Read the First time

MINISTERIAL CONSULTATIVE COMMITTEES

ADJOURNMENT MOTION:
Irregular Release of Funds from Central Cultural Fund

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 සැප්තැම්බර් 04වන බදාදා***
*2019 செப்ரெம்பர் 04, புதன்கிழமை*
*Wednesday, 04th September, 2019*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள்
[மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## தேர்தல் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE ELECTION COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2019 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2019.01.01 - 2019.03.31) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම (52 අධිකාරය) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු, 32 වගන්තිය යටතේ ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුනි 20 දිනැති අංක 2128/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති ඉදිරිපත් කරමි.

(අංක 04/2019 දරන සුරාබදු නිවේදනය)

එම රීති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ
(ii) 2017 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රතිසන්ධානය හා උතුරු හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2017 වර්ෂය සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2012 සහ 2013 වර්ෂ සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(iii) 2016 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(v) 2018 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(vii) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Note on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates; and

(ii) Excise (Amendment) Bill,

which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
( மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද කිව්වේ, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, අද ඔබතුමා ඉදිරිපත් කළ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව සම්බන්ධයෙන් මට ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. ඒ සඳහා අවස්ථාව ලැබෙන්නේ කොයි වෙලාවටද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතුවලට යන්න කලින් මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. Hon. Member, before we move on to Public Business of the day, I will give you time to speak.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කරුණාරත්න පරණවිතාන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රත්නපුර, මහවල පාර, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි ඕ. නාරද ශ්‍රී විතාරණ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුණ්ඩසාලේ, පල්ලේකැලේ, ට්‍රිනිටි ගාර්ඩන්ස්, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්.පී.කේ. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, මම බෝම්බුවල, වැලිගොඩැල්ල යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී.ටී. දොඩම්වල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගෙන් මම අහන ප්‍රශ්නය මෙයයි.

මේ වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරාම වන අලින්ගේ තර්ජනය පවතින අතර, මේ මාසය තුළ පමණක් වන අලින්ගේ පහර දීමෙන් මරණ 5ක් පමණ සිදු වී ඇත. වන අලින් පහර දීමෙන් මනුෂ්‍ය ජීවිතවලට බරපතළ හානි සිදු වී ඇති අතර, ඔවුන් ජීවත් වන නිවාස විශාල වශයෙන් විනාශ වී ඇත. එමෙන්ම, ඔවුන්ගේ ස්ථිර ගෙවතු භෝග එනම්, පොල්, කෙසෙල්, අඹ භෝග සම්පූර්ණයෙන් විනාශ වී ඇත.

වනජීවී දෙපාර්තමේන්තුව මඟින් ඉදිකරන ලද විදුලි වැට පද්ධතිය නිලධාරින්ගේ අධීක්ෂණය සහ සැලකිල්ල නොමැතිකමින් විනාශ වී ඇත. නිලධාරින්ගේ මෙම අකාර්යක්ෂමතාව හා වගකීම් පැහැර හැරීම දිගින් දිගටම සිදුවන නිසා, ඔවුන් පිළිබඳව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේ ද?

මෙම වන අලි උවදුර මඟහැරීම සඳහා ගනු ලබන කඩිනම් ක්‍රියා මාර්ග කවරේ ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs.)
ගරු කථානායකතුමනි, මෙතුමා සහ තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් මා සමඟත්, ඇමතිතුමා සමඟත් මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ගරු අනුර සිඩ්නි ජයරත්න මැතිතුමා සඳහන් කළ පරිදි, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ විවිධ ස්ථානවල වන අලින්ගෙන් තර්ජනය පවතිනවා. පසුගිය කාලය තුළ වන අලින් හේතුවෙන් පුද්ගල මරණ මෙන්ම දේපොළ හානි ද සිදුවී තිබෙනවා. මීට අමතරව, ජනතාවගේ වගා කටයුතුවලට ද මෙම තත්ත්වය අහිතකර ලෙස බලපා තිබෙනවා.

මෙම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා රජය විසින් විවිධ ක්‍රියා මාර්ග ගනිමින් සිටිනවා. දැනට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති විදුලි වැටවල්වල දුර කිලෝමීටර 718.88ක්. මෙසේ ඉදිකරන ලද විදුලි වැටවල් නඩත්තුව සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින් 272ක් යොදවා තිබෙනවා. ඊට අමතරව, පොළොන්නරු වනජීවී කලාපයේ වන අලි කළමනාකරණ කටයුතු සඳහා තවත් සිවිල් ආරක්ෂක භටයින් 60 දෙනෙකු අනුයුක්ත කර තිබෙනවා. එසේම, මෙම ගැටලුව සඳහා එක පිළියමක් වශයෙන්, ජන ජීවිතයට ඉතා පීඩාකාරී ලෙස හැසිරෙන වන අලින් අල්ලා පුනරුත්ථාපනය කිරීම සඳහා, වන අලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම ද ආරම්භ කර තිබෙනවා. මෙම වැඩසටහන යටතේ, දැනටමත් හොරොව්පොතාන ප්‍රදේශයේ වන අලි රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කර ඇති අතර, එහි පීඩාකාරී වන අලි රැඳවීමට කටයුතු කරමින් පවතිනවා.

එසේම, වන අලි පලවා හැරීමේ ක්ෂණික ක්‍රියා මාර්ගයක් ලෙස භාවිත කිරීමට අලි වෙඩි යොදා ගන්නා අතර, ජනාවාස තුළට පැමිණෙන වන අලි පලවා හැරීමට ජනතාව වෙත අලි වෙඩි නිකුත් කිරීමේ ක්‍රමවේදයක්ද පවත්වා ගෙන යනු ලබනවා. එම අලි වෙඩි බෙදා දීම සඳහා ප්‍රාදේශීය ලේකම්, ගොවි සංවිධාන වැනි ආයතන හා සංවිධානවල යාන්ත්‍රණයක් භාවිත කරනු ලබනවා.

ගරු කථානායකතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දැනට කිලෝමීටර 648.3ක් විදුලි වැට ඉදි කර ඇති අතර, එම විදුලි වැටවල්වලින් කිලෝමීටර 177ක් අලුත්වැඩියා කිරීමට හඳුනාගෙන තිබෙනවා. එම අලුත්වැඩියා කටයුතු මාස 03ක් ඇතුළත සිදු කර අවසන් කිරීමට මේ වන විට උපදෙස් ලබා දී තිබෙන අතර, සුංගාවිල, පල්ලියගොඩවැල්ල කිලෝමීටර 8.3ක පවතින විදුලි වැටෙහි ඉතිරි කොටස කඩිනමින් ඉදිකර, මාසයක් තුළ අවසන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම විදුලි වැට නඩත්තු කිරීමේ කටයුතු නිසි පරිදි සිදු නොවන බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. විදුලි වැට ඉදි කිරීමේ කටයුතු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර, එහි නඩත්තු කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබනවා. ඒ සම්බන්ධයෙන් සොයා බලා නිසි පියවර ගැනීමට කටයුතු කරන ලෙසට වනජීවී ඇමතිතුමා වෙත උපදෙස් ලබා දීමට මා කටයුතු කරනවා. එසේම, දැනට ජාතික විදුලි වැට වැඩසටහන සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩ පිළිවෙළ අනුව සෑම විදුලි වැටකටම කිලෝමීටර 1කට නඩත්තු සහායකයන් හෝ සිවිල් ආරක්ෂක භටයකු දිවා හා රාත්‍රී කාලයේ යොදා ගැනීමට අපේක්ෂා කරන අතර, ඉදිරියේදී එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරෙනවා. ඒ සඳහා නව බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතිනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමනි, අගමැතිවරයාගේ අවසරය ඇතුව තමයි වෙනත් කෙනෙකු ප්‍රශ්නයක් අහනවා නම් අහන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න. ඊට පස්සේ අගමැතිතුමාගේ කැමැත්ත ඇතුව ඔබතුමාටත් ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු අගමැතිතුමනි, ඔබතුමා සඳහන් කරපු සියලු කටයුතු සිදු වෙමින් යනවා. නමුත් වනජීවී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ගැන අපි සතුටු වෙන්නේ නැහැ. පසු ගිය දවසක මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දම්සෝපුර කියන ගමේ දම්සෝපුර විදුහල් ක්‍රීඩාංගණයේ උදේ හයට පමණ වන අලි ඇවිල්ලා හිටියා. ඒ අවස්ථාවේදී මැදිරිගිරිය නව නගරයේ ඒ ප්‍රදේශය භාර වනජීවී කාර්යාලයට ගම් වැසියෝ කථා කළා. එතකොට වෙලාව උදේ හයයි. ළමයින් පාසලට එන අවස්ථාව. ඒ

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

අවස්ථාවේ ඒ නිලධාරින් දීපු උත්තරය වුණේ, "අපට අද උසාවියේ නඩුවකට යන්න තිබෙන නිසා දැන් එන්න විධියක් නැහැ" කියන එක. ගමේ අය ඊට පස්සේ තමයි මේ වන අලි ටික එළෙව්වේ. ඒ වන විටත් පාසලට දරුවන් එනවා.

ගරු අගමැතිතුමනි, මේ නිලධාරින්ගේ ක්‍රියාත්මක වීම දිනෙන් දිනම අඩු වෙමින් යනවා. ඒ නිලධාරින් ඒවා නොසලකා හරිනවා. අනෙක් එක තමයි, රෑට හදිසියක් වෙලා වන අලි පලවා හරින්න ගෙන්වා ගන්න ඉන්න නිලධාරින් රෑට මේ කාර්යාලවල ඉන්නේ බීමත්ව. එක නිලධාරියකුවත් සිහියෙන් නැහැ. ඔවුන් අධික බීමත්වයි ඉන්නේ. ඒක නිසා ගරු අගමැතිතුමනි, දෙපාර්ත මේන්තුවේ තිබෙන අකාර්යක්ෂමතාවත්, ඒ ගොල්ලන්ගේ තිබෙන නොසැලකිල්ලත් මේ ගැටලු වැඩිවෙන්න හේතු වෙනවා. ඔබතුමා කිව්වා වාගේ පල්ලියගොඩැල්ල ඉඳලා සුංගාවිල දක්වා කිලෝමීටර අටක විදුලි වැට පද්ධතියේ මේ වන විට ඉදිකිරීම් කරගෙන යනවා. ඒ කරන සමහර ඉදිකිරීම්වල ප්‍රමිතියක් නැහැ. මේ ළඟදී ඉදිකිරීම් කරපු අලි වැට පද්ධතිය -අවුරුදු දෙකකට කලින් ඉදිකරපු අලි වැට පද්ධතිය- දැන් විනාශ වෙලා. මේ කරන ඉදිකිරීම්වලත් ප්‍රගතියක් නැහැ. ඒ ඉදිකිරීම් සඳහා ගන්නා කණුවල ප්‍රමිතියක් නැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, ඉතා හොඳ ප්‍රමිතියෙන් මේ කටයුතු කිරීමට ඒ නිලධාරින්ට උපදෙස් දෙන හැටියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවන ප්‍රශ්නයත් අහනවාද?

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
නැහැ, එපමණයි ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමාත් තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම මේ පිළිබඳව ප්‍රශ්න කරලා තිබෙනවා. මම බලාපොරොත්තු වෙන්නේ මේ සම්බන්ධයෙන් අපේ විෂය භාර ඇමතිතුමා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන්නයි. ඒකට අපේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානින් ඇතුළත් කරන්නත් බලාපොරොත්තු වෙනවා. සති දෙකකට වතාවක් හෝ මාසයකට වතාවක් රැස්වෙලා ප්‍රගතිය වාර්තා කරන්න අපට සිදු වෙනවා. නැත්නම් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මොකද, දෙපාර්තමේන්තුවේ අඩුපාඩුකම් තිබෙනවා. මේ කටයුතු සම්බන්ධීකරණය කරන්න ඇමතිතුමා, අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්, අදාළ නිලධාරින් සහ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඇතුළත් කමිටුවක් පත් කරන එක තමයි මේ සඳහා වඩාත් සුදුසු බවට මට පෙනෙන්නේ. වුවමනා නම්, ඒ අය මුණ ගැහිලා ඊට පස්සේ අපේ මන්ත්‍රීතුමන්ලාට ඒ ප්‍රදේශවලට ගිහිල්ලාත් ඒ වාර්තා ලබා දෙන්න පුළුවන්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ස්ථාවර නියෝග අනුව මට allow කරන්න පුළුවන් වෙන්නේ,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම පැහැදිලි කර දෙනතුරු. ඒ ප්‍රශ්න අහපු මන්ත්‍රීවරයාට විතරයි අවස්ථාව දෙන්න පුළුවන්. නමුත් ගරු අගමැතිතුමාත්, ඔබතුමාත් එකඟත්වයෙන් කරනවා නම්, ඒකට මගේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මේ ප්‍රශ්නය මතු කරන්නට අවස්ථාවක් ලබාදීම පිළිබඳව ඔබතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේත් වන අලි තර්ජනය ඉතාම ඉහළින් තියෙනවා. පසුගිය අවස්ථාවල ජීවිත හානිත් සිද්ධ වුණා. ඒ වාගේම දේපළ හානි විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා. මම හිතන හැටියට හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, අනෙක් දිස්ත්‍රික්කත් ආවරණය වන විධියට, වන අලි හානිය අවම කර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, ගම් වාසින් දැනට මේ සඳහා වෙනත් විවිධ ක්‍රම සොයා ගෙන තිබෙනවා. ඔවුන් විදුලි වැටට අතිරේකව වෙනත් ක්‍රමවේද සොයාගෙන තිබෙනවා. ඒ වාගේම, වන අලි එන එක ස්වාභාවිකව පාලනය කර ගන්නා ක්‍රම සහිත වැඩසටහන් ද තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

ලෝකයේ වඳ වී යන සතුන් හා ශාක වර්ග ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ස්ථාපිත කළ Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora හෙවත් වඳ වී යැමේ තර්ජනයට ලක්ව ඇති වන සතුන් හා ශාකවල අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය හා සම්බන්ධ 18වන වාර්ෂික සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට තීරණය කරනු ලැබුවේ 2016 වසරේ දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවර පැවැති 17වන CITES සමුළුවේදීයි.

ලොව වනාන්තරවලින් අනවසරයෙන් කපා, කොළඹ වරාය ඔස්සේ ප්‍රති අපනයනයට ගෙන ආ rosewood දැව සහ අප්‍රිකානු දළ ඇතුන් මරා ලබාගත් ලේ තැවරුණු දළ කන්ටේනර් පිටින් අල්ලා ගැනීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කිරීම සහ 2016 එම දළවලට අන්තර්ජාතික ප්‍රසිද්ධියක් ලබා දී ගාලු මුවදොර පිටියේදී විනාශ කිරීම, මෙම සමුළුව ශ්‍රී ලංකාවට ලබා දීමට තීරණය කිරීමට ප්‍රධානම හේතුව විය.

2018 වසරේදී සිදු කළ අමාත්‍ය මණ්ඩල සංශෝධනයත් සමඟ අමාත්‍යවරුන් කිපදෙනකුටම මෙම සමුළුවේ වගකීම භාරදී තිබුණ ද එය අවිධිමත් වීම නිසා CITES මහ ලේකම් කාර්යාලයේ නිලධාරින් අවසානයේදී තීරණය කළේ 2019 වසරේ මෙම සමුළුව ජිනීවා නුවර පැවැත්වීමටයි.

2018 අප්‍රේල් මාසයේදී කැබිනට් පත්‍රිකාවක් මඟින් CITES ලේකම් කාර්යාලයක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේ ස්ථාපිත කළේ 2019දී කොළඹ සමුළුව වෙනුවෙන් සැලසුම් සකස්

කිරීමට ය. නමුත් එක්සත් ජාතීන්ගේ සමුළුවට පමණක් දෙවන වන,- ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් 193යි ඉන්නේ. මෙකේ 183යි- ලොව වැඩිම පාර්ශ්වකරුවන්ගේ නියෝජනය සිදු කෙරෙන මෙම CITES සමුළුව ශ්‍රී ලංකාවට අහිමි වී ඇති බව ඔබතුමා දන්නේද?

මෙම සමුළුව ශ්‍රී ලංකාවට අහිමි කිරීම සම්බන්ධයෙන් සෘජුවම චෝදනා එල්ල වන්නේ වර්තමාන ආණ්ඩුවේ අයහපත් කළමනාකරණය නිසා බව ගරු අගමැතිතුමා පිළිගන්නේද? එසේ නැතහොත් ඊට වගකිවයුත්තන් කවුරුන්ද?

වසර 30ක ත්‍රස්තවාදය මුදා ගත් රට ලෝකයට විවෘත කර දීමට තිබුණු හොඳම අවස්ථාවක් වන CITES සමුළුව මෙරටට ලබා දී තිබියදී, එය නැති කර ගැනීමට ක්‍රියා කළ ආණ්ඩුවේ දේශපාලනඥයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මෙම සමුළුව අහිමි කිරීමට හේතු වූ කරුණු ගැන සවිස්තර වාර්තාවක් ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු අගමැතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, තර්ජනයට ලක් වූ වන සත්ව හා ශාක විශේෂවල අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතියේ - CITES - පාර්ශ්වකරුවන්ගේ 18 වන සැසිය පැවැත්වීම, 2018 නොවැම්බර් මස 05 වෙනි දින අංක 2096/17 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය යටතට පත් කළා. එවිටත් එම සමුළුව ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, සංස්කෘතිය සහ ජාතීන් අතර ඇති අන්‍යෝන්‍ය සබැඳියාව විදහා දක්වන ආකාරයෙන් සංවිධානය කරමින් පැවතුණි. එම සංවිධාන කටයුතු ඒ ආකාරයෙන්ම එම අමාත්‍යාංශය මඟින් ඉදිරියට ගෙන ගිය අතර, අදාළ වන සියලු පාර්ශ්වයන්ගේ මූලිකත්වයෙන් සංවිධාන කටයුතු සූදානම් කෙරිණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව හා ඒ අවට පරිශ්‍රය මූලික කරගෙන 4,000කට අධික විදේශීය නියෝජිතයන් පිළිගැනීමට සියලු කටයුතු සිදු කළ අතර, 2018 වර්ෂයේ දෙසැම්බර් 23වැනි දින CITES ලේකම් කාර්යාලයේ මහ ලේකම්වරිය ශ්‍රී ලංකාවට පැමිණ අපගේ ප්‍රයත්නය ප්‍රශංසනීය බවට ඇගැයීමක්ද සිදු කළා. නමුත්, අවසනාවන්ත අන්දමින් එම සමුළුව පැවැත්වීමට මාසයකට පෙර පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය එල්ල වුණා. එම අවාසනාවන්ත සිද්ධිය වූ මොහොතේ සිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ජිනීවාහි CITES ලේකම් කාර්යාලය සමඟ සෘජු සම්බන්ධතා පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලැබුවා. නමුත්, එම කාල වකවානුවේ ඇති වූ ආරක්ෂක තත්ත්වය සලකා බලා ජිනීවා CITES මහ ලේකම් කාර්යාලය විසින් මෙම සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම තාවකාලිකව කල් දැමීමට තීරණය කරනු ලැබුවා. ඒ අනුව, ජිනීවා මහ ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වෙමින් මෙම සමුළුව සැප්තැම්බර් 1වැනි දින සිට 12වැනි දින දක්වා පැවැත්වීමට නව දින වකවානු තීරණය කළා. ඒ සඳහා සියලු එකඟතාවලට එළැඹුණා. එම කාල වකවානුවේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් නිරීක්ෂණ චාරිකාවක් සඳහා ලංකාවට පැමිණි අතර, 2019 මැයි මස 28 සිට 30 දක්වා කාලය තුළ මෙරට රැඳී සිටිමින් කරුණු අධීක්ෂණය කළා. සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල නිලධාරින් කල් තැබූ සමුළුව නැවත පැවැත්වීමේ හැකියාව ඔවුන් වෙත පෙන්වා දීමට කටයුතු කළා. නමුත්, අවසානයේදී ඔවුන් තීරණය කළේ, ආරක්ෂක තත්ත්වය නිසා මේ සමුළුව කල් දමන්නයි. වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි ඒක වුණේ, ගරු කථානායකතුමනි.

මේ CITES එක ආරම්භ වූ අවස්ථාවේ එහි මහ ලේකම්තුමිය මෙහෙම සඳහන් කළා:

"May I once again express our sadness over the tragic events in Sri Lanka last April and the losses and impacts suffered by the Sri Lankan people because of this tragedy. We truly wish we could have met as planned earlier this year in Colombo. We thank the Secretariat in Colombo for all their efforts in the early preparations for CoP18. I kindly ask you all to stand for a minute of silence".

ඇත්ත වශයෙන් මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් වුවමනා නම්, ඒක අදාළ ඇමතිතුමාගෙන්ම ලබා ගන්න කියලායි මම යෝජනා කරන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ ආරක්ෂක තත්ත්වය මත මෙම සමුළුව පැවැත්වීම අහෝසි කළා නම්, ශ්‍රී ලංකාව මේ පිළිබඳ කෝපයට පත් වෙලා 2018 ජූනි මාසයේ රුසියාවේ සෝචි නුවරදී පෙර සූදානමක් ලෙස දියත් කරපු මේ සමුළුවේ ලාංඡනය - logo එක - ඉවත් කර ගැනීමට කටයුතු කළේ ඇයි? රටවල් 183කට, ශ්‍රී ලංකාවට ආවේණික සතුන්ගෙන් සමන්විත ඒ ලාංඡනය ඉදිරිපත් කරලා තිබුණා. ඔබතුමා කියන ආකාරයට ආරක්ෂක තත්ත්වය මත මෙම සමුළුව පැවැත්වීම අහෝසි කළා නම්, එය ගැටුමක ප්‍රතිඵලයක් නොවෙයි නම්, ඒ ලාංඡනය ඉවත් කර ගැනීමට ඔබතුමන්ලා කටයුතු කළේ ඇයි?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එහෙම වාර්තාවක් මට නම් ලැබිලා නැහැ. ඇමතිතුමා කියනවා එහෙම දෙයක් සිදු වුණේ නැහැ කියලා. අවශ්‍ය නම් මට ඒ ගැන තව සොයා බලන්න පුළුවන්. ඒකයි මම විශේෂයෙන් කියන්නේ මෙවැනි ප්‍රශ්න අදාළ ඇමතිවරුන්ටයි යොමු කරන්න තිබෙන්නේ කියලා. මට මේ ප්‍රශ්නය යොමු කළ නිසා මම පිළිතුරු දෙනවා. මහ ලේකම්තුමිය ඇවිත් මේ සංවිධානය දිහා බැලුවා නේ. ඊට පසුව සිදු වුණු අලුත් සිදුවීම මේ බෝම්බ පිපිරීම පමණයි. මහ ලේකම්තුමිය පැමිණෙද්දී සමහර විට එතුමිය ඒ ගැන අසතුටට පත් වුණාද කියලා මම දන්නේ නැහැ. මහ ලේකම්තුමිය පැමිණ අසතුටට පත්වුණා කියලාද ඔබතුමා කියන්නේ? නොවැම්බර් 05වෙනි දා මේ විෂයය දුන්නා, අලුත් ඇමතිවරයෙකුට. එතුමිය ආවේ දෙසැම්බර් 23වෙනි දා. එහෙම නම්, මොනවාද වුණේ කියලා ඔබතුමා එතැනින් ප්‍රශ්න කරන්න. මගෙන් අහන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු අග්‍රාමාත්‍යතුමනි, දෙසැම්බර් 23 සිටියේ තමුන්නාන්සේලා පත් කරපු ඇමතිවරයකු විමයි ප්‍රශ්නයට හේතු වුණේ. අග්‍රාමාත්‍යතුමාට මගේ තාක්ෂණික ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි නම්, මම එතුමාට උත්තර දිය හැකි ප්‍රශ්නයක් අහන්නම්කෝ. එක්සත් ජාතික පක්ෂයේ -[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න, ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේක සිදු වුණේ ආරක්ෂක තත්ත්වය නිසා. මහ ලේකම්තුමිය එනකොට ඒ සති හයේදී ඒ කටයුතු භාර ගෙන තිබුණේ වෙන ඇමතිවරයෙක්. එතැනදී ප්‍රශ්නයක් ඇති වුණාද කියන එකත් මම සොයා බලා කියන්නම්. එතුමිය එතකොට ඒක තීරණය කළා නම්, එහෙම නම් ඒක වුණේ ඒ කාලයේදී. එහෙම නැත්නම් අපි කියන විධියට මේක සිදු වුණේ බෝම්බ පිපිරීම නිසා. අපේ රැස්වීම් ගණනාවකුත් අපට කල් දමන්න සිදු වුණා, මේ බෝම්බ පිපිරීම නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමාට මේ තාක්ෂණික ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැයි කියනවා. නමුත්, දිගින් දිගටම ලේකම් කාර්යාලය සමුළුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්න බැහැයි කියපු බව දෙපාර්ශ්වය අතර හුවමාරු වූ ඊමේල් පණිවුඩ, අදාළ ලිපි ගොනු ගෙනැත් බැලුවාම අග්‍රාමාත්‍යතුමාට පැහැදිලි වෙයි. මොකද, ඔබතුමා නොමඟ යවා තිබෙන්නේ. ඔබතුමාට තාක්ෂණික ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැයි කියන නිසා මම ඔබතුමාට උත්තර දිය හැකි ප්‍රශ්නයක් අහන්නම්.

ගරු අග්‍රාමාත්‍යතුමනි, වඳ වීමට ලක්වෙලා තිබෙන මේ සත්ව කොට්ඨාස අතරට එක්සත් ජාතික පාක්ෂිකයා අඩංගු වීම, ඔබතුමාගේ නායකත්වය යටතේ වසර විසිපහක සිදුවීම ගැන ඔබතුමා කියන්නේ කුමක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙතැනට දේශපාලනය ගේන්නේ නැතිව වනජීවීන් සම්බන්ධ ප්‍රශ්නයට යමු. මේක අනවශ්‍ය දෙයක් නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මෙතුමාට තාක්ෂණික ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න අහන්න කියනවා නේ. එම නිසා එතුමාට උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක් මම ඇහුවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒක බණ්ඩාරනායක මැතිතුමාගේ කාලයේ සිට කිව්වා. එහෙත් සමහර සතුන් බලන්නේ වඳ වෙන්නේ නැති නිසා වෙනත් තැනකට පනින්න. අපි එහෙම නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. I. Charles Nirmalanathan. You can ask your Question.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

1. (அ) வவுனியா மாவட்டத்தில் நீண்ட காலமாகப் பல கிராமங்களில் சுத்தமான குடிநீர் இன்மையால் மக்கள் பல சிரமங்களை எதிர்கொண்டு வருகின்றார்கள். குறிப்பாக, கடந்த 2014ஆம் ஆண்டு முதல் 2019ஆம் ஆண்டு வைகாசி மாதம் வரையில் 6,781 பேருக்கு சிறுநீரக நோய் ஏற்பட்டுள்ளது. இதனால், அப்பகுதியில் வாழுகின்ற வறிய மக்கள் பல்வேறு துன்பங் களையும் வாழ்வாதார நெருக்கடிகளையும் எதிர்கொண்டுவருவதை கௌரவ பிரதமர் அறிவாரா?

(ஆ) இம்மாவட்டத்தில், வவுனியா நகர பிரதேச செயலகத்திற்கு உட்பட்ட வவுனியா நகர், இறம்பைக்குளம், வெளிக்குளம், கோவில்குளம், வைரவப்புளியங்குளம், வவுனியா நகர் வடக்கு, தோணிக்கல், பட்டாணிச்சிப் புளியங்குளம், மூன்று முறிப்பு, நெளுக்குளம், மடுகந்த, புதுக்குளம், பண்டாரிக்குளம், தாண்டிக்குளம், நொச்சிமோட்டை, மறக்காரம்பளை, அத்தோடு வெண்கலச் செட்டிகுளம் பிரதேச செயலாளர் பிரிவில் கங்கன்குளத்திலுள்ள ஒட்டாரக்குளம், பிரமணாளங்குளத்திலுள்ள நீலியாமோட்டை, பெரியதம்பனை, பாவற்குளப் படிவம் 04, கிறிஸ்தவக்குளம், குருக்கள் புதுக்குளத்திலுள்ள எருக்கலங்கள், பெரியகட்டிலுள்ள பழைய குடிமனை, புதிய குடிமனை, கன்னாட்டி, பெரிய புளியாலங்குளத்திலுள்ள காந்திநகர் மற்றும் நேரிய குளத்திலுள்ள நேரியகுளம், அழகாபுரி, வேப்பங்குளம் ஆகிய கிராமங்களுக்குச் சுத்தமான குடிநீர் இன்றி அதிகமானோர் சிறுநீரக நோயினாலும் பாதிக்கப்பட்டுள்ளதை கௌரவ பிரதமர் அறிவாரா?

(இ) மேலும், வவுனியா மாவட்டத்திற்கு நீர் மீள்சுத்திகரிப்பு - RO plant திட்டத்தினூடாக வழங்கப்பட்ட கூடுதலான திட்டங்கள் சிங்களப் பகுதி மக்களுக்கு வழங்கப்பட்டுள்ளபோதிலும், அங்கு கூடுதலாகச் செறிந்துவாழும் தமிழ் மக்கள் அத்திட்டத்தின்மூலம் குறைந்த பயன்களை மட்டுமே பெற்றுள்ளனர் என்பதையும் கௌரவ பிரதமர் அறிவாரா?

(ஈ) ஆமெனில், குடிநீர் இன்றிச் சிரமப்படுகின்ற மேற்குறிப்பிட்ட வவுனியா நகர் மற்றும் வெண்கலச் செட்டிகுளம் ஆகிய பிரதேச செயலகங்களுக்கு உட்பட்ட குறித்த கிராமங்களுக்கு நிரந்தர நீர் மீள்சுத்திகரிப்பு நிலையங்களை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா? என்பதையும், அது எக்காலப் பகுதியில் நடைமுறைப்படுத்தப்படும் என்பதையும் கௌரவ பிரதமர் இச்சபையில் அறிவிப்பாரா?

2. வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சின் தேசிய வீடமைப்பு அதிகாரசபையினால் மன்னார், வவுனியா மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் தற்பொழுது

நடைமுறைப்படுத்தப்பட்டிருக்கின்ற மாதிரிக் கிராம வீட்டுத் திட்டங்கள் மக்களுக்குக் கையளிக் கப்பட்டுவரும் நிலையில், நீண்ட காலமாகப் பல மாதிரிக் கிராம வீட்டுத் திட்டங்களுக்கு எந்தவித நிதியும் வழங்கப்படவில்லை என்பதையும் பல மாதிரிக் கிராம வீட்டுத் திட்டங்களுக்குச் சிறிதளவு நிதியே வழங்கப்பட்டுள்ளது என்பதையும் கௌரவ பிரதமர் அறிவாரா? இதற்கான நிதியினை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா? என்பதை அவர் இச்சபையில் அறியத் தருவாரா?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මීට අදාළ අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. ඒ අමාත්‍යාංශ දෙකෙන්ම වාර්තා ලබා ගෙන තිබෙනවා.

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනටමත් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා වවුනියාව දිස්ත්‍රික්කයේ නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක් වූ ප්‍රදේශවලට ආරක්ෂිත පානීය ජලය සැපයීමට ජල පවිත්‍ර යෝජනා ක්‍රමය ස්ථාපනය කර, ප්‍රජා මූලික සංවිධානවලට ලබා දීමට ක්‍රියාමාර්ග ගනු ලැබුවා. ඒ අනුව වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පමණක් ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - 16ක් සවි කර ඇති අතර, ඒවා වවුනියාව දිස්ත්‍රික්කයේ නිදන්ගත වකුගඩු රෝගයේ අවදානමට ලක් විය හැකි ප්‍රදේශවලට භාර දී තිබෙනවා. එසේම නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීමේ වැඩසටහන යටතේ නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උතුරු කලාපීය ජලසම්පාදන මධ්‍යස්ථානය මඟින් සෑම වසරකම නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක්වූ හා අවදානමට ලක් විය හැකි ප්‍රදේශවලට ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - ලබා දෙනවා. මෙයට අමතරව ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව සහ නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය සහ ශ්‍රී ලංකා නාවික හමුදාවද ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - හරහා නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක්වූ ප්‍රදේශවලට පිරිපහදු කළ ජලය ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, වවුනියාව ජලසම්පාදන ක්‍රමය මඟින් වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වවුනියාව නගරය, රම්බායිකුලම, වෙලාක්කුලම, කෝවිල්කුලම, තෝනික්කාල්, වෛරවප්පුලියංකුලම, වවුනියාව නගර උතුර, පට්ටානිච්චිප්පුලියංකුලම, මුන්ඩමුරිප්පු, නෙලුක්කුලම, මඩුකන්ද, පූදුක්කුලම, බණ්ඩාරික්කුලම, මරක්කාරම්බලෛ, තාණ්ඩික්කුලම, නොච්චිමෝට්ටෛ යන ග්‍රාම නිලධාරි වසම් ආවරණය කර තිබෙනවා.

එසේම, වවුනියාව දිස්ත්‍රික්කයට පානීය ජලය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව - ADB - විසින් අරමුදල් සපයන ලද වියළි කලාපීය නාගරික ප්‍රදේශ සඳහා ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය හරහා වෙන් කළ ජලාශයක් ඉදි කර ඇති අතර, එමඟින් නල මාර්ගයෙන් පිරිසිදු ජලය ඉහත ප්‍රදේශයට සපයනු ලබනවා. ඉහත නාගරික ප්‍රදේශ සඳහා ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කර නොමැති වුවද, වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ඇතැම් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට භූගත ජල සැපයුම ලබාදී තිබෙනවා. කෙසේ වෙතත්, මාස දෙකක් ඇතුළත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර නල මාර්ගයෙන් පිරිසිදු ජලය සමස්ත වවුනියාව නගරයටම ඉක්මනින් ලබා දිය හැකි වෙතැයි අපි අපේක්ෂා කරනවා.

මෙයට අමතරව වැංගල සෙට්ටික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - 08ක් ස්ථාපනය කර ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රජා මූලික සංවිධාන - CBO - වෙත ලබා දී තිබෙනවා. ඒ සමඟම ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් වැංගල සෙට්ටික්කුලම ප්‍රදේශයට ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - 02ක් ද ලබා දී තිබෙනවා. ඒ අනුව පෙරියකඩ්ඩු, නෙරියාකුලම, පිරමනාලකුලම සහ පාවට්කුලම ඒකක 04 යන ප්‍රදේශවලට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජල පවිත්‍ර යන්ත්‍ර - RO plants - හරහා ජලය සපයනු ලබනවා.

එසේම, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරනු ලබන දේශගුණික ප්‍රතිරෝධී ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය හරහා වැංගල සෙට්ටිකුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තවත් ගම්මාන කිහිපයක් ආවරණය වෙනවා. එබැවින්, නුදුරු අනාගතයේදී ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ අනෙකුත් ප්‍රදේශද ආවරණය කරනු ලබනවා. ජල පවිත්‍ර ස්ථාපනය සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ, නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහජන සෞඛ්‍ය පරීක්ෂක, ප්‍රජා මූලික සංවිධාන, මහජන නියෝජිතයන් සහ අනෙකුත් සංවිධාන මඟින් ලැබෙන ඉල්ලීම් මත පදනම්වයි. එම ඉල්ලීම්වලට අනුව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලබන අතර, ඒ අනුව ජල පවිත්‍ර ස්ථාපනය කිරීම සඳහා ප්‍රදේශය තෝරා ගනු ලබනවා. ගරු කථානායකතුමනි, මා ඇමතිතුමාට විශේෂයෙන් දැනුම් දෙන්නම්, මේ පිළිබඳව අනික් කරුණු පැහැදිලි කරන්න කියලා.

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ සෙසු ප්‍රදේශවල මෙන් උතුරු පළාත තුළත් මෙමඟින් විමසීම් කර ඇති වවුනියාව, මන්නාරම හා මුලතිව් වැනි දිස්ත්‍රික්කවලත් ආදර්ශ ගම්මාන ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. උතුරු පළාත තුළ, 2015 සිට 2019 අගෝස්තු 31 වන දින විට ගම්මාන 18ක් ජනතා අයිතියට පවරා දී තිබෙනවා. ගම්මාන 407ක් මේ වන විට ඉදිකරමින් තිබෙනවා. එයින් ගම්මාන 18ක් තමයි ජනතා අයිතියට පවරා දී තිබෙන්නේ. නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ බලාපොරොත්තුව, මෙම නිවාස ඉදිකිරීම් මේ වසර අවසාන වීමට ප්‍රථම නිම කිරීමයි. විශේෂ අවශ්‍යතාවක් ඇති හෝ වැඩිපුර මුදල් වැය කළ යුතු ගම්මාන, එහෙම නැත්නම් මුදල් නොලැබුණු ගම්මාන ගැන ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා විස්තර ලබා දුන්නොත්, ඒවා නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට යොමු කරන්න පුළුවන්. දැනට උතුරු පළාත තුළ ප්‍රතිලාභීන් 8,653ක් ඉන්නවා. ඒ සඳහා රුපියල් මිලියන 5,146ක මුදලක් වැයකොට තිබෙනවා. මේ වන විට ගම්මාන 18ක පුද්ගලයන් වෙත නිවාස භාර දී තිබෙනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதமர் அவர்களே, தாங்கள் நாட்டினுடைய பிரதமராக இருப்பது மட்டுமல்லாமல், வடக்கு மாகாண அபிவிருத்தி அமைச்சராகவும் இருக்கின்றீர்கள்! அதன் காரணமாகத்தான் நான் இந்த விடயத்தை உங்களிடம் முன்வைக்கின்றேன். வவுனியா மாவட்டத்தில் வைத் தியசாலைகளின் தேவைகளும் இருக்கின்றன. நேரம் கருதி, அந்த விபரங்களை நான் இங்கு சமர்ப்பிக்காமல் நேரடியாக உங்களுடைய அலுவலகத்தில் சமர்ப்பிக்கின்றேன். குறிப்பாக, வவுனியா மாவட்டத்தில் சுத்தமான குடிநீர்த் திட்டம் தொடர்பாக நீங்கள் கூறியதுபோல நடவடிக்கை எடுக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. ஆனால், அங்கிருக்கின்ற நீர் வழங்கல் அதிகாரசபையினுடைய முகாமையாளர்கள் தங்களுக்கு நிதிகள் ஒதுக்கப்படுவதில்லை என்ற கருத்தை

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

முன்வைத்திருக்கின்றார்கள். அவர்களிடம் திட்டங்கள் இருக் கின்றன. ஆகவே, நீர் வழங்கல் அதிகாரசபையினுடைய முகாமையாளர் மற்றும் அந்தப் பிரதேசத்தினுடைய பாராளுமன்ற உறுப்பினர்களை அழைத்து, தங்களுடைய அமைச்சின் செயலாளருடைய தலைமையின்கீழ் ஒரு திட்டமிடல் உருவாக்கப்பட்டு, வவுனியா மாவட்டத்தில் இருக்கின்ற அனைத்து மக்களுக்குமான குடிநீரை எவ்வளவு காலத்தில் வழங்க முடியும்? அதற்கு எவ்வளவு பணம் தேவை? என்ற ஓர் ஆய்வை கௌரவ பிரதமர் அவர்கள் செய்ய முன்வரவேண்டுமென்று நான் இந்த நேரத்தில் அவரிடம் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, do you have a second question? Or is that all?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதமர் அவர்கள், தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையினுடைய பணம் தொடர்பாகக் கூறியிருந்தார். ஆனால், 2018ஆம் ஆண்டு வழங்கப்பட்ட வீட்டுத் திட்டத்திற்கான பணம்கூட இற்றைவரை அங்கிருக்கின்ற மக்களுக்கு வழங்கப்படவில்லை. அந்த மக்கள் தங்களுடைய வீடுகளைப் பூர்த்தி செய்து குடிபுகுந்துவிட்டார்கள். ஆனால், 500,000 ரூபாய் வீட்டுத் திட்டத்தில் 250,000 ரூபாய்தான் இன்றுவரை அவர்களுக்குக் கொடுக்கப்பட்டிருக்கின்றது.

அதேபோல, 2019ஆம் ஆண்டு மன்னார் மாவட்டத்தில் 2,300 பயனாளிகள் தெரிவுசெய்யப்பட்டு, அந்தப் பயனாளிகளுக்கான திட்டங்களை ஆரம்பித்து வைத்தார்கள். அமைச்சர் உட்பட நாங்களும் சென்றுதான் அந்தத் திட்டங்களை ஆரம்பித்து வைத்தோம். ஆனால், பல திட்டங்களுக்குப் பணம் எதுவும் கொடுக்கப்படவில்லை. சில திட்டங்களுக்கு 40,000 ரூபாய், 100,000 ரூபாய் மாத்திரமே கொடுக்கப்பட்டிருக்கின்றது. 750,000 ரூபாய் திட்டத்தில், ஆகக்குறைந்த தொகையுடன் மேலதிகமாகச் செலவிட்டு மக்கள் இன்று கடனில் இருகின்றார்கள். 2 வாரங்களுக்கு முன்பு மன்னார் எமில் நகரைச் சேர்ந்த 43 வயதுடைய செல்வராணி என்ற ஓர் அம்மா National Housing Development Authority க்கு 2 தடவை போய்வந்து மயங்கிவிழுந்த அவர், தற்போது இறந்துவிட்டார். இதே நிலைமையில்தான் அங்கிருக்கின்ற பயனாளிகள் அந்தப் பணத்தைப் பெற்றுக் கொள்வதற்கு முடியாமல் இருக்கின்றார்கள். தங்களுக்கு ஒரு மாதத்திற்கு மேலாக கொழும்பிலிருந்து பணம் வரவில்லை என்று மாவட்ட முகாமையாளர் கூறுகின்றார். மாவட்ட அபிவிருத்திக் குழுவினரைக் கேட்டபோது, அவர்களும் தங்களுக்குப் பணம் வரவில்லை என்று சொல்கின்றனர். என்னைப் பொறுத்தவரையில், ஒரு திட்டமிடல் இல்லாமல் வெறுமனே விளம்பரத்திற்காக இந்தத் திட்டங்களை ஆரம்பித்தார்களா? என்கின்ற சந்தேகம் எழுகின்றது. அதேநேரத்தில், ஒரு வீட்டுத் திட்டத்தை - 25 வீடுகளை - திறந்து வைப்பதற்குப் பல மில்லியன்களைச் செலவழிக் கின்றார்கள். அந்தப் பணத்தினைச் சேமித்து இந்த வீட்டுத்திட்டப் பயனாளிகளுக்குக் கொடுப்பதற்கு கௌரவ அமைச்சர் முன்வர வேண்டும். இந்த மக்கள் மிகுந்த சிரமத்தில் இருக்கின்றார்கள் என்று நான் அமைச்சரிடம் பல தடவை தெரிவித்திருக்கின்றேன். ஆனால், அவருடைய பதில் தெளிவில்லாத காரணத்தினால்தான் கௌரவ பிரதமர் அவர்களிடமும் இந்தக் கேள்வியை முன்வைக்கின்றேன். ஆகவே, அந்த மக்களுக்கு இந்தப் பணத்தை மிக விரைவில் பெற்றுக்கொடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Prime Minister, do you want to reply?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

Yes.

ගරු කථානායකතුමනි, චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා වවුනියාවේ රෝහල ගැනත් ප්‍රශ්නයක් මතු කළා. මගේ ලේකම්තුමාට කියන්නම්, ඒ ගැන කරුණු සොයලා, ඔබතුමා සමහත් සාකච්ඡා කරන්න කියලා, ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන කියන්න දැන් මට මෙතැන කරුණු නැහැ.

දෙවනුව, නිවාස පිළිබඳව තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් සියලු විස්තර ඔබතුමා මට ලබා දෙනවා නම්, - කොහේටද මුදල් වුවමනා කියලා - ඇමතිතුමා සමහත් සාකච්ඡා කරලා මම ඒ තොරතුරු ටික ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාට මා යොමු කරන ප්‍රශ්නය මෙයයි.

(1) 2020 වර්ෂය සඳහා ආණ්ඩුව මඟින් අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(2) එසේ නොවේ නම්, ඒ සඳහා අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමේ සූදානමක් තිබේද?

(3) අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීම මඟින් ආණ්ඩුවේ ආදායම් අහිමි වීමක් සිදු වෙනවා පමණක් නොව, වියදම් ශීර්ෂ සඳහා නිශ්චිත වශයෙන් මුදල් වෙන් නොකිරීම නිසා රාජ්‍ය මුදල් අවභාවිතාවකට ඉඩකඩ සැලසෙන බව දන්නේද?

(4) විශේෂයෙන්ම, පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට නියමිත 2020 වර්ෂය තුළදී මේ ආකාරයට නිශ්චිත වශයෙන් වෙන් නොකළ වියදම් ක්‍රමවේදයක් අනුගමනය කිරීම මඟින් මැතිවරණ කාල සීමාව තුළ ආණ්ඩුවේ ප්‍රතිරූපය ගොඩ නඟා ගැනීම සඳහා රාජ්‍ය මුදල් අවභාවිත කිරීමේ ඉඩක් නොපවතින්නේද?

(5) මහ මැතිවරණය පැවැත්වීමෙන් පසුව පත් වන නව ආණ්ඩුවටද 2020 අප්‍රේල් 30වන දාට පෙර අය වැයක් සකස් කිරීමට නොහැකි වන බැවින්, 2020 වර්ෂයේ දෙවන කාර්තුව සඳහාද අය වැයක් නොමැතිව තවත් අතුරු සම්මත ගිණුමක් ගෙන ඒමට සිදු නොවන්නේද?

(6) ඉහත තත්ත්වය තුළ රාජ්‍ය මුදල් අවභාවිතාවකට හා රටේ ආර්ථිකය තවත් බිඳ වැටීමකට ලක් වන බව පිළිගන්නේද?

(7) නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, සාමාන්‍ය ක්‍රමවේදය අනුව නම්, 2020 වර්ෂය සඳහා 2019 වර්ෂය තුළ අය වැය ලේඛනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. නමුත්, මෙවර එය ඉදිරිපත් නොකිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබෙනවා. එම තීරණය ගත්තේ සම්ප්‍රදායක් හැටියටයි. මේ වසරේ ඔක්තෝබර් මාසයේ අග භාගයේ සිට නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ජනාධිපතිවරණය පවත්වනවා නේ. යම් කාල සීමාවක ඒ වාගේ මැතිවරණයක් තිබෙන කොට, මෙතෙක් කල් එහෙම අය වැයක් ඉදිරිපත් කර නැහැ. අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමෙන් ආදායම් අහිමි වීමක් සිදු වෙන්නේ නැහැ. මේ අවුරුද්දේ මුදල් සියල්ලම වියදම් වෙන්නේ දැනට සම්මත කර තිබෙන විසර්ජන පනත යටතේයි. එයින් පිට යන්න අපට බැහැ. ඒ නිසා දෙසැම්බර් 31වැනි දා වනතුරු මේ යටතේ තමයි ඒ කටයුත්ත කරන්නේ.

විශේෂයෙන්ම අතුරු සම්මත ගිණුමක් මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන රටේ පවතින නීතිරීති, මුදල් රෙගුලාසි සහ රජයේ චක්‍රලේඛ අනුවයි වියදම් කරන්න තිබෙන්නේ. අලුත් ව්‍යාපෘති එකක්වත් එතැනට ඇතුළු වෙන්නේ නැහැ. එහෙත්, මේක අපි ඇතුළු කරන්නේ මේ අවුරුද්ද සඳහා නොවෙයි, ලබන අවුරුද්ද සඳහායි. ඒ වාගේම, ආණ්ඩුවක් මැතිවරණය සඳහා මුදල් යොදවනවා නම්, -දැන් මැතිවරණ කොමිසමක් තිබෙනවා- ඒ ගැන සොයා බලා නියෝග දෙන්න පුළුවන්.

ඇත්ත වශයෙන්ම, ඊළඟ ප්‍රශ්නය එන්නේ පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳවයි. 1988දී ජනාධිපතිවරණය අවසන් වූ වහාම මැතිවරණයත් පැවැත්වුවා. 1999 ජනාධිපතිවරණය අවසන් වුණාම, අය වැය ඉදිරිපත් කිරීමෙන් පසුව තමයි පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුවේ. එහෙත් ඒ අවස්ථා දෙකේදීම ජනාධිපතිතුමාට බලය තිබුණා පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. අද ඒ බලය පාර්ලිමේන්තුව සතුවයි තිබෙන්නේ. ඉක්මනින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න අපට වුවමනා නම්, පාර්ලිමේන්තුවේ එකඟත්වය අනුවයි එය කරන්න ඕනෑ.

මම හිතන විධියට මෙය විශේෂයෙන්ම පක්ෂ නායකයන් සහ පාර්ලිමේන්තුවෙන් ගත යුතුව තිබෙන තීරණයක්. පළමුවැනි මාස කිහිපය තුළදී ජනාධිපතිවරණයකින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනවාද, නැද්ද කියන එක පාර්ලිමේන්තුව ගන්න ඕනෑ තීරණයක්. ඒ අනුව අය වැය පිළිබඳවත් තීරණය කරන්න පුළුවන්. ඒක පක්ෂ නායකයන් සහ පාර්ලිමේන්තුව ගත යුතු තීරණයක්. අතුරු සම්මත ගිණුමක් පිළිබඳව ඒ කාලයේදී ක්‍රියා කරන්නේ කොහොමද කියලා තීරණය කරන්න සිදු වුණොත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - Committee on Public Finance - ඒ අදාළ නිලධාරින් කැඳවලා ඒ අය සමඟ සාකච්ඡා කරන්න කියලායි මම යෝජනා කරන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමනි, ඔබතුමා විපක්ෂ නායකතුමා වශයෙන් 2009.11.03වැනි දා එක්තරා පුවත් පතකට කරන ලද ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවට එකතු කරන්න මම කැමැතියි. එවකට පැවැති රාජපක්ෂ රජය, අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට යනවිට ඔබතුමා මෙහෙම කියා තිබෙනවා. ඒ පුවත් පතේ මෙහෙම තිබෙනවා.

".....පැහැදිලිවම අය වැය යෝජනාවලියක් ඉදිරිපත් කිරීමේ හැකියාව වත්මන් රජයට පවතිනවා. එසේ හැකියාවක් තිබියදී අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීම විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාට අනුව නම්, ඉදිරි වසර සඳහා වන අය වැය ලේඛනයේදී රජය විසින් ආදායම් උපද්දවා ගැනීම සහ වියදම් පාලනය සම්බන්ධව රටට හෙළි කිරීමට අපොහොසත් වීම නිසා මෙසේ අතුරු සම්මත ගැටයක් ගසන බව......"

අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නැහැ. අය වැය යෝජනාවක් ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමාම ඒක කියලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. මේ අවස්ථාවේදී අතුරු සම්මත ගිණුමකින් ලබන අවුරුද්දේ පළමුවැනි මාස හතරට මුදල් වෙන් කරද්දී, ඔබතුමන්ලාට ආණ්ඩුවේ ආදායම වැඩි කරන්න හම්බ වෙන්නේ නැහැ. වියදම් තමයි වැඩි කරන්න හැකි වෙන්නේ. උදාහරණයක් ගත්තොත්, වැටුප් ගෙවීම ඔබතුමන්ලාට මේ අවුරුද්දට වෙන් කරපු මුදලින් කරන්න බැහැ. ඒ නිසා වෙන්න පුළුවන් දේ මේකයි. මැතිවරණයක් අභියසදී ඔබතුමන්ලාට අය නොසලකා වැය වැඩි කරන්න පුළුවන්. අන්න ඒකෙන් වන රාජ්‍ය මුදල් අවභාවිතාව ගැනයි මා ප්‍රශ්න කළේ. ඒ වාගේම, නැවත පාර්ලිමේන්තු මැතිවරණයක් ඒ මාස කිහිපය තුළදී පැවැත්වුවාට පස්සේ ඒ අලුතින් එන කුමන ආණ්ඩුවකට වුවත් අය වැයක් හදා ගන්න කාලයක් නැති වෙනවා. ඒ නිසා මැතිවරණය ඉලක්ක කර ගත්තු වැඩක්ද ඔබතුමන්ලා අතුරු සම්මත ගිණුමක් මඟින් කරන්නේ කියන එකයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ඡන්දය තිබෙන්නේ ඇත්ත වශයෙන්ම නොවැම්බර් හෝ දෙසැම්බර් මාසයේ. ඒ නිසා මේ කාලසීමාව තුළ තමයි මේ ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ. රටේ ආර්ථික තත්ත්වය ගැන දැන ගන්න වුවමනා නම් ඒ ගැන අපට විවාදයක් මේ ගරු සභාවේ පවත්වන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ මාස කිහිපය තුළ අපේ ආදායම අඩු වුණා. දැන් ආදායම සාමාන්‍ය තත්ත්වයට එමින් පවතිනවා. කෙසේ හෝ රජයක් හැටියට අපි ක්‍රියා කරන්නේ ප්‍රාථමික අය වැය අතිරික්තයක් තියා ගන්නයි. අපි පසුගිය අවුරුද්දේත් ඒ දේ ඇති කළා. මේ අවුරුද්දේත් බලන්නේ අඩු ගානේ සම සමව හෝ තියා ගන්නයි. එන අවුරුද්දේ අතිරික්තය තවත් වැඩි කරන්නයි බලාපොරොත්තු වන්නේ. ඒකයි ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්තිය. ඒ නිසා අපට වියදම් වැඩි කරන්න බැහැ. වියදම් වැඩි කළොත් අය වැය පරතරය වැඩි වෙනවා. ඒ පරතරය නැති කරලා, සෘණ පරතරයක් වෙනුවට අතිරික්තයකට එන්නයි බලන්නේ. ඒ අවස්ථාවේදී වියදම් ස්වාභාවිකවම පාලනය වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු අගමැතිතුමනි, පසුගිය ජූලි මාසයේ වැටුප් වැඩිවීමත් එක්ක ඔබතුමන්ලාට අතුරු සම්මත ගිණුමේදී වියදම් වැඩි කිරීමට සිදු වනවාමයි. මගේ ප්‍රශ්නය මේකයි. අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමෙන පසු, නව ජනාධිපතිවරයා මේ අමාත්‍යාංශ වෙනස් කළොත් එතැනදී ගැටලුවක් ඇති වෙනවා. මොකද, ඔබතුමාත් දන්නවා මුදල් වෙන් කරන්නේ ශීර්ෂවලට බව. එතකොට අලුතින් එන ජනාධිපතිවරයා මේ අමාත්‍යාංශ කුමන ආකාරයට පත් කරාවිද කියලා අපි දන්නේ නැහැ. එතකොට ඔබතුමන්ලාට දෙසැම්බර් මාසයේ හෝ ජනවාරි මාසයේ නැවත

[ගරු බිමල් රත්නායක මහතා]

අතුරු සම්මත ගිණුමක් ගෙනෙන්න වනවා නේද? ඇත්තටම අය වැයකින් තොරව යන්න හදන ගමනින් සැලකිය යුතු ගැටලුවකට මුහුණ දෙන්න වනවා නේද, ගරු අගමැතිතුමනි?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අතුරු සම්මත ගිණුමක් වුවමනා නම් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ශීර්ෂ හැටියට වෙනස් වෙන්නේ නැහැ. අමාත්‍යාංශ හැටියට වෙනස් වෙන්න පුළුවන්. එහෙත් දෙපාර්තමේන්තු, සංස්ථා ශීර්ෂ වෙනස් වෙන්නේ නැහැ.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 44/'18 - (1), ගරු හේෂා විතානගේ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## අපරාධ මැඩලන නිලධාරින්: ත්‍යාග මුදල්
## குற்றச்செயல்களைத் தடுக்கும் உத்தியோகத்தர்கள்: பரிசுத்தொகை
## OFFICERS COMBATTING CRIMES: REWARDS

98/'18

**2. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීම සඳහා ඉදිරිපත්ව සිටින නිලධාරින් දිරිමත් කිරීම සඳහා 2015 වර්ෂයේ සිට ගෙවා ඇති ත්‍යාග මුදල් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) මේ වනවිට කොපමණ නිලධාරින් සංඛ්‍යාවක් සඳහා එම ත්‍යාග මුදල් ගෙවා තිබේද;

(iii) දීමනා ගෙවිය යුතු ආකාරය පිළිබඳව නිර්ණායක පවතීද;

(iv) එසේ නම්, එම නිර්ණායක සභාගත කරන්නේද;

(v) ජීවිත පරදුවට තබා කටයුතු කරනු ලබන එම නිලධාරින් වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා/ ත්‍යාග මුදල් වැඩි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම කාල සීමාවන් සහ ක්‍රමවේද සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டில் காணப்படும் குற்றச்செயல்களை தடுப்பதற்காக செயற்படும் உத்தியோகத்தர்களை உற்சாகப்படுத்துவதற்காக 2015 ஆம் ஆண்டு முதல் வழங்கப்பட்டுள்ள பரிசுத்தொகையின் பெறுமதி ஒவ்வொரு வருடத்தின் அடிப்படையில் யாது;

(ii) இதுவரையில் மேற்படி பரிசுத்தொகை வழங்கப் பட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது;

(iii) கொடுப்பனவு வழங்கப்பட வேண்டிய விதம் தொடர்பில் யாதேனும் அளவுகோல்கள் காணப் படுகின்றனவா;

(iv) ஆமெனில், அந்த அளவுகோல்களை சபையில் சமர்ப்பிப்பாரா;

(v) உயிரைப் பணயமாக வைத்து செயற்படும் குறிப்பிட்ட உத்தியோகத்தர்களுக்கு வழங்கப் படும் ஊக்குவிப்புக் கொடுப்பனவு / பரிசுத் தொகையை அதிகரிப்பதற்கான நடவடிக்கைகள் எதிர்காலத்தில் எடுக்கப்படுமா;

(vi) ஆமெனில், குறிப்பிட்ட கால வரையறை மற்றும் செயன்முறையை சபாபீடத்தில் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he state -

(i) separately, as per each year from year 2015 to date, the amount of rewards granted to motivate the officers who come forward to combat the crimes in the country;

(ii) the number of officers who have been paid the aforesaid rewards to date;

(iii) whether a criterion which should be followed in the payment of allowances is available;

(iv) if so, whether aforesaid criterion will be tabled;

(v) whether measures will be taken to increase the value of the rewards and the allowances paid to the aforesaid officers who dedicate their lives; and

(vi) if so, whether the details of such time periods and the mechanisms will be tabled?

(b) If not, why?

**ගරු රුවන් විජේවර්ධන මහතා (ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - வெகுசன ஊடக அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ruwan Wijewardene - Non-Cabinet Minister of Mass Media and State Minister of Defence)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු

පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| වර්ෂය | ත්‍යාග මුදල් (රුපියල්) |
|---|---|
| 2015 | 537,289,153.00 |
| 2016 | 646,367,488.70 |
| 2017 | 672,450,720.50 |
| 2018 | 82,501,903.18 |
| 2019 මැයි මස දක්වා | 227,673,015.40 |

(ii) 2015 සිට 2019 මැයි මස දක්වා පොලිස් නිලධාරින් නවලක්ෂ හැත්තෑහතරදහස් තුන්සිය විසි දෙකකට (974322) ත්‍යාග මුදල් ගෙවා ඇත.

(iii) ඔව්.

(iv) ත්‍යාග අරමුදලින් ගෙවිය යුතු දිරි දීමනා (ත්‍යාග මුදල්) ගෙවීම සම්බන්ධ නිර්ණායක අඩංගු 1990.03.09 දිනැති අංක 600/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය **සභාගත*** කරමි.

(v) ත්‍යාග මුදල් ගෙවීමේදී එක් එක් නිලධාරියා විසින් කරන ලද රාජකාරියේදී නිලධාරියාට ඇතිවන අනාරක්ෂිතභාවය, ජීවිත තර්ජනය, සිද්ධියේ බරපතළකම ආදිය සිද්ධියෙන් සිද්ධියට වෙන් වෙන් වශයෙන් -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අගමැතිතුමනි, ඔබතුමා යන්නේ නැතුව ඉන්න. උත්තරයක් ගන්න තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒක මට අයිති ප්‍රශ්නයක් නොවෙයි. ඒක අදාළ අමාත්‍යාංශයට යොමු කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ බලන්න, ගරු අගමැතිතුමනි, මේ ප්‍රශ්නය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතටයි එන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා පිළිතුරු දුන්නාට පස්සේ අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් නේ.

රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා උත්තරය දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අගමැතිතුමා යනවා නේ. ඒක නේ වැඩේ.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ගරු කථානායකතුමනි, මා පිළිතුරේ ඉතිරි කොටස කියවන්නම්.

(v) ත්‍යාග මුදල් ගෙවීමේදී එක් එක් නිලධාරියා විසින් කරන ලද රාජකාරියේදී නිලධාරියාට ඇතිවන අනාරක්ෂිතභාවය, ජීවිත තර්ජනය, සිද්ධියේ බරපතළකම ආදිය සිද්ධියෙන් සිද්ධියට වෙන් වෙන් වශයෙන් තක්සේරු කර එම රාජකාරිය නිසි ලෙස ඇගයීමට ලක් කර උපරිම ත්‍යාග මුදලක් අනුමත කිරීම ක්‍රමවේදය වේ. එමෙන්ම, ත්‍යාග මුදල් පිරිනැමීමේදී නිශ්චිත මුදලක් සඳහන් කර නොමැති අතර, එසේ නිශ්චිත මුදලකට සීමා කළ නොහැක.

(vi) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු ඇමතිතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. හැබැයි, රුවන් විජේවර්ධන රාජ්‍ය ඇමතිතුමා තමයි උත්තර දුන්නේ. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයට එතුමාටත් උත්තර දී ගන්න බැහැ. පොලීසිය පිළිබඳ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. මේ පිළිබඳව තීන්දු - තීරණ ගැනීමේ විශාල අර්බුදයක් අද තිබෙනවා. ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න කැමැතියි. රජයේ සේවකයන්ට ගෙවන "බටා" එක නැත්නම් සංයුක්ත දීමනාව ගැන ප්‍රශ්නයක් මම අහන්නේ. සංයුක්ත දීමනාව රජයේ සේවකයන්ට දින 24කට වැඩි කර ගන්න ඔබතුමන්ලාගේ රජය අනුමැතිය ගත්තා. ඒක වැඩි කරලාත් දීලා තිබෙනවා. හැබැයි, මේ දීමනාව පොලිස් නිලධාරින්ට දින 14කට අඩු කරලා තමයි දීලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේක ප්‍රතිපත්තිමය තීන්දුවක්. ඒක තමයි මම කිව්වේ, අගමැතිතුමා මෙතැන හිටියා නම් හොඳයි කියලා මේ ගැන ගියන්න. මේක රුවන් විජේවර්ධන මැතිතුමාට විතරක් විසඳන්න පුළුවන් ප්‍රශ්නයකුත් නොවෙයි. ඒ ප්‍රශ්නය විසඳන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා. අතිගරු ජනාධිපතිතුමාත් මේ සංයුක්ත දීමනාව වැඩි කරන්න කියලා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. හැබැයි, මුදල් දෙන්නේ නැහැ. ඒකයි මේ ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඇහුවා නම් වැදගත් වෙන්නේ.

එතුමා පක්ෂයේ කාරණාවලදී පැනලා යනවා වාගේ මේ ගරු සභාවෙනුත් හෙමිහිට යන්න ගියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කාරණය යොමු කරන්න පුළුවන් නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම කියන්න හැදුවේ මේකයි. පොලිස් නිලධාරින්ට රජයේ නිවාඩු නැහැ. පොලිස් නිලධාරින්ට සෙනසුරාදා, ඉරිදා නිවාඩු නැහැ. පොලිස් නිලධාරින්ට half-day leave නැහැ. අපේ රජයේ සේවකයන් half-day leave දාලා යනවා නේ? ඔබතුමා දන්නවා, රජයේ නිවාඩු දවසේ අපටත් නිවාඩු කියලා. රජයේ නිවාඩු දිනවල පාර්ලිමේන්තුව රැස් වෙන්නෙත්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

නැහැ. ඒක අපටත් අදාළයි, මේ රටේ ඉන්න සියලු රාජ්‍ය සේවකයන්ටත් අදාළයි. හැබැයි, ඒක පොලීසියට අදාළ නැහැ. හමුදාවට අදාළත් නැහැ. පොලීසිය පැය 24ම රාජකාරි කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේක ප්‍රතිපත්තිමය තීන්දුවක් කියලා මම කිව්වේ ඒකයි. මෙය වැදගත් කාරණයක් නිසා ඔබතුමාත් මේ සම්බන්ධව කථා කළා. රජය ඇයි මේ පොලිස් නිලධාරින්ගේ සංයුක්ත දීමනාව අඩු කරලා තිබෙන්නේ? ඔබතුමා රාජ්‍ය ඇමතිතුමා විධියටත් අතිගරු ජනාධිපතිතුමා රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයා විධියටත් අවශ්‍ය යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒත් මුදල් අමාත්‍යාංශයෙන් තමයි මේ කැපිල්ල කරලා තිබෙන්නේ. සාමාන්‍ය රාජ්‍ය නිලධාරින්ට මේ සංයුක්ත දීමනාව -බටා එක- දින 24ක් දෙනවා. පොලිස් නිලධාරින්ගේ බටා එක දින 14ක් දක්වා කපලා. මම ඒ ගැන අහන්න කැමැතියි. මොන දෙවියන් වහන්සේද මේකට උත්තර දෙන්නේ? අගමැතිතුමාගෙන් ඒක ඇහුවාම අගමැතිතුමාත් යන්න ගියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙනවාද? නැත්නම්, අවධානය යොමු කරවනවාද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ගරු කථානායකතුමනි, ඇත්තටම රජය විධියට මේ බටා එක ගෙවන්න ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. මට මතක හැටියට අපේ සාගල රත්නායක ඇමතිතුමා ඉන්න කාලයේ ඉඳන්ම මේ බටා එක ගෙවන්නට සාකච්ඡා වුණා. මම හිතනවා, ඒක පුළුවන් තරම් ඉක්මනින් ක්‍රියාත්මක කරන්නට අවශ්‍යයි කියලා. මම හිතන හැටියට, එතැන මුදල් ප්‍රශ්නයක් තිබෙනවා වෙන්නටත් පුළුවන්. ඒ නිසා ඒ ගැන මුදල් ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා පුළුවන් තරම් ඉක්මනින් විසඳන්න කටයුතු කරන්න අවධානය යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය පුළුවන් තරම් ඉක්මනින් විසඳලා දෙන්න. එකහ වුණා නම් දෙන එක සාධාරණයි නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඒ ගැන අවධානය යොමු කරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමතියි, මෙම සංයුක්ත දීමනාව කපලා තිබෙනවා, දින 24 සිට දින 14 දක්වා. ඒක සාගල රත්නායක මහත්තයා අමාත්‍ය ධුරයේ ඉන්නකොටත් නොවෙයි, ඊට පසුව තමයි ඔබතුමන්ලා ආණ්ඩුව විධියට තීරණයක් ගත්තේ දින 24ක් ලෙස තිබුණු එක දින 14ට අඩු කරන්න. ඒක වැරදියි ඇත්තටම. නමුත් ඒ තීන්දුව දැන් ක්‍රියාත්මකයි. මම අහන්න කැමැතියි, පොලීසියේ නිලධාරින්ට පමණක් ඒක දින 14ට අඩු කරන්න මේ ආණ්ඩුවෙන් තීන්දු කළේ ඇයි කියලා. ඇත්තටම ඔවුන්ට රුපියල් 500 ගණනේ දුන්නා නම්, සාමාන්‍ය පොලිස් නිලධාරියකුට දවස් 24ක් වැඩ කළා නම් ඒක හම්බ වෙනවා. හැබැයි, ඒකෙන් තවත් දවස් 10ක් අඩු කළා. මේ මිනිස්සුත් ජීවත් වෙන්නත් එපායැ. මේ පොලිස් නිලධාරින් පාරේ ඉන්න කොට සිදු වෙන ප්‍රශ්නවලට, කැ ගහන ඒවාට, පහර දෙන ඒවාට මුහුණ දෙන්න වෙනවා. [බාධා කිරීමක්] මොකක්ද කිව්වේ?

**ගරු කබීර් හෂීම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹஷீம் - நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development and Petroleum Resources Development)
තමුන්නාන්සේලාගේ කාලයේ ඒ දීමනාවවත් තිබුණේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තිබුණා, තිබුණා. මම මේ දැන් පොලීසියේ නිලධාරින්ගෙන් අහලායි කථා කරන්නේ.

කබීර් හෂීම් ඇමතිතුමනි, ඔබතුමා පොලිස් නිලධාරින්ට කථා කළේ නැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් අගමැතිතුමා ඔබතුමාගෙන් තෙල් සංස්ථාවත් ගලවන්න හදනවා. මම ඔබතුමාට සහයෝගය දෙන්නයි කථා කරන්නේ.

ගරු කථානායකතුමනි. මම ඇහුවේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඉතින් track එකට පිටින් යනවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමා උත්තර දෙන්න හදනවා නේ. එතුමා පැනලා දෙන්න යනවා නේ. ඒක නේ වැඩේ වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට අවශ්‍ය නැහැ-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න දෙන්න. මම අහන්න කැමැතියි, overtime එක අඩු කරන්න කථා කරලා තියෙන්නේ ඇයි කියලා. එහෙම නැත්නම් මේ අමාත්‍යාංශය කරගෙන යන්න කබීර් හෂීම් අමාත්‍යතුමාටවත් දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහලා ඉවර කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාට ඒක දුන්නත්, ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕනෑ කියලායි අපි කියන්නේ. ගරු කථානායකතුමනි, ආණ්ඩුවෙන්, මුදල් අමාත්‍යාංශයෙන් මේ සඳහා මුදල් දෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඒ ගැන අවධානය යොමු කරන්න.

## පළාත් පාලන ආයතන යටතේ පවතින මාර්ග ප්‍රතිසංස්කරණය: බදුල්ල දිස්ත්‍රික්කය
## உள்ளூராட்சி நிறுவனங்களின் கீழுள்ள வீதிகளைப் புனரமைத்தல்: பதுளை மாவட்டம்
RENOVATION OF ROADS UNDER LOCAL AUTHORITIES: BADULLA DISTRICT

161/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, පළාත් පාලන ආයතන යටතේ පවතින මාර්ග පද්ධතියේ දුර කිලෝමීටර් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව ප්‍රතිසංස්කරණයට ලක් කරනු ලැබූ පළාත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සතු මාර්ග බොහොමයක් ඉතා දැඩි ලෙස අබලන් වී ඇති බැවින්, එම මාර්ග පද්ධතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்தில் உள்ளூராட்சி நிறுவனங்களின் கீழுள்ள வீதி முறைமை எத்தனை கிலோமீற்றர் நீளமுடையதென்பதையும்;

(ii) நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்ததையடுத்து புனரமைக்கப்பட்ட மாகாண வீதிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) பதுளை மாவட்டத்தில் உள்ளூராட்சி நிறுவனங்களுக்கு சொந்தமான அநேகமான வீதிகள் மிகவும் மோசமான நிலையில் பழுதடைந்துள்ளதால் அந்த வீதி முறைமையை துரிதமாகப் புனரமைப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the length of the road network in Badulla District, which is under the purview of the local authorities, in kilometres;

(ii) the number of provincial roads which were renovated after the Good Governance Government came into power; and

(iii) the steps that will be taken by the Ministry to renovate the road network coming under the purview of the local authorities in Badulla District expeditiously due to the fact that most of the aforesaid roads are heavily dilapidated?

(b) If not, why?

**ගරු ජේ.සී. අලවතුවල මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Internal and Home Affairs, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම

ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇමුණුම 01 මගින් දක්වා ඇත.

*ඇමුණුම **01***

**<u>බදුල්ල දිස්ත්‍රික්කයේ, පළාත් පාලන ආයතන යටතේ පවතින මාර්ග පද්ධතියේ දුර පිළිබඳ තොරතුරු</u>**

| අනු අංකය | පළාත් පාලන ආයතනය | මාර්ග පද්ධතියේ දුර කි. මී. |
|---|---|---|
| 01 | බදුල්ල මහා නගර සභාව | 84.65 |
| 02 | බණ්ඩාරවෙල මහා නගර සභාව | 69.78 |
| 03 | හපුතලේ නගර සභාව | 11.16 |
| 04 | ඇල්ල ප්‍රාදේශීය සභාව | 508.00 |
| 05 | හාලිඇල ප්‍රාදේශීය සභාව | 340.00 |
| 06 | මීගහකිවුල ප්‍රාදේශීය සභාව | 245.00 |
| 07 | කන්දකැටිය ප්‍රාදේශීය සභාව | 210.00 |
| 08 | රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව | 298.00 |
| 09 | මහියංගනය ප්‍රාදේශීය සභාව | 378.74 |
| 10 | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව | 315.00 |
| 11 | හපුතලේ ප්‍රාදේශීය සභාව | 196.00 |
| 12 | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව | 448.29 |
| 13 | වැලිමඩ ප්‍රාදේශීය සභාව | 290.67 |
| 14 | ඌව පරණගම ප්‍රාදේශීය සභාව | 676.00 |
| 15 | සොරණාතොට ප්‍රාදේශීය සභාව | 277.41 |
| 16 | පස්සර ප්‍රාදේශීය සභාව | 73.9175 |
| 17 | බදුල්ල ප්‍රාදේශීය සභාව | 110.00 |
| 18 | ලුණුගල ප්‍රාදේශීය සභාව | 363.38 |

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

(ii) ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

*ඇමුණුම 02*

**යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව ප්‍රතිසංස්කරණයට ලක් කරනු ලැබූ පළාත් මාර්ග පිළිබඳ තොරතුරු.**

පළාත් පාලන ආයතනය - බදුල්ල මහා නගර සභාව (2015 සිට මේ දක්වා)

| වර්ෂය | නඩත්තු තාර | ප්‍රතිසංස්කරණ කරන ලද (පෙරමුසු යොදා) | කොන්ක්‍රීට් | කාපට් | ග්‍රැවල් | සම්පීඩන ගල් ඇතිරීම |
|---|---|---|---|---|---|---|
| 2015 - 2019 | 49.097 | 100.00m$^3$ | 14.09 | 5.56 | 8.22 | 7.68 |

පළාත් පාලන ආයතනය - බණ්ඩාරවෙල මහා නගර සභාව

| වර්ෂය | කර්මාන්ත සංඛ්‍යාව . | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | මාර්ගයේ මුළු දුර |
|---|---|---|---|---|---|---|---|---|
| 2015 | 25 | - | - | 25 | 21 | - | 04 | 4260.00m |
| 2016 | 08 | - | 1 | 07 | 04 | - | 04 | 1211.00m |
| 2017 | 12 | - | 1 | 11 | 08 | - | 04 | 2748.05m |
| 2018 | 17 | - | 1 | 16 | 16 | - | 01 | 1471.04m |
| 2019 | 21 | - | 4 | 17 | 14 | - | 07 | 3352.02m |
| එකතුව | 83 | - | 7 | 76 | 63 | - | 20 | 13012.11m |

පළාත් පාලන ආයතනය - හපුතලේ නගර සභාව

2015 – 2019 දක්වා ප්‍රතිසංස්කරණ මාර්ග සංඛ්‍යාව - 01 යි.

ඇමුණුම් අංක 02-1

පළාත් පාලන ආයතනය - ඇල්ල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | සම්පිණ්ඩණ ගල් ඇතිරීම |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | | 10 කි.මී. | - | 2 කි.මී | 1 කි.මී. |

පළාත් පාලන ආයතනය - හාලි ඇළ ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | සම්පිණ්ඩණ ගල් ඇතිරීම |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | | 10 කි.මී. | - | 2 කි.මී | 1 කි.මී. |

පළාත් පාලන ආයතනය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | සම්පිණ්ඩණ ගල් ඇතිරීම |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | | 1.3250 කි.මී. | 238.975 කි.මී | 4.7 කි.මී | -. |

පළාත් පාලන ආයතනය - කන්දකෑටිය ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර |
|---|---|---|---|---|---|---|
| 2015 | - | - | - | 565.41m | 639.00m | - |
| 2016 | - | - | - | 527.14m | - | - |
| 2017 | - | - | - | 486.60m | 95.00m | - |
| 2018 | - | - | - | 672.80m | 660.00m | - |
| 2019 | - | - | - | 584.00m | 660.00m | - |

ඇමුණුම් අංක 02-11

පළාත් පාලන ආයතනය - රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් මාර්ග සංඛ්‍යාව | බොරළු | තාර | සංවර්ධනය කරන ලද දුර කි.මී |
|---|---|---|---|---|---|---|---|
| 2015 | - | 33 | - | 02 | 31 | - | 56.85 |
| 2016 | - | 11 | - | 07 | 11 | - | 8.41 |
| 2017 | - | 10 | - | 10 | 10 | - | 0.495 |
| 2018 | - | 05 | - | 05 | 05 | - | 0.85 |
| 2019 | - | - | - | - | - | - | |
| එකතුව | | 59 | | 24 | 35 | | 66.405 |

පළාත් පාලන ආයතනය -මහියංගණය ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | කුට්ටිගල් |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | - | 28.64 කි.මී | 3.50 | 4.50කි.මී | 85.00 කි.මී |

පළාත් පාලන ආයතනය - බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් මාර්ග සංඛ්‍යාව | බොරළු | තාර |
|---|---|---|---|---|---|---|
| 2015 | - | - | - | 30 | - | - |
| 2016 | - | - | - | 32 | - | - |
| 2017 | - | - | - | 58 | - | - |
| 2018 | - | - | - | 31 | - | - |
| 2019 | - | - | - | - | - | - |

පළාත් පාලන ආයතනය - හපුතලේ ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | කුට්ටිගල් |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | 1 කි.මී. | 158කි.මී | - | 50 කි.මී | 23කි.මී | 93කි.මී | 2.00 කි.මී |

ඇමුණුම් අංක 02-111

පළාත් පාලන ආයතනය - හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ මාර්ග | දුර ප්‍රමාණය | බොරළු | තාර |
|---|---|---|---|---|---|---|
| 2015 | - | - | 20 | 1056 m | 639.00m | - |
| 2016 | - | - | 34 | 2212.5 m | - | - |
| 2017 | - | - | 40 | 1968m | 95.00m | - |
| 2018 | - | - | 21 | 825m | 660.00m | - |
| 2019 | - | - | - | - | - | - |

පළාත් පාලන ආයතනය -වැලිමඩ ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | කොන්ක්‍රීට් | ප්‍රතිසංස්කරණ මාර්ග | බොරළු | තාර |
|---|---|---|---|---|---|
| 2015 | 11.08 කි.මී | ✓ | - | - | - |
| 2016 | 12 කි.මී | ✓ | - | - | - |
| 2017 | 6.කිමී | ✓ | - | - | - |
| 2018 | 11.9කි.මී | ✓ | - | - | - |
| 2019 | 2.9 කි | ✓ | - | - | - |

| වර්ෂය | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | කුට්ටිගල් |
|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | 148 කි.මී | 29කිමී.67.මී | 81කි.මී | - |

පළාත් පාලන ආයතනය - ඌව පරණගම ප්‍රාදේශීය සභාව

| වර්ෂය | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | කුට්ටිගල් | අබලන් මාර්ග |
|---|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | 130 කි.මී | 398 කි.මී | 128කි.මී | - | 20 |

පළාත් පාලන ආයතනය - සොරණාතොට ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | කොන්ක්‍රීට් | ප්‍රතිසංස්කරණ මාර්ග | බොරළු | තාර |
|---|---|---|---|---|---|
| 2015 | 900.මී | 515.10 | 303.7 | - | - |
| 2016 | - | 1349 මී | - | - | - |
| 2017 | - | 882.5මී | 1267.5 කියුබික් .මී | - | - |
| 2018 | - | 192.75 මී | - | - | - |
| 2019 | - | 304.6මී | 725 කියුබික් .මී | - | - |
| | | | | | |

ඇමුණුම් අංක 02 - IV

පළාත් පාලන ආයතනය - පස්සර ප්‍රාදේශීය සභාව

| වර්ෂය | අලුතින් ඉදිකිරීම් | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් මාර්ග සංඛ්‍යාව | බොරළු | තාර | සංවර්ධනය කරන ලද දුර කි.මී. |
|---|---|---|---|---|---|---|---|
| 2015 | - | 32 | - | 32 | - | - | 1.420 |
| 2016 | - | 29 | - | 29 | - | - | 1.653 |
| 2017 | - | 79 | - | 79 | - | - | 4.265 |
| 2018 | - | 20 | - | 20 | - | - | 0.783 |
| 2019 | - | - | - | - | - | - | - |
| එකතුව | | 160 | | 160 | - | - | 8.129 |

පළාත් පාලන ආයතනය - බදුල්ල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | නඩත්තු | ප්‍රතිසංස්කරණ | කොන්ක්‍රීට් | බොරළු | තාර | කුට්ටිගල් |
|---|---|---|---|---|---|---|
| 2015-2019 | - | - | 4.905 මී | - | - | - |

පළාත් පාලන ආයතනය -ලුණුගල ප්‍රාදේශීය සභාව

| වර්ෂය | නඩත්තු මාර්ග | ප්‍රතිසංස්කරණ මාර්ග | කොන්ක්‍රීට් මාර්ග | බොරළු මාර්ග | තාර මාර්ග | කුට්ටිගල් මාර්ග |
|---|---|---|---|---|---|---|
| 2015-2019 | 1 | 4 | 59 | - | 1 | - |

(iii) මෙම අමාත්‍යාංශය මගින් විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරන "නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය - RIDEP" යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට අයත් ඇමුණුම 03හි සඳහන් මාර්ග සංවර්ධනය කිරීම සඳහා හඳුනාගෙන ඇති අතර, එම මාර්ගවල මූලික සැලසුම් නිර්මාණය හා විමර්ශන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. 2021 වර්ෂය වන විට එම මාර්ගවල සියලු සංවර්ධන කටයුතු අවසන් කිරීමට නියමිතය. ඇමුණුම **සභාගත*** කරමි.

එසේම, 2017 වර්ෂය තුළ පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන) ව්‍යාපෘතිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරන ලද මාර්ගවල තොරතුරු ඇමුණුම 04මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පිළිතුර සැපයීම වෙනුවෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, 2021දී සියලු පාරවල් හදලා අවසන් කරන බවකුත් පිළිතුරේ තිබෙනවා. නමුත් ඒ පිළිතුරට මම එකඟ වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. අපේ රටේ -අපේ ආණ්ඩුව ඇතුළු- පත් වූ සියලු ආණ්ඩු ගත්තොත්, අපේ රට තුළ තිබෙන මාර්ග පද්ධති එනම් RDA එක සහ පළාත් පාලන ආයතන සතුව තිබෙන පාරවල් inventory එකකට අරගෙන නැහැ, ගරු කථානායකතුමනි. එහි තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි, පත් වන අපේ ආණ්ඩුවල ජනප්‍රියතාව සහ දේශපාලන පැවැත්ම වෙනුවෙන් අවශ්‍ය තැනත්, අවශ්‍ය නැති තැනත් ඉදි කිරීම් කටයුතු කිරීම. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මම පැහැදිලිව කියනවා, අපේ පළාත වෙනුවෙන් මේ වන කොට රාජ්‍ය ප්‍රතිපාදන වෙන් කළත්, අවශ්‍යතාව මත, ඒ කියන්නේ, ආර්ථික වශයෙන් රටට බලපාන විධියට, ජන ජීවිතයට අවශ්‍ය වන විධියට, ජන ජීවිතයට බලපාන විධියට මාර්ග පද්ධතිය සැකසෙන්නේ නැහැ කියන කාරණය. අපිත් ඒකට පැහැදිලිව වග කිව යුතුයි. ඒ නිසා මා දැනගන්න කැමැතියි, අමාත්‍යාංශය හැටියට මේ කියන යෝජනාවට සක්‍රිය දායකත්වය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය සතුව යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන කාරණය.

ගරු අමාත්‍යතුමනි, අපි කියන්නේ, අවශ්‍යතාව මත ප්‍රතිපාදන වෙන් විය යුතු බවයි. මම හිතනවා, එවිට අප යොදවන බදු මුදල රටේ නිශ්චිත තැන්වලට යවන්න පුළුවන් වන බව. එසේ නොවී ඔබතුමාගේ අමාත්‍යාංශයේ මේ මුදල් වෙන් කිරීම මෑත කාලයේ ඉඳලා ඉතාම අසාධාරණ විධියටයි සිදු වන්නේ. ඒ කොතැනද, කොහොමද කියන කාරණය මා කියන්න යන්නේ නැහැ. එහෙම කියන එක හොඳ නැහැ. ගරු අමාත්‍යතුමනි, මම පැහැදිලිව අසනවා, ඒ කටයුත්ත සිදු කරන්න පුළුවන් පැහැදිලි වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් හැදීමට අමාත්‍යාංශයට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, අපේ ගරු අමාත්‍යතුමාත් සමඟ සාකච්ඡා කරලා එතුමා කියපු ඒ කාරණය සම්බන්ධයෙන් ඉතාම සාධනීය පිළිතුරක් ඉදිරියේදී ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා. නමුත්, මා විශේෂයෙන් සඳහන් කළේ මේකයි, ගරු මන්ත්‍රීතුමනි. මෙම පිළිතුරේ ඇමුණුම 03 යටතේ සඳහන් විදේශ ආධාර යටතේ ලැබෙන මාර්ග - RIDEP - තමයි 2021 වර්ෂයේදී අපි හදලා අවසන් කරන්නේ. විශේෂයෙන් අපි මේ මාර්ග තෝරා ගෙන තිබෙන්නේ බොහෝ වෙලාවට පාරවල් දෙකක් සම්බන්ධ කරන අත්‍යවශ්‍ය මාර්ග හැටියටයි. විදේශ ආධාර ලබා දීමේදී සලකා බලන නිර්ණායක තිබෙනවා. ඒ නිර්ණායක අනුව තමයි මේ මාර්ග තෝරාගෙන තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු අනෙක් කාරණා ගැන ගරු අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරලා සාධාරණ විධියට, අවශ්‍යතාව අනුව ඉදිරියේදී කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. ආණ්ඩුවක් වශයෙන් කරන සංවර්ධන වැඩ පිළිවෙළවල් නවත්වන්න සමහර මන්ත්‍රීවරු දැන් උසාවි යන්න හදනවා. අපි දන්නවා, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා හෙට අනිද්දාට උසාවි යන්න හදනවා කියලා. ඒ, අපි ප්‍රතිපාදන වෙන් කරලා පාරවල් හදන නිසයි. මා දන්නේ නැහැ, එතුමා මේවාට විරුද්ධ වන්නේ ඇයි කියලා. එතුමා කියන්නේ, ආණ්ඩු පක්ෂයට විතරයි මුදල් දෙන්නේ, විපක්ෂයට මුදල් දෙන්නේ නැහැ කියලායි. හැබැයි, ඉතිහාසය ගත්තත් එහෙමයි. එතුමන්ලා ආණ්ඩු කරපු කාලයේත් විපක්ෂය නියෝජනය කරපු අපට මුදල් දුන්නේ නැහැ. RIDEP කියන වැඩ පිළිවෙළ විදේශ ආධාර යටතේයි ක්‍රියාත්මක වන්නේ. නමුත් ඒ නිර්ණායක තුළ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. අපි දන්නවා පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වුණේ කොට්ඨාස ක්‍රමයට බව. කොට්ඨාසයේ සංවර්ධනය භාරව ඉන්නේ ඒ කොට්ඨාසයේ මන්ත්‍රීවරයායි. මේ මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ නිර්ණායකවලින් එකක් මා කියන්නම්. අදාළ කොට්ඨාසයේ මන්ත්‍රීවරයාට තමන්ගේ අභිමතය පරිදි, අවශ්‍යතාව තිබෙන මාර්ග සඳහා ප්‍රතිපාදන වෙන් කරගන්න බැහැ. මෙතැන ඡන්ද ක්‍රමයක් තිබෙනවා, පාවිච්චි කරන්න.

මම උදාහරණයක් කියන්නම්, ගරු කථානායකතුමනි. මම නියෝජනය කරන කොට්ඨාසයේ සංවර්ධනය කළ යුතු මාර්ගය තෝරා ගැනීම සඳහා ඡන්දය ලබා දෙන්න වෙන්නේ වෙනත් කොට්ඨාසයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකුට සහ එම ජනතාවගෙන් සැදුම්ලත් කණ්ඩායමකට. එතකොට ඒ අවශ්‍යතාව පැහැදිලිව තේරුම් ගන්න බැහැ. අපේ කොට්ඨාසයේ සංවර්ධනය තවත් කොට්ඨාසයක මන්ත්‍රීවරයෙක් සහ ඒ කොට්ඨාසයේ ජීවත් වන ජනතාව විසින් තමයි තෝරන්නේ. ඒක බරපතළ ගැටලුවක්. ඒ ප්‍රශ්නය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ආවා; දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ආවා. එම නිසා ඒ නිර්ණායක ටික වෙනස් නොකර මේ වැඩ පිළිවෙළට යන්න බැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමා 2021දී ඒ වැඩ කරන්න බලාපොරොත්තු වෙනවා. 2021දී කරන්න තියා මේ අවුරුද්දේ ඒ වැඩ තෝරාගන්නත් බැරි වෙනවා. මොකද, අදාළ කොට්ඨාසයේ සංවර්ධනය කළ යුත්තේ කුමක්ද කියන එක තෝරා ගැනීම පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙන නිසා. ඒ පිළිබඳව සොයා බලා එය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නවා නම් හොඳයි කියන කාරණය තමයි මම කියන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන විධියට ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා නම්, තව දුරටත් සාකච්ඡා කරලා ඒ සම්බන්ධ නිවැරදි කිරීමක් කරන්න අපට පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -365/'18- (2), ගරු වේලු කුමාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ක්‍රිකට් භාණ්ඩ ප්‍රදානය කිරීමේ උත්සවය: 'ශ්‍රී ලංකා ක්‍රිකට්' හිටපු නිලධාරියකු සහභාගි වීම
## கிரிக்கெற் உபகரணங்களைக் கையளிக்கும் வைபவம்: 'இலங்கை கிரிக்கெற்' முன்னாள் அதிகாரியொருவரின் பங்குபற்றல்
## FUNCTION TO DISTRIBUTE CRICKET EQUIPMENT: PARTICIPATION OF FORMER OFFICER OF SRI LANKA CRICKET

616/'18

5. **ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, තෝරාගත් පාසල් 35ක් සඳහා ක්‍රිකට් භාණ්ඩ ප්‍රදානය කිරීමේ උත්සවයක් 2018.10.02වැනි දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්වූ බවත්;

(ii) එම උත්සවයට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලනය වෙනුවෙන් තරග සංවිධායක කමිටු ප්‍රධානියා ලෙස කටයුතු කළ බන්දුල දිසානායක නමැත්තෙකු සහභාගි වූ බවත්;

(iii) එම උත්සවය සඳහා ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිල ටයි පටියද පැළඳ සිටි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය කල් දමා නිසි බලධාරියකු යටතේ ක්‍රියාත්මක වූ එවැනි අවස්ථාවකදී හිටපු බලධාරියකුට මෙවැනි උත්සව සඳහා සහභාගි වීමට ඇති නෛතික හා සදාචාරාත්මක පසුබිම කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂිත නිලධාරීන් යහපාලන රජයේ කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීම වැළැක්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தின், தெரிவு செய்யப்பட்ட 35 பாடசாலைகளுக்கு கிரிக்கெற் உபகரணங் களைக் கையளிக்கும் வைபவமொன்று 2018.10.02 ஆம் திகதி விளையாட்டுத்துறை அமைச்சின் டங்கன் வைற் கேட்போர் கூடத்தில் நடாத்தப்பட்டது என்பதனையும்;

(ii) அந்த வைபவத்திற்கு இலங்கை கிரிக்கெற் நிறுவனத்தின் முன்னாள் நிர்வாக குழுவின் சார்பாக போட்டிகள் ஏற்பாட்டுக் குழுவின் பிரதானியாக கடமையாற்றிய திரு. பந்துல திசாநாயக்க என்பவர் பங்குபற்றியிருந்தார் என்பதனையும்;

(iii) அந்த வைபவத்தில் அவர் இலங்கை கிரிக்கெற் நிறுவனத்தின் உத்தியோகபூர்வ கழுத்துப்பட்டி யையும் அணிந்திருந்தார் என்பதனையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கை கிரிக்கெற் நிறுவனத்தின் தேர்தல் பிற்போடப்பட்டு தகுதிவாய்ந்த அதிகாரியின் கீழ் செயல்படுகின்ற ஒரு சந்தர்ப்பத்தில் முன்னாள் அதிகாரி ஒருவர் இவ்வாறான வைபவ மொன்றில் பங்குபற்றுவதற்குள்ள சட்டரீதி யானதும் தார்மீகமானதுமான பின்னணி யாதென்பதையும்;

(ii) இலங்கை கிரிக்கெற் நிறுவனத்தின் ஊழல் நிறைந்த அதிகாரிகள் நல்லாட்சி அரசாங்கத்தின் செயற்பாடுகளில் பங்குபற்றுவதனைத் தடுப்ப தற்காக அமைச்சு மேற்கொள்கின்ற நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Foreign Employment and Sports:

(a) Is he aware that-

(i) a function was held at the Duncan White Auditorium of the Ministry of Sports on 02.10.2018 to award cricket equipment to 35 selected schools in Colombo District;

(ii) a person named Bandula Dissanayake, who was the Chairman of the Tournament Committee of Sri Lanka Cricket, attended that function on behalf of the former administration of Sri Lanka Cricket; and

(iii) at that function, he was wearing the official necktie of Sri Lanka Cricket?

(b) Will he inform this House-

(i) the nature of the legal and ethical background for a former official of Sri Lanka Cricket to attend such an event in a situation where election of office bearers of that institute had been postponed and the institute was functioning under a competent authority; and

(ii) the nature of the steps that will be taken by the Ministry to prevent the corrupt officials of Sri Lanka Cricket from participating in the activities implemented by the Good Governance Government?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන්. නමුත්, අද එතුමාත් ඇවිල්ලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දිගින් දිගටම අහපු ප්‍රශ්නවලට ඇමතිවරු නොමැති නිසා මට තමයි උත්තර දෙන්න සිද්ධ වුණේ. උත්තරය තිබෙනවා, දෙන්නද? නැත්නම් පසුව -

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

දැන් උත්තරය දෙන්න, ගරු ඇමතිතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) එවකට ක්‍රීඩා අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ අගහිඟකම් ඇති පාසල් අතර ක්‍රිකට් උපකරණ බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ක්‍රිකට් උපකරණ ඉල්ලා ඇති අතර, එම ප්‍රතිලාභීන් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ සිටින බැවින්, කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය හරහා එම පරිත්‍යාග ලබා දීමට ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේ උත්සවයක් පවත්වා ඇත.

(ii) කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන් බන්දුල දිසානායක මහතා මෙම උත්සව අවස්ථාවට සහභාගි වී ඇත. කිසිදු විටෙක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නියෝජිතයෙකු ලෙස එතුමා එම අවස්ථාවට සහභාගි වී නොමැත.

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිය සාමාජික සංගම්හි නිලධාරින් වෙත නිකුත් කළ ටයි පටියක් එම අවස්ථාවේ බන්දුල දිසානායක මහතා පැළඳ සිට ඇති අතර, එය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිලධාරින් විසින් පළඳිනු ලබන නිල ටයි පටිය නොවේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිකුත් කරනු ලබන ටයි පටි ප්‍රසිද්ධ උත්සවයකට පැළඳීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තහනම් කර නොමැත.

(ආ) (i) කොළඹ දිස්ත්‍රික් සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන් එම අවස්ථාවට ආරාධනා ලැබ, බන්දුල දිසානායක මහතා සහභාගි වී ඇත. එබැවින්, නෛතික සහ සදාචාරාත්මක පසු බිම සම්බන්ධයෙන් ගැටලුවක් පැන නොනඟී.

(ii) එවැනි චෝදනාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වී නොමැත.

(ඇ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවා නම්, ඒවා අමාත්‍යවරයා වෙත යොමු කරලාම තමයි උත්තර දෙන්න වෙන්නේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

හොඳයි, ගරු ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු කථානායකතුමනි, ඊයේ COPE එක රැස් වූ අවස්ථාවේ විශේෂයෙන් ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව හෙළිදරව් වුණා. මල්වතු මහා නාහිමියන්ට රුපියල් මිලියන 25ක අල්ලසක් දීමට ගිය බව ඊයේ COPE එකේදී හෙළි වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා අක්කර 30ක භූමි භාගයක් නිදහස් කර ගැනීමට තමයි මල්වතු මහා නාහිමියන්ට අල්ලස් දීමට ගිය බව හෙළිදරව් වෙලා තිබෙන්නේ. මම හිතන විධියට ඒක ඉතා බරපතළ ප්‍රශ්නයක්.

ඊයේ ජනාධිපතිවරයා අගමැතිවරයාගේ නම නොකියා කිව්වා, "රටේ ප්‍රධානම ප්‍රශ්නයකට අගමැතිවරයා මුහුණ දෙනවා. අපි ලිපිලේඛන ලෑස්ති කරලා තිබෙනවා" කියලා. මම හිතන හැටියට මෙය රටට විතරක් නොවෙයි, ජාත්‍යන්තරයටම අපකීර්තියක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අදාළ ප්‍රශ්නය අහමු නේද, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහන්නයි යන්නේ. මල්වතු මහා නාහිමියන්ට අල්ලස් දීමට යෑම අපකීර්තියක් වෙනවා. මම හිතන විධියට අද ප්‍රධාන පුවත් පත්වල මේ පිළිබඳ සඳහන් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට යොමු කරයි කියා මම හිතනවා. මම හිතන විධියට අද ක්‍රීඩා අමාත්‍යතුමාට මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට වඩා වැදගත් දෙයක් තිබෙනවා. එතුමා හෙට පැවැත්වෙන කුරුණෑගල රැස්වීමේ වේදිකාව හදනවා. අපි මන්ත්‍රීවරු හැටියට ප්‍රශ්නයක් ඇහුවාම, එතුමා පිළිතුරු දෙන්න එන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ප්‍රශ්නය යොමු කරනවා. මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියටයි මම මේ ප්‍රශ්නය අහන්නේ. අපේ ආගමික නායකතුමකු වන මල්වතු මහා නාහිමියන්ට අල්ලස් දීමට යෑම පිළිබඳව ඔබතුමා දන්නවාද, ඒ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කිරීමට කටයුතු කරනවාද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මට කරන්න පුළුවන් ප්‍රශ්නය අමාත්‍යතුමාට යොමු කිරීම පමණයි. මම නොදන්නා දේවල් ගැන කියන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතිගෞරවනීය මල්වතු මහා නාහිමියන් ගැන සඳහන් කිරීමත් හොඳ නැහැ. ඒ ගැන මේ අවස්ථාවේ පාර්ලිමේන්තුව වශයෙන් අපිත් කනගාටු වෙනවා.

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මම එය සඳහන් කළේ, අද හැම මාධ්‍යයකම ඒ ප්‍රවෘත්තිය පළ වී තිබෙන නිසායි; මල්වතු මහා නාහිමියන්ට අගෞරව කරන්න නොවෙයි. අද ජාත්‍යන්තර

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

වශයෙන් පුවත් පත්වල මේ ප්‍රශ්නය සඳහන් වෙලා තිබෙනවා. මේක බොරු කථාවක් නොවෙයි. ඊයේ COPE එකේදී හෙළිදරව් වූ කාරණයක්, ගරු කථානායකතුමනි.

ගරු අමාත්‍යතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. "ක්‍රිකට් ඒඩ් සමාගමේ ක්‍රියාකාරිත්වය අත්හිටුවයි" කියන සිරස්තලය යටතේ මාධ්‍යවල පළ වී තිබෙන, ඊයේ COPE එකේදී හෙළිදරවු වී තිබෙන කාරණයට අනුව උපාලි සෙනෙවිරත්න මහතාට රුපියල් ලක්ෂ 70ක මාසික දීමනාවක් ගෙවා තිබෙනවා. ඒ වාගේම මේ කෙටි කාලය තුළ තවත් රුපියල් ලක්ෂ 39ක් ගෙවා ඇති බවත්, ඔහු විසින් කරන ලද කර්තව්‍ය තුළින් රුපියල් ලක්ෂ 24ක ආදායමක් පමණක් ක්‍රිකට් ආයතනයට ලැබී තිබෙන බවත් හෙළි වී තිබෙනවා. මෙවැනි පුද්ගලයන්ට මෙලෙස ගෙවා තිබෙන්නේ ජාතික බදු මුදල් සම්භාරයක්. අද අපේ ක්‍රිකට් කඩා වැටිලා තිබෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, මම අහන ප්‍රශ්නය මේකයි. මේ රටේ ජනතාව පාවිච්චි කරන සබන් කැටයට, හාල් කිලෝවට ගහන බදු මුදල් තමයි මේ සඳහා වැය කරන්නේ. මේ තරම් මහා විනාශයක් වෙද්දී ඔබතුමන්ලාගේ රජය මේ පිළිබඳව හොයා බලා නැහැ. බැඳුම්කර සිද්ධියට වඩා ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, මේ ක්‍රිකට් ආයතනය හා සම්බන්ධ සිද්ධියේදී. රුපියල් ලක්ෂ 70ක් එක් කෙනෙකුට ගෙවනවා, නමුත් මේ පුද්ගලයා කරපු දෙයක් නැහැ. ලෝකයේ ඉමහත් ගෞරවයට පාත්‍ර වෙලා තිබුණු "ශ්‍රී ලංකා ක්‍රිකට්" අද අන්ත පරාජයකට ලක්වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම අහන ප්‍රශ්නය මේකයි. මෙතරම් මුදල් ප්‍රමාණයක් ගෙවා මේ පුද්ගලයන් ආරක්ෂා කර, මහා නාහිමියන්ගේ ගෞරවනීය තත්ත්වය විනාශ කර දමා මෙලෙස කටයුතු කිරීමට සම්බන්ධ ඇමතිවරයෙකුත් ඉන්නවා. ඒ ඇමතිවරයා අද ඇවිල්ලා නැත්තේ මේ ප්‍රශ්නය මතුවන බව එතුමා හොඳින් දන්නා නිසායි. එතුමා ජනාධිපතිවරණයට සජිත් ප්‍රේමදාස මහතා ගෙන ඒම සඳහා සූදානම් වනවා. හෙට කුරුණෑගල රැස්වීම සඳහා එතුමා කුරුණෑගලට ගිහිල්ලා වේදිකාව ගහනවා. මන්ත්‍රීවරු හැටියට අපේ අයිතිවාසිකමක් තමයි, ගරු ඇමතිතුමන්ලාට ප්‍රශ්න යොමු කිරීම. නමුත්, අපේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඇමතිවරු එන්නේ නැහැ. මම පාර්ලිමේන්තුවේදී අහන ප්‍රශ්නවලින් ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගෙන් අහන ප්‍රශ්නවලට විතරයි ඇමතිවරයා හැටියට එතුමා පැමිණ උත්තර දීලා තිබෙන්නේ. අපි ප්‍රශ්න අහන වෙලාවට අනෙක් සියලු ඇමතිවරු මේ පාර්ලිමේන්තුවට එන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ජාතික මුදල් සම්භාරයක්, මේ රටේ ජනතාවගේ මුදල් සම්භාරයක් මෙවැනි අකටයුතුකම් සඳහා යෙදවීම ක්‍රීඩා අමාත්‍යාංශයේ විතරක් නොවෙයි, සෑම අමාත්‍යාංශයකම වාගේ සිද්ධවනවා. ගරු ඇමතිතුමනි, මට විතරක් නොවෙයි, මේ සියලු ගරු මන්ත්‍රීවරුන්ට දැනගන්න, මේ රටේ ජනතාවට දැනගන්න විශේෂයෙන්ම ඊයේ COPE එකේදී පැන නැඟුණු මේ කාරණා සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් කරන්න. ඒ අනුව මෙහි සැබෑ තත්ත්වය හෙළි කිරීම සඳහා ඔබතුමා කටයුතු කරන්නේද කියන ප්‍රශ්නය මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයත් අදාළ ඇමතිවරයාට යොමු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විශේෂයෙන්ම අතිගෞරවනීය මල්වතු මහා නාහිමිපාණන් වහන්සේ ගැන මේ අවස්ථාවේ සඳහන් වුණා. ඒ වාගේ කීර්තිමත්, ඒ වාගේ ගෞරවනීය මහා නාහිමිපාණන් වහන්සේනමකගෙන් එසේ සිද්ධ වන්නේ නැහැ. COPE එකේ සභාපතිතුමා සමඟත් කථා කරලා පාර්ලිමේන්තුව වෙනුවෙන් ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම හොඳයි කියලා මා හිතනවා.

ප්‍රශ්න අංක 06 - 799/'19 - (1), ගරු ජයන්ත සමරවීර මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොහුවල හන්දිය දක්වා වූ මාර්ග: පුළුල් කිරීම
## கொஹுவல சந்தி வரையான பாதை: விஸ்தரிப்பு
## ROADS LEADING TO KOHUWALA JUNCTION: EXPANSION

811/19

**7. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොහුවල හන්දිය දක්වා ගමන් කරන මාර්ග ඔස්සේ දැනට පදිකයන්ට ගමන් කිරීම සඳහා ඉඩකඩ වෙන්කර තිබේද;

(ii) දැඩි වාහන ගමනාගමනයක් සිදුවීම හේතුවෙන් තත්ත්වය උග්‍ර වී තිබේද;

(iii) මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2016 වර්ෂයේ සිට ගන්නා ලද පියවර කවරේද;

(iv) ඉහත කී මාර්ගවලට යාබද ඉඩම දේශපාලනඥයන්ට සහ ලයිසියම් විද්‍යාලයට අයත් වන හෙයින් එකී මාර්ග පුළුල් කිරීම කල් දමනු ලැබ තිබේද;

(v) මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදුකරනු ලබන්නේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේනම් , ඒ මන්ද?

நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொஹுவல சந்திக்கு இட்டுச் செல்லும் பாதைகளின் ஓரமாக பாதசாரிகளுக்கான இடம் காணப்படுகின்றதா என்பதையும்;

(ii) அதிகளவு வாகனப் போக்குவரத்து காரணமாக நிலைமை மோசமடைந்துள்ளதா என்பதையும்;

(iii) இது தொடர்பாக 2016 இல் இருந்து வீதி அபிவிருத்தி அதிகாரசபையினால் மேற் கொள்ளப்பட்ட நடவடிக்கைகள் பற்றியும்;

(iv) மேலே குறிப்பிடப்பட்ட பாதைகளின் விஸ் தரிப்பு, அப்பாதைகளுக்கு அருகாமையில் உள்ள காணி அரசியல்வாதிகளுக்கும் லைசியம் கல்லூரிக்கும் சொந்தமாக இருப்பதன் காரண மாக பிற்போடப்பட்டுள்ளதா என்பதையும்;

(v) இது தொடர்பாக அவர் ஒரு கூற்றை தெரிவிப் பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Highways and Road Development and Petroleum Resources Development:

(a) Will he inform this House-

(i) whether a pedestrian space along the roads leading to Kohuwala Junction is available at present;

(ii) whether the situation got aggravated due to heavy traffic flow;

(iii) the steps that have been taken by the Road Development Authority (RDA) in this regard since 2016;

(iv) whether expansion of the above-mentioned roadways has been put off because the land adjacent to those roadways belong to politicians and Lyceum College; and

(v) whether he will make a statement in this regard?

(b) If not, why?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

නුගේගොඩ - කළුබෝවිල මාර්ගය දෙපස උස් කළ පදික වේදිකාවද - raised footwalk - පාමංකඩ-හොරණ මාර්ගය දෙපස උස් නොකළ පදික වේදිකාවද ඉදිකර ඇත.

(ii) කොහුවල මං සන්ධිය කොළඹ නගරයට ආසන්නව පිහිටි නාගරික මං සන්ධියක් බැවින් කලක සිටම කාර්ය බහුල වේලාවලදී මාර්ග තදබදයක් ඇති වේ.

(iii) මාර්ග සංවර්ධන අධිකාරියේ ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් පාමංකඩ පාලමේ සිට කැස්බෑව දක්වා මාර්ගය පුළුල් කිරිම ආරම්භ කොට ඇත. දැනට පැපිලියාන සිට කැස්බෑව දක්වා මාර්ග කොටස වැඩිදියුණු කර ඇති අතර කොහුවල මං සන්ධියේ මාර්ග තදබදය අවම කිරීමට පිළියමක් ලෙස හංගේරියානු ණය ආධාර යටතේ ගුවන් පාලමක් ඉදිකිරීමට දැනට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එම වැඩකටයුතු මෙම වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතව ඇත.

(iv) නැත.

(v) පාමංකඩ-පැපිලියාන දක්වා කොටසේ අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත.

ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු කොහුවල මං සන්ධිය පුළුල් කොට, උස් කළ පදික වේදිකා ඉදිකර සංවර්ධන කටයුතු සිදු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, එම මාර්ගයේ තිබෙන තදබදය නිසාම කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් අරගෙන, හංගේරියානු ආධාරයත් එක්ක ගුවන් පාලමක් එතැන ඉදිකිරීම සඳහා දැනට සියලු දේ අනුමත කරලා තිබෙනවා. එම ව්‍යාපෘතිය තව මාසයකින් ක්‍රියාත්මක කරන බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කොහුවල මං සන්ධිය ගැන 2016දීත් ප්‍රශ්නයක් අහලා තිබෙනවා. කොහුවල මං සන්ධියේ පදිකයන්ට යන්න ඉඩක් නැහැ. කොහුවල මං සන්ධිය බොහොම පටු තැනක්. එතැනට එන වාහන ප්‍රමාණයත් එක්ක පදිකයන්ට ගමන් කරන්න ඉඩක් නැහැ. පදිකයන්ට යන්න පදික මංතීරුවක් අත්‍යවශ්‍යයි. එහෙම නැත්නම් පදිකයන්ට යන්න වෙන්නේ මහ පාරේ. එතකොට අනතුරු වැඩි වනවා. ඊළඟට, මාර්ග තදබදය වැඩි වනවා. ඒ සඳහා 2016 ඉඳලා අද වනතෙක් ගත්ත පියවර මොකක්ද කියලායි මම අහන්නේ. 2016 ඉඳලා මම මේ ප්‍රශ්නය අහලා තිබෙනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, දැනට අපි සමහර තැන්වල පදික වේදිකා හදාගෙන යනවා. මෙම මාර්ගය සම්බන්ධව අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, පාමංකඩ - පැපිලියාන දක්වා කොටසේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයක් සිදු වෙලා තිබීම. විශේෂයෙන්ම ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අපි ඉල්ලීම් කරලා තිබෙනවා. මොකද, ඉඩම් පවරා ගැනීම් සඳහා ප්‍රථමයෙන්ම වන්දි ගෙවීම සඳහා මුදල් ලබා ගැනීමට අවශ්‍යයි. හැකි ඉක්මනින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන, එය ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2016 ඉඳලා ඔබතුමන්ලාට මේ සඳහා වුවමනා කරන ප්‍රතිපාදන ලබාගෙන, වන්දි ගෙවලා, ඉඩම් අත්පත් කර ගන්න පුළුවන් වෙලා නැහැ. නමුත් අපට ඒ ප්‍රදේශයේ අය දන්වන ආකාරයට, එතැන ඉඩම් තුනක් තිබෙනවා. මම කැමැති නැහැ, එම ඉඩම්වල අයිතිකරුවන්ගේ නම් කියන්න. ඒවා දේශපාලනඥයන් තුන්දෙනෙකුගේ ඉඩම්. ඒ දේශපාලනඥයන්ගේ ඉඩම් එක්තරා විධියකට මේ මාර්ගයට මායිම් වන නිසා ඒවා අත්පත් කර ගැනීමේ ප්‍රමාදයක් තිබෙනවා කියන එකයි මහජනයා කියන්නේ. ඔබතුමා කියන්නේ, මුදල් ලැබිලා නැහැ කියන එකයි. එම දේශපාලනඥයන් තිදෙනාගේ ඉඩම් ඊට යාබදව තිබෙන බව ඔබතුමා දන්නවා ඇති. 2016 ඉඳලා ඒවා අත්පත් කර ගැනීමට මුදල් ලැබීම ප්‍රමාද වී තිබෙනවා යැයි කියන එක ගැන එක්තරා විධියකට සැකයක් ඇති කරනවා, මුදල් ප්‍රමාදයයි, දේශපාලනඥයන්ගේ ඉඩම් පවරා ගැනීමට තිබෙන අකැමැත්තයි අතර යම් සම්බන්ධයක් තිබෙනවාද කියලා. ඒ ගැන ඔබතුමා ප්‍රකාශයක් කරන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, එම මාර්ගයට මායිම්ව දේශපාලනඥයන්ගේ ඉඩම් තිබෙනවා. ඇතැම් බලවතුන්ගේ ඉඩම් තිබෙනවා කියලා මම නම් දැනගෙන හිටියේ නැහැ. අනෙක් කාරණය, අපේ රජයට නම් ඒක අදාළම නැහැ. පසුගිය කාල පරිච්ඡේදය තුළ පැවැති ආණ්ඩුව ක්‍රියා කරපු හැටි අපි දැක්කා. ඒ දවස්වල ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ගෙවල් හැර දුප්පත් මිනිසුන්ගේ ඉඩම් හරහා පාරවල් කපාපු හැටි මට සාක්ෂි ඇතිව කියන්න පුළුවන්. මට ඒ විස්තරත් එක්ක කියන්න පුළුවන්. මහාමාර්ග හා මාර්ග සංවර්ධන ඇමතිවරයා හැටියට මම කියන්න කැමැතියි, මගේ ආසනයේ

[ගරු කබීර් හෂීම් මහතා]

පාරක් පළල් කිරීම සඳහා පළමුව කඩන්න වුණේ මගේ මහ ගෙදර බව.

මම ඒකට ඉඩ දුන්නා. පූර්වාදර්ශයක් හැටියට මගේ මහ ගෙදර කඩලා, අනෙක් ඒවා කඩන්න කිව්වා. ඒ නිසා මෙතැනදීත් කවුරු හෝ බලවතෙකුගේ, දේශපාලනඥයෙකුගේ ගෙයක්, ඉඩමක් එතැන තිබෙනවා නම් අපි ඒක බාධාවක් හැටියට හිතන්නේ නැහැ. ඒක පවරා ගන්න ඕනෑ නම්, අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා කියලා මම මේ අවස්ථාවේ දී සහතික කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 1019/'19-(1), ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## රාස්සගල රෝහල වසා දැමීම නිසා ජනතාව මුහුණ දෙන ගැටලු: විසඳුම්
## ராஸ்ஸகல வைத்தியசாலை மூடப்பட்டதால் மக்கள் எதிர்கொள்ளும் அசௌகரியம்: தீர்வு
DIFFICULTIES FACED BY PEOPLE DUE TO CLOSURE OF RASSAGALA HOSPITAL: SOLUTIONS

44/'18

**1. ගරු ඒ. ඒ. විජේතුංග මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. A. A. Wijethunga on behalf of the Hon. Hesha Withanage)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බලංගොඩ, රාස්සගල ප්‍රාදේශීය රෝහල නායයෑමේ අවදානමක් හේතුවෙන් වසා දමා තිබෙන බවත්;
(ii) දැනට රෝගීන්ට ප්‍රතිකාර කරනු ලබන්නේ රාස්සගල ආයුර්වේද මධ්‍යස්ථානයේ ඉහළ මහලේ බවත්;
(iii) ඒ හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන ජනතාව පීඩාවට ලක්වන බවත්;
එතුමා දන්නේද?

(ආ) මෙම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பலாங்கொடை, ராஸ்ஸகல பிரதேச வைத்தியசாலை மண்சரிவு அபாயம் காரணமாக மூடப்பட்டுள்ளது என்பதையும்;
(ii) தற்போது ராஸ்ஸகல ஆயுர்வேத நிலையத்தின் மேல்மாடியில் நோயாளர்களுக்கு சிகிச்சை அளிக்கப்படுகிறது என்பதையும்;
(iii) இதனால் சிகிச்சை பெற்றுக்கொள்ள வருகின்ற மக்கள் அசௌகரியத்துக்கு உட்படுகிறார்கள் என்பதையும்;
அவர் அறிவாரா?

(ஆ) மேற்படி பிரச்சினையைத் தீர்ப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that-
(i) the Rassagala hospital in Balangoda has been closed down due to a landslide risk;
(ii) patients are being treated at the moment on the upper floor of the Rassagala Ayurvedic Centre; and
(iii) the people who come to get treatment are inconvenienced due to that reason?

(b) Will he inform this House the steps that will be taken by the Ministry to solve this problem?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017 මැයි මාසයේ ඇති වූ වර්ෂාව හේතුවෙන් රාස්සගල ප්‍රාදේශීය රෝහල පිහිටි භූමිය නායයාමේ අවදානමකට ලක් විය. එම රෝහලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් එහි සේවාවන් තාවකාලිකව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිල නිවාසයේ පවත්වාගෙන යන ලදී.
(ii) රෝහල පිහිටි භූමියේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර, 2019.05.27 දින සිට නැවතත් රෝහල ක්‍රියාත්මක වේ.
(iii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

## ගලබොඩ වතුයායේ විශ්‍රාමික කම්කරුවන්: ඊපීඑෆ්, ඊටීඑෆ් සහ විශ්‍රාම පාරිතෝෂික
## கலபொட தோட்டத்தில் ஓய்வுபெற்ற தொழிலாளர்: ஊ.சே.நி., ஊ.ந.நி., ஓய்வூதியப் பணிக்கொடை
RETIRED WORKERS OF GALABODA ESTATE: EPF, ETF AND PENSION GRATUITY

365/'18

**4. ගරු ඒ. ඒ. විජේතුංග මහතා (ගරු වේලු කුමාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க - மாண்புமிகு வேலு குமார் சார்பாக)
(The Hon. A. A. Wijethunga on behalf of the Hon. Velu Kumar)
රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ගලබොඩ වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில் முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான கலபொட தோட்டத்தில் 2002 ஆம் ஆண்டில் தொழில் புரிந்த தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2000 முதல் 2015 ஆம் ஆண்டு வரை இத்தோட்டத்தில் தொழில் புரிந்து ஓய்வெடுக்கச் செய்யப்பட்ட ஆண் மற்றும் பெண் தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை தனித்தனியாக யாது என்பதையும்;

(iii) அவ்வாறு ஓய்வெடுக்கச் செய்யப்பட்ட தொழிலாளர்களில் இன்றளவில் ஊழியர் சேமலாப நிதி, ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதி மற்றும் ஓய்வூதியப் பணிக்கொடை செலுத்தப் படாத தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவ்வாறான தொழிலாளர் ஒவ்வொருவரினதும் பெயர், அங்கத்தவர் இலக்கம், ஊழியர் சேமலாப நிதி, ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி மற்றும் பணிக்கொடை ஊதியத்தின் நிலுவை தனித் தனியாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development:

(a) Will he inform this House-

(i) the number of estate workers who served in 2002 in the Galaboda Estate that belonged to Janatha Estate Development Board;

(ii) separately, the number of male and female estate workers who went on retirement from 2000 - 2015 after serving in this estate;

(iii) the number of retired workers, out of the aforesaid workers, who have not been paid Employees' Provident Fund (EPF), Employees' Trust Fund (ETF) and Pension Gratuity; and

(iv) the name of each of the aforesaid worker, the membership number and the amount due from the EPF, ETF and Pension Gratuity, separately?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වතු කම්කරුවන් 180.

(ii)

| වර්ෂය | සේවය කර විශ්‍රාම ගැන්වූ | | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පිරිමි සංඛ්‍යාව | ගැහැනු සංඛ්‍යාව | |
| 2000 | 1 | 1 | 2 |
| 2001 | 8 | 6 | 14 |
| 2002 | 4 | 4 | 8 |
| 2003 | 3 | 8 | 11 |
| 2004 | 4 | 5 | 9 |
| 2005 | 1 | 2 | 3 |
| 2006 | 11 | 14 | 25 |
| 2007 | 3 | 5 | 8 |
| 2008 | 5 | 4 | 9 |
| 2009 | 3 | 5 | 8 |
| 2010 | 3 | 5 | 8 |
| 2011 | 6 | 6 | 12 |
| 2012 | 3 | 7 | 10 |
| 2013 | 11 | 13 | 24 |
| 2014 | 11 | 6 | 17 |
| 2015 | 9 | 13 | 22 |
| Total | **86** | **104** | **190** |

(iii) සේ.නි.භා. අරමුදල - 0
සේවක අර්ථ සාධක අරමුදල - 111
විශ්‍රාම පාරිතෝෂිකය - 81

(iv) කරුණාකර **ඇමුණුම*** බලන්න.

(ආ) අදාළ නොවේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා: දීමනා
## தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையின் தவிசாளர்: கொடுப்பனவுகள்
## CHAIRMAN OF NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: ALLOWANCES

799/'19

**6.** ගරු වාසුදේව නානායක්කාර මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. Vasudeva Nanayakkara on behalf of the Hon. Jayantha Samaraweera)
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) 2015.01.09 දින සිට 2018.10.25 දින දක්වා කාලය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබුවේ කවුරුන්ද;

(ii) ඔහුට ගෙවන ලද මාසික දීමනාව කොපමණද;

(iii) ඔහුට ගෙවන ලද මාසික දුරකථන දීමනාව කොපමණද;

(iv) ඔහු විසින් ලබාගෙන ඇති මාසික ඉන්ධන දීමනාව හෝ ප්‍රවාහන දීමනාව කොපමණද;

(v) කුලී නිවසක් ලබාගෙන තිබේ නම්, ඒ සඳහා ගෙවා ඇති මාසික කුලිය කොපමණද;

(vi) මීට අමතරව, වෙනත් දීමනා ගෙවා තිබේ නම්, එම දීමනා මාසිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සභාපතිවරයා සඳහා කොපමණ වාහන සංඛ්‍යාවක් වෙන්කර තිබේද;

(ii) එම වාහන අතරින් අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) කුලී හෝ බදු පදනම මත වාහන ලබාගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.09 முதல் 2018.10.25 ஆம் திகதி வரையிலான காலப்பகுதியில் தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையின் தவிசாளராகப் பணிபுரிந்தவர் யார்;

(ii) அவருக்குச் செலுத்தப்பட்டுள்ள மாதாந்த கொடுப்பனவு யாது;

(iii) அவருக்குச் செலுத்தப்பட்டுள்ள மாதாந்த தொலைபேசிக் கொடுப்பனவு யாது;

(iv) அவர் பெற்றுக்கொண்டுள்ள மாதாந்த எரிபொருள் கொடுப்பனவு அல்லது போக்குவரத்துக் கொடுப்பனவு யாது;

(v) வாடகை வீடு பெற்றுக்கொள்ளப்பட்டிருப்பின், அதற்காக செலுத்தப்பட்டுள்ள மாதாந்த வாடகை யாது;

(vi) இவற்றுக்கு மேலதிகமாக ஏனைய கொடுப்பனவுகள் ஏதும் செலுத்தப் பட்டிருப்பின், அக்கொடுப்பனவுகள் மாதாந்தம் வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தவிசாளருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி வாகனங்களில் அதிகாரசபைக்கு சொந்தமான வாகனங்களின் எண்ணிக்கை யாது;

(iii) வாடகை அல்லது குத்தகை அடிப்படையில் வாகனங்கள் பெற்றுக்கொள்ளப் பட்டிருப்பின், அது பற்றிய விபரம் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the person who served as the Chairman of the National Housing Development Authority from 09.01.2015 to 25.10.2018;

(ii) the monthly allowance paid to him;

(iii) the monthly telephone allowance paid to him;

(iv) the monthly fuel allowance or the transport allowance he has obtained;

(v) if he had rented a house, the monthly rent paid; and

(vi) in addition, if any other allowances have been paid, those allowances according to each month, separately?

(b) Will he also inform this House-

(i) the number of vehicles allocated for the Chairman;

(ii) the number of vehicles owned by the Authority, out of those vehicles; and

(iii) if vehicles have been rented or leased, details regarding them?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) එල්.එස්. පලන්සූරිය මහතා.

(ii) 2015 ජනවාරි 21 දින සිට 2015 ජූනි මස අවසානය දක්වා මසකට රුපියල් 50,000.00 බැගින් ද, 2015 ජූලි මස සිට 2018 ඔක්තෝබර් මස දක්වා මසකට රුපියල් 75,000.00 බැගින් ගෙවා ඇත.

(iii) රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල නිලධාරින්ට සන්නිවේදන සැපයීමට අදාළව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/02/2015 අනුව මසකට රුපියල් 13,000/-කි.

(iv) 1. මාසික ඉන්ධන දීමනාවක් ලබාගෙන නැත.

2. මසකට ලීටර් 170 බැගින් සාමාන්‍ය රාජකාරි සඳහා ඉන්ධන ලබාගෙන ඇත.

3. කොළඹින් බැහැර විශේෂ රාජකාරි සඳහා අතිරේක ඉන්ධන ලබාගෙන ඇත.

(v) එල්.එස්. පලන්සූරිය මහතා වෙත කුලී නිවසක් ලබා දී නැත.

(vi) ප්‍රශ්න අංක (ii) සහ (iii) පිළිතුරුවල සඳහන් මාසික දීමනාව, දුරකථන දීමනාව හැර වෙනත් කිසිදු දීමනාවක් ලබා දී නොමැත.

(ආ) (i) සභාපතිවරයා වෙනුවෙන් එක් වාහනයක් වෙන් කර ඇත.

(ii) සභාපතිතුමා වෙනුවෙන් එක් එක් කාලවකවානු තුළ වෙන් කරන ලද වාහනයේ විස්තර පහතින් දක්වා ඇත.

(iii) සභාපතිතුමා වෙත 2017.02.06 දින සිට මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලබා ගත් අංක CAT-3061 දරන ජීප් රථය වෙන් කර ඇත. එම රථය සඳහා ගෙවා ඇති කුලී මුදල් විස්තර ඇමුණුමෙහි සඳහන් වේ.

ඇමුණුම

<u>සභාපතිතුමා වෙත වෙන්කර ඇති ජීප් රථය සඳහා සෙන්ට්‍රල් ෆිනෑන්ස් ආයතනය වෙත මුදල් ගෙවීම් සාරාංශය</u>

| වාහන අංකය | වාහන වර්ගය | කාල වකවානුව | අධිකාරිය සතු හෝ කුලී පදනමට ලබා ගත් වාහනයක්ද |
|---|---|---|---|
| PE-4183 | කැබ් රථය | 2015.01.09 සිට 2017.02.05 දක්වා | අධිකාරිය සතු වාහනයකි |
| CAT-3061 | ජීප් රථය | 2017.02.06 සිට මේ දක්වා | මෙහෙයුම් කල්බදු වාහනයකි |

(ඇ) අදාළ නොවේ.

## උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර: බඳවා ගැනීමේ පටිපාටිය

## பிறப்பு மற்றும் இறப்பு பதிவாளர் பதவி: ஆட்சேர்ப்பு நடைமுறை

## POST OF REGISTRAR OF BIRTHS AND DEATHS: RECRUITMENT PROCEDURE

1019/'19

**8. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා වෙනුවට)**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா சார்பாக)

(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Anura Priyadharshana Yapa)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ගැසට් කරන ලද කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාස හතරකට එක් අතිරේක උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙක් බැගින් පත් කිරීමට කටයුතු යොදා තිබේද;

(iv) එසේ නම්, ඒ මන්ද;

(v) ප්‍රධාන රෝහල් සඳහා පත් කරන ලද වෛද්‍ය උප්පැන්න හා මරණ ලියාපදිංචි රෙජිස්ට්‍රාර්වරුන් සංඛ්‍යාව හා රෝහල් සංඛ්‍යාව කොපමණද;

(vi) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්ප්‍රදාය වෙනස් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிறப்பு மற்றும் இறப்பு பதிவாளர்களுக்காக வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டுள்ள பிரிவுகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) மேற்படி பதிவாளர் பதவிகளுக்கான ஆட்சேர்ப்பு நடைமுறை யாதென்பதையும்;

(iii) நான்கு கிராம அலுவலர் பிரிவுகளுக்கு ஒரு மேலதிக பிறப்பு மற்றும் இறப்பு பதிவாளரை நியமிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அது ஏன் என்பதையும்;

(v) பிரதான வைத்தியசாலைகளுக்கு நியமிக்கப் பட்டுள்ள மருத்துவ பிறப்பு மற்றும் இறப்பு பதிவாளர்களின் எண்ணிக்கை மற்றும் வைத் தியசாலைகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(vi) பதிவாளர் பதவிக்கான ஆட்சேர்ப்பு மரபினை மாற்றுவதற்கான முறையியலொன்று செயற் படுத்தப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the number of Divisions for which vacancies for the post of Registrar of Births and Deaths have been gazetted;

(ii) the recruitment procedure for the said post of Registrar;

(iii) whether arrangements have been made to appoint one Additional Registrar of Births and Deaths for four Grama Niladhari Divisions;

(iv) if so, why;

(v) the number of Medical Registrars of Births and Deaths appointed to the main hospitals and the number of hospitals; and

(vi) whether a methodology is being implemented to change the tradition in recruiting for the post of Registrar?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1,011.

(ii) විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ පටිපාටිය ඇමුණුම** මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(v) ප්‍රධාන රෝහල් සඳහා පත් කර ඇති වෛද්‍ය උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් ගණන 51ක් වන අතර, ඔවුන් රෝහල් 51කට අනුයුක්තව සේවය කරනු ලබයි. මෙයට අමතරව වෛද්‍ය නොවන උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් 25 දෙනෙකු රෝහල් 25ට අනුයුක්තව සේවය කරනු ලබයි.

(vi) විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම සඳහා උපත් හා මරණ ලියා පදිංචි කිරීමේ පනත මඟින් අමාත්‍යවරයා වෙත බලතල පැවරී ඇත.

එකී බලතල ප්‍රකාරව රෝහල තුළ මාසිකව සිදුවන උපත් හා මරණ සංඛ්‍යාව 400 ඉක්මවන රෝහල් සඳහා නව රෝහල් කොට්ඨාස ඇති කිරීමට පියවර ගන්නා ලදී. මේ යටතේ නව රෝහල් කොට්ඨාස 46ක් ගැසට් කරන ලද අතර (2018.11.09 දිනැති අංක 2097 ගැසට් පත්‍රය, 2019.01.25 දිනැති අංක 2018 ගැසට් පත්‍රය හා 2019.03.29 දිනැති අංක 2017 ගැසට් පත්‍රය මඟින්) එකී කොට්ඨාස සඳහා රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදන 2019.03.08 අංක 2114 හා 2019.05.10 අංක 2123 දරන රජයේ ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, what is your point of Order?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කරුණු -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පොඩ්ඩක් ඉන්න, මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත
### குடிவருவோர், குடியகல்வோர் (திருத்தம்) சட்டமூலம்
### IMMIGRANTS AND EMIGRANTS (AMENDMENT) BILL

"(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2019 සැප්තැම්බර් 17 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2019 செப்ரெம்பர் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Hon Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government; to be read a Second time upon Tuesday, 17th September, 2019 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 2.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන් කථා කරන්න ඉන්න නිසා, අද සභාවේ කටයුතු පස්වරු 7.30 දක්වා ගෙන යන ලෙස ඉල්ලීමක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the resolution adopted by Parliament on 09th July 2019, the designations of the following Ministerial Consultative Committees shall be re-designated as follows as per the decision taken by the Committee of Selection on 23rd August 2019.

The Ministerial Consultative Committee on Agriculture, Livestock Development, Irrigation and Fisheries & Aquatic Resources Development as the 'Ministerial Consultative Committee on Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries & Aquatic Resources Development'; and

The Ministerial Consultative Committee on Public Administration, Disaster Management and Rural Economic Affairs as the 'Ministerial Consultative Committee on Public Administration, Disaster Management and Livestock Development'."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් අහන්න තිබුණා නේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඔබතුමා අද මැතිවරණ කොමිසමේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ නිසායි මම මේක අහන්නේ. මැතිවරණ කොමිසමේ එක් සාමාජිකයෙක් ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය 2019.11.10 දිනට පැවැත්වීමට නියම කිරීම පිළිබඳව එම තේරීම් භාර නිලධාරියාට, ඒ කියන්නේ ගාලු දිස්ත්‍රික් ලේකම්ට ඇමතීමක් කරමින්, එසේ කිරීම ගැන තියුණු ලෙස ප්‍රශ්න කර ඇති බව සැලයි. මේ ගැන ඔබතුමා බැලිය යුතුයි. මොකද, ඔබතුමාගේ සභාපතිත්වය යටතේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යටතේයි, මේ කොමිෂන් සභා තිබෙන්නේ. අපට පැමිණිලි කරන්න වෙන කෙනෙක් නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාත් ඒ බව පුවත් පතක දැක්කා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තවද, වහාම ක්‍රියාත්මක වන පරිදි මැතිවරණය ළඟාවීමට පෙර දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරින් ගණනාවකට විරුද්ධව විනය පරීක්ෂණ පවත්වමින්, ඔවුන් එම තැන්වලින් ඉවත් කර ආණ්ඩුවට හිතවත් අය පත් කර ගැනීමට දැනට කටයුතු කිරීමට සූදානම් වෙමින් තිබෙන බවට ආරංචියක් තිබෙනවා. එම කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොකද, ඔබතුමා අපේක්ෂකයෙක් වෙනවා නම්, [බාධා කිරීමක්] මේක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. තවම ඒවා ගැන -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කිව්වේ, ඔබතුමා අපේක්ෂකයෙක් වෙනවා නම්, මේක බරපතළ ප්‍රශ්නයක්. අපේක්ෂකයෙක් නොවෙනවා නම්, මම ඔබතුමාට මේ කාරණය ඉතාම වුවමනාවෙන් යොමු කරනවා, සොයා බැලීමට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. කොහොමත් ඒක මගේ යුතුකම නේ.

ඊළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ ගරු සභාවේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා පිළිබඳවම ඔබතුමා තමයි නායකත්වය දරන්නේ. ගරු කථානායකතුමනි, පුවත් පතක මුල් පිටුවක වාර්තා කර තිබුණා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 100 දෙනෙකුට මත් පැන් වෙළෙඳාමට සහ 75 දෙනෙකුට වැලි කැපීම සඳහා බලපත්‍ර හිමි කර දී තිබෙනවා කියලා. 2019 අගෝස්තු 29 වැනි දින "දිවයින" පුවත් පතේ මුල් පිටුවේ මෙය සඳහන් වුණේ. මේ තුළින් රටට, සමාජයට යන පණිවුඩය මොකක්ද? අපි සෙක්කුව ළඟ ඉඳගෙන වොකලට් කැවත් බලාගෙන ඉන්නා මිනිසුන් හිතන්නේ පුන්නක්කු කනවා කියලායි. 2019 අගෝස්තු මස 29 වැනි දින "දිවයින" පත්තරේ මුල් පිටුවේ මෙසේ සඳහන් වනවා:

"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225 දෙනා අතරින් 100 දෙනෙකුට මත්පැන් වෙළෙඳාම් කිරීමේ බලපත්‍ර ඇති බවත් මන්ත්‍රීවරුන් 75 දෙනකු වැලි කැපීමේ හා ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර හිමිකරුවන් බවත් රාජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක මහතා ඊයේ (28දා) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය."

ගරු කථානායකතුමනි, ප්‍රකාශය වඩා බරපතළ වන්නේ එතුමා මේ ටික ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට කියපු නිසායි. අපේ උත්තරීතර සභාවේ සිටින රාජ්‍ය අමාත්‍යවරයෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කියනවා නම්, මන්ත්‍රීවරුන් 100 දෙනෙකුට මත්පැන් වෙළෙඳාම් කිරීමේ බලපත්‍ර තිබෙනවා, 75 දෙනෙකුට වැලි කැපීමේ හා ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර තිබෙනවා කියලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න. ඒ සොයා බලා පිළිතුරක් දෙන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ අයගේ නම් සඳහන් කරන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මට පැහැදිලිව කියන්න පුළුවන් අපේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මේ පැත්තෙන් නම් එකම මන්ත්‍රීවරයෙකුටවත්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Let me explain.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, you go ahead.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මේ පැත්තේ එකම මන්ත්‍රීවරයකුටවත් එවැනි බලපත්‍ර දීලා නැහැ. මට ඒක ඉඳුරා සනාථ කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඒ කාරණය පිළිගනිමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
හැබැයි, පසුගිය ආණ්ඩුව කාලයේ උඩ රට පළාතේ මන්ත්‍රීවරයකුට බලපත්‍ර 15ක් තිබුණු බව මම දන්නවා. කුරුණෑගලත් එහෙම මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නයට සභානායකතුමා පිළිතුරු දුන්නා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ආණ්ඩුවෙන් අපි එක මන්ත්‍රීවරයෙකුටවත් බලපත්‍ර දීලා නැහැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
කාගේ ආණ්ඩුවෙන් දුන්නත්, ඒ අයගේ නම් ටික කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඒ නම් ටික කියන්න ඕනෑ මම නොවෙයි, එහෙම කියපු කෙනායි. ඔබතුමා එතුමාගෙන්ම අහන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තමයි ඒක කියලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක කියපු මන්ත්‍රීතුමාගෙන් ඔබතුමාට ප්‍රශ්නයක් අහන්න පුළුවන්, ඒ නම් ටික හෙළිදරව් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, එහෙම කරමු.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒක, කථානායකතුමා - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමා ඒක දන්නේ නැහැ නේ. Sir, you do not know it, do you?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, I do not know. මම ඒ ගැන දන්නේ නැහැ. මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් පිට කියන දේවල් මට control කරන්න බැහැ. මම ඒ ගැන පක්ෂයේ නායකත්වය දැනුවත් කළා. එතුමා රාජ්‍ය අමාත්‍යවරයෙක්. අගමැතිතුමාටත්, සභානායකතුමාටත් ඒ ගැන කටයුතු කරන්න පුළුවන්.

**ගරු සුජීව සේනසිංහ මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Non Cabinet Minister of Science, Technology and Research)
ඔබතුමාටත් ඒ බලපත්‍ර තිබෙනවාද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මට කොහේද තිබෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමා, ඒ කාරණය අගමැතිතුමාටත් යොමු කරලා පිළිතුරක් ලබා දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුව ආවාට පසුව බලපත්‍ර ගැන අපි සාකච්ඡා කරලා නැති බව මම අනිවාර්යයෙන්ම කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. ඒක එතැනින් අවසානයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ අයගේ නම් ටික සඳහන් කරන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We have not even discussed.

අනෙක් කාරණය මෙකයි, ගරු කථානායකතුමනි. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මැතිවරණය ගැන කිව්වා. අපි ඒ මැතිවරණයට සූදානම්. ඒ මැතිවරණයට බය වෙලාද කොහේද නිදහසට කරුණු දක්වනවා. ඒ මැතිවරණය ජයග්‍රහණය කරන්න එක්සත් ජාතික පෙරමුණ සූදානම්. අපි ඒ මැතිවරණය ජයග්‍රහණය කරන්න සූදානම්. අපි උඩින්ම දිනනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපිත් සූදානම්. මැතිවරණය පවත්වන්න. ගයන්ත කරුණාතිලක මැතිතුමාට,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා මෙතැන ඉන්නවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ප්‍රචණ්ඩත්වයෙන් තොරව මැතිවරණය මෙහෙයවන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි වයඹ මැතිවරණය දැක්කා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවාට තව කල් තිබෙනවා නේ. අපි දැන් ප්‍රධාන වැඩකටයුතුවලට යමු.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

## මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අයුතු ලෙස මුදා හැරීම
## மத்திய கலாசார நிதியத்தின் பணத்தொகையை முறைகேடாக விடுவித்தமை
## IRREGULAR RELEASE OF FUNDS FROM CENTRAL CULTURAL FUND

[අ.භා. 2.23]

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති, ගරු අග්‍රාමාත්‍යතුමා සභාපතිත්වය දරන මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් රුපියල් මිලියන 3,600ක මුදලක් පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව මුදා හැර ඇති බව දැනගන්නට ලැබී ඇත.
>
> මේ ආකාරයට මුදල් නිදහස් කර ඇත්නම් එකී මුදල කුමන කාරණයක් සඳහා භාවිතයට ගත්තේද, කෙතරම් මුදල් ප්‍රමාණයක් ඒ සඳහා වැය කළේද, එකී මුදල් කුමන පුද්ගලයන්හට ලබා දී ඇත්ද යන්න පිළිබඳව ගරු සභාවට දැනුම් දිය යුතුය.

[ගරු ටී.බී. ඒකනායක මහතා]

මෙය රාජ්‍ය මුදල් අවභාවිතයක් මෙන්ම පොදු දේපළ පනත යටතට ද ගැනෙන වරදකි. මධ්‍යම සංස්කෘතික අරමුදල නියෝජනය කරන සාමාජිකයන්ගෙන් දැන ගැනීමට ලැබී ඇති පරිදි, මේ වසරේ පසුගිය මාස 08ක කාලයක් තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය කැඳවා නොමැත.

එබැවින් ඉහත කී මුදල මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ලබා දී තිබේ නම්, එය බරපතළ වරදකි. රාජ්‍ය මුදල් අවභාවිතයක් හා රාජ්‍ය මූල්‍ය විනය කඩ කිරීමකි. එමෙන්ම මෙම පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් නිල බලයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා මුලසුන දැරිය යුතු හෙයින් මේ සම්බන්ධව එතුමාටද වගකීමක් තිබේ.....

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of order?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අවභාවිත කිරීමක් ගැන අපේ ගරු මන්ත්‍රීතුමා කථා කරනවා. මේ සම්බන්ධයෙන් COPE වාර්තාවක් නැහැ. එසේ මුදල් අවභාවිත කර තිබෙනවා නම් COPE වාර්තාවක් තිබෙන්න ඕනෑ. පුවත් පත්වල තිබෙන ඒවා මෙතැන කියවන්න බැහැ. මුදල් අවභාවිත කර තිබෙනවා කියලා COPE වාර්තාවක් තිබෙන්න ඕනෑ. පුවත් පතක තිබෙන වාර්තාවක් කියවලා, මෙහෙම චෝදනා කරන්න පුළුවන්ද?

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanaya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම යෝජනාව කියවා අවසාන කරන්න ඉඩ සලසා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing, Construction and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කරන්න මම එතුමාට අවස්ථාව දෙනවා. හැබැයි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු මන්ත්‍රීතුමනි. මගේ උත්තරය දැනගන්න ඔබතුමා මෙම සභා ගර්භය තුළ රැඳී සිටින්න කියලා.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
....එබැවින් රජයේ මුදල් සම්බන්ධව පූර්ණ බලය පාර්ලිමේන්තුව සතු වන බැවින්, ඉහත කී ආකාරයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් රුපියල් මිලියන 3,600ක මුදලක් අයථා ලෙස නිදහස් කිරීම සම්බන්ධව පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිමි"

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත අනුව, මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ මුලසුන දරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමායි. මේ වසරේ එහි පාලක මණ්ඩයේ රැස්වීම් එකක් විතරයි පවත්වා තිබෙන්නේ. එම රැස්වීමට සභාපතිවරයා - අග්‍රාමාත්‍යවරයා- පැමිණ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන අවස්ථාවේදී එයට පිළිතුරු දෙන්න. [බාධා කිරීමක්] විධිවිධාන සලස්වා ඇති ආකාරයට, මෙම අරමුදලේ පරිපාලනය හා කළමනාකරණය මෙහි පාලක මණ්ඩලය සතු වෙනවා. ඒ පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව, මේ මුදල් භාවිත කිරීමට හා තීන්දු ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නැහැ. මෙහි සභාපතිවරයා අග්‍රාමාත්‍යතුමායි. සංස්කෘතික කටයුතු ඇමතිතුමා මෙම අරමුදලේ මුදල් විෂයය භාර අමාත්‍යතුමා වෙනවා. ඊළඟට, අධ්‍යාපන අමාත්‍යවරයා, සංචාරක විෂයය භාර අමාත්‍යවරයා, හින්දු කටයුතු විෂයය භාර අමාත්‍යවරයා සහ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්තුමා, සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්තුමා, පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල්තුමා සහ අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන පුද්ගලයකු හෝ දෙදෙනෙකුට මේ පාලක මණ්ඩලයේ කටයුතු කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම අරමුදල ස්ථාපිත කර තිබෙන්නේ පාර්ලිමේන්තුව මඟින් සම්මත කළ පනතක් මඟින්. ඒ නිසා, එම පනතේ රෙගුලාසි, නීති රීති මෙලෙස උල්ලංඝනය කරමින් කටයුතු කිරීම පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කිරීම වැදගත් වෙයි කියලා අපි කල්පනා කරනවා.

පාලක මණ්ඩලයේ වාර්තාවල සඳහන් වන ආකාරයට, අගෝස්තු 30වන දා වන විට රුපියල් ලක්ෂ 15,980ක් එහි ස්ථිර ගිණුමෙන් නිදහස් කරගෙන තිබෙනවා. ඒක විතරක් නොවෙයි කරලා තිබෙන්නේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවා ගන්නකොට, මෙම අරමුදල සතු මුදල්වලින් ඔවුන්ට වැටුප් ගෙවීමට හැකියාව තිබෙනවාද? මේ පනත අනුව එවන් හැකියාවක් නැහැ. නමුත්, ඒ සඳහාත් -ඔවුන්ගේ වැටුප් ගෙවීමටත්- මාසයකට රුපියල් ලක්ෂ 500ක් පමණ මේ අරමුදලින් පාවිච්චි කරනවා. පනත අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ස්මාරක සංරක්ෂණය කරන්න මෙහි මුදල් යොදවන්න පුළුවන්. නමුත් පත්වීම් ලබා දීලා, ඔවුන්ට වැටුප් ගෙවන්න අරමුදලේ මුදල් යොදවන්න බැහැ. මෙයට අමතරව තවත් කාරණා තිබෙනවා. මේ ගැන යම් ප්‍රශ්න මතු වන්නේ නම්, ඒවාට උත්තර ලබා දෙන්න මට පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[අ.භා.2.29]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු ඇමතිතුමනි, එම යෝජනාවේ සඳහන් වන ආකාරයට, මෙය විශාල මුදලක්. සංස්කෘතික කටයුතු ඇමතිතුමා හැටියට ඔබතුමාට මේ මුදල උපයෝගී කරගෙන විශාල වැඩකොටසක් කරන්න පුළුවන්. නැඟෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. විශේෂයෙන්ම, ත්‍රිකුණාමලය කොටුවේ කෝනේෂ්වරම් කෝවිල අසල ක්‍රිස්තු වර්ෂ 274 - 301 කාලයේ මහසෙන් රජතුමා හදවපු පන්සලක් තිබිලා තිබෙනවා. ඊට පස්සේ, ක්‍රිස්තු වර්ෂ 718 - 724 කාලයේ vවන අග්බෝ රජතුමා එතැන තිබුණු ගෝකන්න විහාරයට පොත්ගුලක් හදලා පූජා කළ බවත්, අතීතයේ ධීවර කර්මාන්තයේ යෙදුණු මහායාන බෞද්ධයන් මුහුද දෙසට පෙනෙන විදියට කන්ද මුදුණේ අවලෝකිතේෂ්වර බෝධිසත්ව රූපයක් ඉදිකර තිබූ බවත් කියැවෙනවා. මෙතැන තිබුණු විහාරස්ථානයත්, කෝවිලත් දෙකම 1624.02.23වැනි දා පෘතුගීසින් විසින් ගිනි තබා විනාශ කර තිබෙන බව පොත් පත්වල ලියැවී තිබෙනවා. ප්‍රැන්සිස් සේවියර් කියන කතෝලික පියතුමා සඳහන් කර තිබෙනවා, අද කෝනේෂ්වරම් කෝවිල තිබෙන

කොටුවේ pagoda තුනක් තිබූ බව. පැගෝඩාවක් කියන්නේ, දාගැබක්. 1954දී පුරාවිද්‍යා කැණීම් කරනකොට මේ ස්ථානයෙන් බුදුපිළිම කොටස්, කැටයම් සහිත ගල්, උළුවස්සක කොටස් සහ විශාල පාදමක් හම්බවෙලා තිබෙනවා. එතැනින් එහාට කැණීම් කරලා නැහැ. එතැනින් හම්බ වූ ගල් පාදම අදත් ත්‍රිකුණාමලය පැරැණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේ තබා තිබෙනවා. ඊට පස්සේ, එතැන තිබුණු පැරැණි බෝධිය 1964 අගෝස්තු මාසයේදී කිසියම් පිරිසක් විසින් කපා දමා තිබෙනවා. එවකට ත්‍රිකුණාමලයේ හිටපු දිසාපති එම්.බී. සේනානායක මහතා, එවකට සිටි සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ට 1964.10.08වැනි දා ලිඛිතව ඒ බව දන්වා තිබෙනවා.

කෝනේෂ්වරම් කෝවිල පිහිටි කොටුව ආශ්‍රිත තත්ත්වය මම ඔබතුමාට පැහැදිලි කරන්නේ කරුණු කාරණා කීපයක් නිසායි, ගරු ඇමතිතුමනි. පසුගිය කාලයේ, මධ්‍යම සංස්කෘතික අරමුදලින් විශාල වියදමක් දරලා එම ස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළා. අද වනවිටත් ඒ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඊට දායකත්වය දෙන්න, ඒ වැඩ කරන්න පැමිණ සිටින්නේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් නොවෙයි. ඒ සඳහා පැමිණ සිටින්නේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පිටස්තර අයයි. ඊට අල්ලපු දිස්ත්‍රික්කයෙන්වත් නොවෙයි, ඊටත් එහා දිස්ත්‍රික්කයක, අපේ ටී.බී. ඒකනායක මැතිතුමාත් නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසයෙන් පැමිණි පිරිසක් තමයි මෙහි කම්කරුවන් හැටියට සේවය කරන්නේ. ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය ඒ පිළිබඳව යොමු කරනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉතාම සුළු පිරිසක් මෙහි සේවය කරනවා. අඩු තරමින් ඒ අයවත් ස්ථිර සේවකයන් බවට පත්කර දෙන්න. ඒ වාගේම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රැකියා විරහිත තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින අවස්ථාවක කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රදේශයෙන් පමණක් ඒ කම්කරුවන් ඒ පළාතට එව්වේ ඇයි කියන කාරණය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පන්සල් 149ක් තිබෙනවා. මේවා අතරින් ස්ථාන 56ක් ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශිත පුරාවිද්‍යා ස්ථාන බවට පත්කර තිබෙනවා. ඒ වාගේම හින්දු කෝවිල් 335ක් තිබෙනවා, මුස්ලිම් පල්ලි 196ක් තිබෙනවා, කතෝලික පල්ලි 37ක් තිබෙනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්නියා උණු වතුර ළිං 7ක් තිබෙනවා. ඒ අසළ චෛත්‍ය ඇතුළු නටබුන් ගොඩනැඟිලි පුරාවිද්‍යා ස්ථානයක් හැටියට 2011.09.09 දින අංක 1723 ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා. මෙය ක්‍රිස්තු වර්ෂ 143 - 167 හාතිය තිස්ස රජු විසින් කරවන ලද බවටයි ඉතිහාසයේ සඳහන් වෙන්නේ.

උණු වතුර ළිං අසළ තිබෙන ශිවම් කෝවිල වශයෙන් හඳුන්වන ශාලාව ආගමික ස්ථානයක් ලෙස ලියා පදිංචිවෙලා නැහැ. එහෙත් නැඟෙනහිර පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මෙම ශාලාව ආගමික ස්ථානයක් ලෙස ගෙන, එය අලුත්වැඩියාව සඳහා අද වන විට රුපියල් මිලියන 1.3ක් ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අද වන විට මෙම ස්ථානයේ තිබෙන පුරාවිද්‍යා වස්තු පිළිබඳවත් අධිකරණ කටයුත්තක් සිදුවන බැවින් මා වැඩි විස්තර කියන්නේ නැහැ. නමුත් මේ කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ පුරාවිද්‍යා වස්තු මොන යුගයට අයත්ද, මොන ආගමකට අයත්ද කියා සලකන්නේ නැතුව මේ තිබෙන්නා වූ පුරාවිද්‍යා වස්තු සංරක්ෂණය කරන්නට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින රජයේ නීතිරීති අනුව කටයුතු කිරීම සඳහා දායකත්වය ලබා දුන්නොත් ඉතාම හොඳයි. මොකද, මේවා අපේ රටේ මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා විය යුතු බවට සලකන නිසායි.

මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහදිවුල්වැව, නාමල් වත්ත කියන ස්ථානයේ සිට කිලෝමීටර 5ක් පමණ කැලෑව තුළ පිහිටි අරයන්කුලම් වැව ළඟ විශාල පැරණි විහාරයක නටබුන් තිබෙනවා. එය චෛත්‍ය දෙකක්, සීමා මාලකයක් සහිතව විශාල ප්‍රදේශයක් පුරා විහිදිලා තිබුණු විහාරස්ථානයක්. එතැනට යන්න රක්ෂිතයක් මැදින් පාරක් කපලා තිබෙනවා. ඒ නටබුන් අතරේ අද වනකොට වෙනත් ආගමික සිද්ධස්ථානයක් ඉදිවෙමින් පවතිනවා.

තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගැමුණුපුර - සිරාජ් නගර්වල සේනවල්ලි වැව අසල නිවුන් සෑගල නමින් ස්ථානයක් තිබෙනවා. එතැන දාගැබ් දෙකක නටබුන් සමඟ ගල් කණු ආදිය තිබෙනවා. කළු ගලෙන් නෙළන ලද විශාලතම පැරණි මල් ආසනය තවමත් එතැන නුග ගහක් යට තිබෙනවා. මෙම ස්ථානයේ තිබුණු දාගැබ් ඩෝසර් කරලා ඒ මත ළමා උද්‍යානයක් ඉදිකරලා තිබෙනවා. මෙය අනුරාධපුර මුල් යුගයට තරම් ඉතිහාසයක් තිබෙන තැනක්. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හරහා පරීක්ෂණයක් පවත්වා මේවා සංරක්ෂණය කරන්නට කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

තඹලගමුව - යුනිට් 9 සාලියපුර පාරේ පැරණි කරඹවලාන වැව තුළ සීමා මාලකයක් තිබෙනවා. එතැනත් ගල් කණු ආදී නටබුන් තිබිලා තිබෙනවා. එය ඩෝසර් කළ පුද්ගලයා පොලීසියෙන් අල්ලාගෙන ගිහින්, ඔහුට යළි ඇප ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එවැනි දෙයක් කළාම පුරාවිද්‍යා ආඥා පනත අනුව එකවර ඇප දෙන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳවත් සොයා බැලුවොත් හොඳයි.

තඹලගමුව - යුනිට් 9 වර්තමාන කෝවිල් භූමියත් නටබුන් රැසක් තිබුණු ස්ථානයක්. එතැන ඉතිරි වෙලා තිබෙන්නේ මල් ආසනය පමණයි. මනුෂ්‍යයෙක් එතැන තිබුණු සෙල් ලිපිය කඩා ගෙදරට ඇතුළුවන තැන පඩියකට දමාගෙන තිබුණා. දැන් වුණත් පරීක්ෂණයක් කළොත් එය සොයා ගන්න පුළුවන්.

තඹලගමුවේ යුනිට් -8 යුද හමුදා කඳවුරට නුදුරින් නිශ්ශංකමල්ල රජ්ජුරුවන්ගේ ගම් ලිපියක් තිබුණා. ගම් ලිපි කියන්නේ, ඒ රජ්ජුරුවෝ රටේ සංචාරය කරද්දී රට වැසියන්ට තෑගි බෝග දීලා ගව්වෙන් ගව්වට හදලා තිබෙන සෙල් ලිපිවලටයි. ඒක දෙකට කඩලා, අන්‍ය ආගමික කෙනෙකුගේ වත්තක වළකට දමා තිබෙනවා. දැනට පියවි ඇසට දකින්නට තිබෙන නිශ්ශංකමල්ල රජ්ජුරුවන්ගේ එකම සෙල් ලිපිය මේක කියලාත් මතයක් තිබෙනවා. ඒ පිළිබඳවත් සොයා බලන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරන්නට කැමැතියි.

තඹලගමුව යුනිට් - 8 තිස්සපුර තිබුණු රන්දළ වෙහෙර කියන ස්ථානයේ පුරාණ නටබුන් සියල්ල ඩෝසර් කරලා තිබෙනවා. මේක රජයේ රක්ෂිතයක තමයි තිබෙන්නේ. දැනට දා ගැබේ නටඹුන් තිබෙනවා. ඒ ඉඩම ඩෝසර් කරලා දැනට කනත්තක් හැටියට පාවිච්චි කරනවා.

තඹලගමුවේ තට්ටගල කියන ස්ථානයත් විනාශ වෙමින් පවතිනවා. මෙතැන චෛත්‍යයක්, පිළිම ගෙයක් සහ පොකුණු 7ක නටබුන් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට නිමල් ලාන්සා මන්ත්‍රීතුමාගේ වේලාව ගන්න කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

හොඳයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

තඹලගමුව උල්පත්වැව වෙහෙර ළඟ කාවන්තිස්ස රජු සමයට එහා ගිය නටබුන් රැසක් තිබෙනවා. එතැන දා ගැබේ කොටසක් ඇතුළු නටබුන් විශාල ප්‍රමාණයක් විනාශ වෙමින් පවතිනවා. දැනට මෙහි ස්වාමීන් වහන්සේලා වැඩ සිටින නිසා යම් ප්‍රමාණයක රැකවරණයක් තිබෙනවා.

ගල්මැටියාව වැව අසල කැලයේ කිලෝමීටර 6ක් විතර කැලය ඇතුළට වන්නට නිශ්ශංකමල්ල රජු හදපු එකදා වැවක් තිබෙනවා. එතැන ලොකු පුවරු ලිපියක් සහ වට අඩි 300ක විතර විශාල චෛත්‍යයක නටබුන් විනාශවෙලා තිබෙනවා.

තඹලගමුව ගල්මැටියාව වැව අසල කැලයේ සුවඳකන්ද කියන ප්‍රදේශය පුරාවිද්‍යාත්මක නගරයක් වාගේ මහා විහාර ගණයට අයත් පංචායතනයක් තිබිලා තිබෙනවා. මෙතැන නටබුන් විශාල ප්‍රමාණයක් ලොකු ප්‍රදේශයක් පුරා පැතිරිලා තිබෙනවා. තඹලගමුව ගල්මැටියාව දකුණු ග්‍රාම නිලධාරි වසමේ ඉදිවැව අසල රක්ෂිතයේ II වන ගජබා රජුගේ මාළිගාව හැටියට විශ්වාස කරන ගල්වලින් හදපු කුට්ටම් පොකුණක් තිබෙනවා. ඒක අක්කර භාගයකට වඩා ලොකු පොකුණක්. රජුගේ සොහොන ලෙස සලකන තැනකුත් තිබෙනවා. මේවා නිදන් හොරු විනාශ කළත් නටබුන් තිබෙනවා. ඉදිවැව අසල කැලෑවේ ඕලු පොකුණ කියන ස්ථානයේත් චෛත්‍ය තුනක නටබුන් තිබෙනවා. මෙතැන අඩි 100ක විතර දිග කාමර වෙන් කළ ගල්ලෙන් තිබෙනවා. මේවා දිනපතාම විනාශ වෙමින් පවතිනවා. ගල්මැටියාව වැව තුළත් නටබුන් විසිරිලා තිබෙනවා. මේ තිබෙන නටබුන් අනුව ගල්මැටියාව ප්‍රදේශයම පැරණි නගරයක් කියලා හිතන්නට පුළුවන්.

තඹලගමුව - 93 ගල්වල අසල මේ ආණ්ඩුවෙන් වැවක් හැදුවා. ඒක ජනාධිපති කාර්යාල ප්‍රතිපාදනවලින් කරපු එකක් කියලායි දැනගන්නට තිබෙන්නේ. එතැනත් නිදන් හොරු විනාශ කරපු චෛත්‍යයක් තිබුණා. ඒක වැවේ වේල්ලට එකතු කරලා වහලා දමා තිබෙනවා. කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ - වාන්ඇළ විහාරගල රජමහා විහාරයේ වයෝවෘද්ධ ස්වාමීන් වහන්සේ නමක් වැඩ සිටිනවා. උන් වහන්සේ බොහොම අමාරුවෙන් එම ස්ථානය රැකගෙන ඉන්නවා.

හේමමාලා සහ දන්ත කුමරු ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩමවාගෙන එන අතර නවාතැන් ගත්තු ස්ථානයක් හැටියට තමයි මෙම ස්ථානය සැලකෙන්නේ. මෙතැනත් කටාරං කොටපු ගල් ගුහා, පොකුණු, ගල් කණු සහ පැරණි දා ගැබක කොටසක් තිබෙනවා. කැලෑවක් එක්ක තිබෙන මේ භූමිය කින්නියා-අයිල්අඩි ප්‍රදේශවලින් පැමිණෙන අන්‍ය ආගමිකයන් ගෙන් ආක්‍රමණය වෙමින් පවතිනවා.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන හැටියට ගැසට් නොකළ සියලු ස්ථාන ගැසට් කරන්න 2014දී විතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ගවේෂණයක් කළා. නමුත්, මේ වනතුරු ගැසට් කළේ නැහැ. එය නතරවෙලා තිබෙනවා. ඒ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කරලා ඒවා ගැසට් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඓතිහාසික කොට්ටියාරම මූල මහා විහාරය හෙවත් ගිරිනුවර රජමහා විහාරය මුත්තූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන්නේ. මේක සේරුවිල රජමහා විහාරයට අයිති පන්සලක්. වළගම්බා රජ්ජුරුවෝ සැඟවිලා සිටි බව කියන ගල්ලෙනක් ඇතුළු ලෙන් 28ක් මෙතැන තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දන් වළඳපු පාත්‍රය සඟවලා තිබූ තැන බව සඳහන් වෙන සෙල් ලිපියක් ඇතුළු සෙල් ලිපි තුනක් මෙතැන තිබෙනවා. ඒ වාගේම පරණ චෛත්‍ය 3ක නටබුන් තිබෙනවා. මේ විහාරස්ථානය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උසම කන්ද මුදුනේයි තිබෙන්නේ. අවුරුදු 800කට පස්සේ පසුගිය 2018 අවුරුද්දේ තමයි මෙතැන කඨින පිංකමක් කරලා තිබෙන්නේ. ඒ කඨින පිංකමෙන් පස්සේ මෙතැන තිබුණු අඩි 10ක් විතර උස බෝ පැළය කවුරුන් විසින් හෝ රෑ කපා දමා විනාශ කරලා තිබෙනවා. මේ ගැන මුත්තූර් පොලීසියට පැමිණිලි කරලා තිබුණත් ඒ පිළිබඳව කිසිම තොරතුරක් හෝ වාර්තාවක් මේ වන විට ලැබිලාත් නැහැ, සාධාරණයක් වෙලාත් නැහැ.

පසුගිය අප්‍රේල් 21වන දා, පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරයට පසුව දා කිසියම් පිරිසක් මේ පන්සලටත් ප්‍රහාරයක් එල්ල කරන්න සූදානමක් තිබූ බවට තොරතුරු ලැබිලා තිබුණා. ඒවා ආරක්ෂක අංශවලට දැනුම්දීලා තිබෙනවා. මෙතැන හමුදා මුර පොළක් තිබෙනවා. ඒකත් දැන් අයින් කරන්න යනවාලු. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා දන්වන්න කැමැතියි.

කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුල්මුඩේ පිහිටි අසිරිමලේ ආසිරිකන්ද පුරාණ විහාරයට අයිති පුරාවිද්‍යා ගල් දාලා වෙන් කරපු ඉඩම්වලට සමහර පුද්ගලයන් ප්‍රකාශන ඔප්පු හදලා තිබෙනවා. ඉඩම් විෂය භාර ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමා මේවා පරීක්ෂා කරලා ඒ අයට නිසි තැන් ලබා දීලා, ඒ ඉඩම් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

තෙන්නමරවාඩි සංබමලේ රජමහා විහාරය ක්‍රිස්තු පූර්ව 2 -3 සියවස්වලට අයිතියි. එතැන දා ගැබක නටබුන්, ගල් කණු, මල් ආසන, සඳකඩපහණ, කොරවක්ගල්, මුරගල් ආදී බෞද්ධ විහාරාංගවලට අයිති නටබුන් තිබෙනවා. නමුත්, යම්කිසි පිරිසක් මෙතැන පුරාවිද්‍යා මුර කුටියක්වත් හදන්න දෙන්නේ නැහැ. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරන්නට කැමැතියි.

තිරියාය, සෙම්බුමලේ රජමහා විහාරයත් නටබුන් දා ගැබක් සහිත ස්ථානයක්. එතැන වෙනත් ආගමික සිද්ධස්ථානයක් හදලා තිබෙනවා. ඒ පිළිබඳවත් සොයා බලලා එතැනත් සංරක්ෂණය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරන්නට කැමැතියි.

සාම්පූර් - සුඩකුඩා දාගැබත් ඩෝසර් කරලා තිබෙනවා. ඒ ගැනත් පරීක්ෂණයක් කරලා, ඒකත් සංරක්ෂණය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

පුරාවිද්‍යා ඉඩම්, පූජා භූමි ඉඩම්, පූජා ඔප්පු ඉඩම් නිරවුල් කරන්න මිනින්දෝරු දෙපාර්තමේන්තුව මැනුම් කටයුතු කර, කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථාන දොළහක කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ ස්ථාන හැටියට කුඹුරුපිටිය, බඹරගල ආරණ්‍ය සේනාසනය, පුල්මුඩේ -1, ඇතානැගි කන්ද රජමහා විහාරය, සලපෙයාරු - භාගිය පබ්බත වන සෙනසුන, පුල්මුඩේ -1, මිහිඳුලෙන රජමහා විහාරය, තිරියාය සප්තනාග පබ්බත වන සෙනසුන, තෙන්නමරවාඩි - සංකමලේ රජමහා විහාරය, කුඹුරුපිටිය - දෙබරගල ආරණ්‍ය සේනාසනය, පුල්මුඩේ -1 ශ්‍රී සද්ධම්මයුත්තික රජමහා විහාරය, පුල්මුඩේ -1 යාන්ඔය රජමහා විහාරය, පුල්මුඩේ -3 නාගලෙන පුරාණ රජමහා විහාරය,

පුල්මුඩේ - 4 ශාන්තිපුර රජමහා විහාරය කියන ස්ථාන ගැසට් කරලා ඔප්පු නිරවුල් කරදීමයි කරන්න තිබෙන්නේ. ඒකත් අද සිදු වෙලා නැහැ. ඒ කාර්යයත් කර දෙන්න කියලා ඉල්ලීමක් කරන්න කැමැතියි.

පසුගිය අවුරුද්දේ නැඟෙනහිර පළාතේ නටබුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ගවේෂණය කරන්න පටන් ගත්තා. දැන් ඒ කටයුතු මඩකලපුවේ ඉඳලා අතරමඟ නතර වෙලා තිබෙනවා.

දැනට පුරාවිද්‍යා ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කර තිබෙන ස්ථාන සහිත ගැසට් නිවේදනය, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අවලංගු කරන්න හදනවා කියලා ආරංචියක් තිබෙනවා. විධිමත් විධියට මැනලා, මායිම් නිරවුල් නොකර ගැසට් කර තිබීම එයට හේතුව වී තිබෙනවා. ඒ පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන්න කියා ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ත්‍රිකුණාමලයේ, වල්ලුවර්කෝට්ටම් කියන ගමේ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් හැදුවා. ඒක "තොල්කාප්පියා නගර්" කියලා විවෘත කළා. ඒ නිවාස ව්‍යාපෘතිය ආදි මානවයාගේ මෙගලිතික සොහොන් බිමක තමයි හදලා තිබෙන්නේ. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, ඒවාත් සංරක්ෂණය කර දෙන්න කියලා ඉල්ලීමක් කරන්න කැමැතියි.

මීට අමතරව, ත්‍රිකුණාමලය - වෙල්ගම් වෙහෙර සිට කිලෝමීටර් 8ක් වයඹ දෙසට ගිය තැන කැලෑවේ, "නටබුන් වැව" නමින් හඳුන්වන ප්‍රදේශයේ වටිනා පුරාවිද්‍යාත්මක නටබුන් තිබෙනවා. කටාරන් කොටපු ගල්ලෙන් 5ක්, සඳකඩ පහණක්, කොරවක් ගල්, නිධන් හොරු විසින් කඩා විනාශ කර තිබෙන චෛත්‍යයක් එතැන තිබෙනවා. එතැන පසුගිය කාලයේ ත්‍රස්තවාදීන්ගේ කඳවුරක් පවත්වා ගෙන ගිය තැනක් හැටියට ආරක්ෂක අංශ විසින් සඳහන් කර තිබෙනවා. මේ ස්ථානයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ගැසට් කරලා නැහැ. ඒ ස්ථානයත් ගැසට් කරලා, සංරක්ෂණය කරලා, මතු පරපුරට දායාද කර දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

කන්නියා උණුවතුර ළිංවල ඉඳලා කිලෝමීටර් දෙකහමාරක් පමණ දුරින් කැලේ මැද තවත් ගල්කණු ගොඩක් තිබෙනවා. මෙම ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණයට ලක් වෙලා නැහැ. විශේෂයෙන්ම මෙම ස්ථාන පුරාවිද්‍යා ගවේෂණයට ලක් කරලා, මතු පරපුරට සංරක්ෂණය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ වෙනුවෙන් රුපියල් මිලියන 3,600ක මුදලක් වැය කළා. අපේ ශිෂ්ටාචාරය, අපේ රජ දවස එදා තිබුණු ශ්‍රී විභූතිය පිළිබඳව තිබෙන අයිතිය, සලකුණු මේ වෙනකොට විශාල වශයෙන් නොයෙක් නොයෙක් විධියට විනාශ වෙමින් පවතිනවා. ඒ නිසා විශේෂයෙන්ම සංස්කෘතික කටයුතු භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට වග කීමක් තිබෙනවා, මේ ස්ථාන සංරක්ෂණය කරලා ආරක්ෂා කර දෙන්න. කොයි ආගමකට, කොයි ජාතියකට අයිති වුණත්, මේවා අපේ රටේ ඉතිහාසය විදහා දැක්වීමට තිබෙන සාධක. ඒ නිසා මේවා සංරක්ෂණය කළ යුතුයි. මේ ගැන කවුරු කරුණු ඉදිරිපත් කළත්, අවධානය යොමු කරන්නේ නැහැ.

ඒ නිසා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීලා, විශේෂ කණ්ඩායමක් අපේ දිස්ත්‍රික්කයට -නැඟෙනහිර පළාතට- එවලා, ඒ ස්ථානවල සංරක්ෂණ කටයුතු කරලා, මේවා මතු පරපුරට දායාද කර දෙන්න කියන ඉල්ලීමක් කරනවා. මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ සියලු අඩුපාඩු ටික මට ලැබෙන්න සලස්වන්න. මම නිලධාරින් කණ්ඩායමක් එවන්නම්. ඔබතුමාත් එක්ක ඒ සෑම තැනකටම ගිහිල්ලා, කෙරෙන්න ඕනෑ සියලු දේවල් ඔබතුමාගේ අධීක්ෂණය යටතේ කරන්න අපි වැඩ පිළිවෙළක් යොදන්නම්. මට ඒ ලැයිස්තුව දැන් එවන්න.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

බොහොම ස්තුතියි. මම ඒ ලැයිස්තුව ඔබතුමාට දෙන්නම්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව කරුණක් සඳහන් කරන්නම්. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ -කෝප් කමිටුවේ,- ඊයේ සාකච්ඡා වූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳ කාරණයක් අද ගරු මන්ත්‍රීතුමෙක් පාර්ලිමේන්තුවේදී මතු කර තිබුණා. මම ඒ වෙලාවේ සභාවේ හිටියේ නැහැ. ඒ පිළිබඳව ගරු කථානායකතුමාත් මා දැනුවත් කළා.

විශේෂයෙන්ම ඒක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු කුලියට ලබා ගත්ත ඉඩමක්; නුවර මල්වතු මහා විහාර පාර්ශ්වයට අයිති, ගංගාරාම පන්සලේ ඉඩමක්. ඒ ඉඩම ලබා ගෙන තිබීම ගැන අපි ඊයේ කාරක සභාවේදී කථා කළා. කෝප් කමිටුවේදී කථා කළ විධියට, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විශ්වවිද්‍යාලයක් හදන්න මීට අවුරුදු තුනකට කලින් තමයි ඒ ඉඩම ලබාගෙන තිබෙන්නේ. හැබැයි, ඒ ඉඩම ලබා ගත්තාට එහි කිසිදු කටයුත්තක් කරලා තිබුණේ නැහැ. ඒ ඉඩම විශ්වවිද්‍යාලයක් සඳහා යොදා ගැනීමේ ප්‍රමාදය ගැනයි අපි සාකච්ඡා කළේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්තාවල ඉතා පැහැදිලිව නොනිමි වැඩ හැටියට - අවසන් නොකළ වැඩ හැටියට- එය සඳහන් කරලා තිබෙනවා. එය මල්වතු පාර්ශ්වයට අයිති ඉඩමක් නිසා මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් වහන්සේගේ පාර්ශ්වයෙනුත් පැහැදිලි කර ගැනීමක් කර ගන්න විගණකාධිපතිතුමාට නියම කළා. ඒ නිසා ඒ කාරණය මල්වතු මහා නායක ස්වාමීන් වහන්සේට හෝ මහා සංඝ රත්නයට අපහාසාත්මක ලෙස, අගෞරවයක් වන විධියට යොදා නොගන්න කියලා ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ ගැන පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න එපා, ඊට වඩා වෙනස් අර්ථ කථනයක් දෙන ආකාරයකට. ඒක ඉතා පැහැදිලිව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදු කළ කටයුත්තක්; ඔවුන්ගේ ගිණුම්වල තිබෙන දෙයක්. ඒ පිළිබඳව අපි පරීක්ෂණයක් කරනවා පමණයි. එහෙම නැතිව, ඒ කාරණය මහා සංඝ රත්නයට අගෞරවයක් වන ආකාරයට දේශපාලනික අර්ථයකින්වත්, වෙනත් අර්ථයකින්වත් යොදා ගන්න එපා කියලා ඉතාම ගෞරවයෙන්, වගකීමෙන් සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. කාරණයක් කියන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කයේ තිබෙන පන්සල්, පල්ලි, කෝවිල්වල ආදායම් තත්ත්වය ඉතාම අවමයි. හේතුව, ඒ ඉන්න කම්කරු, ධීවර, ගොවි ජනතාවට ඒ පන්සල්, පල්ලි, කෝවිල් නඩත්තු කිරීමේ හැකියාවක් නැතිකම. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මහවැලි කලාපයට

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

අයත් කුඹුරු ඉඩම් තිබෙනවා, අක්කර තුන්දහසක්, හාරදහසක් විතර. ඒවා බෙදලා අක්කර දෙක ගණනේ ඒවාට දෙන්න පුළුවන් නම් ඉතාම සුදුසුයි. මොකද, ඇතැම් ස්වාමීන් වහන්සේලාට දානය පිළිගන්වන්නවත් ඒ ගම්වල ජනතාවට හැකියාවක් නැහැ.

**ගගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තත්පර 30ක් දෙන්න. ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයේ ඉන්න කොට එවකට පැවැති රජයට මම මේ පාර්ලිමේන්තුවේදී යෝජනාවක් ඉදිරිපත් කළා, මේ රටේ සමස්ත විහාරස්ථානවලට කුඹුරු අක්කර දෙකහමාරක් වෙන් කරලා ඒ හැම විහාරස්ථානයකටම ස්වාධීන ආදායම් මාර්ගයක් නිර්මාණය කරන්න කියලා. එවකට පැවැති රජය ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. ඔබතුමා ඉදිරිපත් කරන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාළ මේ යෝජනාව හොඳ යෝජනාවක්. අතිගරු ජනාධිපතිතුමා එක්කත්, ගරු අග්‍රාමාත්‍යතුමා එක්කත් සාකච්ඡා කරලා අපි ඒ යෝජනාව ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්නම්. [බාධා කිරීමක්] ඒ යෝජනාව ඉදිරියට කරගෙන යන්න කටයුතු කරන්නම්.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා.2.51]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළේ, මහජන බැංකු පනත ප්‍රතිසංස්කරණය කරන්නට, සංශෝධනය කරන්නට වාද විවාදයක් ගිය සතියේ තියලා, අද එයට සංශෝධන ගෙනැල්ලා ඡන්දය විමසන්න තිබුණු අවස්ථාවේයි. නමුත්, විපක්ෂ නායකතුමා විසින් ගරු කථානායකතුමාට ලියුමක් ඉදිරිපත් කරලා ඉල්ලීමක් කර තිබුණා, එය කල් දමන්න කියලා. ඒ ඉල්ලීම මත ඒ කටයුත්ත සතියක්, දෙකක් කල් දමා තිබෙනවා. මොකද, අපේ ආණ්ඩුවට කිසිම දෙයක් හදිසියේ කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා ඒකට කල් දීලා වාද විවාද කරන්න පුළුවන්. නමුත්, අද මේ සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව දිහා බලන කොට ඒ ඉදිරිපත් කරපු ලියුමයි, මේ යෝජනාවයි අතරේත් සම්බන්ධතාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය එක පාරටම මනසට පැන නැඟෙනවා. මොකද, අද මේ යෝජනාව ඉදිරිපත් කරන කොට මුදල් අවභාවිතයක් ගැන සඳහන් කළා. නමුත්, මුදල් අවභාවිතයක් ගැන කථා කරන කොට යම්කිසි කරුණු කාරණා තියෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඒවා ගැන සාකච්ඡා කරන කොට, එක්කෝ විගණකාධිපතිතුමාගේ වාර්තාවක් තිබෙන්න ඕනෑ, මෙහෙම ප්‍රශ්නයක්, ගැටලුවක් තිබෙනවාය කියලා. නමුත් එහෙම කිසිම වාර්තාවක් හෝ ගැටලුවක් නැහැ. නැත්නම් COPE එකේ හෝ COPA එකේ සාකච්ඡා කරලා යම් කිසි වාර්තාවක් තිබෙන්නට ඕනෑ. එහෙම වාර්තාවක්වත් නැහැ. විගණකාධිපතිගෙන්වත් වාර්තාවක් නැහැ. කාගෙන්වත් වාර්තාවක් නැහැ. නිකම් වාර්තාකාරයෙක් පත්තරේකට ලියලා තිබෙන මොකක් හරි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ වැදගත් කාලයත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ මුදලුත් නාස්ති කරලා මෙතැන වාද - විවාද කරනවා. මම ඒක මුලින්ම සඳහන් කරන්නට අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තැබීමේ මේ යෝජනාව පිළිබඳව මට මුලින්ම එන්න තිබෙන නිගමනය මෙයයි. ජනාධිපතිවරණයක් තියන්න යන අවස්ථාවකදී දේශපාලන අරමුණකින් මෙවැනි යෝජනාවක් මෙතැනට ඉදිරිපත් කරලා මඩ ගහන්න කරන වෑයමක් කියන එකත් අපට මෙයින් පෙනෙනවා. හැමෝම එයට එකඟ වෙන්න ඕනෑ නැහැ. නමුත් අපි සමහර දෙනෙකුට එහෙම පෙනෙන්නට ඕනෑ.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්තා තිබෙනවා. ඕනෑ කෙනෙකුට ඒවා ලබා ගන්නට පුළුවන්. මේ අවුරුද්දේ ජනවාරි 01වැනි දා ඉඳලා අගෝස්තු 31වැනි දා වෙන කල් ලැබුණු ආදායම වාගේම වියදමත් සඳහන් කරලා තිබෙනවා. ඒ තොරතුරු ලබා ගන්නට පුළුවන්. අද අපි දීලා තිබෙනවා නේ, තොරතුරු දැන ගැනීමේ අයිතිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, ඕනෑම පුරවැසියකුට තොරතුරු ලබා ගන්න පුළුවන්. ඒ අයිතිය දුන්නේ අපේ රජයෙන්. මොකද, අපි කරන දේවල් හංගලා කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. අපි කරන දේවල් කරන්නේ විවෘතවයි. අපි මේ රටේ අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරනවා. මේ ජනාධිපතිවරණයෙන් පස්සේ -ඒ පැත්තේත් වෙන්න පුළුවන්. මේ පැත්තේත් වෙන්න පුළුවන්- මේ රටේ අලුත් දේශපාලන පරපුරක් මේ රට භාර ගන්නට ඕනෑ. මේ වෙනස්වීම ඉදිරියට ගෙන යන්න අලුත් දේශපාලන පරපුරක් මේ රට භාර ගන්න ඕනෑ.

මෙතැන වියදම වශයෙන් සඳහන් කරනවා, රුපියල් මිලියන 3,039ක්. බිලියනවලින් කිව්වොත් මධ්‍යම සංස්කෘතික අරමුදලින් රුපියල් බිලියන 3.3ක් වියදම් කරලා තිබෙනවා. ඒකේ හුඟක් විස්තර තිබෙනවා. ඒ විස්තර ඕනෑ කෙනෙකුට ලබා දෙන්නට පුළුවන්. ඒ වියදමින් සංවර්ධන කටයුතු කරලා තිබෙනවා; ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. උදාහරණ වශයෙන් සංවර්ධන කටයුතු ගැන කිව්වොත්, තිස්සමහාරාමයේ වෙරගොඩැල්ල චෛත්‍යයට රුපියල් මිලියන 7.5යි. අනුරාධපුර මහා විහාරයට, මිරිසවැටියට, ථූපාරාමයට හා මිහින්තලයට රුපියල් මිලියන 626ක් පමණ වියදම් කරලා තිබෙනවා. අභයගිරියට රුපියල් මිලියන 47ක්, ජේතවනයට රුපියල් මිලියන 147ක් වියදම් කරලා තිබෙනවා. තවත් කියන්න හුඟක් ස්ථාන තිබෙනවා. තිබෙන සීමිත කාලය නිසා ඒවා කියන්න වෙලාවක් නැහැ. කුරගලට රුපියල් මිලියන 65ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම තිස්සමහාරාම රජ මහා විහාරයට රුපියල් මිලියන 75ක් වියදම් කරලා තිබෙනවා. ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ස්වර්ණමාලි චෛත්‍ය රාජයාණන් වහන්සේ ඇතුළු අටමස්ථාන ආගමික ස්ථානවලට රුපියල් මිලියන 27ක් වියදම් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, you have two more minutes.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

කතරගම කිරිවෙහෙරට රුපියල් මිලියන 47ක්, මඩු මාතා සිද්ධස්ථානයට රුපියල් මිලියන 54ක්, තලවිල ශාන්ත ආනා සිද්ධස්ථානයට රුපියල් මිලියන 50ක් වියදම් කරලා තිබෙනවා. වෙලාව නැති නිසා මම ඒ විස්තර කියන්න යන්නේ නැහැ. ඒ

වාගේම මේ අමාත්‍යාංශය හරහා දිස්ත්‍රික්ක 25ක් තෝරාගෙන "සිසු දහම් සෙවණ" වැඩසටහන යටතේ දහම් පාසල් 352කට ආයෝජන කරගෙන යනවා. ඊට අමතරව "අරනේරි"- ඒක දෙමළ වචනයක්. සිංහලෙන් ඒකට "සදාචාරය" කියලා කියන්න පුළුවන්. ඉංග්‍රීසියෙන් "morality" කියලා කියනවා. ඒ දහම් පාසල්වල යටිතල පහසුකම් ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. මේවා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට දීලා නැහැ. අමාත්‍යාංශයේ ආයතනවලටයි මේ සියලු වැඩ දීලා තිබෙන්නේ. ඒක පැහැදිලි කරන්න අවශ්‍යයි.

පසුගිය පාස්කු ඉරුදින විශාල ප්‍රහාරයක් ඇති වුණා. මම මේ යෝජනාව ගැන සඳහන් කරන කොට, කවුද මෙතැන නැඟී ඉඳලා ඒ ගැන කිව්වා. පාස්කු ඉරුදින සිදු වූ ප්‍රහාරය නිසා දේවස්ථාන විනාශ වුණා. අපි සියලුදෙනා දන්නවා, කටුවාපිටියේ පල්ලියට, කොච්චිකඩේ පල්ලියට, මඩකලපුවේ පල්ලියට ප්‍රහාර එල්ල වුණා කියලා. ඒක ත්‍රස්ත ප්‍රහාරයක්. මේ ත්‍රස්ත ප්‍රහාරය නිසා මේ ගොඩනැඟිලිවලට හානි වුණාම ඒවා ප්‍රතිසංස්කරණය කරන එකේ වරදක් තිබෙනවාද කියන එක මම අහන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි. ඊට පස්සේ මේ අන්තවාදීන් මොනවාද කළේ? ඒ අන්තවාදීන් හැම තැනම ඉන්නවා. ඊට පස්සේ කලබලයක් ඇති කළා. ඊට පස්සේ මුස්ලිම් දේවස්ථානවලට පහර ගහගෙන ගියා.

එදා මට මතකයි, ගරු කථානායකතුමාගේ ආරාධනාවෙන් රාජ්‍ය ඇමති රුවන් විජේවර්ධන මැතිතුමාත්, මාත් අස්ගිරි මල්වතු පාර්ශ්වයේ නායක ස්වාමීන් වහන්සේලා හමුවෙලා මේ ගැන සාකච්ඡා කරන්න ගියා. ඒ එන ගමන් රුවන් විජේවර්ධන ඇමතිතුමායි, මායි මිනුවන්ගොඩ දී බැස්සා. ඇයි? මුස්ලිම් දේවස්ථානවලට ගහගෙන ගහගෙන ගිය ඒවා බලන්න. ඒවා ප්‍රතිසංස්කරණය කරන්න අපි කොච්චර වියදම් කරලා තිබෙනවාද කියන විස්තර තිබෙනවා. දැන් මෙතැන කිව්වා, පුරාවිද්‍යා නටබුන් තිබෙන ස්ථාන ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ කියලා. ඒ යෝජනාව හොඳයි. ඇමතිතුමා දැන්මම නැඟිටලා කිව්වා, ඒවායේ ලැයිස්තු දෙන්න කියලා. ඒ සිද්ධස්ථානත් ඒ ඓතිහාසික ස්ථානත් ප්‍රතිසංස්කරණය කරන්නට අපට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදායමින් සියයට 25ක් ඒ සඳහා යෝජනා කරන්නට පුළුවන්. ඒවාටත් මුදල් දීලා තිබෙනවා. නමුත්, ඉස්සර තිබුණ වැඩ තවමත් කරමින් පවතිනවා. 2019 වර්ෂයේදී රුපියල් බිලියන 3.8ක් වියදම් කරලා ඓතිහාසික ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළත් අපි ක්‍රමානුකූලව කරගෙන යනවා. පත්තරවල තිබෙන ඒවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කියවලා, වාද විවාද කරලා, මේ පාර්ලිමේන්තුවේ කාලයත්, මහජනතාවගේ මුදලුත් නාස්ති කරන්න එපා කියන එක නැවතත් මතක් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன் அவர்கள்!

[பி.ப. 2.59]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய ஒத்திவைப்புவேளைப் பிரேரணையாக மத்திய கலாசார நிதியம் பற்றிய விடயம் விவாதத்திற்கு எடுத்துக் கொள்ளப்பட்டிருக்கின்றது. எமது நாட்டில் கலாசார விடயங்களுக்காக ஒதுக்கப்படுகின்ற நிதியமாக இந்த மத்திய கலாசார நிதியம் கருதப்படுகின்றது. சகல கலாசார அமைப்புக்களுக்கும் பகிர்ந்தளிக்கக்கூடிய விதத்தில் இந்த மத்திய கலாசார நிதியத்தின் நிதி செலவு செய்யப்பட்டிருக்க வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். நாங்கள் பன்மைத்துவ சமூகங்களைக் கொண்ட ஒரு நாட்டில் வாழ்ந்துகொண்டிருக்கின்றோம். எங்களுடைய நாட்டைப் பொறுத்தமட்டில் பௌத்த வழிபாட்டுத்தலம், இந்து வழிபாட்டுத்தலம், கிறிஸ்தவ வழிபாட்டுத்தலம், இஸ்லாமிய வழிபாட்டுத்தலம் என நான்கு விதமான வழிபாட்டுத்தலங்கள் காணப்படுகின்றன. இந்த நாட்டில் இந்த நான்கு மதங்களின் கலாசாரங்களும் கடைப்பிடிக்கப்பட்டு வருகின்ற ஒரு சூழ்நிலையில், கலாசாரத்திற்குப் பொறுப்பாகவிருக்கின்ற கௌரவ அமைச்சர் அவர்கள் இந்த நான்கு கலாசார அமைப்புக்களையும் அல்லது அந்தக் கலாசாரங்களைப் பின்பற்றுகின்ற மதங்களையும் அடிப்படையாகக்கொண்டு அந்த நிதியினைப் பகிர்ந்தளித்திருப்பார் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். முக்கியமாக, ஓரினக் கலாசாரமுடைய நாடுகளில் ஆட்சி செய்வதைவிட, பல்லின கலாசாரமுடைய மக்களை ஆட்சி செய்வதென்பதும் பரிபாலிப்பதென்பதும் கஷ்டமான ஒரு காரியமென்பதை எல்லோரும் விளங்கிக் கொள்வார்கள். அந்த அடிப்படையில், பன்மைத்துவச் சமூகத்திற்கு ஏற்ற விதத்தில் நிதியினைப் பகிர்ந்தளித்துச் சகல இனத்தவர்களும் அந்த நிதியின் மூலமாகப் பயன்பெறக்கூடிய விதத்தில் இந்த மத்திய கலாசார நிதியத்தினது செலவினங்கள் அமைந்திருக்க வேண்டுமென்பது எங்களுடைய எதிர்பார்ப் பாகும். அதுவும் ஒரு நியாயமான எதிர்பார்ப்பாகவே இருக்கின்றது.

அமைச்சர் அவர்களின் வீடமைப்பு நிர்மாணப் பணிகளை எடுத்துக்கொண்டால், அநேகமாக எல்லாச் சமூகத்தையும் திருப்திப்படுத்தக்கூடிய விதத்தில் பட்டிதொட்டியெல்லாம் அவருடைய பணிகள் வியாபித்திருப்பதை நாங்கள் அறிவோம். குறிப்பாக, ஹம்பாந்தோட்டை மாவட்டத்திற்கு அடுத்ததாக மட்டக்களப்பு மாவட்டத்தில் பல வீடுகள் கட்டிக் கொடுப்பட்டிருக்கின்றன என்பதையும் நாங்கள் அறிவோம். அதில் நாங்கள் எந்தக் குறையும் சொல்வதற்குத் தயாராக இல்லை. அதற்காக நான் அவரைப் பாராட்டுகின்ற அதேவேளை, அமைச்சர் அவர்கள் தன்னுடைய வீடமைப்புத் திட்டத்தில் காட்டுகின்ற அதே பார்வையை, அதே செயற்பாட்டினை இந்த மத்திய கலாசார நிதியம் பற்றிய விடயத்திலும் காட்டி, அதனை முன்னெடுத்துச் செல்கின்ற போது, வீடமைப்புப் பணிகளுக்குச் சமாந்தரமாக இந்தக் கலாசாரப் பணிகளும் பரந்துபட்டுச் செயற்படுத்தப்படும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, குறிப்பாக, தர்மப் பாடசாலைகள் என்று சொல்லப்படுகின்ற அறநெறிப் பாடசாலைகளை எங்களுடைய தமிழ் பிரதேசங்களிலும் அமைக்கின்ற செயற்பாடுகளை நீங்கள் முன்னெடுத்து வருகின்றீர்கள். பல்வேறு பிரதேசங்களிலும் காணப்படுகின்ற பல்வேறு மதக் கலாசாரங்களுக்கு ஏற்ற விதத்தில் இந்த நிதி செலவு செய்யப்பட வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது. கலாசாரம் என்பது ஒவ்வோர் இனத்திற்கும் முக்கியமானதோர் அடையாளமாக இருக் கின்றது. அவர்களுடைய வரலாற்றை எடுத்துக் காட்டுகின்ற ஒரு பின்னணியில் அமைந்திருக்கின்ற ஒரு பொக்கிஷமாக அது அமைந்திருக்கின்றது. இவ்வாறான பின்னணியில் காணப் படுகின்ற அந்தப் பொக்கிஷமானது ஒவ்வோர் இனத்தவராலும் வெவ்வேறு கலாசாரங்களைப் பின்பற்றுகின்றவர்களாலும் பேணிப் பாதுகாக்கப்பட வேண்டிய முக்கியமான ஒரு முதுசப்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பொருளாக அல்லது பாரம்பரியப் பொருளாக அமைந்திருக்கின்றது. இந்தப் பாரம்பரியத்தைக் கடைப்பிடிக்கின்றபோது பக்குவமான செயற்பாடு நடைபெறுமாக இருந்தால் அது பன்மைத்துவச் சமூகங்கள் மத்தியில் முரண்பாடுகள் இல்லாமல், பகைகள் இல்லாமல் அவர்கள் சரியான வழியில் செல்வதற்கு உதவக்கூடியதாக இருக்கும். பல்வேறுபட்ட விமர்சனங்கள் இருக்கலாம் அல்லது சில விடயங்களில் பல்வேறுபட்ட நோக்குகள், கண்ணோட்டங்கள் காணப்படலாம், ஒவ்வொரு சமூகத்தவர்களும் பார்க்கின்ற பார்வைகள் வித்தியாசமான வையாக இருக்கலாம், ஆனால், இந்த சமத்துவம், சமதர்மம், சமவுரிமை சமவாய்ப்பு என்கின்ற விடயங்கள் மிக உயர்ந்த விழுமியக் கருத்துக்களாகும்.

பன்மைத்துவச் சமூகங்களைப் பொறுத்தமட்டில் சமத்துவமான செயற்பாடு, சமதர்மமான செயற்பாடு, சமவாய்ப்பான செயற்பாடு என்பவை முன்னோக்கி நகர்த்தப்படுகின்றபோது, எல்லோர் மத்தியிலும் நம்பிக்கையைக் கட்டியெழுப்பக் கூடியதாக இருக்கும். மாறாக, இவற்றில் சிலவேளைகளில் ஏற்படுகின்ற தவறுகள் பல்வேறுபட்ட பாதிப்புக்களை ஏற்படுத்தக்கூடியதாக இருக்கும். எமது நாட்டை எடுத்துக் கொண்டால், கடந்த காலத்தில் எமது நாட்டில் வரலாற்று ரீதியாகச் சில தலைவர்கள் விட்டுவந்த தவறுகள் பல்வேறுபட்ட நீண்டகாலப் பிரச்சினைகள் ஏற்படுவதற்குக் காரணமாக அமைந்திருக்கின்றன என்பதை நாம் அறிவோம். வரலாறு எங்களுக்குப் பல பாடங்களை அழுத்தம் திருத்தமாகக் கற்பித்திருக்கின்றது; நல்ல படிப்பினைகளைத் தந்திருக்கின்றது. எனவே, நாங்கள் எப்போதும் அனுபவ ரீதியான வரலாற்றுப் பாடங்களை மறந்துவிடக்கூடாது.

தொல்லியல் மற்றும் எங்களுடைய பாரம்பரியம், எங்களுடைய மரபுரிமை என்பனவெல்லாம் எங்களுடைய முன்னோர்கள் - எங்களுடைய முன்னைய சந்ததிகள் - அப்படியே சந்ததிகள் வாயிலாகக் கடத்திக்கொண்டுவந்து எங்களிடம் ஒப்படைத்திருக்கின்ற விடயங்களாகும். ஒவ்வொரு சமூக அமைப்பிலும் இந்தப் பாரம்பரியம், கலாசாரம் என்பன மிக முக்கியமானதாகப் பேணப்பட்டுக்கொண்டு வருகின்றன. இவ்வாறு பேணப்படுகின்ற அந்தக் கலாசாரப் பொக்கிஷத்தை ஒவ்வோர் இனமும் பெரிதாக நினைக்கின்றது. இவ்வாறு ஒவ்வோர் இனமும் ஒவ்வொரு கலாசாரப் பிரிவினரும் பெரிதாக மதிக்கின்ற அந்தச் சொத்தினை மற்றைய சமூகத்தினர் சிலவேளைகளில் இரண்டாம் நிலையில் கருதுகின்றபோது அல்லது அவற்றுக்குரிய மரியாதையைக் கொடுக்காது செயற்படுகின்றபோது அல்லது அப்படியான நிலையங்களை அழிப்பதற்கு முற்படுகின்றபோதுதான் ஒரு நாட்டில் தேசிய ஐக்கியம் - தேசிய ஒருமைப்பாடு என்பது பிளவுபடக்கூடிய ஒரு நிலைமைக்குக் கொண்டுசெல்லப்படுகின்றது. இவையெல்லாம் எங்களுடைய நாட்டில் நாம் பார்த்த விடயங்களாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, தமிழ் மக்கள் மத்தியில் உங்களைப் பற்றி நம்பிக்கையிருக்கின்றது; அவர்கள் உங்கள்மீது நம்பிக்கை இழக்கவில்லை. எனவே, சில செயற்பாடுகளில் தவறுகள் அல்லது குறைபாடுகள் இருக்குமாக இருந்தால், அவற்றைத் திருப்தி செய்யக்கூடிய ஆளுமை உங்களிடம் இருப்பதாக நாங்கள் கருதுகின்றோம். வீடமைப்பு விடயத்தில் எமது மக்கள் உங்கள்மீது கூடுதலான திருப்தியோடிருக்கின்றார்கள். அதேபோன்று கலாசாரம் சம்பந்தமான விடயங்களிலும் அவர்கள் திருப்திப்படக்கூடிய விதத்தில் உங்களுடைய செயற்பாடுகள் அமையுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம்.

யுத்தம் நடைபெற்ற இடங்களில் 30 ஆண்டுகளாக அறநெறிப் பாடசாலைகள், கலாசார மண்டபங்கள் என்பன அமைக்கப்படாத நிலைமை காணப்பட்டது. அந்த யுத்தம் முடிந்த பின்னர் அப்படியான கலாசார -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Can I explain, Hon. Member?

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Yes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

As far as development activities are concerned, this year, we have a problem with regard to cultural centres. That is one project carried out through the Ministry. We have not received allocations for cultural centres. But, when it comes to Dhamma Schools, it is different. The other day, I went to Batticaloa and inaugurated an *Aranery* School. We have inaugurated *Aranery* Schools in Mullaitivu also. So, you have to understand that cultural centres come under a different project. We have already initiated *Aranery* Schools irrespective of caste, creed, ethnicity, religion or anything. We are following a very balanced approach. So, we do not discriminate them and we ensure that everyone's cultural and religious rights are respected.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே, நிறைவு செய்ய இன்னும் 2 நிமிடங்கள் இருக்கின்றன.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பில் மண்முனைப்பற்று பிரதேச செயலக பிரிவிலுள்ள தாழங்குடாவில் அறநெறிக் கற்கை நிலையத்தை நீங்கள் அமைத்திருப்பதை நான் அறிவேன். அதேபோன்று எதிர்காலத்தில் கலாசார மண்டபங்கள், கலாசார நிலையங்கள் அமைக்கப்பட வேண்டிய தேவையிருக்கின்றது. மட்டக்களப்பைப் பொறுத்தமட்டில் 14 பிரதேச செயலகங்கள் காணப்படுகின்றன. இவற்றில் யுத்தத்தினால் அதிகமாகப் பாதிக்கப்பட்ட 8 பிரதேச செயலகப் பிரிவுகள் காணப்படுகின்றன. இந்தப் பிரதேச செயலகப் பிரிவுகளில் நிச்சயமாக அறநெறி சார்ந்த கற்கை நிலையங்களும் அதேபோன்று கலாசார மண்டபங்களும் தேவைப்படுகின்றன. இதுபற்றி நாங்கள் உங்களிடம் பிரஸ்தாபித்திருக்கின்றோம். எனவே, இந்த விடயங்களைக் கருத்திற்கொண்டு எதிர்வரும் காலங்களில் இந்த தர்மநெறி - அறநெறி கற்கை நிலையங்களையும் பண்பாட்டியலைப் பாதுகாத்துப் பேணக்

கூடிய கலாசார மண்டபங்களையும் நீங்கள் அமைத்துத் தருவீர்கள் என்ற நம்பிக்கையிருக்கின்றது.

அதேவேளை, கூடுதலாகப் பாதிக்கப்பட்ட இடங்களுக்கு கூடுதலான முக்கியத்துவம் வழங்கப்பட வேண்டும். வடக்கு, கிழக்குப் பிரதேசங்களைப் பார்க்கின்றபோது, யுத்தத்தால் அதிகளவு பாதிக்கப்பட்ட பிரதேசங்கள் காணப்படுகின்றன. வடக்கை எடுத்துக்கொண்டால், குறிப்பாக, முல்லைத்தீவு, வவுனியா, மன்னார், கிளிநொச்சி போன்ற பிரதேசங்கள் மிகக் கூடுதலாக யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்களாக இருக்கின்றன. அதேபோன்று கிழக்கிலும்கூட சில பிரதேச செயலகப் பிரிவுகள் முற்றிலும் பாதிக்கப்பட்ட பிரதேசங் களாகக் காணப்படுகின்றன. எனவே, இந்த இடங்களில் கலாசார, பண்பாட்டு மையங்களைக் கட்டியெழுப்புவதற்குரிய ஆக்கபூர்வமான செயற்பாடுகளை நீங்கள் முன்னெடுக்க வேண்டும். வீடமைப்பு விடயத்தில் தமிழ் மக்கள் உங்கள்மீது கொண்டிருக்கின்ற அதேயளவு நம்பிக்கையினை கலாசார அமைப்பு விடயங்கள், அறநெறிக் கற்கை விடயங்களை உருவாக்குகின்ற விடயத்திலும் பெறுவதற்கு நீங்கள் ஆக்கபூர்வமான ஓர் ஆளுமையைச் செலுத்துவீர்கள் என்று நாங்கள் நம்புகின்றோம்.

மேலும், புரையோடிப்போயிருக்கின்ற இனப்பிரச்சினை யைத் தீர்க்கக்கூடிய ஓர் ஆளுமைமிக்க தலைவராக நீங்கள் எதிர்காலத்தில் பரிணமிக்க வேண்டும். பெரும்பான்மையினத் தலைவர்கள் பலர் புரையோடிப்போயிருக்கின்ற இந்த இனப்பிரச்சினையை மையமாக வைத்துக்கொண்டுதான் தங்களுடைய அரசியல் காய்நகர்த்தல்களைச் செய்திருக் கின்றார்கள். தேர்தலுக்கு முன்னர் அவர்கள் சொல்லுகின்ற கருத்திலும் தேர்தலுக்குப் பின்னர் அவர்கள் செயற்படுகின்ற விதத்திலும் பாரிய மாற்றங்கள் காணப்படுகின்றன. எதிர்காலத்தில் நீங்கள் தலைமைத்துவத்தை வகிக்கின்றபோது தேர்தலுக்கு முன்பும் தேர்தலுக்குப் பின்பும் உங்களுடைய செயற்பாடுகள், உங்களுடைய நடவடிக்கைகள் ஒத்த தன்மையுடையதாக விளங்க வேண்டும். சகல இன மக்களின் நம்பிக்கையைப் பெறக்கூடிய விதத்தில் உங்களுடைய செயற்பாடுகள் அமைய வேண்டுமெனக்கூறி, எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා.3.11]

**ගරු සුජීව සේනසිංහ මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுஜீவ சேனசிங்க- விஞ்ஞான, தொழில்நுட்ப மற்றும்ஆராய்ச்சிஅமைச்சரவைஅந்தஸ்தற்றஅமைச்சர்)

(The Hon.Sujeewa Senasinghe - Non-Cabinet Minister of Science, Technology and Research)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මුලින්ම ගරු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා, ඒ අදහස් දැක්වීම සම්බන්ධයෙන්. මා හිතන විධියට, ගරු ඇමතිතුමාත් පිළිගත්තා, සමානුපාතිකව සියලුදෙනාට ඒ සේවය අනිවාර්යයෙන්ම ඉටු විය යුතුය කියන එක. හින්දු දහම් පාසල් සඳහා එම සේවය ලබා දුන් බව කියැවුණා. හින්දු කෝවිල් සම්බන්ධයෙන් මීට වඩා ඉල්ලීම් අපි ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙනවා. ඒ ඉල්ලීම් ද ඉටු කරමින්, සමානුපාතිකව සියලු ආගමික ස්ථානවලට සේවය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපත් එක්ක සම්බන්ධ වන අපේ නායක ස්වාමීන් වහන්සේලා ඇතුළු සියලු ස්වාමීන් වහන්සේලාට මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුව වෙනුවෙන් අපේ ගෞරවය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමා එතුමාගේ විෂය පථය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරනවාය කියන කාරණයට වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු සියලුදෙනා එකඟ වෙයි කියලා මා හිතනවා. එතුමා එසේ කටයුතු කරන බව තමයි සියලුදෙනාගේම අදහස. ඒ විෂය පථය තුළ කරන කාර්ය භාරය සමානුපාතිකව බෙදෙනවාද, නැද්ද යන කරුණ සම්බන්ධයෙන් අපට විවාදයක් තිබෙන්න පුළුවන්. මා හිතන විධියට එය විවාදයට බඳුන් විය යුතුයි. එහි අඩු පාඩු තිබෙනවා නම් අප ඒ අඩු පාඩු සකස් කර ගත යුතුයි.

ඒ කෙසේ වෙතත්, ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්පූර්ණ යෝජනාවක් නොවෙයි කියලායි මා හිතන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(மாண்புமிகு குழுக்களின்பிரதித்தவிசாளர்அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினாவிடுக்கப்பட்டுஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලුකුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமைவகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු සුජීව සේනසිංහ මහතා**

(மாண்புமிகு சுஜீவ சேனசிங்க)

(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියමින් සිටියේ, ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව අංග සම්පූර්ණ යෝජනාවක් නෙවෙයි කියලායි. ඇත්තටම, මුදල් අවභාවිතයක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න නම්, COPE එකෙන්, PAC එකෙන්, එහෙම නැත්නම් වෙනත් කමිටුවකින් විමර්ශනයක් සිදු වෙලා තිබිය යුතුයි; විගණන දෙපාර්ත මේන්තුවෙන් විගණනයක් සිදු වෙලා තිබිය යුතුයි. එහෙම නැතිව, කවුරු හෝ කියපු පලියට, ඇසුණු පලියට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම නුදුසුයි කියන එකයි මගේ මතය.

ඒ කෙසේ වෙතත්, මා මේ අවස්ථාවේදී කථා කරන්න ඉදිරිපත් වීමට හේතුවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට නෑකමක්වත්, එතුමා සමඟ වෙනත් සම්බන්ධතාවක්වත් මට නැහැ. එතුමාත් එක්ක අවුරුදු 20ක් විතර දේශපාලන වශයෙන් වැඩ කරන්න මට අවස්ථාව ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන එකයි දශම ගණනක මුදලක් අවභාවිත වෙලා තිබෙනවාය කියලා මේ දවස්වල කසු කුසුවක් පැතිරිලා තිබෙනවා. එතුමා කරන වැඩ කෙරෙහි, එතුමා කරන සුබසාධන කටයුතු කෙරෙහි මට ලොකු විශ්වාසයක් තිබෙනවා. ආණ්ඩුවේ මුදල් පමණක් නොවෙයි, ව්‍යාපාරිකයන් ගෙන් හෝ වෙනත් ඕනෑම තැනකින් එකතු කරන මුදල් යොදා මගේ ආසනයේ වේවා, මගේ දිස්ත්‍රික්කයේ වේවා, මගේ

[ගරු සුජීව සේනසිංහ මහතා]

දිස්ත්‍රික්කයෙන් පිට දිස්ත්‍රික්කවල වේවා, එතුමා කරන හැම වැඩක් සම්බන්ධයෙන්ම අකුරටම ගණන් තියන ඇමතිවරයෙක් තමයි, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා කියන්නේ. එසේ නොවන අවස්ථාවක් කොහේ හෝ තිබෙනවා කියලා ඔබතුමන්ලා අභියෝග කරනවා නම්, මා ඒ අභියෝගය බාර ගන්නවා. එතුමා, එතුමා වියදම් කළ මුදල් සම්බන්ධයෙන් හරියාකාරව, පැහැදිලිව අදහස් ඉදිරිපත් කර නැහැ, ගිණුම් ඉදිරිපත් කර නැහැ කියලා ඔබතුමන්ලා කියනවා නම්, එවැනි තැනක් අපට පෙන්වන්න කියලා මම අභියෝග කරනවා. දේශපාලන වශයෙන් එතුමා සම්බන්ධයෙන් මා තුළ තිබෙන විශ්වාසය ඒකයි. එතුමා ඒ විශ්වාසය අද වනතුරු පළුදු කරලාත් නැහැ. ඒ හින්දා මම හිතුවා, කෙටියෙන් හෝ මේ යෝජනාව ගැන කථා කරන්න ඕනෑ කියලා. මගේ ඒ විශ්වාසය ඉදිරි අනාගතයේදීත් එසේමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාත් කිව්වේ, බලයේ සිටියත් නැතත් වැඩක් කරන කෙනකුළ ලෙස සජිත් ප්‍රේමදාස මහත්මයා එතුමන්ලාත් හඳුනාගන්න බවයි. විශේෂයෙන්ම, උතුර, නැඟෙනහිර මන්ත්‍රීවරුන් වශයෙන් එතුමන්ලා එසේ කීම ලොකු හයියක්. මොකද, එතුමා අපේ පක්ෂයේ සාමාජිකයෙක් නොවන නිසා. මා හිතන්නේ, එය රටටම ලොකු හයියක් කියලායි. වැඩක් කරන්න පුළුවන් එවැනි නායකයෙක් අප අතර ඉන්නවා. තවත් නායකයෝ ඇති. හැබැයි, එසේ පිළිගත් නායකයෙක්, විශේෂයෙන් පක්ෂ, පාට භේදයෙන්, ජාති, ආගම් භේදයෙන් තොරව මේ රටේ සියලුදෙනා පිළිගන්නා නායකයෙක් මේ වන කොට ඉන්නවාය කියන එක ඒ කථාවෙන් අපට පැහැදිලි වෙනවා. ඒ නිසා අපි ඒ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ ප්‍රකාශය කිරීම සම්බන්ධයෙන්.

නිවාස සම්බන්ධයෙන් කථා කරමින් ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා, සජිත් ප්‍රේමදාස මැතිතුමා ලංකාව පුරා නිවාස ව්‍යාපෘති කරගෙන යනවා කියලා. එසේ කීම සම්බන්ධයෙනුත් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් දේශපාලන භේදයෙන් තොරව සජිත් ප්‍රේමදාස මැතිතුමා සම්බන්ධයෙන් කතා කරාවි කියලා. එතුමා කළ දෙයක් සම්බන්ධ වරදක් තිබෙනවා කියලා පෙන්නුවොත්, ඒ ගැන විවෘතව සොයා බලා, ඇත්තටම වරදක් වෙලා තිබෙනවා නම් එය අවබෝධ කරගෙන, ඒ පිළිබඳව අප සමඟ කථා කරන්න මැළි වන පුද්ගලයෙක් නොවෙයි, එතුමා.

ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කළ නිසාම ඔබතුමා සම්බන්ධයෙනුත් කිව යුතු දෙයක් තිබෙනවා. ඔබතුමා පටන් ගත්තා, සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම. එහි සභාපතිවරයා කපිල ද සිල්වා මහතායි. එය පෞද්ගලික සමාගමක්. එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ 5දෙනෙක් ඉන්නවා. බන්දුල විතානච්චි මහත්මයා තමයි, එහි කළමනාකාර අධ්‍යක්ෂ. එතුමා ඔබතුමාගේම පෞද්ගලික ලේකම්වරයායි. මම දන්නේ නැහැ, ඒක හරිද කියලා. මම වැරැදියි නම් නිවැරැදි කරන්න. උදාහරණයට, ඩබ්ලිව්.ඒ. රණවීර, Working Director, CCF. ඒ සමාගමට සේවකයන් තුන්සිය ගණනක් බඳවාගෙන තිබෙනවා. ඒ සේවකයකු සඳහා රුපියල් 1,200ක් බැගින් ගෙවා තිබෙනවා. හැබැයි, ඒ මුදලින් සේවකයාට ගිහින් තිබෙන්නේ රුපියල් 700යි. රුපියල් 500ක් ඒ සේවකයන්ට නොලැබුණු වග තමයි මට ලැබුණු තොරතුරුවල තිබෙන්නේ. මම වැරැදි ද දන්නේ නැහැ. මා වැරැදි නම් ඔබතුමා නිවැරැදි කරන්න, ගරු මන්ත්‍රීතුමනි. එහි විගණනය සම්බන්ධයෙන් ඔබතුමාට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. විගණකාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් විගණනයක් කර තිබෙනවා. එහිදී, විගණන නීති රීතිවලට තනිකරම පටහැනිව ක්‍රියා කර ඇති බව සඳහන් කරමින්, එතුමා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම, මේ සම්බන්ධයෙන් තමයි සීඅයිඩී එකෙන් හෝ වෙනත් ආයතනයකින් පරීක්ෂණයක් හෝ පැවැත්විය යුත්තේ. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මම මේ වාර්තාව ඔබතුමාට ඉදිරිපත් කරනවා. එහි සඳහන් කරුණුවල වැරැද්දක් තිබෙනවා නම් එය නිවැරදි කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ - Auditor-General's Department එකේ - ඒ විගණන වාර්තාව මම ඔබතුමාට යොමු කරනවා. මුලින්ම මේ වාර්තාවේ, "සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම, සමාගම පිහිටුවීමේ අරමුණ...." යනාදී වශයෙන් සඳහන් වෙනවා. උදාහරණයට, "වැඩ නොමැතිව, අතිරික්තව සිටින සේවක සංඛ්‍යාව හා වැඩ නොමැතිකමින් පසෙකට දමා තිබෙන යන්ත්‍ර සූත්‍ර ආදියෙන් ප්‍රයෝජන ගැනීමේ අරමුණ සහ දැනට මහා භාණ්ඩාගාරයේ ඇති බර යම් ප්‍රමාණයකින් අඩු කිරීමේ අරමුණ...." කියලා විස්තර සඳහන් වෙනවා. නමුත්, ඒ අරමුණු තුනම එම සමාගමෙන් ඉටු වෙලා නැහැ. අපි නොවෙයි, විගණකාධිපති දෙපාර්තමේන්තුව තමයි මේවා කියන්නේ. "...මධ්‍යම සංස්කෘතික අරමුදලේ කිසිදු සේවකයෙක් මෙම සමාගමේ කටයුතු නොකරන අතර, ඔවුන් වෙනුවෙන් මාසික වැටුපක්ද මෙම සමාගම නොගෙවයි.... " කියාත් එම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු සභානායකතුමනි, මට තව විනාඩි 3ක් පමණ ලබා දෙන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු සුජීව සේනසිංහ ඇමතිතුමාට තව විනාඩි 10ක කාලයක් දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Thank you, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයට ඒ වාර්තාවේ සඳහන් වෙනවා, "මධ්‍යම සංස්කෘතික අරමුදලේ යන්ත්‍ර සූත්‍ර ප්‍රයෝජනයට ගත් බවට තොරතුරු අනාවරණය නොවිණි. මේ අනුව මූලිකව සමාගම් පිහිටුවීමේ අරමුණින් ඉවත් වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය වේ...." කියලා.

ගරු සභානායකතුමනි, අවුරුදු ගණනක අත්දැකීම් තිබෙන මන්ත්‍රීවරයකු වශයෙන්, ඇමතිවරයකු වශයෙන් ඔබතුමා ඇහුවා, විගණනයකින් තොරව මේ වාගේ චෝදනාවක් අපේ ඇමතිතුමාට ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා. මේ යෝජනාව විගණනයකින් පසුව ඉදිරිපත් වුණා නම්, ඇත්තටම අපට මේ ගැන කථා කරන්න අරමුණක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම විගණන වාර්තාවේ තවදුරටත් සඳහන් වෙනවා, "සංස්කෘතික අරමුදල විසින් ක්‍රියාත්මක කරන නෙදර්ලන්ත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් 40කට ආසන්න ප්‍රමාණයක් මෙම සමාගම වෙත පිරිනමා තිබුණි. 2009 නොවැම්බර් 30 දින වන විට කොන්ත්‍රාත් 28ක කටයුතු නිම වී තිබූ අතර, ඇස්තමේන්තු පිරිවැය මිලියන 32කි. මෙහිදී විගණනය විසින් පහත නිරීක්ෂණය කෙරේ. සමාගම වෙත පිරිනමනු ලැබූ

සියලු කොන්ත්‍රාත් කිසිදු මිල කැඳවීමකින් තොරව ඊට පවරා තිබීම නිසා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරවීම්වලට අදාළ විස්තර පහත දැක්වේ." කියලා.

ඔබතුමා මේක කොහොමද කළේ? මම නොවෙයි, විගණන දෙපාර්තමේන්තුවයි මේවා කියන්නේ. ප්‍රසම්පාදන ක්‍රමයෙන් බැහැර වී, නීති විරෝධී ලෙස එම සමාගමට කොන්ත්‍රාත් ලබා දීම තුළින් රටට වූ පාඩුව සහ නීතිය කඩ කිරීම සම්බන්ධයෙන් වූ තොරතුරු විගණකාධිපතිතුමා එකින් එකට, ඉතා පැහැදිලිව ඒ වාර්තාවේ සඳහන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, "ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ICTAD ආයතනයේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් කැඳවීම ඇහිරී යාම....." යනාදී වශයෙන් කාරණා කීපයක් එම වාර්තාවේ සඳහන් වෙනවා. ඒ අවස්ථාව ලබා දීලා නැහැ. "...එසේම, රුපියල් මිලියන 5කට වැඩි කොන්ත්‍රාත් සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා රුපියල් මිලියන 3කට වැඩි කොන්ත්‍රාත් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු හරහා ඉදිකිරීම් සිදු නොවීම.... " කියන කාරණයත් එහි සඳහන් කර තිබෙනවා. ඒවා නීති විරෝධී කටයුතු. මේවා අමාත්‍යාංශ විසින් පිළිපැදිය යුතු කාරණා. අමාත්‍යවරු වශයෙන් අපි අනිවාර්යයෙන්ම මේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව කටයුතු කළ යුතුයි. හැබැයි, මේ පිළිබඳව විගණකාධිපතිතුමාගේ වාර්තාවක් තිබියදී, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැතිව, කිසිදු විගණන වාර්තාවක්, COPE වාර්තාවක්, PAC වාර්තාවක් හෝ නොමැතිව අද මේ යෝජනාව ඉදිරිපත් කිරීම අසාධාරණයි කියන එක තමයි මගේ හැඟීම, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි.

ඊළඟට, විගණකාධිපතිතුමාගේ වාර්තාවේ සඳහන් මෙන්න මේ කාරණය කෙරෙහිත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒක තමයි, "නෙදර්ලන්ත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් මෙහි තිබෙන සමාගම වෙත සෘජුවම පැවරීම නිසා, ඉහත අවශ්‍යතාවලින් බැහැර වී ඇති බව පෙනී යන අතර,..." කියන කාරණය. එතකොට, මේ අරමුණු සියල්ලම -සමාගම පිහිටුවීමේ අරමුණු සියල්ලම- බැහැර කර තිබෙනවා. මේකෙන් පෙනී යන්නේ, හොර සමාගමක් පිහිටුවලා, [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා දේශපාලනයෙන් තොරව හැම තැනකදීම සාධාරණය වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරයකු බව මම දන්නවා. මම ඔබතුමාත් එක්ක කොච්චර විවාද කළත්, ඔබතුමාට ගරු කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාටත් මම එහෙමයි සලකන්නේ. ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් සලකා බලන්න, වැරැද්දක් තිබෙනවා නම් අනෙකුත් කථිකයන් ඒවා ඉදිරිපත් කරයි. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා වියදම් කළ මුදල් ප්‍රමාණය පිළිබඳ සියලු විස්තර ඇතුළත් ගිණුම් මා ළඟ තිබෙනවා. ඒවා අපේ සියලු නායක ස්වාමීන්වහන්සේලා පිළිගනීවි. සියලු පුණ්‍ය භූමි සඳහා, දේවස්ථාන සඳහා වියදම් කළ මුදල් ප්‍රමාණ ඉතා පැහැදිලිව එකින් එකට, රුපියලෙන් රුපියලට පෙන්වන්න පුළුවන් ගිණුම් අපි ළඟ තිබෙනවා. අනෙක් මන්ත්‍රීවරු ඒ කරුණු ඉදිරිපත් කරයි. එම ගිණුම් පිළිබඳ විස්තර ඇතුළත් පොතක් මා ළඟ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලු අවසර ඇතිව ඉදිරිපත් කර තිබෙන ගිණුම් සම්බන්ධයෙන් වන එම පොත මම **සභාගත*** කරනවා. එතුමා කර තිබෙන මුදල් ගනු දෙනු මොනවාද කියලා මේ පොතෙන් බලාගන්න පුළුවන්.

ඔබතුමන්ලා දන්නවා, කමිටුව රැස්වෙලා නැත්නම්, ඒ කමිටුවේ අවසරය ඇතිව, එහෙම නැත්නම් අවසරය ලැබෙන තෙක්, අපට ඒකට මුදල් "පාස්" කර ගන්න පුළුවන් බව. පුණ්‍ය කටයුත්තක් සඳහා, ඉදිකිරීම් සඳහා අපට මුදල් වියදම් කරන්න අවශ්‍ය නම්, එම කමිටුවේ අනුමැතිය ලබා ගන්නා තෙක් මුදල් ලබා ගන්න පුළුවන්. ඒක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. හැබැයි, ඒ සඳහා වන අනුමැතිය පසුව ලබා ගන්නට ඕනෑ. එහෙම වුණාය කියලා අපට වැඩ නවත්වන්න බැහැ.

අපි පිරිසිදුව වැඩ කරනවා නම්, කමිටුව රැස් වුණේ නැහැ කියලා අපට අමාත්‍යාංශයක වැඩ නවත්වන්න බැහැ. අපි ඒ කාර්ය භාරය අනිවාර්යයෙන්ම ඉටු කරන්න ඕනෑ. හැබැයි, එවැනි පිරිසිදු ආකාරයෙන් වැඩ කිරීමක් විගණකාධිපතිතුමාගේ මේ වාර්තාව අනුව අපි මෙතැනදී දකින්නේ නැහැ. එහි සඳහන් වෙනවා, "ප්‍රසම්පාදන සංග්‍රහයේ සියලු ප්‍රතිපාදන බැහැර වීම නිසා, අමාත්‍යාංශය යටතේ පිහිටු වූ සමාගම ප්‍රසම්පාදන සංග්‍රහයට විකල්ප ආදේශය විගණනයේදී මත භේදයට තුඩු දී ඇත" කියලා. මම මේ ගැන ඔබතුමාගෙන් අහනවා, ටී.බී. ඒකනායක මැතිතුමනි. මම වැරදි නම් කියන්න. සමහර විට මම වැරැදි වෙන්න පුළුවන්. මට ලැබුණු ලැයිස්තුවකින් තමයි මේ කරුණු ඉදිරිපත් කරන්නේ, ටී.බී ඒකනායක මැතිතුමනි. මා හිතන විධියට ඔබතුමාගේ පෞද්ගලික ලේකම්, බන්දුල විතානාච්චි මහතා මේ පෞද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ. මම ඒක හරියටම දන්නේ නැහැ. මම වැරැදි වෙන්න පුළුවන්. මම වැරැදි නම් ඔබතුමා මට සමාව දෙන්න ඕනෑ. මම හරි නම්, ඔබතුමා මගෙන් සමාව ගන්න ඕනෑ. පෞද්ගලික ලේකම්වරයෙක් මෙවැනි පෞද්ගලික සමාගමකට යොදා ගැනීම නුසුදුසුයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කිරීමට මා අවස්ථාව ලබා දෙනවා. මොකද, ඔබතුමාට ඒකපාර්ශ්විකව මේ චෝදනාව ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙන්නේ නැති නිසා. පිළිතුරු දීම සඳහා ඔබතුමාට වේලාව ලබා දෙන්න කියලාත් මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මෙම සමාගම මඟින් විශාල වශයෙන් අත්තනෝමතික ලෙස, සියලු නීති-රීති උල්ලංඝනය කරමින් කටයුතු කරලා තිබෙනවා. ප්‍රසම්පාදන ක්‍රමයකින් තොරව, කිසිම මිල කැඳවීමකින් තොරව තමයි මේ ගනුදෙනු සියල්ල සිදු වී තිබෙන්නේ. අඩුම ගණනේ මිල කැඳවීමකින්වත් තොරව තමයි මේ ගනුදෙනු සියල්ල මෙම සමාගමට ලබා දීලා තිබෙන්නේ. ඔබතුමා අද මේ යෝජනාව ඉදිරිපත් කළ නිසායි මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ. එහෙම නැත්නම් මම ඔබතුමාට විරුද්ධව මෙය ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. මම ඉතාම සාධාරණ ලෙස ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ඔබතුමාට මේ ලියකියවිලි සියල්ල භාර දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන්නේ මේ දේ පමණයි. සජිත් ප්‍රේමදාස මැතිතුමා දේශපාලන වශයෙන් මම සෑහෙන කාලයක සිට දන්නවා. එතුමා පැය විසිහතරම මහන්සි වෙලා කටයුතු කරනවා. සමහර වේලාවට එතුමා උදේ 5.30ට, 6.00ට call කරලා අපෙන් අහනවා, "ගම් උදාව ගෙවල් ටික බැලුවාද, ඒවාට අවසර පත්‍ර ගත්තාද?" කියලා. එතුමා මහන්සි වෙමින් තමන්ගේ ජීවිතයම දේශපාලනය වෙනුවෙන් කැප කරනවා. මම හිතන විධියට එතුමාගේ පියාටත් වැඩිය පොදු ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් එතුමා කටයුතු කරනවා.

එතුමා රැකියා දුන්නා කියලා එතුමාට මඩක් ගහලා තිබෙනවා මම දැක්කා. මම හිතන විධියට එතුමාට ගහන්න පුළුවන් මඩ එච්චරයි. එතුමා සාමාන්‍ය නිවාඩු දවසක කොට කලිසමක් ඇඳගෙන -අනෙක් මන්ත්‍රීවරු සාජ්ජයක් දමලා මොනවා හෝ කරන වේලාවක - රැකියා දීමට කටයුතු කරනවා. මම දැක්කේ එච්චරයි. එතුමා එතුමාගේ ප්‍රදේශයේ ජනතාවට රැකියා ලබා දෙනවා. එතුමා එතුමාගේ නිවාඩු කාලයත් පුළුවන් තරම් මහන්සි වෙන්නේ ජනතාව වෙනුවෙන් වැය කරන්නයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුජීව සේනසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මේ කරුණ කිව්වේ එතුමාට මඩ ගහලා තිබෙන්නේ අවස්ථා එකක, දෙකක පමණක් නිසායි. මම මෙතුමා ඉහළින් තියන්න කථා කරනවා නොවෙයි. මෙතුමා ඉදිරි අනාගතයේ තවදුරටත් මහන්සි වෙලා මේ කාර්ය භාරය කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා. ඉදිරි අනාගතයේ මෙතුමාට බලතල වැඩිවෙත්ම, වගකීම් වැඩිවෙත්ම තවත් මහන්සි වී වැඩ කිරීමට හැකි වන පරිදි එතුමා වටා පිරිසිදු තරුණ නායකයන් පිරිසක් පක්ෂ, පාට භේදයෙන් තොරව එකතු වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. රටේ ඉදිරි ගමන වෙනුවෙන් ජනතාව බලාපොරොත්තු වෙන්නේ ඒකයි. ප්‍රතිපත්ති ගරුක නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, දිශාවක් නැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියලා ජනතාව අපට හූහක් වේලාවට මැසිවිලි නඟනවා. එම නිසා, අපි ජනතාවට ආදර්ශයක් වෙන්න ඕනෑ. එහෙම මන්ත්‍රීවරු සුළු සංඛ්‍යාවක්, එහෙම නැත්නම් යම් ප්‍රමාණයක් ඇති. අපි යම් ප්‍රතිපත්තියක් අනුව ප්‍රතිපත්ති ගරුක දේශපාලනයක් කරනවාය කියන පණිවුඩය ඒ අයට දෙන්න කැමැතියි. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, සජිත් ප්‍රේමදාස මැතිතුමා අනාගතයේදී මේ රටේ විශාල විපර්යාසයක්, ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරයි කියලා. පිරිසිදු, වැඩ කළ හැකි, වැඩ කිරීමට වුවමනාව තිබෙන, ඒ වාගේම ඉදිරි අනාගතයේ වැඩ කරන්න බලාපොරොත්තුවෙන් ඉන්න, දූෂණයෙන් තොරව, විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කළ හැකි විස්සක, තිහක කණ්ඩායමක්, පාක්ෂ, පාට භේදයෙන් තොරව එකතු වුණොත් හොඳයි. අපි වාසුදේව නානායක්කාර මැතිතුමාටත් ආරාධනා කරනවා. ඔබතුමාත් අපි අගය කරන දේශපාලනඥයෙක්. මොන වෙනස්කම් තිබුණත්, ඔබතුමා මට බැන්නාත්, අපි ඔබතුමාගේ සමහර කාර්ය පටිපාටි අනුගමනය කරනවා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාත් එහෙමයි. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ වරදක් තිබෙනවා නම්, අපට ඒක ලියලා දෙන්න කියලායි. අපි ඒ ගැන අනිවාර්යයෙන්ම එතුමාගෙන් විමසනවා; නොවරදවාම අපි එතුමාගෙන් විමසනවා. මේ රටේ බිහි වූ දක්ෂම නායකයෙක්, ජනාධිපතිවරයකු බවට පත් වීමට අවශ්‍ය සියලු ගුණාංග සජිත් ප්‍රේමදාස මැතිතුමාට තිබෙනවාය කියා මා විශ්වාස කරනවා. ඒ අනුව එතුමාට අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ, අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ගේ, අපේ පක්ෂයේ සියලුදෙනාගේ ආශිර්වාදය මත, විරුද්ධ පක්ෂයේ වාසුදේව නානායක්කාර මැතිතුමා වැනි ප්‍රවීණයන්ගේ ආශිර්වාදය මත රටට සේවය කිරීමට වාසනාව, ධෛර්ය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ පැහැදිලි කිරීමේදී සමාගමක් පිහිටුවීම පිළිබඳව කිව්වා. ඒ කාලයේ cadre එකක් තිබුණේ නැහැ. Cadre එකක් නොමැති අවස්ථාවකදී විශේෂයෙන් ශ්‍රම පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට බලයක් තිබෙනවා. ශ්‍රම පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය අනුව තමයි ඒ කටයුතු කළේ. හැබැයි, පසුගිය කාලයේ cadre එකක් නැතුව බඳවා ගත්තා. අපි එහෙම බඳවා ගත්තේ නැහැ. අපි කළේ, කැබිනට් පත්‍රිකාවකට අනුව ශ්‍රම පදනමින් බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කරමින් ඒ සේවකයන් බඳවාගෙන අවශ්‍ය වැඩබිම්වලට යොමු කිරීමයි. නමුත්, මේ රජය අපි ඒ වැඩබිම්වලට යොමු කළ සියලු දෙනා අයින් කළා; සේවයෙන් පහ කළා. එමනිසා ඒ ගොල්ලෝ අධිකරණයට ගියා. අධිකරණයෙන් තීන්දු කළා, එලෙස සේවයෙන් පහ කිරීම නීති විරෝධියි කියලා. ඒ නිසා මේ පිළිබඳව - [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva – Non-Cabinet Minister of Economic Reforms and Public Distribution)

ඕනෑ, ඕනෑ විධියට සේවකයන් බඳවා ගන්න බැහැ.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

පටිපාටියක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

පටිපාටියේ කොහේද එහෙම තිබෙන්නේ?

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

මම පැහැදිලි කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ප්‍රශ්නයක් තමයි ඇහුවේ. - [බාධා කිරීම්] විෂය භාර ඇමතිතුමාගෙන් අපි ප්‍රශ්නයක් ඇහුවේ. මේ පාලක මණ්ඩලයේ අවසරයක් නැතුව - [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

සේවකයන් බඳවා ගන්න එහෙම බැහැ.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

පාලක මණ්ඩලයේ අවසරයක් නැතුව බඳවා ගැනීම් කරන්න පුළුවන්ද? පාලක මණ්ඩලයේ අවසරයක් නැතුව මුදල් වෙන් කරන්න පුළුවන්ද? අපි ඇහුවේ, ඒ ප්‍රශ්න දෙක. ඒ ප්‍රශ්න දෙකට අපට උත්තර දෙන්න. 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත - [බාධා කිරීමක්]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිටපු සංස්කෘතික ඇමති ගරු ටී.බී. ඒකනායක මැතිතුමා කිව්වා, cadre එකක් තිබුණේ නැහැ කියලා. මම අහන කෙටි ප්‍රශ්නය මෙකයි. රුපියල් 1,200 ගණනේ ගෙවනවා කියලා cadre එකට පිටින් මැන්පවර් ආයතනයට බඳවා ගත්ත සේවකයන්ට රුපියල් හත්සිය ගණනයි ගෙව්වේ. කෝ ඒ ඉතුරු රුපියල් 500?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයට මම මේ කාරණයත් එකතු කරනවා.

ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා කියන්න උත්සාහ කරනවා, cadre එකක් නැති නිසා පිටින් පෞද්ගලිකව සේවකයන් අරගෙන,

රුපියල් දාහක් ආණ්ඩුවෙන් අරගෙන, පන්සියයක් ඒ පුද්ගලයන්ට ගෙව්වා කියලා. එහෙම කරන්න හැකියාවක් නැහැ. Cadre එකක් නැත්නම් Management Services Department එකට ගිහිල්ලා කියන්න ඕනෑ, "අපට cadre එක නැහැ. කරුණාකරලා cadre එක හදලා දෙන්න" කියලා. ඔබතුමා හිටපු ඇමතිවරයෙක්. ඇමතිවරයකු හැටියට ඔබතුමා ඒ ගැන දැන ගන්න ඕනෑ. ඔබතුමා අද ඇවිල්ලා මෙහෙම "බබා උක්කුං" කථා කියන්න එපා. [බාධා කිරීමක්]

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, cadre එක නැති නිසා සේවකයන් බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශයේ කැබිනට් පත්‍රිකාවෙන් අවසර දුන්නා. ඒ අනුව තමයි බඳවා ගැනීම කළේ. මෙම සමාගමට සේවයකන් බඳවා ගැනීම පිළිබඳව පසුගිය කාලයේ FCID එකට ගියා. නමුත්, ඒ පරීක්ෂණවලදී පැහැදිලි වුණා ඒ ක්‍රමය නිවැරදියි කියලා. මුදල් අය කිරීම පිළිබඳව අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා කියපු කාරණය පිළිබඳවත් ඉදිරිපත් වූ පෙත්සම් අනුව CID, FCID පරීක්ෂණ පැවැත්වුවා. ඒ පරීක්ෂණවලදීත් එය නිවැරදියි කියා පැහැදිලි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොච්චර වෙලාවක් වෙන් වී තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විනාඩි 17ක් තිබෙනවා.

[අ.භා.3.29]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, එතුමා නැවත නැවත කිව්වා, "අලුත් දියසේන කුමාරයෙක් මේ රටට බිහි වෙන්න යනවා. ඒ දියසේන කුමාරයාගේ පරිවාර සේනාවේ වැඩ කරන්න එතුමා දැනටමත් තීන්දු කර තිබෙනවා, අපටත් එන්න" කියලා. කොහොම හරි දැන් මේ විවාදය කෙරෙන්නේ සංස්කෘතික අරමුදල ගැන නොවෙයි. මේ විවාදය යන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වය ගැන. සජිත් ප්‍රේමදාස මහතා එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වනවා නම්, ඒ ජනාධිපතිවරණයේදී මම එතුමාට විරුද්ධ වනවා. නමුත් ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමනි, මම නම් මගේ සුබ පැතුම් එකතු කරනවා ඔබතුමාට එක්සත් ජාතික පක්ෂයෙන් ඒ අපේක්ෂකත්වය ලැබෙන්න කියලා. එතකොට අපට තරග කරන්න වෙන්නෙත්, සටන් කරන්න වෙන්නෙත් අලුත් විධියේ ප්‍රතිවාදියෙක් එක්ක. මට හිතෙනවා, ඒ ප්‍රතිවාදියා එක්ක කරන සටනේදී අපට වඩාත් ලොකු හයියක් ලැබෙයි කියලා අපේ ජයග්‍රහණය ලබා ගන්න. මම එහෙම හිතනවා. ඒ මම හිතන දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංස්කෘතික අරමුදලේ ප්‍රශ්නය ගැන අපි දැන් කථා කරමු. මේ අරමුදලේ කමිටුව රැස්වෙන්නේ නැත්නම් ගරු සුජීව සේනසිංහ මැතිතුමා කිව්වා, ඒ සංස්කෘතික අරමුදල් මණ්ඩලයේ තීරණයට යටත්ව ආවරණ අනුමැතිය ඇතිව වියදම් කිරීම් කරන්න පුළුවන් කියලා. නමුත්, එහෙම එක් වරක් හෝ දෙවරක්ව වියදම් කරන්න පුළුවන්. එහෙම නැතුව දිගටම ආවරණ අනුමැතිය අනුව වියදම් කරන්න බැහැ. ඒක විගණකාධිපතිතුමා අනුමත කරන්නේ නැහැ. මේ මණ්ඩල තියෙන්නේ නිකම් නොවෙයි. මේ මණ්ඩල තියෙන්නේ යම් වගකීමක්, සාමූහිකව කරන යම් සාකච්ඡාවකින් පසුව තීන්දු තීරණ ගන්නයි. ඒ නිසා ආවරණ අනුමැතියට යටත්ව දිගටම කරගෙන යන්න බැහැ. මම දන්නේ නැහැ, කීවරක් මේ කමිටුව රැස් වුණාද කියලා. මට ආරංචිය හැටියට මේ අවුරුද්දේම දෙවතාවයි රැස්වෙලා තියෙන්නේ. මේ මුදල්, සංස්කෘතික අරමුදල වියදම් කරන්න ඕනෑ නම්, ඒ කමිටුව රැස් වෙන්න ඕනෑ. ඇයි, මේ කමිටුවේ ඉන්න අයට රැස්වෙන්න බැරි කමක් තිබෙනවාද? එහෙම නැත්නම් මේ කමිටුව රැස්කරවීම ගැන ඇමතිතුමා අවශ්‍ය උනන්දු කරවීම කරලා නැද්ද? ඇමතිතුමා මේ කමිටුවේ ඉන්න උදවියට "එක්කෝ අස්වෙලා යන්න, නැත්නම් රැස්වෙන්න" කිව්වාද? මේ කමිටුවේ සභාපති කවුද? එතුමාටයි මේ කැඳවීම කරන අධිකාරය තියෙන්නේ. ආණ්ඩු පක්ෂයෙන් මට උත්තරයක් නම් ලැබුණේ නැහැ, මේ කමිටුවේ සභාපති කවුද කියලා.[බාධා කිරීමක්] ගරු අගමැතිතුමා? [බාධා කිරීමක්] කමිටුවේ සභාපති එතුමා නම්, කමිටුව කැඳවන එක එතුමාගේ වගකීමක්. ඇමතිතුමාගේ වගකීමක් තමයි මේ කමිටුව කැඳවන්න කියලා එතුමාට කියන එක. එහෙම කියලාත් කැඳෙව්වේ නැද්ද කියලා අහන්න මම කැමැතියි. ඔබතුමා කැඳවන්න කිව්වත් සභාපතිතුමා හැටියට අගමැතිතුමා ඒ කැඳවීම කළේ නැද්ද? මේ කමිටුව නිසා ඔබතුමා මොන වාගේ අමාරු තැනකට පත් වුණාද කියන්න අපි දන්නේ නැහැ. අපි හිතන්නේ ඒ තිබෙන ධුරාවලිය අනුව කමිටුව ගැන ඇමතිතුමාටයි බලය තිබෙන්නේ කියලා. ඉතින්, මේ කමිටුවේ සාකච්ඡා කරලා ඒ වියපැහැදම් තීන්දු නොකිරීම වරදක්. ඒක පළමුවෙනි වරද හැටියට මම පෙන්වන්න කැමැතියි. අයථා පරිදි වැය කළා ද නැද්ද කියන කාරණය - තමුන්නාන්සේලා කිව්වා වාගේ,- විගණකාධිපතිවරයා හෝ අභ්‍යන්තර විගණන අංශයෙන් සොයා දැනගත යුතු කාරණයක්. අපට පුළුවන් අපි ළඟ තිබෙන තොරතුරු ඒ තැන්වලට යවලා ඒ ගැන පරීක්ෂණ කරන්න කියන්න. අමාත්‍යාංශය නම් අපේ පරීක්ෂණයට රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියට එනවා. රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියේ සංස්කෘතික කටයුතු, නිවාස යන සියල්ලම ඇතුළත් අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරනකොට, අපේ වැඩි කාලය යන්නේ නිවාස සංවර්ධන අධිකාරිය ගැන කථා කරන්න. එහෙම නැත්නම් ඔබතුමා යටතේ තියෙන විවිධ ආයතන හා සංස්ථා ගැන කථා කරන්න. ඒ අනුව තමයි අපට අහන්න සිද්ධ වෙන්නේ අර නිවාස සංවර්ධන අධිකාරියේ සමුපකාර සුබසාධන සමිතියේ සාමාජිකයන්ගේ වැටුප්වලින් කපා ගත් මුදල් ගැන. මම මේ කියාගෙන යන්නේ සංස්කෘතික අරමුදලේ ප්‍රශ්නය එක්තරා විධියකට පැහැදිලි කරන්නයි. ඒ මුදල් කපා ගත්තාට, සංස්ථාව ඒක ඒ අරමුදලට බැර කරලා නැහැ; හර කරලා නැහැ. එතකොට සේවකයන්ගේ මුදල් සංස්ථාව වැය කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු මන්ත්‍රීතුමනි, මම නිවැරදි කිරීමක් කරන්නම්. ඔබතුමා කිව්වා, නිවාස සංවර්ධන අධිකාරියේ කියලා. ඔබතුමා සඳහන් කරන්නේ රාජ්‍ය ඉංජිනේරු-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මට ඇහෙන්නේ නැහැ. ඔබතුමා ටිකක් හයියෙන් කියනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා සඳහන් කළා, නිවාස සංවර්ධන අධිකාරියේ සමුපකාර සමිතිය කියලා. එය නිවැරදි කරන්න ඕනෑ. ඒක රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සමාවෙන්න. ඔබතුමා නිවැරදියි. මම කිව්වේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කථා කරගෙන යනකොට ඒවාට තමයි අපි වඩාත් අවධානය යොමු කරන්නේ කියන කාරණය. ඔබතුමා යටතේ තියෙන යම් යම් ආයතනවල යම් යම් අඩුපාඩුකම්, කැපී පෙනෙන අඩුපාඩුකම්, එහෙම නැත්නම් තිබුණා වූ බරපතළ දෝෂ මතු කරලා පෙන්වන්නයි හදන්නේ. මොකද, මේක බරපතළ කාරණයක් නිසා. අනුන්ගේ මුදල් අරගෙන තවත් කෙනෙකුට වියදම් කරන්න බැහැ. සංස්ථාවත් juristic person කෙනෙක්; සංස්ථාවත් පුද්ගලයෙක්; මේ සියලු සේවකයන්ද පුද්ගලයෝ. සේවකයා කියන පුද්ගලයාගේ මුදල් කපාගෙන සංස්ථාව කියන පුද්ගලයාට වියදම් කරන්න බලයක් නැහැ. ඒක ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ සිද්ධ වෙලා තිබෙන නිසා තමයි අපට ඒක රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන්න වෙන්නේ. මට ආරංචිය හැටියට ඒකෙන් කොටහක් ගෙවලා තියෙනවා. මිලියන 80ක විතර මුදලක් එකතු වෙන්න ඕනෑ. ඒවායේ පොලියත් එකතු වෙන්න ඕනෑ. මේවා සියල්ල ගණන් බලලා නිසියාකාරව ඒ සුබසාධන සමුපකාර සමිතියට ලබාදෙන්න ක්‍රියා කළොත් අමාත්‍යාංශයේ ඔබතුමාගේ නායකත්වය ගැන අපට ප්‍රශංසා කළ හැකියි.

ඔබතුමා ජනාධිපති අපේක්ෂකයා හැටියට එන්න ඉන්නවා නම්, ඔබතුමා කළ යුතු පළමුවැනි කාර්යය තමයි මේවා නිදොස් කරන එක. මේවා නිදොස් කරලා, මේවා නියාමනය - regularize - කරලා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන හැම ආයතනයකම මේ කියන කාරණා හරියාකාරව, පිරිසිදුව, සහසුද්දෙන් ක්‍රියාත්මක කරන්න ඔබතුමාට පුළුවනි. එතකොට අපට කියන්න පුළුවන්, "අන්න, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා කම්කරුවන්ගෙන් කපා ගත් සල්ලි සංස්ථාවට වියදම් කරන්න දීලා නැහැ" කියලා. සංස්ථාව වියදම් කරපු සල්ලි කම්කරුවන්ගෙන් කපාගෙන නම්, ඒක එක්තරා විධියට සාපරාධී චෝදනාවකට ලක් විය හැකි වරදක්. නමුත් මම දන්නේ නැහැ, මේවා ගැන සාපරාධී චෝදනා ඉදිරිපත් නොවන්නේ ඇයි කියලා. අපේ ඇමතිතුමාට සාපරාධී චෝදනාවක් කළ හැකියි කියලා මා කියනවා නොවෙයි. මම කියන්නේ, සංස්ථාවට, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාපරාධී චෝදනාවක් කළ හැකියි, අනුන්ගේ සල්ලි අරගෙන වියදම් කර ගත්තාම. සංස්ථාවක් කියන්නේත් පුද්ගලයෙක්; නෛතික පුද්ගලයෙක්. ඒ නිසා මම ඔබතුමාට කියන්නේ, ඔබතුමා ජනාධිපති අපේක්ෂකයා වෙන්න බලාපොරොත්තු වෙනවා නම්, විශේෂයෙන්ම ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මැතිතුමනි, ඔය ප්‍රශ්නය මගේ කාල වකවානුවේදී පමණක් උද්ගත වූ ප්‍රශ්නයක් නොවෙයි කියන එක සඳහන් කරන්නට ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, දිගටම ආපු ප්‍රශ්නයක්. ඒක පිළිගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක කාලයක් පුරාම ආපු ප්‍රශ්නයක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, ඒක මම පිළිගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ වාගේම ඔබතුමා දන්නවා, මේවා සියල්ලම ගණන් මිනුම් බලනකොට, cumulatively බලන්නේ. අවසාන වශයෙන් පෙර කරපු වරද ඊට පසුව තමන් අතට භාර ගත්තොත්, ඒ භාර ගත් වරද තමන්ගේ වගකීම බවට පත් වෙනවා. මම මේ කියන්නේ ඒ වරද ආරම්භ වෙච්ච කාලයේ ඉඳලා වග කිව යුත්තන්ට විරුද්ධව සාපරාධී චෝදනා දැමිය හැකි බවයි; එහෙම නැතුව ඒ ඔක්කෝම ඔබතුමාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට දැමිය හැකියි කියලා නොවෙයි. නමුත් ඒවා කෙරිලා නැති බවයි මම මේ කියන්නේ.

මෙම අරමුදලේ මුදල් දහම් පාසැල්, ඒ වාගේම විහාරස්ථාන, කෝවිල්, පල්ලිවලට ඔබතුමා දීලා තිබෙනවා, ඒ ආයතන දියුණු කරන්න. ඒක හොඳ දෙයක්, ඒක කළ යුතු දෙයක්.

මම කැමැතියි, රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන සිද්ධස්ථානයක් වන කූරගල ගැන කථා කරන්න. මුස්ලිම්වරුන් හා සිංහල-බෞද්ධ අයත් වඳින ස්ථානයක් තමයි, කූරගල. ඒ වාගේම ලොකු ආරාවුල් තිබෙන තැනක්. ඔබතුමා වෙන් කරපු මුදලින් කූරගල කරපු දියුණුව මොකක්ද කියන්න මම දන්නේ නැහැ. මම මෑත කාලයේදී ඒ සිද්ධස්ථානය බලන්න ගිහිල්ලා නැහැ. ඔබතුමා කැමති නම් ඒ ගැන යමක් කියන්න, ගරු ඇමතිතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මැතිතුමනි, කූරගල ඓතිහාසික සිද්ධස්ථානය ගොඩ නැඟීම සඳහා රුපියල් ලක්ෂ 650ක් අපි වෙන් කරලා තිබෙනවා. මේ වන විට ඒ අදාළ නිර්ණායක සහ කොන්දේසි මත ඒ පුරා විද්‍යාත්මක භූමියට විදුලිය ලබා දීම, මාර්ගය සකස් කිරීම, ජලය ලබා දීම, තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම යනාදී වශයෙන් පුළුල් වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ සියලු ජන කොට්ඨාසවල සංහිඳියාව, සහෝදරත්වය, එකමුතුභාවය සුරකිමින් අපි ඒ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඒ ගැන ඔබතුමාට දෝෂයක් කිව්වා නොවෙයි. මම කිව්වේ කූරගලට ඔබතුමා වියදම් කරලා තිබෙනවා; ඒක ආගම් දෙකක පොදු සිද්ධස්ථානයක්; ඒ අතර ආරාවුලකුත් තිබෙනවා කියායි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි. මම ගරු මැතිතුමාට කිව්වේ ඒ සියලු අයගේ සහෝදරත්වය, සංහිඳියාව, එකමුතුභාවය සුරකිමින් අපි මේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යනවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක හරි. ඔබතුමා වාගේම මාත් ඉන්නේ ඒ අදහසේ තමයි. සංහිඳියාව ඇති කරන්නත්, ආගමික එකඟතාවකට ඒ දෙපාර්ශ්වයම ගෙනෙන්නත් අවශ්‍යයි. නමුත් එතැන අසීරු තැන් කීපයක් තිබෙනවා. එහි භාරකාරත්වය පිළිබඳව තිබෙන්නා වූ විවිධ හිමිකම් පෑම් නිසා තමයි මේ ආරාවුල එන්නේ. කොහොම හරි අපි මේ ආරාවුල විසඳා ගෙන සංහිඳියාවකට යා යුතුයි කියන කාරණය මා පිළිගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු මැතිතුමනි, භාරකාරත්වය පිළිබඳව ගැටලුවක් නැහැ. අස්ගිරි පාර්ශ්වයේ මහා නායක මා හිමිපාණන් වහන්සේගේ උපදෙස් පරිදි ගලහ විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ භාරකාරත්වය තුළයි එය ක්‍රියාත්මක වෙන්නේ. ඒ භාරකාරත්වය තුළ ප්‍රශ්නයක් නැහැ. අපි හැම විටම උත්සාහ කරන්නේ ආගමික සංවර්ධන වැඩ කටයුතු බොහොම සංහිඳියාවෙන්, එකමුතුභාවයෙන් ක්‍රියාත්මක කරලා, කාටවත් අගතියක් නොවන ආකාරයට ඒ ආගමික සිද්ධස්ථානය වැඩිදියුණු කිරීමටයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම ඒ කාරණය පිළිගන්නවා. ඔබතුමා එහෙම අගතියක් කරන චේතනාවකින් කිසිවක් කළා කියලා මම කියන්නේ නැහැ. නමුත් යම් කෙනෙකුට ලබා දෙන්නා වූ අනුග්‍රහය අනික් කෙනාට අගතියක් හැටියට දැනෙනවා. ඒ විධියටයි මේ ප්‍රශ්නය එන්නේ. මම ඒ ගැන ඊට එහාට කියන්න යන්නේ නැහැ. කුරගල වාගේම අපේ රත්නපුර දිස්ත්‍රික්කය ගැනත් මම කථා කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න. මට මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

හොඳයි, කමක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම මේ කාරණය ඔබතුමාට පැහැදිලි කරන්න කැමතියි. ඒක බෞද්ධාගමික සිද්ධස්ථානයක්. ඉස්ලාමීය ප්‍රජාවත් ඉන්නවා. කුරගල ඓතිහාසික සිද්ධස්ථානය ගොඩ නඟනවා වාගේම පසුගිය දවස්වල විනාශ වූ ගම්පහ දිස්ත්‍රික්කයේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉස්ලාමීය දේවස්ථාන සියල්ලක්ම පිළිසකර කරන්නටත් අපි ආධාර උපකාර ලබා දෙනවා. අපි හැම ආගමක්ම ආරක්ෂා වන ආකාරයට මේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. බුද්ධ ශාසනයට ප්‍රමුඛත්වය ලබා දීම පිළිබඳව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවා. එලෙස බුද්ධ ශාසනයට ප්‍රමුඛත්වය ලබා දෙමින් අනිකුත් සියලු ආගම් ආරක්ෂා කරමින් අපි ඒ සියලු වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔව්, මම පිළිගන්නවා. මම අහන්නේ මේකයි. ජාති බේදවාදය, ආගම් බේදවාදය මඟින් මිනිස්සු ඇවිස්සීම වුවමනා කරන්නේ කාටද? වුවමනා කරන්නේ ජනයා අතර බෙදීම් ඇති කරන්න වුවමනා අයටයි. අපට වුවමනා වැඩ කරන පන්තිය,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමාට බාධා කරනවාට මට සමාවෙන්න. ඔබතුමා එලෙස හැසිරෙන පුද්ගලයෙක් නොවෙයි කියලා මම දන්නවා. නමුත් ඔබතුමන්ලාගේ පාර්ශ්වය කණ්ණාඩි ඉදිරිපිටට ගිහිල්ලා බැලුවොත් ඒ වාගේ හැසිරෙන්නේ කවුද කියන එක තමන්ටම පෙනෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඇමතුමනි, අඩු වැඩි වශයෙන් මිනිසුන්ගේ අදහස් උදහස්වල වෙනස්කම් තිබෙන්න පුළුවන්. පාර්ශ්වීය තත්ත්ව තිබෙන්නට පුළුවන්. ඒ වාගේම යම් ආකාරයකට හැඟීම්වලට බර වූ යම් අදහස් තිබෙන්නට පුළුවන්. අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය 1958දී, ඊට පසුව අවසාන වශයෙන් 1983දී ඇති වූ කෝලාහලයටත් මූලික වූ ජාතිභේදවාදය, ආගම් භේදවාදය ඇති කිරීමට පුරෝගාමී වූ නායකයන්ගෙන් සමන්විත වූ පක්ෂයක් බව. ඒක අපි දන්නවා. දැන් ඒක මේ පැත්තට එල්ල කරනවා නම් අපේ ඒකාබද්ධ විපක්ෂයේ කවුරු හෝ ආගම්භේදවාදය ඇති කරන්නට යනවා කියලා, එය ඔබතුමන්ලා කරුණු සහිතව ඉදිරිපත් නොකළොත් එය නිකම් වාචාල කථාවක් විතරක් වෙනවා. අපේ කවුරුවත් නැහැ, ආගම් භේදවාදී තත්ත්ව ඇති කළ. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා, රසික් ෆරීඩ් මැතිතුමා, පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමා එක්කාසු වෙලා මේ පක්ෂයට කවදාවත් -[බාධා කිරීමක්] අපේ පක්ෂය බලයේ සිටියදී තමයි ජාතිවාදය නැති කිරීමට කටයුතු කළේ. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැහැ. නැහැ.ඔබතුමාට මතක නැතිව ඇති, ජේ.ආර්.ජයවර්ධන මහතා, අපේ බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධව ඇති කරපු ඒ කෝලාහලය. ඔබතුමාට මතක නැතිව ඇති, අසූතුනේදී සිරිල් මැතිව් මහතා පාරට බැහැලා දෙමළ විරෝධී කෝලාහලය ඇති කරපු හැටි. ඒකයි මම මේ කියන්නේ. අපට ජාතිභේදවාදය වුවමනා නැත්තේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ජාතිභේද වාදයක් වුවමනා නැහැ. අපට වැඩ කරන ජනතාව එක්සත් කරන්නට ඕනෑ. අපි පසු ගිය දවසක අනුරාධපුරයේ තිබ්බා, අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සණස සමිතියේ මහා සභාව. උතුරින්, නැඟෙනහිරින් හැම පැත්තෙන්ම සිංහල දෙමළ මුස්ලිම් සේවකයන් ඇවිත් ඒ සභාව තිබ්බා. වෘත්තීය සමිති හැටියට අපට ඕනෑ, සියලු ජනයා එක්සත් කරන්නයි. අපේ පන්ති බලය තිබෙන්නේ ජාතික සමගිය උඩ. එම නිසා -[බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

සමසමාජ පක්ෂයයි, කොමියුනිස්ට් පක්ෂයයි ජාතිවාදය අරගෙන ගියේ නැහැ. නමුත් ඒ තුළ ඉඳගෙන ඔබතුමන්ලා කියන කණ්ඩායමේ අය ජාතිවාදය ඇවිස්සූ බව පිළිගන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ. බණ්ඩාරනායක මහතා ජාතිවාදයක් ඇවිස්සුවේ නැහැ. ඔබතුමා කියන ඔය කථාවට පදනමක් නැහැ. බණ්ඩාරනායක- චෙල්වනායගම් ගිවිසුමට තමුන්නාන්සේලා තමයි විරෝධය පෑවේ. ඒ විරෝධය පාලා තමයි ජාතිභේද කෝලාහලය එදා ඇවිස්සුනේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ අපට වෙච්ච පොරොන්දුවක් තිබෙනවා. ඒ ගනුදෙනුවත් මේ වෙලාවේ බේරාගෙන යන්න ඕනෑ. එතුමාගේ කාරක සභාවේ කථා කරගෙන යනකොට මම කිව්වා, "බලන්න, අපේ දිස්ත්‍රික්කයේ පවුල් හයදහස් ගණනක් බිම් අඟලක් නැතිව ඉන්නවා. රජයට අයිති ඉඩම් අක්කර පණස්දාහක් විතර කොම්පැනිවලට දීලා තිබෙනවා. ඒවා කොම්පැනිකාරයෝ බුක්ති විඳිනවා. මේ හයදහස් පන්සිය ගණනක් පවුල්වලට අපට වුවමනා ඉඩම් අක්කර 800යි. එය ලබා ගන්න බැරිව ඉන්නවා" කියලා. මෙහෙම කියා ගෙන යනකොට මම තව කාරණයක් කිව්වා, "ඔබතුමා දන්නවාද, අපේ ජිනදාස මගෙන් ලියුමක් අරගෙන ඉඩමක් ඉල්ලන්න ප්‍රාදේශීය ලේකම් ළඟට ගියා. ප්‍රාදේශීය ලේකම් කිව්වා, 'කසාද බැඳපු නැති කට්ටියට ඉඩම් දෙන්නේ නැහැ' කියලා. ඊට පස්සේ ඒ මිනිහා ගිහින් කසාදයක් බැන්දා. ඊට පස්සේ ආපසු ගිහින් ප්‍රාදේශීය ලේකම්ට ඉඩම ගැන මතක් කළාම ප්‍රාදේශීය ලේකම් කිව්වා, 'මට දෙන්න ඉඩමක් නැහැ' කියලා. ඒ මිනිහා කසාදයකුත් බැඳගෙන අන්තිමට භාර්යාවටත් එක්ක ඉඩමක් හොයන්න සිදු වුණා, තමන්ටවත් ඉඩමක් සොයා ගන්න බැරි වෙලාවේ" කියලා. ඒ වෙලාවේ ඔබතුමා නැඟිටලා කිව්වා, "මම ඒ ප්‍රශ්නය විසඳා දෙන්නම්" කියලා. ඒ අනුව මම ඔබතුමාට ලියුම් දෙකක් එව්වා. නමුත් මගේ ප්‍රශ්නය තවම විසඳිලාත් නැහැ; ලියුම්වලට උත්තරත් නැහැ. එම නිසා ඔබතුමාගේ ප්‍රකාශය -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මන්ත්‍රීතුමනි, මම අදහසක් ඉදිරිපත් කළාට කමක් නැද්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කමක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දැන් ඔබතුමා කිව්වා, අක්කර සිය ගණන් එක එක කොම්පැනිවලට දෙනවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අක්කර පණස්දාහක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් කාරණා දෙකක් අහන්න කැමතියි. මොන රජයේ කාලයේ ද මොනරාගල දිස්ත්‍රික්කයේ අක්කර දසදහස් ගණන් ඩෝල් කොම්පැනියට දුන්නේ? ඒක එකක්. දෙවැනි එක, මොන කාලයේද වැලිකන්ද ප්‍රදේශයේ තවත් අක්කර දසදහස් ගණනක් එවකට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අනුදැනුම නැතිව ඩෝල් කොම්පැනියට දුන්නේ? ඒ කොයි කාලයේද? මට ඒක කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම දන්නවා, ඩෝල් කොම්පැනියට බදුකරයක් හැටියට යම් වගාවක් දැමීමට ඉඩම් දුන්නේ අපේ ආණ්ඩුව කාලයේ කියලා. මම ඒක නැහැ කියන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ආණ්ඩුවක් හැටියට වුවමනා කරන සංවර්ධන කටයුතු සඳහා ආයෝජකයන්ට බදුකරයක් යටතේ ඉඩම් ලබා දීලා තිබෙන්නේ ඒ ඉඩම්වල සංවර්ධනයට. [බාධා කිරීමක්] බදුකරයක් නොවෙයිද? [බාධා කිරීමක්] නැහැ. නැහැ. මම දන්නා වන සංරක්ෂණයක් නැහැ. මම කියන්නේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසාන කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ එක දෙයයි. ඒවා සංවර්ධනය කරන්න ලබා දුන්නේ ඒ ඉඩම් නිකම් මුඩු ඉඩම් හැටියට තිබෙන නිසායි. ඒක වෙනම කථාවක්.

මම මේ කියන්නේ ඔබතුමා අපට වෙච්ච පොරොන්දුවක් ගැනයි. ඔබතුමාට ලියුම් දෙකක් යවලාත් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න බැරි වුණා. ඔබතුමාගේ ප්‍රකාශය ගැන අපට විශ්වාසය තියන්න කියනවා නම්, කරුණාකරලා පළමුව ඔබතුමා වෙච්ච පොරොන්දුව ඉටු කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න. රත්නපුර දිස්ත්‍රික්කයේ - ඔබතුමා සඳහන් කරන බල ප්‍රදේශයේ- ඇත්ත වශයෙන්ම බරපතළ ඉඩම් හිඟයක් තිබෙනවා. මා ඔබතුමාගේ ඉල්ලීම අහක දැම්මා නොවෙයි. නමුත්, ඔබතුමා පොඩ්ඩක් නිවැරදි කරන්නට ඕනෑ. ඔබතුමන්ලාගේ රජය තිබෙන කාලයේ -ඒක ඔබතුමාගේ වගකීම නොවෙයි- අක්කර දසදහස් ගණන් මුඩු ඉඩම් බහු ජාතික කොම්පැනිවලට දුන්නා. ඒ නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා වෙච්ච පොරොන්දුව,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතින්, ඉඩම් නැත්නම් මොනවා කරන්නද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉඩම් නැත්තේ නැහැ. මුඩු ඉඩම් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ඉඩම් නැති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉඩම් අක්කර පනස්දාහක් තිබෙනවා, කොම්පැනිවලට දීපු ඉඩම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අක්කර 10,000ක් මුඩු ඉඩම් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහේද, රත්නපුරයේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. වගාවක් නැති මුඩු ඉඩම් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම හිතන විධියට ඔබතුමා ඔය සඳහන් කරන්නේ වතු ඉඩම් නේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, වතු ඉඩම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇත්තටම මම ඔබතුමාට කියන්න කැමැතියි, අපි වතු සමාගම්වලට කථා කරලා ඒ ඉඩම් ලබා ගන්න විශාල පරිශ්‍රමයක් දැරුව බව. නමුත් ඒ සමහර තැන්වල අපි සාර්ථක වුණා. රත්නපුර දිස්ත්‍රික්කයේදී ඇත්තටම අපි අසාර්ථක වුණා. මම ඔබතුමාගේ ඉල්ලීමක් පැහැර හරින්නේ නැහැ. ඒ වාගේම ඉඩමක් තියාගෙන නොදී ඉන්නේත් නැහැ. නමුත්, මම ඔබතුමාට එකක් කියන්න කැමැතියි. ඒ ගැන සමාවෙන්න. ඩෝල් ලංකා ආයතනයට මොනරාගල දිස්ත්‍රික්කයේ අක්කරයක් දෙකක් නොවෙයි, අක්කර දස දහස් ගණනක් දීලා තිබෙනවා. පොළොන්නරුවේ ඉඩම් දීලාත් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමන්ලාට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පර්චස් 20ක් ගන්න බැරි වුණා කියලාද කියන්නේ. [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ ඉඩම් තිබුණා නම්, ඒ පනත තුළ අපට ඕනෑ තරම් ඉඩම් බෙදන්න තිබුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇත්ත කථාව නම්, ඔබතුමාගේ ප්‍රකාශය ගැන මම විශ්වාසයක් තැබුවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉඩම් නැති තැනක ඉඩම් දෙන්නට මට බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඉඩම් දෙන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවෙන්න. ඔබතුමාගේ කථාව මම ප්‍රතික්ෂේප කරනවා, බොහොම කාරුණිකව.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
( மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පර්චස් 20ක් හෝ අරගෙන ඒ අයට දෙන්න ඔබතුමා දැරූ ප්‍රයත්නය කුමක්ද?

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration, Disaster Management and Livestock Development)
අයියෝ! කිසිම නීතියක් නැතිව දීලා තිබෙන්නේ. සල්ලි අරගෙන දීලා තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමන්ලා "ඩෝල්" ගහපුවා කියන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඩෝල් සමාගමට මොනරාගල දිස්ත්‍රික්කයෙන් පමණක් අක්කර 13ක් දීලා තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ ඓතිහාසික භූමිය කෑවා. ඒ, අලින්ගේ නිජභූමිය.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ ආවේගය අපි පිළිගන්නවා. ඔබතුමාට පුළුවන් නම් පර්චස් 20ක් හොයා දෙන්න. මම නියෝජනය කරන කඩුවෙල

[ගරු සුජීව සේනසිංහ මහතා]

ආසනයෙන්වත් මට ඉඩමක් හොයා ගන්න බැහැ. කවුරුවත් ඉඩමක් දෙන්නේ නැහැ. කොහෙන්වත් ඉඩමක් අත්පත් කර ගන්න එක දැන් ලේසි නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අත්පත් කර ගන්න හරිම ලේසියි. පර්චස් 20 වටිනාකම බදින එක විතරයි කරන්න ඕනෑ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොහෙන්ද අත්පත් කර ගන්නේ? කාගෙන්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇයි? අවශ්‍යතාව මත ඕනෑම ඉඩමක් අත්පත් කර ගන්න රජයට පුළුවන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ සඳහා අවුරුදු දෙකක්වත් ගතවනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. ඒ සඳහා වන වගන්තියක් තිබෙනවා.

[අ.භා.3.54]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කරුණු කිපයක් ඉදිරිපත් කරන්න ලැබීම ගැන සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දේශපාලන ඉතිහාසයේ මෑත කාලයේ තරම් මධ්‍යම සංස්කෘතික අරමුදලින් අපේ සම්බුද්ධ ශාසනයට වේගවත් වැඩ කොටසක් ඉටු කරන්න ක්‍රියා කරපු කාලයක් මට මතක නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දහම් පාසල් ගුරුවරයකු විධියට අවුරුදු 15ක් සේවය කළ කෙනෙක්. අපේ ගම් ප්‍රදේශවල තිබෙන දහම් පාසල්වල විශාල ගැටලුවක් තිබුණා. ඒ තමයි දහම් පාසල් බොහොමයකට ගොඩනැගිලි නොමැති ප්‍රශ්නය. ගම්බද ප්‍රදේශවල දහම් පාසල්වල දරුවෝ දහම් අධ්‍යාපනය ලැබුවේ ගස් යට. මේ ව්‍යාපෘතිය යටතේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකර දහම් පාසලට භාර දෙන වැඩසටහනක් ආරම්භ කළා. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ ඉතාම දුෂ්කර ප්‍රදේශවල දහම් පාසල් ගොඩනැගිලි ගණනාවක් මෙම වැඩසටහන යටතේ ඉදිකර තිබෙනවා. මෙහි විශේෂත්වය වන්නේ දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකරලා දහම් පාසලට භාර දෙන්නේ තවත් රාජ්‍ය ආයතනයක් වීමයි. එක්කෝ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, එහෙම නැත්නම් නාවික හමුදාව, එහෙම නැත්නම් යුද හමුදාව. මෙවැනි රජයේ ආයතනයකට තමයි මේ වෙක්පත ගියේ. කොන්ත්‍රාත්කරුවන්ට කොමිස් කුට්ටිය සාක්කුවේ දමාගන්න පුළුවන් විධියට මේ දහම් පාසල් ගොඩනැගිලි ඉදි කෙරුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දහම් පාසල් ගොඩනැගිලි 361ක වැඩ ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම මේ වන විට වැඩ අවසන් කළ දහම් පාසල් ගොඩනැගිලි 270කට මුදල් ගෙවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරපු වැඩ කොටස දිහා බැලුවාම අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා, අපේ සොළොස්මස්ථානවල, අපේ අටමස්ථානවල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන රට පුරාම තිබෙන අපේ රජ මහා විහාරස්ථානවල, ආගමික ස්ථානවල අලුත්වැඩියාවලට විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර තිබෙන බව. ඕනෑම කෙනෙකුට සැකහැර දැනගන්න පුළුවන් විධියට මේ සියල්ල ලේඛනගත වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දිනවල එවැනිම තවත් වැඩසටහනක් ආරම්භ කරන්න අපට පුළුවන් වුණා. අපේ ප්‍රදේශවල තිබෙන ඉතාම දුප්පත් විහාරස්ථානයක ස්වාමීන් වහන්සේනමක් අපවත් වුණොත්, ඒ ස්වාමීන් වහන්සේගේ ආදාහන උත්සවය කර ගන්න මෙම නව වැඩසටහන යටතේ රුපියල් ලක්ෂයක මුදලක් ඒ ආදාහන කමිටුවට පරිත්‍යාග කරනවා. හැබැයි, ඒ මුදල සම්පූර්ණයෙන්ම ලබා දුන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්. ප්‍රාදේශීය ලේකම්තුමා හෝ ලේකම්තුමිය විසින් ඇස්තමේන්තු සකස් කරලා ඔවුන් විසින් වියදම් කරන ආකාරයට තමයි ඒ වෙක්පත ලබා දුන්නේ.

ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රදේශවල පැවැත්වෙන පෙරහැරවල් සංවිධානය කර ගැනීමේ අපහසුතා තිබුණා. බොහෝ වෙලාවට දායකයන්ගෙන් මුදල් එකතු කරමින් ඒ කටයුතු කර ගෙන යද්දී, එවැනි පෙරහැර සංවිධානය කිරීමටත් නව වැඩසටහනක් යටතේ රුපියල් ලක්ෂ දෙකහමාර බැගින් ප්‍රතිපාදන වෙන්කළා.

ඒ වාගේම, රාජ්‍ය උත්සවයක් හැටියට පිළිගත් පෙරහැරවලට ලක්ෂ 5ක වාගේ මුදලක් පරිත්‍යාග කළා. බොහෝම ඉහළින් වෙහෙර විහාරස්ථාන ඇසුරු කරමින්, වෙහෙර විහාරස්ථාන තමන්ගේ දේශපාලනයට පාවිච්චි කරමින්, වෙහෙර විහාරස්ථාන වැඳ පුදාගෙන මල් වට්ටි අතේ තියාගෙන මහා ලොකු බෞද්ධයන් හැටියට විශාල ප්‍රතිරූප හදා ගන්නා මහත්වරු පසුගිය කාලයේ රුපියල් 10,000ක්වත් විහාරස්ථානයකට වෙන් කරලා නැති අවස්ථාවක, අපි මෙවැනි ප්‍රතිපාදනයක් වෙන් කළාම ඒ දිහා කුහකකමින් බලන එක, ඒ දිහා ඊර්ෂ්‍යාවෙන් බලන එක, ඒ දිහා දේශපාලන කෝණයෙන් බලන එක අපේ බුදු දහමටත් පටහැනි දෙයක් බව මේ බෞද්ධයන්ය කියලා කියා ගන්නා මහත්වරුන්ට මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වියදම් ලේඛනය දිහා බැලුවාම අපට පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා, ඒ මුදල් සියල්ල විනිවිදභාවයෙන් වියදම් කරලා තිබෙන බව. මේ සියල්ල ලේඛනගත වෙලා තිබෙනවා. ඇමති වැටුප ලබා ගන්නේ නැතිව, ඇමතිවරයකුට හිමි වාහන ලබා ගන්නේ නැතිව, තමන්ගේ කාලය සම්පූර්ණයෙන්ම ජනතාව වෙනුවෙන් කැප කරලා ක්‍රියා කරන ඇමතිවරයකුට අභූත චෝදනා ඉදිරිපත් කිරීමේ අරමුණින් තමයි මේ යෝජනාව අද පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒකට සැලෙන්නේ නැහැ. එල ඇති රුකට ගල් ගහන එක ගැන අපි කිසිසේත්ම සැලෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම කෙනෙක්ම මතක තියා ගන්න ඕනෑ වැදගත් කාරණාවක් තිබෙනවා. ජනතා ප්‍රසාදය දිනාගෙන, පැය 24න් පැය 18ක් විතර ජනතාව වෙනුවෙන් වෙහෙස මහන්සි වෙලා වැඩ කරන, ජනතාවත් එක්ක අත්වැල් බැඳගෙන ඉස්සරහට යන නායකයකු දෙස ඊර්ෂ්‍යාවෙන්, කුහකකමින් බලලා, කකුලෙන් ඇදලා බිමට දාලා ඒ ගමන වළක්වන්න කවුරු හරි උත්සාහ කරනවා නම්, ඒක ඉතිහාසයේ

වරද්දා ගැනීමක්ය කියන එක මේ වෙලාවේ දී මම කියන්න කැමැතියි. මේ රටේ මිනිසුන් බුද්ධිමත්. මේ රටේ ජනතාව බුද්ධිමත්. අද අපි යන හැම තැනකම පෙනෙනවා, කවුරු මොන විධියට කකුලෙන් ඇදලා ගමන ආ පස්සට දමන්න උත්සාහ කළත්, සජිත් ප්‍රේමදාස මැතිතුමා යන ඒ දේශපාලන ගමන වළක්වන්න කිසි කෙනෙකුට පුළුවන්කමක් නැහැ කියන එක. ගමේ ඉපදුණු, ගමේ හැදුණු වැඩුණු පුද්ගලයකු හැටියට මම පැහැදිලිවම කියන්න කැමැතියි, එතුමාට බාර දුන් අමාත්‍යාංශයේ වගකීම අද එතුමා උපරිමයෙන් ඉටු කරලා තිබෙන බව. මේ සියලු වාර්තා මඟින් අපට එය පැහැදිලිව පෙන්නුම් කරලා තිබෙනවා. ඒ නිසා අවසාන වශයෙන් මම මේ දේ කියන්න කැමැතියි. මම පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට අවුරුදු 23ක් කටයුතු කළා. විහාරස්ථානවලට මුදල් දෙන එක චක්‍රලේඛවලින් තහනම් කරලා තිබුණු යුගයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට මන්ත්‍රීවරයකු හැටියට මන්ත්‍රී ප්‍රතිපාදනවලින් මුදලක් විහාරස්ථානයකට, පන්සලකට, දහම් පාසලකට දෙන්න බැරි යුගයක් තිබුණා. විහාරස්ථානයක ඉදිකිරීමකට මුදලක් දෙන්න බැරි යුගයක් තිබුණා. ඒ නිසා මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා බෞද්ධයකු විධියට සංස්කෘතික අරමුදලේ මුදල් හොඳ කළමනාකාරිත්වයක් ඇතිව පාවිච්චි කරලා අපේ විහාරස්ථාන ගොඩනඟන්න ක්‍රියා කිරීම ගැන. බොහොම ස්තුතියි.

[අ.භා. 4.02]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තැබීමේ මේ යෝජනාව සම්බන්ධයෙන් මම කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මුලින්ම ගරු සභානායකතුමාගේ පැත්තෙන් මේ පිළිබඳව පාර්ලිමේන්තුවට පිළිතුරක් ලබා දිය යුතුයි කියලා මම හිතනවා. "මධ්‍යම සංස්කෘතික අරමුදලේ මිලියන 1,200කට ආසන්න මුදලකට වෙච්ච දෙයක් නැහැ" කියන ප්‍රවෘත්තිය ඇත්තටම අපි ජනමාධ්‍යවලින් දුටුවේ, විපක්ෂයෙන් ඉදිරිපත් වෙච්ච දෙයක් විධියට නොවෙයි. රවි කරුණානායක ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි පැමිණිල්ලකට හෝ යෝජනාවකට අනුව අග්‍රාමාත්‍යතුමා විසින් ඒ පිළිබඳව සොයා බලන්න කමිටුවක් පත් කරනවා කියලායි අපි ජනමාධ්‍යවලින් දුටුවේ. ඒ නිසා මේ විවාදය ඉදිරියට යැමට පෙර මම සභානායකතුමාගෙන් මුලින්ම දැන ගන්න කැමැතියි, අගමැතිතුමා එවැනි කමිටුවක් පත් කරලා තිබෙනවාද, තිබෙනවා නම්, ඒ කමිටුවේ කවුද ඉන්නේ කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මා දන්නා තරමට අගමැතිතුමා එවැනි කමිටුවක් පත් කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පුවත් පතක පළ වෙච්ච දෙයක් ගැන ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ මේ ආකාරයට ප්‍රශ්න කරන එක වැරැදියි. මොකද, මම මුලින් පෙන්නුවා වාගේ මෙතැන මුදල් අවභාවිතයක් වෙලා නැහැ. COPE එකෙන්වත්, PAC එකෙන්වත් මේ පිළිබඳව විමසීමක් කරලා නැහැ. මේ ගැන audit query එකක් නැහැ. පුවත් පතක පළ වෙච්ච ලිපියක් අල්ලාගෙන පාර්ලිමේන්තුවේ වැදගත් කාලය නිකම් නාස්ති කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

සභානායකතුමා ලබා දුන් පිළිතුර ගැන මම ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කළාය කියලා පුවත් පත් වාර්තා කරලා තිබුණා. අපි සොයා බැලුවාම අපට දැන ගන්න ලැබුණා, අග්‍රාමාත්‍යවරයා එවැනි කමිටුවක් පත් කරලා නැහැ කියලා. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය, මේ කාරණය පුවත් පත්වලට ආවේ ආණ්ඩු පක්ෂයේම ඇමතිවරයකුගෙන් වීමයි. ඇමතිවරයෙක් තමයි මේ පැමිණිල්ල කළා කියන්නේ. මා දන්නා තරමින්, නිල වශයෙන් අගමැතිවරයා තමයි මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයා වෙන්නේ. අපි මුලින්ම කියන්නේ, ආණ්ඩුවට තිබෙන ලොකුම වගකීම තමයි, ආණ්ඩුවේ ඇමතිවරයකු කිව්ව ඒ කාරණය ප්‍රතික්ෂේප කරන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ සභාවේ ඉදිරිපත් වන කරුණු අනුවත් පැහැදිලි වන්නේ, අවුරුදු විසි ගණනක්, තිස් ගණනක් තිස්සේම බරපතළ විධියට සිද්ධවෙලා තිබෙන්නේ, ඒ පැවරුණු කාර්යය වෙනුවට වෙනත් කාර්යයන් කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් යොදාගෙන තිබෙනවා කියන කාරණයයි. ඒ ගැන ඕනෑ තරම් කරුණු කාරණා අපට කියන්න පුළුවන්. ඒ නිසා, ඇත්තටම අපි දකින පළමුවන දේ තමයි, ඒ ඉතිහාසයටම යන්න බැරි නම්, අඩු ගණනේ පසුගිය අවුරුදු 19 ගැනවත් සලකලා, අනිවාර්යයෙන්ම මේ අරමුදල පිළිබඳව පුළුල් විගණනයක් කළ යුතුයි කියන එක. එවැනි පුළුල් විගණනයක් කළාම මේවායේ තිබෙන සැබෑ තත්ත්වය එළියට එනවා.

අපි ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, මධ්‍යම සංස්කෘතික අරමුදලින් විවිධාකාර අගමැතිවරුන් යටතේ, විවිධාකාර සංස්කෘතික ඇමතිවරුන් යටතේ කරන ලද විශාල - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Harshana Rajakaruna to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I propose that the Hon. Harshana Rajakaruna do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එක්කෝ, මේ ප්‍රශ්නය FCID එකට භාරදීලා අවුරුදු 10ක් හෝ අවුරුදු 15ක් තිස්සේ සිදු වූ දේවල් ගැන සොයන්න. එහෙම නැත්නම්, ඉතාම ඉක්මනින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඒ කටයුත්ත පවරන්න කියන ඉල්ලීම මා කරනවා. ඒ වාගේම මා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව සොයන එක COPE එකට හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට -මා හිතන හැටියට මෙයට අදාළ වන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි- පවරන්න කියලා.

මෙය දෛවයේ සරදමක් හැටියට මට දැනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පැමිණිල්ල කළා කියන්නේ, රවි කරුණානායක ඇමතිතුමා කියලායි ජනමාධ්‍ය වාර්තා

[ගරු බිමල් රත්නායක මහතා]

කරන්නේ. මාත් සාමාජිකයකු වශයෙන් සිටි COPE එකේදී, ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සම්බන්ධයෙන් ප්‍රධාන චෝදනාවට ලක් වූ කෙනෙක් තමයි, එතුමා. මේ චෝදනාව ඉදිරිපත් කළේ එතුමා කියලා තමයි පුවත් පත් වාර්තා කරන්නේ. දෛවයේ සරදමේ අනික් කථාව තමයි, ශ්‍රී ලංකා මහ බැංකු වංචාවේ චූදිතයකු වූ කෙනෙක් චෝදනාවක් ඉදිරිපත් කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකු වංචාව ආරක්ෂා කරමින් පොත් ලියූ අය අද ඒ පැමිණිල්ලට විරුද්ධව කථා කිරීම. ඇත්තටම, මේ රටේ ජනතාව තේරුම් ගත යුතුයි, මේ කරන දේශපාලන සූදුව මොකක්ද කියලා. මගේ අදහස මේකයි. අගමැතිවරයා විසින් පත් කරන කමිටු නම්, සාමාන්‍යයෙන් ප්‍රශ්න කල් දැමීමට පමණක් පත් කරන ඒවා විතරයි නේ. ඒ කමිටු එපමණ වැදගත්කමක් නැහැ. අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම COPE එකට හෝ අදාළ COPA එකට ඉදිරිපත් කරන්න කියලා.

මේ අවස්ථාවේදී මා කරුණු කිහිපයක් කෙටියෙන් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ ගැන සාමාන්‍යයෙන් සාකච්ඡා කරනවා අඩුයි. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශය මෙයට අදාළ නිසා මා කියන්න කැමැතියි, අද අපේ රටේ පුරාවිද්‍යා ස්ථානවල හෝ පූජනීය ස්ථානවල විශාල සංස්කෘතික ගැටලු තිබෙන බව. ඒක ඇත්ත. අවුරුදු 2,500කට කලින් ඒවා අපේ විශිෂ්ටත්වය, හැකියාව නිරූපණය කරන මධ්‍යස්ථාන වුණාට, අද අපත් ඇතුළුව ඒවාට යන ජනතාවගේ, ඒවාට යන දේශපාලනඥයන්ගේ ඉතාම අසංස්කෘතික හැසිරීමක් තමයි තිබෙන්නේ. ඉතාම ඉහළ සංස්කෘතික මධ්‍යස්ථාන ලෙස සලකන ස්ථානවලදී අපේ ජනතාවගේ හැසිරීම ගත්තොත්, ඒක අවුරුදු 3,000කට කලින් තිබුණු හැසිරීමක් වාගේ තමයි පෙනෙන්නේ. මම හොඳ උදාහරණයක් කියන්නම්. මෑතකදී Horton Plains ජාතික වනෝද්‍යානය නරඹන්න ගිය අවස්ථාවේදී මා දැක්කා, World's End කියන ස්ථානයේ ඉතා හොඳ දෙයක් සිද්ධ වෙන ආකාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි යන ජනතාව ගෙන යන ප්ලාස්ටික්, පොලිතීන් හැම එකක්ම ticket counter එකේදීම එතැන සිටින නිලධාරින් ඇත්තටම polite විධියට, විනය ගරුක විධියට ගන්නවා. ඊට පස්සේ, ඔවුන් ළඟ තිබෙන කඩදාසි බෑග්වලට අපි ගෙන යන දේවල් දමාගෙන යන්න ඕනෑ. අර පොලිතීන් ටික ඔක්කොම ඒ අය එකතු කර ගන්නවා. හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානයේ කිලෝමීටර් 9ක් ඇවිදලා එනකොටත් ඇත්තටම මම දුටුවේ එකම ප්ලාස්ටික් බෝතලයක් පමණයි. ඒකත් World's End කියන තැනම තිබුණු එකක්. ඇත්තටම, මම නම් ඒවා දුටුවේම නැති තරම්. ඒක හොඳ දෙයක්. එම නිසා, මම සංස්කෘතික කටයුතු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ජාතික උරුමයන් බවට පත් කර තිබෙන මේ සංස්කෘතික ස්ථාන ඔබතුමා භාරයේ තිබෙනවා. CCF එක යටතේත් මෙවැනි ස්ථාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මම හිතන විධියට, අනුරාධපුරයේ පුරාවිද්‍යාත්මක ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙන්නේ CCF එක යටතේයි. ඒ වාගේම, ලෝක උරුම බවට පත් කළ සංස්කෘතික ස්ථානත් තිබෙනවා. මෙන්න මේ ස්ථානවලදී එහෙම කරන්නේ ඒ එන අය අපහසුතාවට පත් කරන්න නොවෙයි, ප්ලාස්ටික් සහ පොලිතීන් ගෙනයන එක නතර කරන්නයි. අපි ළඟදී මහියංගනය පන්සල බලන්න ගියා. ඇත්තටම, එතැන තිබුණු තත්ත්වය මොකක්ද දන්නවාද? බුදු හාමුදුරුවෝ ආයෙත් ලංකාවට වැඩියොත්, ස්ථිරවම එතැනට නම් ආපහු වඩින එකක් නැහැ. මම කියන්නේ ඒ පන්සලේ තිබෙන අවුලක් ගැන නොවෙයි. ඒ පන්සල පිහිටි භූමිය අන්තිම අපිරිසිදු වෙලා, පොලිතීන්, ප්ලාස්ටික්, අරවා මේවා ඔක්කෝම එතැන තිබෙනවා. මම මේ මහියංගනය විහාරස්ථානය ගැන විශේෂ විවේචනයක් කරනවා නොවෙයි. අපේ බොහෝ බෞද්ධ විහාරස්ථානවලට ගියත්, කෝවිල්වලට ගියත්, පල්ලිවලට ගියත් අපට දකින්න පුළුවන්, එම ස්ථාන ප්ලාස්ටික් සහ පොලිතීන් උවදුරට විශාල ලෙස ගොදුරු වෙලා තිබෙන බව.

ශ්‍රී පාදස්ථානය දිහා බලන්න. විවිධ ආගම්වලට අයත් පිරිස් දහස් ගණනින් ඒ පූජනීය ස්ථානයට යනවා. ඒ ප්‍රදේශය, ප්ලාස්ටික් සහ පොලිතීන් නිසා සම්පූර්ණයෙන්ම විනාශ වෙලායි තිබෙන්නේ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ලෝක උරුම ලෙස නම් කර තිබෙන ප්‍රධාන සංස්කෘතික ස්ථානවලට මේ ප්ලාස්ටික් සහ පොලිතීන් ගෙන යෑම තහනම් කරන්න කියලා. එහෙම තහනම් කරන්නේ මිනිසුන්ට දඬ ගහන්න නොවෙයි නේ. හැතැප්මක් විතර ගියාට පස්සේ බෑග් අරගෙන එන්න කියලා මිනිසුන්ට harass කරන්නේ නැතිව, ටිකට් ගන්න තැන්වලදීම, පරීක්ෂා කරන තැන්වලදීම ඒ පොලිතීන්, ප්ලාස්ටික් අරගන්න. එහෙම අරගෙන, ඔවුන්ට එතැනදීම කඩදාසි බෑග් එකක් දෙන්න, ඒ අයලේ දේවල් ගෙනයන්න. අඩුම තරමින් එවැනි දෙයක්වත් කරන්න.

ගරු ඇමතිතුමනි, පුරාවිද්‍යාත්මක ස්ථාන රාශියක් අපේ රටේ තිබෙනවා. ඒවා සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂා කළ යුතු ස්ථාන. නමුත්, ඒ ස්ථාන සියල්ලම ආරක්ෂා කරන්න තරම් සම්පත් අපේ රටට නැහැ. ඒකත් ඇත්ත ප්‍රශ්නයක්. නමුත්, මෙම ස්ථානවල තිබෙන වැදගත්කම මොකක්ද කියලා සාමාන්‍ය දරුවෙකුට, සාමාන්‍ය මනුෂ්‍යයෙකුට දැනගැනීමේ හැකියාව මෙවැනි ස්ථාන කීයක තිබෙනවාද? මේ බොහෝ තැන්වල යකඩවලින් තනන ලද බෝඩ් එකක ගහලා තිබෙනවා, "මේක පුරාවිද්‍යා ස්ථානයක්" කියලා. ඒකේ තිබෙන්නේ, ඒ ස්ථානවලට හානි කිරීම පුරාවිද්‍යා නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදක් කියන එක විතරයි. එහෙම නැතිව, මේක හැදුවේ කවුද, මෙහි වැදගත්කම මොකක්ද කියන එක පිළිබඳව එක වාක්‍ය 10ක්වත් මේ කිසිම ස්ථානයක ලියා තබලා නැහැ. අනුරාධපුරයේ, මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ තිබෙන ස්ථානවලත් එහෙම සඳහනක් කරලා නැහැ. හැම දාම, මිනිස්සු සිය දහස් ගණනින් අනුරාධපුරයට යනවා. පුරුද්දට, ඔහේ යන්නන්වාලේ යනවා මිසක්, ඒ අයට ඒ ස්ථාන ගැන දැනුමක් තිබෙනවාද? මම කියන්නේ නැහැ, මිනිස්සු පාඩම් කරන්න සංස්කෘතික මධ්‍යස්ථානවලට, පන්සල්, පල්ලිවලට යනවා කියලා. වෙන වුවමනාවකටයි ඒ අය යන්නේ. නමුත්, ඒ අතරේදී අපට මිනිසුන්ට යම් දෙයක් දිය හැකියි. අකිල විරාජ් ඇමතිතුමා අර අච්චු පොත්වල එතුමාගේ photo එක ගැහුවා වාගේ දෙයක් නම් කරන්න එපා. මොකද, සංස්කෘතික ඇමතිවරුන් වෙනස් වුණාට, සංස්කෘතික උරුමයන් වෙනස් වෙන්නේ නැහැ නේ, ගරු ඇමතිතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, සංස්කෘතික අමාත්‍යාංශයේ වගකීම යටතේ, අඩුම තරමින් ප්‍රධාන සංස්කෘතික මධ්‍යස්ථානවලවත් යම් පුවරුවක් හදලා, මිනිසුන්ට විනාඩි දෙක තුනකින් බලා ගන්න පුළුවන් වෙන විධියට එම ස්ථානය ගැන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් යම් විස්තරයක් ඇතුළත් කරන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සංස්කෘතික මධ්‍යස්ථානවලට ඕනෑ තරම් ගිහින් ඇති; පන්සල්, පල්ලි සහ කෝවිල්වලට ගිහින් ඇති. ඒ ස්ථානය ගැන දැනගන්න පුළුවන් පොත් පිංචක් ඒ ස්ථාන කීයකද තිබෙන්නේ? ඔබතුමා චීනයට ඕනෑ තරම් ගිහින් තිබෙනවා නේ. ඔබතුමන්ලා විවිධ රටවලට ගිහින් තිබෙනවා නේ. ඒ රටවල ඕනෑම තැනකට ගියාම, ඒ ඒ ස්ථාන ගැන, එහි ඉතිහාසය ගැන සාමාන්‍ය ජනතාවට දැනගන්න -විද්‍යාඥයන්ට නොවෙයි.- විස්තරයක් සටහන් කර තිබෙනවා. අපේ රටේ ගොඩක් තැන්වල ඒක නැහැ.

ඉතාම කනගාටුයි කියන්න, මම මේ ළඟදී අවුරුදු 2,200ක් පැරණි පන්සලකට ගියා. මම නම කියන්නේ නැහැ, ඒ පන්සලට අගෞරවයක් වන නිසා. ඒ පන්සලේ බණක් ඇහෙන්නේ නැහැ. ඒක, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉතාම ඉහළින් ගොඩනඟලා තිබෙන පන්සලක්. ඒ අය loudspeakers දමාගෙන ආධාර එකතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ දුප්පත් පන්සල් ගැන කියනවා නොවෙයි. මේවා, අති දැවැන්ත රජමහා

විහාරස්ථාන. මම දන්නා තරමින් ඒවාට විශාල ආදායම් තිබෙනවා. පන්සල පිහිටුවලා අවුරුදු 2,200යි. ඒ වුණාට, තවම ආධාර එකතු කරනවා. එහෙම ආධාර එකතු කළාට, ඒ සිද්ධස්ථානය ගැන මේ රටේ දරුවන්ට දැන ගන්න නිවැරදි ප්‍රකාශනයක් නැහැ. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, CCF එක යටතේ තිබෙන ප්‍රධාන ආයතන 100ක්වත් ගැන, ඊළඟට අපේ බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් සංස්කෘතික උරුමයන් ගැන, අපේ ප්‍රධාන සංස්කෘතික ස්ථාන ගැන යම්කිසි විවරණ පත්‍රිකාවක් ටිකට් එකත් එක්ක දෙන්න කියලා. ටිකට් ගන්නා තැන්වලදී, අඩුම තරමින් ඒ ටිකට් එකේම අනෙක් පැත්තේවත් එහෙම සටහනක් ගහලා දෙන්න. රුපියල් 20කට, 25කට ගන්න පුළුවන් වෙනම පොඩි පත්‍රිකාවක් මිනිසුන්ට දෙන්න. ඒක වැදගත්. අපේ රටේ තාක්ෂණය, අපේ හැකියාව ගැන තිබෙන එක සාධකයක් ඒක. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අන්න ඒ වාගේ දෙයක් කරන්න කියලා. කරුණාකරලා, ඔය අනම්, මනම් ගහන්නේ නැතිව, තොරතුරු පත්‍රිකාවක් ප්‍රදර්ශනය කරන්න. අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා කරපු වැරැද්ද කරන්න එපා කියලායි මම කියන්නේ. ඒ ඒ තැන්වලට අදාළව පොත් පිංචක් හඳුන්වා දෙන්න. ඒවා ලියන්න පුළුවන් ඕනෑ තරම් උගතුන් ඉන්නවා. ඒ ස්ථානවලට එන කෙනෙකුට යම් කිසි පත්‍රිකාවක් දෙන්න. ඒ විස්තරය ටිකට් එකේ අනෙක් පැත්තේ ගැහුවොත්, ඕනෑ නම් souvenir එකක් හැටියට තියාගන්නත් පුළුවන්. ඒකයි මම ඔබතුමාට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ කාරණය කියන්න කැමැතියි. සංස්කෘතික උරුමය කිව්වාම, සිංහල, බෞද්ධ සිද්ධස්ථාන විතරද අයිති වෙන්නේ? ඒ ගැන අපේ රටේ සිංහල දරුවන් එච්චර දන්නේ නැහැ කියලා මම හිතනවා. මොකද, අඩු වු පොත් බැලුවාම, මේ රටේ දෙමළ සංස්කෘතික උරුමය ගැන, කතෝලික සංස්කෘතික උරුමය ගැන ඒ සමහර අඩු වු පොත්වල නැහැ. මම මීට අවුරුදු ගණනකට කලින් තලවිල පල්ලිය ගියාට පස්සේ තමයි දැනගත්තේ, ඒක අපේ රටේ පුරාවිද්‍යාත්මක වශයෙන් සංරක්ෂණය කළ, අවුරුදු සිය ගණනක් පැරණි සංස්කෘතික උරුමයක් කියලා. එක රටක් ඇතුළේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාම ජීවත් වෙන නිසා, යුද්ධ කරගත්තත් අවසානයේ නැවත සිංහල, දෙමළ, මුස්ලිම් කාටත් අපට එකට ඉන්න වෙනවා කියලා පිළිගන්නා නිසා, අනිවාර්යයෙන්ම සංස්කෘතික කටයුතු වෙනුවෙන් මුදල් වෙන් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අරමුදලෙන් ඒ වැඩ කරනවාත් ඇති. අපේ රටේ සිංහල බෞද්ධ සංස්කෘතික උරුමයන් තමයි වැඩිපුර තිබෙන්නේ. ඒ ගැන විවාදයක් නැහැ. නමුත්, ඒ අතරේ කතෝලික, ඉස්ලාම්, හින්දු ආගමික උරුම පිළිබඳවත් ජනතාවට අවබෝධයක් ලබා දිය යුතුයි; පාසල් අඩු වු පොත්වල පාඩම්වලට ඒවා හඳුන්වා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංස්කෘතික උරුමය කියන්නේ, ආගමික උරුමය විතරක් නොවෙයි කියන කාරණයත් මම කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරී තිබෙන්නේ පැරණි ආගමික සිද්ධස්ථාන නඩත්තුවීම පමණක්ද කියන්න මම දන්නේ නැහැ. අපේ රටේ ආගමික නොවන සංස්කෘතිකාංග හුඟක් තිබෙනවා, පැරණි දේවල් තිබෙනවා. අපේ රටේ හිටපු පැරණි විද්‍යාඥයන් ගැන අපි දන්නේ නැහැ. අපේ රටේ ඉඳලා තිබෙන්නේ පැරණි ස්වාමීන් වහන්සේලා විතරක් නොවෙයි නේ. පැරණි ගණිතඥයෝ ඉඳලා තිබෙනවා. එහෙම නැත්නම්, මේ විදියේ irrigation projects කරන්න බැහැ. ඔබතුමා හිතනවාද, ඒ වාගේ අය නැතිව ඔය වැව් හදන්න පුළුවන් කියලා. ඒකට ගණිතඥයෝ ඕනෑ. සමහරවිට, "ගුණසේකර" හෝ "මයිල්වාගනම්" කියලා ගණිතඥයෙක් ඉන්න පුළුවන්. භෞතික විද්‍යාඥයන් ඉන්න පුළුවන්. බරණ ගණිතයා ගැන අපි අහලා තිබෙනවා නේ. අනාගමික සංස්කෘතික උරුමය ගැනත් ජනතාවට ඉගැන්වීමේ වග කීමක් ඔබතුමාට තිබෙනවා. අතීතයේ මිනිස්සු හැම වෙලාවෙම පන්සල ඇතුළේ හිටියේ නැහැ. ඒ ගොල්ලෝ කුඹුරු වැඩ කළා. ඒ වාගේම ඒ ගොල්ලෝ විනෝද වුණා, සින්දු කිව්වා, ගහගත්තා. එහෙම දේවල් සිදු වුණා. අනාගමික සංස්කෘතික උරුමයකුත් තිබුණා. විශේෂයෙන්ම, අනුරාධපුරයේ CCF එක ගොඩක් active නිසා ඒවා මතු කරන්න.

අවසාන වශයෙන්, මම ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි. අප මේ සංස්කෘතික උරුම ජාතිවාදයට පාවිච්චි කරනවා. "රාවණා" ගත්තාම, ලංකාවේ සිංහල අය හිතාගෙන ඉන්නවා එයා "සිංහල රාවණා" කියලා. කෝනේෂ්වරම් කෝවිලට ගියාම අපට පෙනෙනවා, එයා "දෙමළ රාවණා" කියලා. ඒ නිසා, අපට අපේ දරුවන්ට උගන්වන්න ලොකු දෙයක් තිබෙනවා. මොකක්ද? අපි අද විවිධ විදියට බෙදිලා හිටියාට, මීට අවුරුදු 2000කට, 3000කට විතර පෙර අපි සියලුදෙනාම මිනිස්සු විදියට තමයි ඉඳලා තිබෙන්නේ. ඒ කාලයේ, රාවණා දෙමළ කථා කළාද, සිංහල කථා කළාද, එයා පන්සිල් ගත්තාද කියලා කාටවත් කියන්න බැහැ නේ. මෙන්න මේ සංස්කෘතික උරුමවලට, දායාදවලට ජාතිවාදී, ආගම්වාදී අර්ථයන් දෙන්නේ නැතිව, ඒවා මිනිසුන්ගේ ජයග්‍රහණ ලෙස, නිර්මාණ ලෙස, අපේ මුතුන් මිත්තන්ගේ නිර්මාණ ලෙස හඳුනන විදියේ මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing, Construction and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධම්මපදයේ ගාථාවකින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

"අත්තානමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ

අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො."

"අනුන් හට බණ දේශනා කරන්නට පෙර තමන් සුදුසු ගුණයෙහි පිහිටා සිටින්න" කියන කාරණාවයි ලොව්තුරු බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා, සභාව කල් තැබීමේ විවාදයට අදාළ යෝජනාව පෙර දින දහවල් 12.00ට හෝ 1.00ට, -ඒ වාගේ කාලවකවානුවකදී- භාර දෙන්න ඕනෑ කියලා. මොකද, පැහැදිලි පිරිසිදු පිළිතුරක් ලබා දීමේ ඒ අරමුණ පෙරදැරි කරගෙන සාධාරණ වෙන්නට ඕනෑ. නමුත්, ඒ සම්ප්‍රදාය කඩ කරමින් ඊයේ මේ යෝජනාව ලබා දුන්නේ සවස 4.50ට. එදා නිලධාරින් බහුතරයක් කාර්යාලයීය වැඩ කටයුතු අවසන් කර ගියාට පස්සේයි. මට හිතා ගන්න බැහැ, මොන පදනමක් ඇතිවද මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කළේ කියලා.

මා හිත මිත්‍ර අපේ ගරු ටී.බී. ඒකනායක මැතිතුමාට ඊළඟට මා මතක් කරන්න කැමැතියි, එතුමාගේ යෝජනාවේ සඳහන් වූ කාරණා. "රුපියල් මිලියන 3,600ක මුදලක් පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව, කුමන කාරණයක් සඳහාද, කෙතරම් මුදලක්ද, කුමන පුද්ගලයන්ට ලබා දුන්නාද, රාජ්‍ය මුදල් අවභාවිතයක් මෙන්ම පොදු දේපොළ පනතද උල්ලංඝනය කර, මාස අටක කාලයක් පාලක මණ්ඩලය රැස් වෙලා නැහැ, පාලක

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මණ්ඩලයේ අනුමැතියකින් තොරව රාජ්‍ය මුදල් අවභාවිතය, මූල්‍ය විනය කඩ කිරීම්" කියන කාරණා ගැන හොයා බලන්නට කාරක සභාවක් පත් කරන්න කියලා එතුමා කියනවා.

ගරු මන්ත්‍රීතුමනි, කථාව ආරම්භයේදීම මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ජේදය. ඊට අනුව, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය. ඒ වාගේම, බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන අතරතුර, සෙසු ආගම්වලටත් ලබා දෙන අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුයි. දැන් මේ කාරණාව අපේ ප්‍රති පක්ෂ කණ්ඩායම්වල සියලුදෙනාට අමතක වෙලා. මොකද, ඒ අයට බුද්ධාගම ගැන මතක් වෙන්නේ මැතිවරණ කාලයක් එනකොට පමණක් නිසා.

අපේ හිටපු ගරු අමාත්‍යතුමනි, සත්‍ය කථාව නම් ඒ අදාළ තැන්පතුවලින් ලබාගෙන අපි මිලියන 1,598ක අරමුදල් භාවිත කර තිබෙනවා කියන එකයි. විශේෂයෙන්ම අපට ඒ තැන්පතුවලින් මුදල් ලබා ගන්න සිදු වුණේ, ලැබෙමින් තිබූ ආදායම අප්‍රේල් 21වැනි දා සිදු වුණු ඒ ත්‍රස්ත ප්‍රහාරය තුළ සම්පූර්ණයෙන්ම පහළ වැටීම තුළයි. හැබැයි, මම වගකීමෙන් කියන්න කැමැතියි, කිසිදු අරමුදලක් පුද්ගලයකුගේ, පෞද්ගලික ආයතනයක හෝ වෙනත් ආයතනයක සුබසිද්ධිය උදෙසා අපි පාවිච්චි කරලා නැහැ, වැය කරලා නැහැ කියන එක.

අපි ආරම්භ කරලා තිබෙනවා, "සිසු දහම් සෙවණ" කියන වැඩසටහන. "ත්‍රිපිටකාභි වන්දනා" වැඩසටහනට සමගාමීව රුපියල් ලක්ෂ 30ක් එක දහම් පාසලකට වැය කරලා, මේ වන විට ලංකාවේ දහම් පාසල් ශාලා 361ක් ඉදි වෙමින් පවතිනවා. මේ බෞද්ධ ශ්‍රී ලංකාවේ එකකට රුපියල් ලක්ෂ 30 බැගින් දහම් පාසල් ශාලා 361කට මුදල් කැප කරන කොට ඒක වැරදි වන්නේ කොහොමද? ඒක පාප කර්මයක්ද? ඒක සිර දඬුවම් ලැබිය යුතු වරදක්ද?

ඒ වාගේම මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්නට කැමැතියි. අපි ආරම්භ කරලා තිබෙනවා, විශේෂ ව්‍යාපෘති. හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් ලක්ෂ 785ක් වටිනා ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. අභයගිරි ව්‍යාපෘතිය වෙනුවෙන් ලක්ෂ 490ක් වටිනා ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. මහා විහාර ව්‍යාපෘතිය යටතේ මිරිසවැටිය, ථූපාරාමය, මිහින්තලය කියන ඒ ව්‍යාපෘති 11ට විතරක් හිටපු ගරු ඇමතිතුමනි, මිලියන 384ක් -ලක්ෂ 3,845ක්- වෙන් කරලා තිබෙනවා. ඒක වරදක්ද? ඒක වැරැදි ක්‍රියාවක්ද? මම ඒක අහන්න කැමැතියි ඔබතුමාගෙන්. සීගිරි ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 102ක්, දඹුල්ල ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 541ක්, මහනුවර ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 1,161ක් වටිනා ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. මම ලබන සතියේ සහභාගි වෙනවා, අස්ගිරි මහා පාර්ශ්වයේ ඉදිකළ වාහල්කඩ විවෘත කිරීමේ අවස්ථාවට. අස්ගිරි මහා පාර්ශ්වය විහාරයේ වාහල්කඩ හදන්නට බැරි වූ මහා බෞද්ධයන්ට ඉවසා දරාගෙන ඉන්න බැහැ, අපි එහෙම වැඩ කරන එක.

මම, උදේ පාන්දර හතරට නැඟිටලා රෑ දොළහට නිදා ගන්නේ. ඒ, බිස්නස් කරන්න නොවෙයි; මුදල් ගරන්න නොවෙයි; පගා ගහන්න නොවෙයි; කොමිස් ගිලින්න නොවෙයි, වැඩක් කරන්න. ඇයි, ඔබතුමන්ලා මේ වාගේ අසාධාරණ චෝදනා කරන්නේ? ඒක මම අහන්න කැමැතියි.

ඒ වාගේම හිටපු ගරු ඇමතිතුමනි, පොළොන්නරු ව්‍යාපෘතියේ ලක්ෂ 53ක් වටිනා ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. කුරගල ව්‍යාපෘතිය ගැන තමුන්නාන්සේලාත්, තවත් කණ්ඩායමකුත් අඬබෙර ගැහුවා. ලක්ෂ 655ක් වෙන් කරලා තිබෙනවා. බදුල්ල ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 110ක්, කෑගල්ල ව්‍යාපෘතියට ලක්ෂ 62ක්, ජේතවන ව්‍යාපෘතියේ ඉතිරි වැඩවලට මිලියන 147ක් -ලක්ෂ 1,471ක්-, යාපහුව ව්‍යාපෘතියට -ටී.බී. ඒකනායක මැතිතුමනි, ඔබතුමාගේ ගම් ප්‍රදේශයට- ලක්ෂ 68ක් වෙන් කරලා තිබෙනවා. තව තිබෙනවා, වැඩ කරන්න. කුරුණෑගල ව්‍යාපෘතියට ලක්ෂ 17ක් වෙන් කරලා තිබෙනවා. මඩකලපු ව්‍යාපෘතිය යටතේ අරන්තලාවේ භික්ෂු ඝාතනය සිදු වූ භූමියේ ගිලන් හලක් හදනවා, ලක්ෂ 80ක. මෙන්න හිටපු ගරු මැතිතුමනි, මගේ දේශහිතෛෂීත්වයයි, බෞද්ධකමයි. අනුන්ගේ සංවර්ධන ව්‍යාපෘතිවලට තමන් උප්පැන්න දීලා එළියට ඇවිල්ලා voice-cuts දෙන voice-cut බෞද්ධයෙක් නොවෙයි, මම. මගේ බෞද්ධකම මහ පොළොවේ තිබෙනවා; විහාරස්ථානවල තිබෙනවා. ඔබතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමන්ලා ඕනෑ තරම් චෝදනා කරන්න. ඕනෑ නම් මා වැලිකඩටත් යවන්න. මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ වසර තුළ මගේ ඉලක්කය දහම් පාසල්ශාලා දහසක් ඉදිකිරීමයි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, හිටපු ගරු ඇමතිතුමනි. මේවා කියන කොට ඉවසාගෙන ඉන්න බැරිද දන්නේ නැහැ. ඔබතුමා ගමේ පුද්ගලයෙක්. පොඩ්ඩක් අහගෙන ඉන්න, කලබල වෙන්නේ නැතුව. වසර හතරක් තුළ 1,125ක් චෛත්‍ය රාජයාණන් වහන්සේලා හදනවා. ඔබතුමන්ලාටත් හිටියා නේ විධායක ජනාධිපතිවරයෙක්, වාර දෙකක්. මට නිකමට කියන්න එක චෛත්‍යයක් හැදුවාද කියලා? එකක් ආසාවට හැදුවාද? කෝ, බෞද්ධකම? හම්බන්තොට දිස්ත්‍රික්කයේ මම හදලා තිබෙනවා, හයක්. ඔය කියන මහා බෞද්ධයන් මොනවත් හදලා නැහැ. දිලිප් වෙදආරච්චි රාජ්‍ය ඇමතිතුමා හදලා තිබෙනවා, දෙකක්. ඒ පොඩි මනුස්සයා; සාමාන්‍ය මනුස්සයා එහෙම කරලා තිබෙනවා. මෙන්න ප්‍රායෝගික බෞද්ධකම. ඔබතුමා ලොකුම ලොකු අමාරුවක වැටුණා, අද දවසේ කාගේ හෝ මොකක් හෝ ගොන් කොන්ත්‍රාත්තුවක් භාරගෙන. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරලා විනාඩි කීය ද කථා කළේ? ඇත්තටම මම ඔබතුමාට හරි කැමැතියි. මම ඇත්ත කියන්නට ඕනෑ. මම ඔබතුමාට දෝෂාරෝපණය කරන්න නම් කැමැති නැහැ. මොකද ඔබතුමා ගමෙන් ආපු පුද්ගලයෙක්, මගේ පියාණන් සමඟ ලොකු සේවාවක් කරපු යාපහුව බල ප්‍රදේශයේ හොඳ මහජන නියෝජිතයෙක්. ඒ නිසා මම ඔබතුමා ගැන වැඩිය කථා කරන්නට යන්නේ නැහැ.

දැන් මේ යෝජනාවෙන් කියනවා, ආවරණ අනුමැතිය නැතිව වැඩ කළා කියලා. මම මේ සභාවට කියන්න කැමැතියි එතුමාත් ආවරණ අනුමැතිය ඇතිව වැඩ කරලා තිබෙන බව. මම මේ විස්තර ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඔබතුමා 2012 ආවරණ අනුමැතිය සහිතව රුපියල් ලක්ෂ 612ක ව්‍යාපෘති කරලා තිබෙනවා. තවත් රුපියල් ලක්ෂ 48ක ව්‍යාපෘති සහ රුපියල් ලක්ෂ 16ක ව්‍යාපෘති ගැන සඳහන් වෙනවා. මම මේ සියල්ල සභාගත කරනවා. මම ළඟ files තොග පිටින් තිබෙනවා. අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ කාලයේත් ආවරණ අනුමැතියට යටත්ව ලොකු වැඩ කොටසක් කරලා තිබෙනවා. ඒක සම්ප්‍රදායක්. අනුමැතිය ලැබෙනතෙක් හිටියොත් මොනම වැඩක්වත් කෙරෙන්නේ නැහැ.

හිටපු ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමතියි ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් අපවත් වූ අවස්ථාවක ඔබතුමන්ලාගේ ඔය මහා බෞද්ධකම, සුපිරිසිදු බෞද්ධකම, නිර්මල බෞද්ධකම ප්‍රචලිත වූ කාලයේ කීයක් මුදලින් ලබා දුන්නාද කියලා. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් රුපියල් 10,000යි ලබා දුන්නේ. සල්ලි තිබුණොත් පළාත් සභාවත් තවත්

රුපියල් 20,000ක් දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් අපවත් වූ වෙලාවක, මුළු බල ප්‍රදේශයම ශෝකාකුල වූ වෙලාවක, අසරණ වූ වෙලාවක සංස්කෘතික අරමුදලින් රුපියල් ලක්ෂයක් අපි ලබා දෙනවා. ඒක වරදක්ද? ඒක නරකද? ඒවා හොඳ නැද්ද? මේවා සියල්ල කරන්නේ ආවරණ අනුමැතියට යටත්ව. තමුන්නාන්සේ කාගේ හෝ දිරච්ච ලණුවක් කෑවා, බොහොම අභිරහස් විධියට. ඊයේ 12.00ට, 1.00ටවත් නොවෙයි. මට මේ පණිවුඩය එනකොට හැන්දෑවේ 5.30යි. නිලධාරින් කවුරුත් නැහැ. අපේ දක්ෂ හපන්කම් තිබෙන නිලධාරින් සියලුදෙනාම මේ තොරතුරු ඒකරාශි කරලා මැදියම් රැයේ සහ අද දවසේ උදේ පාන්දර මට ලබා දුන්නා. ඔබතුමා කරපු මේ වැඩෙන් අද කරන්නට තිබුණු සංවර්ධන ව්‍යාපෘති 10ක් අහෝසි කරන්න මට සිදු වුණා. මම ඒ ගැන බොහොම කනගාටු වෙනවා.

තමුන්නාන්සේට මම කියන්න කැමතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වෙනි ව්‍යවස්ථාවේ තිබෙනවා නේ බෞද්ධකම පෝෂණය කරන්න කියලා. මෙන්න අපි ඒක කරනවා! පෙරහැරක් කරන්න ඉල්ලීමක් කරනකොට ලක්ෂ 5ක් දෙනවා. ඒ පෙරහැර සංස්කෘතිය රැක ගන්න; බෞද්ධකම පෝෂණය කරන්න. ඔබතුමාගේ යෝජනාවෙන් මට එන හැඟීම තමයි මේවා කරන එක හොඳ නැහැ කියන එක. ඇයි? පාලක මණ්ඩල අනුමැතියක් නැතිවයි මේවා කරන්නේ කියලානේ කියන්නේ. මේ හැම cheque එකක්ම ලියන්නේ ගරු මැතිතුමනි, ප්‍රාදේශීය ලේකම්ගේ ගිණුමට. මේ මුදල් එක එක හිතවතුන්ට දෙන්නේ නැහැ.

මම ඔබතුමාට කාරණයක් කියන්න කැමතියි. දැන් මට මේකටත් චෝදනාවක් එයිද දන්නේ නැහැ. අපි දැන් දීඝවාපිය චෛත්‍යය ගොඩනඟනවා. ඔබතුමන්ලාට ඒක කරන්න බැරි වුණා. ඒක කරන්න උනන්දුවක් තිබුණේ නැහැ. දන්නවාද ඒකට යන ගණන? රුපියල් මිලියන 852ක්; රුපියල් ලක්ෂ 8,520ක්. දැන් ඔබතුමන්ලා කියන්නේ ඒක කරන්න එපා කියලාද? අපි දැන් ඒ වැඩ පටන් අරගෙන තිබෙන්නේ. මොකක්ද ඔබතුමන්ලා ඒ ගැන කියන්නේ? මොකක්ද ඔබතුමන්ලාගේ voice-cut බෞද්ධ නායකයෝ ටික කියන්නේ? අනුන්ගේ වැඩවලට උප්පැන්න දීලා එළියට එනකොට, "බුද්ධාගම වැනසුණා. බුද්ධාගම විනාශයි" කියනවා.

ඉතිහාසයේ පළමුවෙනි වතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් දහම් පාසල්ශාලා 1,000ක් හදනකොට බුද්ධාගම විනාශයි කියනවා! චෛත්‍ය 1,125ක් හදනකොට බුද්ධාගම විනාශයි කියනවා! චෛත්‍ය 1,125ක් හදන්නේ දානපතියන්, ආධාරකරුවන්, දායකයන් සම්බන්ධ කරගෙන මිසක් රජයේ මුදල්වලින් නොවෙයි. මම කනගාටු වෙනවා, තමුන්නාන්සේ මේවා ගැන දැනගෙන හිටියේ නැති එක ගැන.

ඒ විතරක් නොවෙයි, අර පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විනාශ වූ දේවස්ථාන තුනම ඉදි කරනවා. කවුද කරන්නේ? ඒක කරන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල්වලින් යුද හමුදාවයි, නාවික හමුදාවයි. එතකොට දැන් යුද හමුදාවයි, නාවික හමුදාවයි කරන්නේත් මුදල් හොරකමක්ද? කෙළින්ම ඒ cheque ලියන්නේ යුද හමුදාවට; නාවික හමුදාවට. කරපු වැඩ ටික අධීක්ෂණය කරලා, ඒවා හොයලා බලලා අපේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මැදිහත්වීමෙන්, SD&CC ආයතනයේ මැදිහත්වීමෙන් ඒවා අධීක්ෂණය කරලා ඒ දේවස්ථාන හැදෙනවා. ඒක වැරදිද? අපි තලවිල දේවස්ථානයේ ලක්ෂ 500ක ව්‍යාපෘතියක් කරනවා. ඒක හොඳ නැද්ද? ඒක නරකද? ඒක නවත්වන්නද? විශාල මුදලක් කැප කරලා මඩු දේවස්ථානයේ දැවැන්ත සංවර්ධනයක් කරනවා. ඒවාට විරුද්ධද? හිටපු ජනාධිපති ආර්යාව ඒවාට විරුද්ධ ද? මඩු දේවස්ථානය සංවර්ධනය කරනවාට, තලවිල දේවස්ථානය සංවර්ධනය කරනවාට, ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත් වූ දේවස්ථාන ගොඩනඟනවාට ඔබතුමන්ලා විරුද්ධ ද? බොහොම කනගාටුයි. තමුන්නාන්සේලා මේ කරන්නා වූ සංවර්ධන වැඩකටයුතු පිළිබඳ ඉතාම වැරදි ආකාරයට අර්ථ කථනය කරලා, ජනතාව නොමඟ යවලා එක එක කුමන්ත්‍රණ හරහා කියනවා, මුදල් අවභාවිත වුණා කියලා. ඒ තොරතුරු කෙළින්ම leak කරනවා, ඊළඟ දවසේ පත්තරවල මුල් පිටුවට යන්න. ඊට පස්සේ උදේ පාන්දර මුල්පිටුව කියවන ඇත්තන්ටත් කියනවා, මේක කොහොම හරි කියවපන් කියලා. එහෙම කියලා විසිහතර පැයම, තුන්සිය හැටපස් දවසේම මඩ ගහනවා; මඩ ගහනවා. මම කියනවා, "ඔබලාගේ දොළ දුක සංසිඳෙනවා නම්, විසිහතර පැයේම, තුන්සිය හැටපස් දවසේම සජිත් ප්‍රේමදාසට මඩ ගහන්න. ඒවා මට ඕනෑ තරම් උරා ගන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. මඩ ගහන්න බැරි නම්, ඕනෑ නම් ඇවිල්ලා ශාරීරිකව හරි ගහන්න. මම විඳ දරා ගන්නම්. ඒකේ කිසි ගැටලුවක් නැහැ" කියලා. ගරු ටී.බී. ඒකනායක මැතිතුමනි, ඔබතුමා නිකම් දෙලොවක් අතර අතරමං වෙලා වාගේ ඉන්නේ මොකද? තනියම ඉන්නේ මොකද? [බාධා කිරීමක්] හරි. කමක් නැහැ.

ඊළඟට, මම ඔබතුමාට කියන්න කැමතියි, අපි කැබිනට් පත්‍රිකාවක් හරහා මේ සියලු ව්‍යාපෘති රාජ්‍ය ආයතනවලින් -රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙනුයි, SD&CC ආයතනයෙනුයි- ක්‍රියාත්මක කරන්නට අනුමැතියක් ගත්ත බව. අපි කරන මේ හැම වැඩකින්ම රාජ්‍ය ආයතන ශක්තිමත් වෙනවා. දැන් ඔබතුමන්ලාගේ කථාව තමයි මේ මුදල් බහිරවයෙක් ගිල්ලාය කියන එක; මුදල් අතුරුදහන් වුණාය කියන එක. ඔබතුමන්ලා කියන්නේ මේ රාජ්‍ය ආයතන හොරකම් කරන ආයතන කියලාද? මේ රාජ්‍ය නිලධාරින්, රාජ්‍ය සේවක නිලධාරි මහත්ම මහත්මීන් හොරුද? හමුදාව, නාවික හමුදාව, රට දැය බේරාගත්ත රණවිරුවන් වංචාකාරයන්ද? ඔවුන්ගේ ශ්‍රමයෙන් අර කොච්චිකඩේ දේවස්ථානය, කටුවාපිටිය දේවස්ථානය, මඩකලපුවේ දේවස්ථානය ගොඩනඟනවා විතරක් නොවෙයි, අපි තවත් සම්පත් රාශියක් යොදලා ඒවා වැඩිදියුණු කරනවා. අලුත් සංකීර්ණ බිහි කරනවා. ඒ නිසා නැවත නැවතත් මම ඔබතුමාට කියන්න කැමතියි, ඔබතුමා පුද්ගලික කාරක සභාවක් පවත්වා කවුද මේ දිරච්ච ලණුව ඔබතුමාට දුන්නේ කියන එක ගැන හොඳින් හොයා බලන්න කියලා.

ඔබතුමන්ලා දන්නවා ඒ පාස්කු ඉරිදාට පස්සේ, මේ රටේ ජාතිවාදී සුළුතරයක්, අන්ත සුළුතරයක්, ආගම්වාදී අන්ත සුළුතරයක් ඒ ත්‍රස්ත ප්‍රහාරය දඩමීමා කරගෙන ඉස්ලාමීය දේවස්ථාන ගණනාවක් විනාශ කළ බව. කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, ඔබතුමන්ලාගේ පාර්ශ්වයට සම්බන්ධ යම් යම් පුද්ගලයන් ඒවාට වග කියන්නට ඕනෑ බව. ඔබතුමන්ලා තමයි ඒ ගිනිකන්ද අවුළන්නට කටයුතු කළේ. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, එය කළේ පෞද්ගලිකව ඔබතුමා නොවෙයි. මම දන්නවා ඒක. නමුත්, ඔබතුමන්ලාගේ පාර්ශ්වයට සම්බන්ධ කොටස් තමයි ඒක කළේ. ඒ සෑම ඉස්ලාමීය දේවස්ථානයකටම දිසාපතිතුමාගේ තක්සේරුව අනුව අපි උදව් පදව් කළා. පාලක මණ්ඩල අනුමැතිය එනකල් ඉන්න පුළුවන්ද, ඒ දේවස්ථාන ගොඩ නඟන්න? පාලක මණ්ඩල අනුමැතියට යටත්ව, ආවරණ අනුමැතියට යටත්ව ඔබතුමාගේ කාලයේත් ලක්ෂ සිය ගණනක්, දහස් ගණනක් වියදම් කළා වාගේ, ගරු අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමාගේ කාලයේත් එසේ ආවරණ අනුමැතියට යටත්ව කටයුතු කළා වාගේ අපිත් කටයුතු කරනවා. ඒ මුදල් වෙනත් කොහේටවත් ගිහිල්ලා නැහැ. ගිහිල්ලා බලන්න, අපේ රටේ පන්සල් පද්ධතිය. මා ඔබතුමාට ඒ ලැයිස්තුව දෙන්නම්. සතියක්, දෙකක් වෙලාව අරගෙන මුළු රටේම යන්න. ගරු හිටපු ඇමතිතුමනි, අපි කරපු හැම වැඩක්ම තිබෙනවා, ඇස් දෙකට පෙනෙන්න.

ගරු හිටපු ඇමතිතුමනි, කනගාටුවෙන් හෝ මේ කරුණු කාරණා මා ඔබතුමාට කියන්න ඕනෑ. මා ළඟ තිබෙනවා, පසු ගිය කාලයේ සිදු වූ දූෂණ, වංචා පිළිබඳ තොරතුරු. බලන්න, මේ වාර්තා දිහා. මේවා නිවැරැදි වාර්තා; සාවද්‍ය ඒවා නොවෙයි. මධ්‍යම සංස්කෘතික අරමුදලින් රුපියල් 351,000ක් වියදම් කරලා තිබෙනවා, ජනපති පදවි ප්‍රාප්තියට. අපේ යහ පාලන රජයේ ජනපති පදවි ප්‍රාප්ති, අගමැති පදවි ප්‍රාප්ති කියන දේවල් නැහැ. ඒ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දිනවලට කෙරෙන්නේ රටේ සංවර්ධන වැඩ. ඒවා සඳහා එවැනි මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදලින් අපි කැප කරලා නැහැ. නමුත්, ඔබතුමාගේ කාලයේ ඒක කරලා තිබෙනවා. තායිලන්ත දූත පිරිසක් ලංකාවට ආවාම ඔහේ ඉවක් බවක් නැතිව රුපියල් ලක්ෂ 10ක් දීලා තිබෙනවා. පෞද්ගලික ආයතනවලට රුපියල් ලක්ෂ 4 ගණනේ දීලා තිබෙනවා. මෙන්න මේක අහගන්න, ගරු හිටපු ඇමතිතුමනි. 2013 මැයි 01වන දා කම්කරු පෙළපාළියට රුපියල් 720,000ක් වියදම් කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ මොනවාටද? ඒකට සංස්කෘතික අංගයක්වත් ඉදිරිපත් කළාද දන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේවා බොරු නොවෙයි. මේවා විගණන වාර්තාවලින් කියන ඒවා. මා මේවා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැටුම් තෙල්වලටද දන්නේ නැහැ. නැටුම් තෙල්වලට!

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එදා සිදු වූ දූෂණ, අක්‍රමිකතා සියල්ල මේ ලේඛනවල තිබෙනවා. මා මේවා ගැන හාරා හාරා කියන්න යන්නේ නැහැ. මොකද, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුහුණ දකින කොට මට ඇත්තටම කනගාටුවකුත් ඇති වෙනවා, දිරච්ච ලුණු බාර ගැනීම ගැන.

ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම ඔබතුමාට කියන්න කැමැතියි, පුරා විද්‍යා ක්ෂේත්‍රයේත් අපි දැවැන්ත වෙනසක් කර තිබෙන බව. අපි මේ වගකීම් බාර ගත්තාට පසු පුරාවිද්‍යා ස්ථානවලට හානි කරන අයට පනවන මූල්‍ය දඩය සහ සිර දඬුවම වැඩි කරලා තිබෙනවා. පුරාවස්තු සෙවීමේ අදහසින් කැණීම් කිරීම වෙනුවෙන් වූ දඩ මුදල ඔබතුමන්ලාගේ කාලයේ රුපියල් 50,000 සිට රුපියල් 250,000 දක්වා වූ ප්‍රමාණයකයි තිබුණේ. අපි ඒ දඩ මුදල රුපියල් ලක්ෂ 5 සිට රුපියල් ලක්ෂ 20 දක්වා වැඩි කරලා තිබෙනවා. එදා සිර දඬුවම වසර දෙකට නො අඩු වසර 5ට නොවැඩි කාලයක් ලෙසයි තිබුණේ. අපි ඒක වසර 2 සිට වසර 7 දක්වා වැඩි කරලා තිබෙනවා. පැරණි ස්මාරකවලට හානි කිරීම සහ අගෞරව කිරීම සම්බන්ධයෙන් දඩ මුදල ඔබතුමාගේ කාලයේ රුපියල් 50,000 සිට රුපියල් 250,000 දක්වා ප්‍රමාණයකයි තිබුණේ. අපි ඒක වෙනස් කළා, රුපියල් ලක්ෂ 5 සිට රුපියල් ලක්ෂ 20 දක්වා. ඒ වාගේම, ස්මාරක අසල අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් මූල්‍ය දඩය ඔබතුමන්ලාගේ කාලයේ තිබුණේ රුපියල් 50,000 ඉඳලා රුපියල් 250,000 අතර ප්‍රමාණයකයි. අපි එය වැඩි කළා, රුපියල් ලක්ෂයේ සිට රුපියල් ලක්ෂ 5 දක්වා. පොදු දඬුවම් සඳහා දඩය ලෙස ඔබතුමන්ලාගේ කාලයේ තිබුණේ රුපියල් 50,000 සිට රුපියල් 250,000 දක්වා ප්‍රමාණයක්. අපි එය වැඩි කළා, රුපියල් 50,000 සිට රුපියල් ලක්ෂ 5 දක්වා. ගරු හිටපු අමාත්‍යතුමනි, අපි මධ්‍යම සංස්කෘතික අරමුදලත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් එකතු වෙලා බොහොම අමාරු කර්තව්‍යයක් ඉෂ්ට කරන්නේ. ඒ කරන්නා වූ අමාරු කර්තව්‍ය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිතුමා හැටියට ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපට අවසරය ලබා දී තිබෙනවා, මේ රටේ බෞද්ධ පුනරුදය, මේ රටේ ආගමික පුනරුදය ඇති කරන්න. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ආශීර්වාදයත් තිබෙනවා. ඒ දෙපොළම දන්නවා, එම අරමුදල්වලින් අපි මුදල් හම්බ කරන්නේ නැහැ, කැප කරන හැම සතයක්ම, හැම රුපියලක්ම සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා, ඒ වාගේම අනෙකුත් ආගමික සංවර්ධන වැඩ සටහන්වලට අපි බොහොම පිරිසිදුව යොමු කර තිබෙන බව. එම නිසා මම ඔබතුමාට විශේෂයෙන්ම කියන්න කැමැතියි, ඔබතුමා ඔය කියන වංචාකාරී ක්‍රියා සිදුවෙලා නැති බව. ආචරණ අනුමැතියට යටත්ව අපි පැහැදිලිව හා පිරිසිදුව දැවැන්ත සංවර්ධන ක්‍රියාදාම රැසක් ක්‍රියාත්මක කරගෙන යනවා.

දහම් පාසල් ඉදිවන ස්ථාන ටික මම ඔබතුමාට කියන්නම්. දැන් අපි ඒවා විවෘත කරගෙන යනවා. ඒවා විවෘත කරගෙන යන වේගය දැකලාද දන්නේ නැහැ, මේ සභාව කල් තැබීමේ යෝජනාව ගෙනාවේ. මොකද, අදත් ලංකාව පුරා විවෘත කිරීම් 10ක් තිබුණා. ඒවා නතර කරන්නද දන්නේ නැහැ, එක් එක් කට්ටියගේ උල් පන්දම් දීම තුළින් සභාව කල් තැබීමේ යෝජනා ගෙනෙන්නේ. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මම මගේ කථාව ධම්මපදය ග්‍රන්ථයේ ගාථාවකින්ම තාවකාලිකව අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ටික වේලාවක් තබා ගන්නවා, තව කුමකට හෝ උත්තර ලබා දෙන්න සිදු වුණොත් උත්තර ලබා දෙන්න. ධම්මපදය ග්‍රන්ථයේ මෙම ගාථාව සඳහන් වෙනවා,

අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ
ජිනේ කදරියන් දානේන - සච්චේන අලිකවාදිනං

"ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් දිනාගත යුතුයි, අසත්පුරුෂයා සත්පුරුෂකමින් දිනාගත යුතුයි, මසුරා දීමෙන් දිනාගත යුතුයි, බොරු කියන්නා සත්‍යයෙන් දිනාගත යුතුයි" යන්න තමයි එහි තේරුම.

ගරු මන්ත්‍රීතුමනි, මම මෙහෙම කියනවාට සමාවෙන්න. ඒ අවසාන කරුණ ඔබතුමාට අදාළයි. මොකද, ඔබතුමා බොරු යෝජනාවක් ගෙනාවේ. හැබැයි, මම ඔබතුමාට වෛර කරන්නේ නැහැ; ඊර්ෂ්‍යා කරන්නේ නැහැ; ක්‍රෝධ කරන්නේ නැහැ. මම තව මාස දෙකක් පමණ ඇතුළත ඔබතුමා සත්‍ය වශයෙන්ම සත්‍යයෙන් දිනා ගන්නවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එසේ ප්‍රකාශ කරමින්, මෙම විවාදයට සම්බන්ධ වන තවත් විශාරදයන් ඉන්නවා නම් ඒ අයගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න මගේ ඉතිරි කාලය තබා ගන්නවා. බොහොම ස්තුතියි.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමාගේ පැහැදිලි කිරීමේදී කිව්වා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට පිළිතුරු කථාවක් කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
එතුමා මට අවස්ථාව දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඇමතිතුමා අවස්ථාව දුන්නාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට දෙවතාවක් කථා කරන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ, ඇමතිතුමා අවස්ථාව දීලා නැහැ. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මගේ කාලයෙන් විනාඩි දෙකක්, තුනක් එතුමාට දුන්නාට කමක් නැහැ. මට කාලය තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම දෙවතාවක් කථා කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඉදිරිපත් කළ යෝජනාව නේ. කල් තැබීමේ යෝජනාව එතුමාගේ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමාට දෙවතාවක් කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට දෙවතාවක් කථා කරන්න බැහැ. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.46]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සංස්කෘතික අරමුදලින් රුපියල් මිලියන 3,600ක් අහිමි වීම සහ ඒවා නිවැරදි ක්‍රමවේදයෙන් තොරව යෙදවීම සම්බන්ධයෙන් හිටපු සංස්කෘතික ඇමතිවරයා වන ගරු ටී.බී. ඒකනායක මැතිතුමා සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ගරු විෂය භාර ඇමතිතුමා ධම්ම පදයෙන් උපුටා ගත් ගාථාවක් අනුව කළ පැහැදිලි කිරීම සහ එතුමාගේ ප්‍රකාශවලින් කියැවුණේ, ගරු ටී.බී. ඒකනායක මැතිතුමා විසින් ගෙනාපු යෝජනාව ආපසු එතුමා වෙතම යවනවා මිසක්, එතුමා එය පිළිගන්නේ නැහැ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, දහම් පාසල් හදන එක ගැන අපි කිසිම වෙලාවක විරුද්ධ නැති බව. වෙහෙර විහාරස්ථාන, චෛත්‍ය, පල්ලි, පන්සල් ගොඩනඟනවාට අපි කිසිම වෙලාවක විරුද්ධ නැහැ. ඒක රජය සතු වග කීමක්. ශාසනය ආරක්ෂා කර ගැනීම, ශාසනයේ අභිවෘද්ධිය, ආගමික පිබිදීම වෙනුවෙන් රජයේ වගකීම තමයි ඒ අවශ්‍ය කටයුතු පුරවැසියා වෙනුවෙන් කර දීම.

හැබැයි, ටී.බී.ඒකනායක මන්ත්‍රීතුමා මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අවභාවිත වීම සම්බන්ධයෙන් තමයි මේ යෝජනාව ගෙනෙන්නේ. අපේ ගැමි ව්‍යාවහාරයේ තිබෙනවා, "කසාදයට කලින් නංගි පෙන්නුවාට, බඳින දවසට ලැබෙන්නේ අක්කා" කියලා. සජිත් ප්‍රේමදාස මහත්මයා හරි ලස්සනට සංඛ්‍යාලේඛන ගොඩක් ඉදිරිපත් කළා. දිසවාපිය ගොඩ නඟනවා කිව්වා; සීගිරිය ගොඩ නඟනවා කිව්වා; දඹුල්ල ගොඩ නඟනවා කිව්වා. ඒ සියල්ල හරි. ඒ සියල්ල ගැන අපි කිසිම වේලාවක චෝදනා කරන්නේ නැහැ.

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත අනුව ඒ කටයුතු කිරීම තමයි එතුමාට තිබෙන වගකීම. ඒ කටයුතු මොනවාද? 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත ගැන එහි දෙවැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා;

> "ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ ආගමික ස්මාරක සංවර්ධනය කිරීම සඳහා ද ශ්‍රී ලංකාවෙහි සහ විදේශයන්හි සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී, ප්‍රතිසංස්කරණය කිරීමේ දී, ආරක්ෂා කිරීමේ දී සහ ආගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේ දී දරන ලද වියදම් පියවීම පිණිස ද කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැලසීම පිණිස ද සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද අරමුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා "මධ්‍යම සංස්කෘතික අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම ..."

මේක තමයි මධ්‍යම සංස්කෘතික අරමුදලේ පරමාර්ථය.

බෞද්ධ කටයුතු සම්බන්ධයෙන් බුද්ධ ශාසන ඇමතිවරයෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ වාගේම මුදල් ඇමතිවරයෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. මුදල් ඇමතිවරයා වාර්ෂික අය වැයක් ඉදිරිපත් කරනවා. මේ වාර්ෂික අය වැය තුළ බුද්ධ ශාසනය වෙනුවෙන්, බුද්ධ ශාසන ඇමතිවරයා වෙනුවෙන් වගකීමක් තිබෙනවා. හැබැයි, ඒ වගකීමෙන් එතුමා බැහැර කරලා, බුද්ධ ශාසනය වැඩි දියුණු කිරීමට, චෛත්‍ය ගොඩනැඟීමට, දහම් පාසල් වැඩි දියුණු කිරීමට කටයුතු කරනවා.

ක්‍රිස්තියානි කටයුතු ඇමතිවරයාට ක්‍රිස්තියානි පල්ලි, ක්‍රිස්තියානි දේවස්ථාන, ක්‍රිස්තියානි දහම් පාසල් වැඩි දියුණු කිරීමට, හින්දු කටයුතු ඇමතිවරයාට ඒ ආගමික කටයුතු සිදු කිරීමට වෙන් කර ඇති අය වැයේ ප්‍රතිපාදන ඉවත් කර, ඉදිරි මැතිවරණයකදී බලාපොරොත්තු වෙන නායකත්වය කෙරෙහි කෙළ හලාගෙන, ඒ ගැන කෑදරකමින් රට වටා යන්න ව්‍යාපෘතියක් සූදානම් කරනවා නම්, ඒ ගැන තමයි සැකයක් මතු වෙලා තිබෙන්නේ. තමන්ගේ ප්‍රතිරූපය ගොඩනඟා ගැනීමට, තමන්ගේ ප්‍රතිරූපය ඉහළට ගෙන යෑමට මේ විධියට ජාතික ධනය වැය කරනවා. අද වෙද්දී අහන්න ලැබෙන සියලු ප්‍රවෘත්තිවල තිබෙන්නේ මොනවාද? උතුරු නැඟෙනහිර අපේ විහාරස්ථාන, පෞරාණික සිද්ධස්ථාන ආරක්ෂා කර ගැනීමට security guard මහත්මයෙක්වත් නැහැ. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආරක්ෂක මුර කුටියක් හදාගන්න පුළුවන්කමක් නැහැ. කූරගල, ඒ වාගේම මුහුදු මහා විහාරය පැත්තේ ඒ කටයුතු කර ගන්න හැකියාවක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා, ඔබතුමාගේ පිළිතුරු කථාවේ දී මට ගහන්න. ඔබතුමා දැන් ටී.බී. ඒකනායක මැතිතුමාට ඇති තරම් දුන්නා නේ. සංස්කෘතික අරමුදලේ එකතු වෙලා තිබුණු අතිවිශාල මුදල කොල්ල කන එක ගැන ටී.බී. ඒකනායක මැතිතුමාට තිබුණු වේදනාව නිසා තමයි මේ යෝජනාව ගෙනාවේ. මේ මුදල් කොල්ල කාලා, මේ මුදල්වලින් තමන්ගේ ප්‍රතිරූපය ගොඩනඟා ගැනීමට උත්සාහ කරනවා. මහවට, එහෙම නැත්නම් අපේ යාපහුවට ලක්ෂ හැටක් දීලා තව ලක්ෂ 150ක් විතර ප්‍රතිරූපය වෙනුවෙන් යොදවනවා. නිවාස සංවර්ධන අධිකාරිය ඔබතුමා යටතේ තිබෙනවා නේ. මම පසුගිය දවස්වල ප්‍රශ්නයක් ඇහුවා, මෙම ආයතනයේ සේවකයන් 1,500යි ඉන්න ඕනෑ. සේවකයන් 4,500ක් ඉන්නේ ඇයි? කියලා. මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවට හතර වතාවක් ආවා. හැබැයි, ඒ හතරවතාවේම ඔබතුමා උත්තර දෙන්න හිටියේ නැහැ. ඔබතුමා ඊයේ සමහර ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා. මම හිතුවා, අනේ මගේ ප්‍රශ්නයටත් පිළිතුරු දෙයි කියලා. ඒ ප්‍රශ්නයත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිසා මෙම විවාදය තුළදී හෝ ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා. පුටුවක් නැති, මේසයක් නැති, පින්තූර ලකුණු කිරීමට යන නිලධාරින්ගෙන් ඔබතුමා ගන්න වැඩ ගැන මේ පාර්ලිමේන්තුවටත් කිව්වොත් හොඳයි. ඔබතුමා උස අය, මිටි අය හැටියට තෝරා පත්වීම් දුන් ඒ පුද්ගලයන්ට කොන්ත්‍රාත් පදනම යටතේ නොවෙයි ඒ පත්වීම් දීලා තිබෙන්නේ. ඒ දුන්න පින්තූර ගෙවල්වල ගහලා තිබෙනවාද කියලා පරීක්ෂා කරන්න පත්කළ නිලධාරින්ට ඔබතුමා මොකක්ද කරන්නේ කියන එක ගැනත් උත්තර දුන්නා නම් හොඳයි.

දැන් මේ මධ්‍යම සංස්කෘතික අරමුදල ගැන කථා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ, වෙන කාගේවත් ප්‍රතිරූපය ගොඩනඟා ගැනීමයි. ඒ පරමාර්ථය වෙනුවෙන් තමයි මේ කටයුතු කෙරෙන්නේ.

ගරු ඇමතිතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදල වෙනුවෙන් ආරම්භ කළ ස්ථිර තැන්පත් ගිණුම් 14ක් මේ වන විට වසා දමා තිබෙනවා. එම ගිණුම් දහහතරේ මුදල් නැහැ. ඒවායේ තිබුණු රුපියල් මිලියන 1,600කට වැඩි මුදලකට වෙච්ච දෙයක් නැහැ. දැන් සජිත් ප්‍රේමදාස ඇමතිතුමා මධ්‍යම සංස්කෘතික අරමුදල සම්බන්ධයෙන් යම් කැබිනට් අනුමැතියක් ඉල්ලනවා. මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙන්නේ අගමැතිවරයා. මේක, අපි ගෙනෙන යෝජනාවක්. එහෙම නැතිව අපි කරන චෝදනාවක් නොවෙයි. අපි යෝජනාව ගෙනාවාට, චෝදනාව කරන්නේ අගමැතිවරයායි. පසුගිය දවස්වල පුවත් පත් තුළින් අපි දැක්කා, මේ මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න අගමැතිවරයා කමිටුවක් පත්කරන්න යනවාය කියන ප්‍රවෘත්තිය. මේ විධියට ඔබතුමන්ලාගේ පක්ෂය තුළ අර්බුද ගොඩනැගෙද්දි දැන් මොකද මේ වෙන්නේ?

මහ බැංකුවෙන් මුදල් කොල්ල කෑවේ කොහොමද? ගුවන් යානා මිලදී ගනිද්දී කොමිස් ගැහුවේ කොහොමද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට තිබෙන විනාඩි 15ත් මම ගන්නවා.

මම කියන්නේ මේකයි. ඒ සිද්ධි දැන් එළියට එනවා. "සජිත් ප්‍රේමදාස මහත්මයා විතරයි වැඩකාරයා; ගමේ වැඩක් කරන්න පුළුවන් මිනිහා එතුමායි" කියලා එක්සත් ජාතික පාක්ෂිකයා ළඟ මතයක් තිබුණා. හැබැයි, අද වෙනකොට ඒ මතයට මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමා වැඩ කරන්නේ කොහොමද, මුදල් යොදවන්නේ කොහොමද කියන එක අද වනවිට සාක්ෂි ඇතිව ඔප්පු වෙමින් තිබෙනවා. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමනි, ඔබතුමා ජනාධිපති අපේක්ෂකයා වීම තමයි අපේ බලාපොරොත්තුව. මොකද, එතකොට එක්සත් ජාතික පක්ෂය ඉතිරි කර ගෙන හිටපු, රටට අනාවරණය විය යුතු කොටස එළියට ගන්න පුළුවන් වෙයි. හොඳයි කියලා වර්ණනා කළ කොටසේ තිබෙන තිත්ත ඇත්ත එළියට ගන්න පුළුවන් වෙයි. ඒක තමයි කර ගත යුත්තේ. ඒක ඔබතුමාට දැනගන්න ඕනෑ තව අවුරුදු පහකින්ද, හයකින්ද කියලාවත්, ඒක කොහොම වෙයිද කියලාවත් මම දන්නේ නැහැ. නමුත්, තව මාසයකින් දෙකකින් රට වැසියාට දැනගන්න පුළුවන් වෙයි, සජිත් ප්‍රේමදාස මහත්මයා මොන වාගේ පුද්ගලයෙක්ද කියලා. එතුමා මේ වැඩ කටයුතු කළේ කොහොමද, චක්‍රලේඛ උල්ලංඝනය කළේ කොහොමද, චක්‍රලේඛ කුණු කූඩයට දැම්මේ කොහොමද, නිලධාරින් අඩන්තේට්ටම්වලට ලක් කළේ කොහොමද කියන සියලු දේවල් මේ ලිපිගොනු දිහා බැලුවාම පෙනෙනවා.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ රැස්වීමට අගමැතිවරයා වාඩිවෙන්නේ නැහැ. නමුත්, අගමැතිවරයා තමයි එහි සභාපතිවරයා. ඒ වුණාට, අගමැතිවරයාගේ අනුමැතියක් මේ මුදල්වලට ලැබෙන්නේ නැහැ. එතුමාගේ අනුමැතියක් නැතිව මේ මුදල් යොදවා ගන්න, කැබිනට් මණ්ඩලයේදී මංගල සමරවීර ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ වෙනුවෙන් මේ මුදල් ටික නිදහස් කරලා දෙන්න කියලා. සජිත් ප්‍රේමදාස ඇමතිතුමනි, මෙතැනින් කොමිස් යන්නේ නැහැ, හොරකම් නැහැ, වංචාවක් නැහැ කියලා ඔබතුමා දැන් කිව්වා. හැබැයි ගරු ඇමතිතුමනි, මේ සඳහා කැබිනට් අනුමැතිය ඉල්ලන ඒ විස්තරයේම ඔබතුමා කියනවා, "ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පවරා ඉටු කර ගැනීම සඳහා මේ මුදල් නිදහස් කරන්න" කියලා. ඒත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ප්‍රසම්පාදන කොමිසමක් හදන්න ආපු ආණ්ඩුවක් නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මේ සඟවලා කථා කරන්නේ මොන ආයතන ගැනද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා ඒක එළි කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොන ආයතනයද? රාජ්‍ය ආයතනද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
රාජ්‍ය ආයතනයක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම නම් මොකක්ද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පිට, - [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද, ආයතනය?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මා ළඟ තිබෙනවා, ඒ නිරීක්ෂණ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා කියන්න, ඒ රාජ්‍ය ආයතන මොනවාද කියලා. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, SD & CC ආයතනය,-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ජනාධිපති අපේක්ෂකතුමනි, ඔබතුමාගේ පැත්තෙන් තොරතුරු නොදුන්නත් ඔන්න, අපි දෙනවා. මේ කියන්නේ, SD & CC එක ගැන තමයි; රාජ්‍ය ඉංජිනේරු නිර්මාණ නීතිගත සංස්ථාව ගැන තමයි. ඒවාට කරුණු, කාරණා බොහෝයි. ඒ කර ගන්න ඕනෑ වැඩ පිළිවෙළවල් කර ගන්න. රාජ්‍ය ඉංජිනේරු නිර්මාණ නීතිගත සංස්ථාව ආදායම් උපයන වෙන මාර්ගවලට යොමු කරන්න ඕනෑ. එම නිසා මේ ගොල්ලන්ට වැඩ වැඩියි. ඒ ගොල්ලන්ට වැඩ වැඩි නිසා මේ සඳහා විශේෂිත කණ්ඩායම් බඳවා ගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ ඕනෑ කරන කණ්ඩායම් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව බඳවා ගන්න ඉඩ දෙන්න කියලා ඔබතුමාගේ අත්සනින් - සජිත් ප්‍රේමදාස මහත්මයාගේ අත්සනින්- යුතුව ලියලා ඉල්ලනවා. ලජ්ජා නැද්ද? දුක නැද්ද? මෙහෙම වුණාම රාජ්‍ය මුදල් අවභාවිත වෙන්නේ නැද්ද ගරු ඇමතිතුමනි? මේ, ප්‍රසම්පාදන කොමිසමක් ගෙනනවාය කියපු ආණ්ඩුවක් නේද? කිරිඇල්ල ඇමතිතුමන්ලා කිව්වේ ප්‍රසම්පාදන කොමිසමක් පිහිටුවනවා කියලා නේද? [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

මේ පාර්ලිමේන්තුව තුළ සිටින කිසිම මන්ත්‍රීවරයකුට කිසි ලෙසකින්වත් චෝදනා කරන්න බැහැ. [බාධා කිරීම්] හැන්සාඩ් වාර්තාවෙන් මේවා ඉවත් කරන්න ඕනෑ. මෙන්න, මගේ අතේ තිබෙනවා ඒ කැබිනට් පත්‍රිකාව. එම කැබිනට් පත්‍රිකාව මම සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

රාජ්‍ය ආයතනවලට, ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව කොන්ත්‍රාත් දෙන්න පුළුවන් කියලා අපි කැබිනට් මණ්ඩලයේදී කිහිප වතාවක්ම තීරණය කර තිබෙනවා. [බාධා කිරීමක්] රාජ්‍ය ආයතනවලට. පෞද්ගලික, -[බාධා කිරීමක්] Please, let me speak. අපි පෞද්ගලික සමාගම්වලට කිසිම කොන්ත්‍රාත් එකක් දීලා නැහැ. ඒ ඔක්කොම රජයේ ආයතනවලටයි දීලා තිබෙන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු සභානායකතුමා මහාමාර්ග ඇමතිවරයා වශයෙන් ඉන්න කොට ඒ කටයුතු කළ ආකාරය පිළිබඳ සියලු විස්තර තිබෙනවා. මම අද සභානායක ජනාධිපති අපේක්ෂකතුමා ගැන නොවෙයි කථා කරන්නේ. අනාගත එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකතුමා ගැනයි මම මේ කථා කරන්නේ. මම කියන්නේ මේකයි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගමේ ග්‍රාම සංවර්ධන සමිතියටත් ගෙනෙන්න ඕනෑය කියපු ඔබතුමන්ලා, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව ලක්ෂ 415ක් වියදම් කරන්න, කෝටි 35ක් වියදම් කරන්න, කෝටි 25ක් වියදම් කරන්න,- [බාධා කිරීමක්] මා ළඟ එම සියලු ලිපිගොනු තිබෙනවා. බුද්ධ ශාසන අමාත්‍යාංශයක් රටේ තියෙද්දී, නිවාස අමාත්‍යාංශයට, නැත්නම් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට වෙහෙර විහාරස්ථානවල, ඒ දේවස්ථානවල වග කීම ගන්නවා. එහෙම කරන්නේ ප්‍රතිරූපය නංවා ගන්න නොවෙයිද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සන්තෝෂ වෙනවා, ගෞරවනීය මහා සංඝරත්නය ඉදිරියේ අපේ ගරු මන්ත්‍රීතුමා මේ විධියට කථා කිරීම ගැන. බොහොම හොඳයි. ඔබතුමා තව තවත් කථා කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
දිවුලපිටිය මැතිවරණ කොට්ඨාසයේ සිටින සියයට 95ක් බෞද්ධයන් නියෝජනය කරන, බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අසීමිතව ගරු කරන පුද්ගලයකු විධියට ඉතාම වැදගත් ආකාරයට මම කියන්නේ මෙච්චරයි. රජයේ යම් නීතියක් තිබෙනවා; වැඩ පිළිවෙළක් තිබෙනවා; අරමුණක් තිබෙනවා. මේ අරමුණුවලින් පිටස්තරව, තමන්ගේ ප්‍රතිරූපය නංවා ගැනීම සඳහා බෞද්ධාගම පාවා දෙනවා නම්, සංස්කෘතිය පාවා දෙනවා නම්, සංස්කෘතික අරමුදල කොල්ලකනවා නම් ඒ අයට අප මොකක්ද කළ යුත්තේ? රටේ සංස්කෘතික අරමුදල කොල්ල කාලා තම ප්‍රතිරූපය නංවා ගන්න උත්සාහ කරනවා නම්, ඒ තරම් පාපයක් තවත් නැහැ.

නිවාස සංවර්ධන අධිකාරියේ සිද්ධ වූ අසීමිත වංචා, දූෂණ තොගය ගැනත් අපි දන්නවා නේ. නිවාස අධිකාරිය යටතේ තිබෙන මුදල් මෙතුමන්ලා පාවිච්චි කළ ආකාරය ගැනත් අපි දන්නවා නේ. මේවා ගැන කලබල වෙලා, තැන් තැන්වල ඉඳගෙන අපට නිකම් චෝදනා කළාට වැඩක් නැහැ. මේ කටයුතු දෙන්න ඒ ඒ අමාත්‍යාංශවලට. බෞද්ධ කටයුතු පිළිබඳ ඇමතිතුමා -ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා- මේ ගරු සභාවේ දැන් ඉන්නවා. එතුමා දක්ෂ ඇමතිවරයෙක්; වැඩ කරන්න උපන් හපන්කම් ඇති කෙනෙක්; හිටපු මහ ඇමතිවරයෙක්. බුද්ධ ශාසන අමාත්‍යාංශයට මුදල් ටික ලැබුණා නම්, එතුමාටත් පුළුවන් පන්සල් හදන්න. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමනි, ඔබතුමාට පන්සල් හදන්න බැරිද? ඔබතුමාටත් පන්සල් හදන්න පුළුවන් නේ. එතුමාට පන්සල් හදන්න පුළුවන්කම තිබෙද්දී, එතුමාට වෙන් වන

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

මුදල එතැනින් ඉවත් කරලා, අනාගත ජනාධිපති අපේක්ෂකත්වය ගැන හිතාගෙන සජිත් ප්‍රේමදාස මැතිතුමා මධ්‍යම සංස්කෘතික අරමුදල අවභාවිත කරනවා. ඒකයි ගරු ටී.බී. ඒකනායක මැතිතුමා මේ යෝජනාව ගෙනාවේ. මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිබෙන්නේ සීගිරිය සංවර්ධනය කරන්න, දඹුලු ලෙන් විහාරය සංවර්ධන කරන්න, අටමස්ථාන සංවර්ධනය කරන්න හා කලා ශිල්පීන් නංවන්න තිබෙන මුදල්. දහම් පාසල්වලට මුදල් දෙනවා නම්, සියලු දහම් පාසල්වලට -10,000ද, 12,000ද, 15,000ද- අවශ්‍යතා අනුව මුදල් දෙන්න; බුද්ධ ශාසන අමාත්‍යාංශය හරහා සොයා බලා ඒ මුදල් ටික ලබා දීමට කටයුතු කරන්න. ඉස්ලාම් දහම් පාසල්වලට, කතෝලික දහම් පාසල්වලට අවශ්‍ය මුදල් ටික දෙන්න. ඒ ගැන අපි කිසිම දවසක, කිසිම වේලාවක විවේචනය කරන්නේ නැහැ.

දැන් බලන්න නිවාස අධිකාරිය යටතේ ආරම්භ කරපු නිවාස ව්‍යාපෘතිවල තත්ත්වය මොකක්ද කියලා. ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිනිය, මම ඔබතුමියගේ ගම් පළාතට ඊයේ-පෙරේදා ගියාම දැක්කා නිවාස ව්‍යාපෘති යටතේ ගෙවල් 200ක් විතර හදලා තිබෙන බව. හැබැයි, ගෙවල් 100ක විතරයි මිනිසුන් පදිංචි වෙලා ඉන්නේ. ඉතුරු මිනිස්සු ගෙවල් දාලා ගිහින්. ඉන්න මිනිසුන්ටත් බොන්න වතුර නැහැ. ඒ මිනිසුන්ට බොන්න වතුර ටික බවුසර්වලින් ගෙනෙන්නේ. මන්නාරම දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා කිව්වා, "ගෙවල් 2,000කට විතර මුල්ගල් තබා තිබෙනවා, - [බාධා කිරීම්]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කතෝලිකයකු හැටියට විහාරස්ථානවලට කරන සේවය ගැන පුදුමාකාර ඊර්ෂ්‍යාවකින් කථා කරනවා. ඒ ගැන මම කනගාටු වනවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ එහෙම කථා කරන්න එපා. සිංහල බෞද්ධයන්ගේ ඡන්දවලින් තමයි තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට ආවේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගැලරියේ ගරුතර මහා සංඝරත්නය වැඩ ඉන්නවා. උන්වහන්සේලාට ගරු කරමින් මා මෙය කියන්නේ. ගරුතර මහා සංඝරත්නය පෙන්වමින්, සංස්කෘතික අරමුදලේ මුදල් අවභාවිත කිරීම ගැනයි මම මේ කියන්නේ. [බාධා කිරීම්] එහෙම නැතුව මේ මුදල් අවභාවිත කරමින්, ප්‍රසම්පාදන - [බාධා කිරීම්] මේක පුදුම කලබලවීමක් නේ. අපි මොකටද භය වෙන්නේ? ඔබතුමන්ලා ඉස්සෙල්ලා ඔබතුමන්ලාගේ පක්ෂයේ තිබෙන ගැටලුව විසඳා ගන්න. ඉන් පස්සේ ජනාධිපති අපේක්ෂකකම ඔබතුමන්ලාගේ නායකයාට අරගෙන දෙන්න. ඔබතුමන්ලාගේ නායකයා තරගයට එවන්න. ඒකට අපි ලෑස්තියි. [බාධා කිරීම්] ඕනෑ කන්දකට යමු. හරිද? ඕනෑ දෙයක් කරමු. ඔබතුමායි මායි දෙදෙනාම එක කන්දේ තමයි හිටියේ. මම එකක, ඔබතුමා එකක නොවෙයි. දෙදෙනාම එක කන්දේ තමයි ඉඳලා ආවේ. බිංගිරියේ කන්දයි, දිවුලපිටියේ කන්දයි කිව්වාම අමුතු කඳු නොවෙයි, දෙකම එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ වෙන දෙයක් නොවෙයි. යම්කිසි රජයක ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, ඒ ප්‍රතිපත්තිය තුළ ජාතික අය වැයක් හැදෙනවා නම්, අපේ ආගම්වල පූජ්‍ය පක්ෂයේ සියලුදෙනා බලාගෙන ඉන්නේ, තමන්ගේ ආගම වෙනුවෙන් මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලායි. මේ ආණ්ඩුව ආගම වෙනුවෙන් කරන කටයුත්ත අපේ පන්සල්වල ස්වාමීන් වහන්සේලා බලාගෙන ඉන්නවා. හැබැයි, පසුගිය අය වැයේ එහෙම දෙයක් පෙනෙන්න තිබුණේ නැහැ. අපේ බුද්ධ ශාසන ඇමතිතුමාට එහෙම බලයක් දීලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි මධ්‍යම සංස්කෘතික අරමුදල යොදා ගන්නේ.

කටුවපිටිය දේවස්ථානය ගොඩනැංවීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වනවා. ඒක හදිසි ප්‍රහාරයක්. ඒක, ඒ මිනිසුන් කානික්කා කැටයට රුපියල, රුපියල් දෙක, රුපියල් පහ දාලා එකතු කරලා හදපු පල්ලිය. කොච්චිකඩේ ශාන්ත අන්තෝනි මුණිඳුන්ගේ දේවස්ථානය ගොඩනඟලා දුන්න එක ගැන අපි ස්තුතිවන්ත වනවා. ඒක, ඒ මිනිසුන් කානික්කා කැටයට සල්ලි දාලා එකතු කරලා හදපු පල්ලිය. මඩකලපුව සියෝන් දේවස්ථානය ගොඩනඟලා දුන්න එකට අපි ස්තුතිවන්ත වනවා. ඒක, මිනිසුන් බොහොම අමාරුවෙන් එකතු වෙලා ගොඩනඟා ගත්ත පල්ලිය. හැබැයි, මේ ආණ්ඩුවේ ඉන්න අගමැතිවරයායි, ජනාධිපතිවරයායි දෙපැත්තේ ඉඳලා ජාතික ආරක්ෂාව බාල්දු කරපු නිසා තමයි ඒ පල්ලි තුනටම ප්‍රහාර එල්ල වුණේ. මේ පල්ලි තුනටම බෝම්බ ගහලා, සුනු විසුනු වුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වරදින්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියන්නේ අමූලික අසත්‍ය නේ. මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිබෙන මුදල්වලින් තමයි ඒ දේවස්ථාන තුන ඇතුළු ඔක්කෝම හදන්නේ. තවත් හදාගෙන යනවා. ඇයි, ඒකට විරුද්ධ? [බාධා කිරීමක්] ඇයි, ඔබතුමා ඒකට විරුද්ධ? [බාධා කිරීමක්] නැහැ. ඇයි, විරුද්ධ? ඔච්චර ඊර්ෂ්‍යා කරන්නේ ඇයි?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ආණ්ඩුවේ විෂය පථයෙන් පිටට ගිහිල්ලා - [බාධා කිරීම්] ආණ්ඩුවේ විෂය පථයෙන් පිටට ගිහිල්ලා, ඒ වාගේම - [බාධා කිරීම්] කලබල වෙන්න එපා. ජනාධිපති අපේක්ෂකයෙකුට ඉන්දික අනුරුද්ධ කියන්නේ කුඹියෙක් වාගේ බොහොම පොඩි එකෙක්. ඒ නිසා ජනාධිපති අපේක්ෂකයෙක් වුණාම, ඒ type එකේ අයත් එක්ක වැඩ කරන්න. අපිත් එක්ක ඔට්ටු වෙන්න එන්න එපා.

මම කිව්වේ මේකයි. මන්නාරමේ අපේ මන්ත්‍රීතුමා අද උදේ අගමැතිතුමාට ප්‍රශ්නයක් යොමු කළා. අගමැතිතුමා එය පරීක්ෂා කර බලා කියනවා කිව්වා. මොකක්ද, අගමැතිතුමාට යොමු කරපු ප්‍රශ්නය? උතුරේ, මඩකලපුවේ ගෙවල් 2,000කට වඩා සෑදීමට මුල්ගල් තබා තිබෙනවා. තවම ඒ අයට ලක්ෂයයි දීලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, තවම ලක්ෂයයි දීලා තිබෙන්නේ. 2018 ඉඳලා 2019 මේ අවුරුද්ද ඉවර වනතුරු ඒ මිනිසුන්ට සල්ලි දීලා නැහැ, ඒ මිනිසුන්ට මුදල් ගෙවන්නේ නැහැ. දැන් තමුන්නාන්සේ කිව්වා, SD & CC එකෙන් ඒවා කරන්නේ කියලා. අපි දන්නවා, ඒකෙන් කරන විදිය. මේ හැම රාජ්‍ය ආයතනයකම උප කොන්ත්‍රාත්කරුවෙක් ඉන්නවා. ඒ උප කොන්ත්‍රාත්කරුවා ඉන්න ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හෝ හිතවතකුගේ මාර්ගයෙන් ඒ උප කොන්ත්‍රාත්කරුවා තමයි මේ ඉදිකිරීම් කරන්නේ. ඒ සැපයුම්කරුවෝ ඔක්කෝම ප්‍රාදේශීය දේශපාලනඥයෝ. මේ ගෙවල්වලට වෙන් කරන මුදල්වලින් ප්‍රාදේශීය දේශපාලනඥයාට කොටසක් යනවා. පසුගිය දවස්වල දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ඒක අනාවරණය වුණා. එවැනි සිද්ධි වෙනවා. ඒ නිසා එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන්න එන්න එපා. මම කියන්නේ, මේ මුදල් අවභාවිතය -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

හොඳයි, මට ඒ ඇති. මම කියන්නේ මේකයි. ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව මේ මිලදී ගැනීම් සහ ඉදිකිරීම් කරන්නට අවස්ථාව ඉල්ලීමත්, යහ පාලන ආණ්ඩුවේ මූලධර්මවලට පයින් ගැසීමක්. ඒ වාගේම මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු ඒ නිලධාරීන්ගේ අනුමැතිය නැතුව කටයුතු කිරීමත්, රාජ්‍ය මුල්‍ය අවභාවිත කිරීමක්. ඒ වාගේම මේ විෂයට අදාළ ජයවික්‍රම පෙරේරා මැතිතුමා වාගේ හිටපු මහ ඇමතිවරුන්, හිටපු දක්ෂ ඇමතිවරුන් කළ යුතු කාර්ය භාරය කොල්ලකෑමත් දේශපාලන සදාචාරයට ගැහීමක්.

තමුන්නාන්සේලාගේ ජනාධිපති අපේක්ෂක ප්‍රශ්න තමුන්නාන්සේලා විසඳා ගන්න. හැබැයි, මේ විධියට ජනතා මුදල් නාස්ති කරන්න, ජනතා මුදල් විනාශ කරන්න, ජනතා මුදල්වලින් මේ විධියට සුදු කෙළින්න ආණ්ඩුවට ඉඩ දෙන්න බැහැ. මේ ගරුතර මහා සංඝ රත්නය -අපේ භික්ෂූන් වහන්සේලා-, අපේ ආගමික නායකයන්, අපේ විහාරස්ථානවල දායක සභාව, අපේ මිසම් පාලක කමිටු, පල්ලි, දේවස්ථානවල කමිටු කියන මේ සියල්ල දැනගත යුතු කාරණාවක් අපි පැහැදිලිවම කියනවා. මේ ආණ්ඩුව track එක පැනලා තමයි යන්නේ. ආණ්ඩුවේ අදාළ අමාත්‍යාංශ විෂය පථයෙන් පිට පැනලා තමයි යන්නේ. බුද්ධ ශාසනය ගොඩනඟන්න ඒ කටයුතු කළත්, ඒ තුළ විශාල දූෂණයක් සිද්ධ වෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ පාර්ලිමේන්තුවේ COPE එකට මේ සියලු කටයුතු එකක් නැර ගෙනැල්ලා සොයා බලා, පරීක්ෂා කරලා මේ රාජ්‍ය මුදල් අවභාවිත වීම සම්බන්ධයෙන් සුදුසු පරීක්ෂණයක් කරන්න කියලා. බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් වෙන් කර තිබෙනවා.

ඊට ප්‍රථමයෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration, Disaster Management and Livestock Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

[අ.භා. 5.12]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පෙනෙන විධියට අද විපක්ෂය බොහොම බියගැන්වී, තැතිගැන්වී ආගමික කටයුතු වෙනුවෙන් කරන කටයුතුවලටත් විරුද්ධව කටයුතු කරන වේලාවක්. තමුන්නාන්සේලාගේ කාලයේ මේ කටයුතු කරන්න බැරි වෙලා, තමුන්නාන්සේලාගේ කාලයේ බෞද්ධාගම වෙනුවෙන්, අනෙක් ආගම් වෙනුවෙන් කටයුතු කරන්න බැරි වෙලා අද වනවිට අපේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමා, අපේ මැති-ඇමතිවරුන් මේ කටයුතු කරන කොට, ඒකට ඊර්ෂ්‍යා හිතිලා තමුන්නාන්සේලා කටයුතු කරනවා.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමා බොහොම භය වෙලා. එතුමා ප්‍රසම්පාදනය ගැන කථා කරනවා. ප්‍රසම්පාදනයක් ගැන නොවෙයි මේ යෝජනාවේ තිබෙන්නේ. මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් ගැනයි මේ කථා කරන්නේ. මේ අවුරුද්දේ අපි බුද්ධ ශාසනය වෙනුවෙනුත්, ආගම වෙනුවෙනුත් "ගම් පෙරළිය" වැඩසටහනින් විතරක් රුපියල් බිලියන හතක් විතර වියදම් කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ මොන විහාරයද, මොන පන්සලද, මොන ආගමික ස්ථානයද දියුණු කළේ කියලා අපි අහනවා. නමුත් අද වනවිට මධ්‍යම සංස්කෘතික අරමුදලින් විතරක් නොවෙයි, "ගම් පෙරළිය" වැඩසටහනින් වාගේම වෙනත් වැඩසටහන්වලින් ද ආගමික ස්ථාන දියුණු කරන්න විශාල මුදලක් වියදම් කරනවා. ඉතිහාසය දිහා බැලුවොත් පෙනෙනවා, බෞද්ධාගම වෙනුවෙන් වාගේම වෙනත් ආගම් වෙනුවෙන් වැඩියෙන්ම වැඩ කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය බව. මේ රටේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය රජය භාරයට අරගෙන, ඒවාට රජයේ මුදල් වියදම් කරන්න පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයයි. අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා පිරිවෙන්වල ඉන්න ස්වාමීන් වහන්සේලාට ලබා දෙන දායක මුදල හය හත් ගුණයකින් වැඩි කළා. නමුත් තමුන්නාන්සේලා ශත පහක්වත් වැඩි කළේ නැහැ. මේ රටේ වෙහෙර විහාර හැදුවා නම් ඒ සියල්ල කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය විසින්. කතරගම කිරි වෙහෙර, මහියංගණ විහාරය ආදී සියල්ල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවති කාලයේ තමයි හදලා තිබෙන්නේ. අද සජිත් ප්‍රේමදාස මැතිතුමා, අපේ ආණ්ඩුව, මේ කටයුතු කරන කොට අපේ හිටපු සංස්කෘතික ඇමතිතුමා කාගේ හෝ කොන්ත්‍රාත්තුවක්, ලඤ්ජයක් බාර අරගෙන මෙහෙම කටයුතු කරනවාද කියන්න මම දන්නේ නැහැ. ඔබතුමා බොහොම වැදගත් මනුස්සයෙක්. ඒ නිසා මේ වාගේ කුණු ගොඩවල් බාර ගන්න එපා, ටී.බී. ඒකනායක මැතිතුමනි. තමුන්නාන්සේ අද හිතට එකඟව නොවෙයි කථා කරන්නේ. තමුන්නාන්සේ බෞද්ධාගමට විරුද්ධත් නැහැ; අපි කරන වැඩවලට විරුද්ධත් නැති බව අපි දන්නවා. නමුත් අද අපි මේ කටයුතු කරද්දී විපක්ෂය පොඩ්ඩක් භය වෙලා ඉන්නවා.

මොනරාගල දිස්ත්‍රික්කයට විතරක් මම හිතන හැටියට මෙතුමා අද වන කොට රුපියල් බිලියනයක් විතර වෙන් කරලා තිබෙනවා. රුපියල් ලක්ෂ හත්සියයක වියදමින් අද වන කොට බුදුරුවගල රජ මහා විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කරගෙන යනවා. මාලිගාවිල බුදු පිළිමය නඟා සිටුවීමේ කටයුතු කළේත් හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමායි. අඩු තරමින් ඒ විහාරයේ මළුව -භූමිය-

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

හදන්න අවුරුදු 20ක් තිස්සේ බැරි වුණා. අද මෙතුමා සංස්කෘතික ඇමති වෙලා, රුපියල් මිලියන 300ක් විතර වියදම් වන වැඩ පිළිවෙළක් පටන් ගෙන තිබෙනවා. මම හිතන්නේ මේවා දකින කොට තමුන්නාන්සේලාට පොඩි ඊර්ෂ්‍යාවක් ඇති වෙනවා ඇති, අපට කරන්න බැරි වෙච්ච වැඩ මෙතුමන්ලා කරනවා කියලා.

රුපියල් මිලියන 40ක වියදමින් කිරි වෙහෙරේ නව ගොඩනැඟිල්ලක් හා ධාතු මන්දිරයක් ඉදි කරන්න පටන් ගෙන තිබෙනවා. අපි එදා රුපියල් ලක්ෂ 300ක වියදමින් යුදගනාව රජමහා විහාරයේ පළමුවැනි අදියර අවසන් කළා. දැන් මෙතුමා ඇවිල්ලා ඒකේ දෙවැනි අදියර කරන්න පටන් ගෙන තිබෙනවා. කොටසර පියංගල රජ මහා විහාරය, දෙමටමල් විහාරය කියන සියල්ලේම වැඩ කටයුතු අපි දැන් කරගෙන යනවා. තමුන්නාන්සේලාට ඒවා දකින කොට හිතේ පොඩි අමාරුවක්, රිදිල්ලක් ඇති වනවා. විපක්ෂයේ අය ජනාධිපතිවරණයට කොච්චර භය වෙලා ඉන්නවාද කියලා අපට පෙනෙනවා. ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන තමයි මේ මඩ ගහන්න පටන් ගෙන තිබෙන්නේ. ජනාධිපතිවරණ සටනින් තමුන්නාන්සේලා පසුබා ඉන්න විත්තිය මෙතැනදී අපට හොඳට පෙනෙනවා. මේ වාගේ මඩ ගහන්නේ නැතිව, මේ වාගේ දේවල් කරන්නේ නැතිව, මේ කටයුතු කරන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

මම හිතන හැටියට අද එක්සත් ජාතික පක්ෂයේ කවුරුවත් ඔබතුමන්ලා කියන විධියේ ලිඛිත ඉල්ලීමක් අපේ අගමැතිතුමාට ඉදිරිපත් කරලා නැහැ; අගමැතිතුමා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලාත් නැහැ. අපේ සමගිය, ශක්ති සම්පන්නභාවය එහෙමම තිබෙනවා. අපි ඒ වැඩ කටයුතු කරගෙන යද්දි තමයි තමුන්නාන්සේලා අද මේ වාගේ දේවල් කරන්නේ. තමුන්නාන්සේලාගේ කාලයට වැඩිය අද විශාල වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලට මුදල් එක්කහු වෙනවා; රජයේ මුදල් දෙනවා. ඒ වාගේම මධ්‍යම සංස්කෘතික අරමුදල වැඩියෙන්ම තර වෙලා තිබෙන්නේ 2015 අවුරුද්දෙන් පස්සේ කියලා අපි කියනවා.

මම හිතන්නේ තමුන්නාන්සේලාගේ කාලයේත් මේවා හැදුවා. නමුත් මොනවාද කළේ? මොනරාගල බන්ධනාගාරයට ගියොත් පෙනෙනවා, මොනරාගල බන්ධනාගාරයේ වැඩියෙන්ම ඉන්නේ තමුන්නාන්සේලාගේ කාලයේ නිදන් හාරන්න ගිහිල්ලා අහු වෙච්ච මිනිස්සු බව. එහෙමයි බුද්ධ ශාසනය දියුණු කළේ. ඒ දවස්වල ප්‍රසිද්ධ දෙයක් තමයි යම් යම් අය යොදාගෙන දුටුගැමුණු රජතුමාගේ කඩුව මොනරාගල දිස්ත්‍රික්කයේ හෙව්වාය කියන කාරණය. වැව් හාරනවා, නිදන් හොයන්න. එවැනි ඉතිහාසයක් තිබුණේ. අද අපි මේ කටයුතු කරගෙන යද්දී,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
සෝමාවතියත් හැරුවා, සොරබොර වැවත් හැරුවා, අනුරාධපුරයත් හැරුවා. සොරබොර වැව හදන්න කියලා නිදන් ටික හැරුවා. මොනරාගල දිස්ත්‍රික්කයේත් හැම තැනම නිදන් හාරලා අන්තිමට සුගලා දේවියගේ මුද්දටත් විද්දා. එහෙමයි කටයුතු කළේ.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் உலர் வலய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs and Dry Zone Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලයත් මේ ගරු ඇමතිතුමාට ලබා දෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
තමුන්නාන්සේලා කරුණාකරලා පසුගිය අතීතය දෙස බලන්න. ගරු ඇමතිතුමා කිව්වා වාගේ, බෞද්ධ කියන අය ඔය කාලයේ වෙහෙර විහාර කීයක් හැදුවාද, පන්සල් කීයකට ආධාර දීලා තිබෙනවා ද කියලා සොයා බලන්න. සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වා වාගේ, අනුන්ගේ මුදලින් වෙහෙර විහාරස්ථාන හැදුවාම ඒවා විවෘත කරන සංස්කෘතියක් තමයි අද පොහොට්ටුවේ තිබෙන්නේ. මම තමුන්නාන්සේලාට කියන්නේ, අපි මේ කරන දේවල්වලට තමුන්නාන්සේලාත් සහයෝගය දෙන්න කියලායි. අපි මේ වාගේ වෙහෙර විහාර හදද්දී, පල්ලි හදද්දී, පන්සල් හදද්දී, කෝවිල් හදද්දී අපි ගෞරව කරන ටී.බී. ඒකනායක මහත්මයා වාගේ හොඳ බෞද්ධයෙක් ඒවාට විරුද්ධ වෙන එක ගැන අපි කනගාටු වෙනවා. තමුන්නාන්සේලා කියනවා වාගේ අපි මේ මුදල් අවභාවිතා කරලා තිබෙනවා නම් ඒ ගැන කථා කරන්න අපි ඕනෑම තැනක සංවාදයකට එන්න සූදානම්. කොහේද පත්තරේකට කවුරු හෝ කියපු එකක් අල්ලාගෙනයි තමුන්නාන්සේ මෙතැනට ඇවිල්ලා මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. අද වෙහෙර විහාර විතරක් නොවෙයි, පාස්කු දින ප්‍රහාරයෙන් හානි වූ පල්ලි තුනම කෙටි කාලයක් ඇතුළත ප්‍රතිසංස්කරණය කරලා දෙන්න පුළුවන්කම අපට ලැබුණා. තමුන්නාන්සේලාගේ කාලයේ හැදුවේ වෙහෙර විහාර නොවෙයි, පස් කඳු, වැලි කඳු. මීට කලින් කථා කරපු මන්ත්‍රීවරයා ගැන කථා කරද්දී කවුද කියනවා ඇහුණා, එතුමා චෛත්‍යය හදලා තිබෙනවා කියලා. එතුමා බොරළු චෛත්‍යය හදලා තිබෙනවා. ඒ වාගේ වැඩ කරපු අය තමයි අද මේ ගැන කථා කරන්නේ. බෞද්ධ ආගම වෙනුවෙන් මෙවැනි සේවයක් කරද්දී, ඒවාට විරුද්ධව මේ විධියට කථා කරන අය දිහා බැලුවාම, මෙවැනි යෝජනා කරන අය දිහා බැලුවාම, මේ අය බෞද්ධ ආගමට මෙච්චර විරුද්ධද කියලා අපට හිතෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ විතරක් අපි මේ අවුරුදු හතරහමාර ඇතුළත පන්සල් 300කට ආධාර කරලා තිබෙනවා. මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ, ඒ වාගේම ගම්පෙරළිය වැඩසටහන යටතේ, එළදායිතා ලේකම් කාර්යාල හරහා හැම පන්සලකටම ලක්ෂ 5ක්, 10ක්, 15ක්, 20ක්, සමහර පන්සල්වලට ලක්ෂ 100, ලක්ෂ 200 දීලා තිබෙනවා. තමුන්නාන්සේලා ආණ්ඩු කරපු අවුරුදු විස්ස තුළම පන්සලකට දුන්නේ වැඩිම වුණොත් රුපියල් 50,000ක් විතරයි. ඔය කියන බෞද්ධ නායකයන් යැයි කියා ගන්නා උදවිය, ඔය කියන බෞද්ධකම ලියා පදිංචි වෙච්ච උදවිය, බෞද්ධකම තමන්ට අයිති කර ගන්න යන උදවියගෙන් මම අහනවා, මොනරාගල දිස්ත්‍රික්කයේ මොන පන්සලටද, මොන පල්ලියටද, මොන කෝවිලටද වැඩියෙන් උදව් කරලා තිබෙන්නේ කියලා. මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ දිසාපතිවරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට චක්‍රලේඛවලින් යවලා තිබුණා, ආගම වෙනුවෙන් වියදම් කරන මුදල් රුපියල් 50,000කට සීමා කරන්න කියලා. අපේ ආණ්ඩුව ආවාට පස්සේ සීමාවකින් තොරව ආගමේ සංවර්ධනය වෙනුවෙන්, උන්නතිය වෙනුවෙන් පන්සල්වලට, පල්ලිවලට, කෝවිල්වලට මුදල් වෙන් කරන්න කියලා අපි චක්‍රලේඛ යවලා තිබෙනවා. ඒ අනුව තමයි බිලියන 7කට වැඩි මුදලක් අපි මේ රටේ ආගම වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ. අපි හැම පන්සලකටම විදුලිය ලබා දීලා තිබෙනවා. සූර්ය කෝෂ පද්ධති අවශ්‍ය තැන්වලට අපි ඒවා දීලා තිබෙනවා. මෙතුමා දහම් පාසල්ශාලා විතරක් 1,000ක් හදනවා. මගේ දිස්ත්‍රික්කයේත් දහම්

පාසල් 30ක් විතර දැනට හදාගෙන යනවා. මේ රටේ ආගම වෙනුවෙන් මෙවැනි සංවර්ධනයක් කරන්න හැම දාම කටයුතු කළේ එක්සත් ජාතික පක්ෂයයි.

බුද්ධාගම වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක්, ක්‍රිස්තියානි ආගම වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක්, මුස්ලිම් ආගම වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් සහ හින්දු ආගම වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් දුන්නා වාගේම, ඒවාට අවශ්‍ය මුදලුත් ලබා දීලා තිබෙනවා.

එහෙම නම් මෙවැනි අභූත චෝදනා එල්ල කරන්න එපා, ආගමට විරුද්ධව තමුන්නාන්සේලා පෙළ ගැහෙන්න එපා, ආගමේ සංවර්ධනට අකුල් හෙළන්න එපාය කියා ඉල්ලා සිටිමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.24]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ் தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non-Cabinet Minister of Economic Reforms and Public Distribution)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මටත් මුලින්ම කියන්න තිබෙන්නේ අපේ ටී.බී. ඒකනායක හිටපු ඇමතිතුමාත් එක්ක අපට කිසි ප්‍රශ්නයක්, ගැටලුවක් නැහැයි කියන එක තමයි. සම්ප්‍රදායකට අනුව තමයි පාර්ලිමේන්තුවේ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මා පාර්ලිමේන්තුවට එන්න කලින් මේ පාර්ලිමේන්තුවේ හිටපු කෙනෙක්. හැම දෙයක්ම සදාචාරාත්මකව කරන්න ඕනෑ. හැම දෙයකම සාධාරණත්වයක් තිබෙන්න ඕනෑ. අපි කෙනකුගෙන් ප්‍රශ්නයක් අහනවා නම් ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සාධාරණ කාලයක් ලබා දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හැන්දෑවේ 4.52ට මේ ප්‍රශ්නය මේ කාර්යාලයට ඉදිරිපත් කරලා, "හෙට උදේට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න"යි කියනවා. මා හිතන හැටියට ඇත්ත වශයෙන්ම එය අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට සරිලන්නේ නැති දෙයක්. මොකද, ඕනෑම කෙනකුට ඒ සඳහා සූදානම් වෙන්න කාලයක් අවශ්‍ය වෙන නිසා. සජිත් ප්‍රේමදාස ඇමතිතුමා කිව්වා, එතුමා මෙය දැන ගන්නකොට හැන්දෑවේ 5.30යි කියලා. ඒ අවස්ථාව වනකොට කාර්යාල වහලා. නමුත් ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට එතුමා කෙසේ හෝ ඉතාම සාර්ථකව උත්තර දුන්නා. ඔබතුමා ඒ අවස්ථාවේදී ඉතාම අවධානයෙන් අහගෙන සිටියා. ඔබතුමා ඒකට බාධා කළේ නැහැ. ඔබතුමාගේ featuresවලින් අපට තේරුණා, මේ ප්‍රශ්නයත් එක්ක ඔබතුමාත් අපහසුතාවට පත්වෙලා සිටියාය කියලා. දැන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා අමාරුවේ දමන්න කියලා ඔබතුමාට කොන්ත්‍රාත්තුවක් භාර දීලා තිබෙනවාය කියලා. ඔබතුමා එයට පැටලිලා තිබෙන බව තමයි අපටත් පෙනෙන්නේ.

අපේ ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා චෝදනාවක් කළා, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා මේ සියලු දේ කරන්නේ එතුමාගේ ප්‍රතිරූපය ගොඩ නඟා ගන්න කියලා. ඒ මන්ත්‍රීතුමා කිව්වා, ගරු ඇමතිතුමා ඒ මුදල් සම්පූර්ණයෙන්ම වියදම් කරලා තිබෙන්නේ බෞද්ධ, කතෝලික, ක්‍රිස්තියානි, ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන වැඩිදියුණු කිරීම සඳහායි කියලා. ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ එක වාක්‍යයක් කියවන්න මා කැමැතියි, මධ්‍යම සංස්කෘතික අරමුදල තමන්ගේ ප්‍රතිරූපය නඟා සිටුවීම සඳහා පාවිච්චි කළේ කවුද කියන එක දැන ගන්න. අපි දන්නවා, ඔබතුමන්ලාගේ රජය කාලයේ ඉදිකරන ලද වරායවලට, ගුවන් තොටුපොළවලට පසුගිය රජයේ ජනාධිපතිවරයාගේ නම තමයි පාවිච්චි කළේ. එසේ කළේ තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නැඟීමට නොවෙයි නම්, වෙන මොනවාටද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. මේ එකකටවත් සජිත් ප්‍රේමදාස මහත්මයාගේ නම දමලා නැහැ. සමහරු හිනා වෙනවා, එකකට කුමාර් සංගක්කාරගේ නම දැම්මා කියලා. සමහරු හිනා වෙනවා, රජ කෙනකුගේ නමක් දැම්මා කියලා. ඕනෑ කෙනකුට එහෙම හිනා වෙන්න පුළුවන්. එතුමා කිව්වා, ගහන්න තිබෙන මඩ ඔක්කොම ගහන්න කියලා. එතුමාට ඒවා දරා ගන්න පුළුවන් කිව්වා. මා හිතන්නේ නැහැ, සජිත් ප්‍රේමදාස මහත්මයා එතුමාගේ නම ගහලා එක ගමක්වත් ඉදිකරලා තිබෙනවා කියලා. මා හිතන්නේ නැහැ, එක පන්සලකවත් එතුමාගේ නම ගහලා තිබෙනවා කියලා. මා හිතන්නේ නැහැ, එතුමාගේ පියාගේ හෝ වෙන කාගේ හෝ නම් ගහලා තිබෙනවා කියලා. එතුමා පාවිච්චි කරලා තිබෙන්නේ, මේ රටේ ඉන්න හා හිටපු වැදගත් මිනිසුන්ගේ නම් තමයි.

මේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ යටතේ 4.9 ඡේදයේ තිබෙනවා, "හිටපු ජනාධිපතිවරයාගේ ජන්ම දිනය හා පදවි ප්‍රාප්තිය වෙනුවෙන් හිටපු අමාත්‍යවරයාගේ පණිවුඩයක් පුවත් පතක පළ කිරීමට හා ශුභ පැතුම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් වශයෙන් රුපියල් 19,86,000ක් වැය කර තිබුණි" කියලා.

එතකොට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වානේ තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නඟා ගන්න මේ සල්ලි වියදම් කළා කියලා. එහෙම නම් මේ සල්ලි වියදම් කරලා තිබෙන්නේ මොනවාටද කියන එක විගණකාධිපතිවරයා ඍජුවම වාර්තා කරලා තිබෙනවා. ඊට වඩා තව හොඳ එකක් මම දැක්කා. "විදේශීය සංචාරක ප්‍රවේශපත් සමඟ නොමිලේ ලබා දීම සඳහා DVDs සපයා ගැනීම" කියන කාරණය. ගොඩක් විවේචන ඉදිරිපත් කළා මේ ප්‍රසම්පාදන කටයුතුවලින් එහාට ගියා, හරි ක්‍රමයට මේ මුදල් වියදම් කළේ නැහැයි කියලා. නමුත් විගණකාධිපතිවරයාගේ වාර්තාවේ එහෙම දෙයක් සඳහන් වෙන්නේ නැහැ. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ මෙන්න මේ වාගේ දෙයක් නම් සඳහන් වෙනවා. මේක හොඳට අහ ගන්න. "අවශ්‍යතාව ඇගැයීමකින් තොරව සහ විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටින් අනුගමනය කිරීමකින් තොරව සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුරය යන සිද්ධස්ථාන ඇතුළත් DVDs ලක්ෂ 5ක් සපයා ගැනීම සඳහා ඉකුත් වර්ෂයේ, -ඒ කියන්නේ 2014දී- හා සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 51ක් චිත්‍රපටි අධ්‍යක්ෂවරයකු වෙත ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් අරමුදල සඳහා කලින් නිෂ්පාදනය කළ වැඩසටහනක රූපරාමු පරිගණකය මඟින් පිටපත් කර අදාළ DVDs සපයා තිබියදීත්, අරමුදලේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ඒ බව වසන් කර ගෙවීමට කටයුතු කිරීම නිසා රුපියල් මිලියන 50කට වැඩි මුදලක් වංචා කිරීමට කොන්ත්‍රාත්කරුට හැකි වී තිබිණි. මේ පිළිබඳව විධිමත් පරීක්ෂාවක් කරන ලෙස හා වංචාව පිළිබඳව පොලීසිය වෙත පැමිණිලි කරන ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව හා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකාර කමිටුව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නියෝග කළද, ලේකම්වරයා ඒ අනුව ක්‍රියා කර නොතිබුණි."

ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මම දන්නේ නැහැ ඔබතුමා සංස්කෘතික කටයුතු ඇමති වශයෙන් සිටි කාලයේද මේක වුණේ කියලා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංස්කෘතික අරමුදලින් රුපියල් මිලියන 51ක් ගෙවලා තිබෙනවා. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා සංස්කෘතික කටයුතු ඇමති වශයෙන් සිටි කාලයේද කියලා මම දන්නේ නැහැ, 2014දී. මොනවාදට? DVDs ලක්ෂ 5ක් ගන්නට. සීගිරියේ පින්තූර, අනුරාධපුරයේ පින්තූර, පොළොන්නරුවේ පින්තූර වාගේ ඒවා හදලා ඒවා film කරලා, ඒවා DVDsවලට දාලා විදේශිකයෝ එනකොට ඒ DVD එකක් නිකම් දෙනවා. දැන් මොකක්ද මේකෙන් කියන්නේ? එතුමා කරලා තිබෙන්නේ copy and paste කිරීම. ඕනෑම කෙනෙකු copy and paste කිරීම දන්නවා. ඔබතුමාත් දන්නවා, මාත් දන්නවා, ඔබතුමාත් දන්නවා. Internet එකට ගියාම සීගිරිය, අනුරාධපුරය, පොලොන්නරුව කියලා තිබුණා, ඒවා copy කරලා අලුත් DVD එකකට දැම්මා. මේ කොන්ත්‍රාත්කාරයා අලුතින් කිසිම දෙයක් කළේ නැතිව තියෙද්දී රුපියල් මිලියන 51ක් ඔබතුමා ගෙවලා තිබෙනවා. මේක කියන්නේ විගණකාධිපතිතුමා. එහෙම නැතිව තැන් තැන්වල කියන කථාවක් නොවෙයි, මේ. දේශපාලන ප්‍රතිවාදියෙකුට ගහන මඩක් නොවෙයි, මේ. මේකට අත්සන් කරලා තිබෙන්නේ එච්.එම්. ගාමිණී විජේසිංහ මහත්මයා. මම හිතන විධියට එතුමා තමයි අපේක්ෂකයෙකු විධියට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා කියලාත් කියන්නේ. ගාමිණී විජේසිංහ මහත්මයා කියන්නේ එතුමා නේද? එතුමාගේ අත්සනින් මේක වාර්තාව තිබෙන්නේ. මේ වාගේ ඍජු, දැඩි චෝදනා සම්බන්ධයෙන් තමයි ඔබතුමන්ලා ක්‍රියාත්මක විය යුත්තේ. මේ වාර්තාවේ කෙළින්ම කියනවා රුපියල් මිලියන 51ක් ඇස් පනාපිට හොරකම් කරද්දී ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, අනෙක් අය හෝ ඔබතුමා, -කිසි කෙනෙක්- මේ ගැන පරීක්ෂණයක් කරලා නැහැයි කියලා. හිටපු අමාත්‍ය ගරු ටී.බී. ඒකනායක මැතිතුමනි, ඔබතුමාට මේ ගැන මොකක්ද කියන්න තිබෙන්නේ? ඇයි ඔබතුමා මේ ගැන පරීක්ෂණයක් කළේ නැත්තේ? ඇයි? [බාධා කිරීමක්] ඔව්, කියන්න.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට එන විදේශිකයන්ට ලංකාවේ තිබෙන පුරාවිද්‍යාත්මක මධ්‍යස්ථාන ගැන විවිධ භාෂාවලින් ලබා දෙන DVD එකක් නිර්මාණය කිරීම සඳහා, පාලක මණ්ඩලයේ තීන්දුවක් අනුව තමයි කටයුතු කරලා තිබෙන්නේ. මේවා කලින් භාවිත DVD තැටි නොවෙයි. මේක ඉතාම නිර්මාණශීලී එකක්. මේකට UNESCO ආයතනයෙන් ප්‍රශංසාවක් පවා ලැබුණා. මේ වාගේ එකක් ලෝකයේ වෙන තැන්වල ක්‍රියාත්මක කරලා නැහැ. භාෂා ගණනාවකින් නිර්මාණය වූ එකක්. පසුව මේ පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් පරීක්ෂණයක් කරලා, එහිදී වරදක් වෙලා තිබෙනවාය කාරණය ඔප්පු කරන්න බැරි වුණා. ඒක තමයි යථාර්ථය.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි. එහෙම නම්, ගාමිණී විජේසිංහ, හිටපු විගණකාධිපතිවරයා අලි බොරුකාරයෙක් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි, මම කථාව අවසන් කරන්නම්.

ගරු මන්ත්‍රීතුමා කියන විධියට, හිටපු විගණකාධිපතිවරයා අලි බොරුකාරයෙක්. හිටපු විගණකාධිපතිවරයා කියලා තිබෙන්නේ අමූලික බොරු; අමූලික බොරුවක් කියලා තිබෙන්නේ. මම ඔබතුමාට ඉතාම පැහැදිලිවම කියෙව්වා, එතුමා කියපු දේ, copy-and-paste job එකක් කරලා තිබෙනවාය කියලා. ඒ ගැන පොලිසියට පැමිණිලි කරන්නත් කියලා තිබියදී, කිසිම දෙයක් කරලා නැහැ කියලායි මම කිව්වේ. ඒ කෙසේ වෙතත්, මම ඔබතුමාට කියන්න ගියේ මේ කාරණයයි. ඔබතුමන්ලා මඩ ගහන්න කලින් කල්පනා කරලා බලන්න, මේ මඩ අනෙක් පැත්තටත් හැරිලා එන්න පුළුවන් කියලා. ඒක තමයි මා කියන මූලික කාරණාව. නමුත්, අපේ ගරු ඇමතිතුමා එතුමාගේ ඒ වැඩ කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා මට තව එක විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැනටමත් ඔබතුමාට වැඩිපුර විනාඩියක් දුන්නා. එහෙම නම්, කාගේ හෝ වේලාවකින් අඩු කරන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කාගෙන් හෝ වෙලාව අඩු කරලා මට විනාඩියක් දෙන්න.

වෙහෙර විහාර හදන එක ගැන මන්ත්‍රීතුමන්ලා කියනවා. ඇත්ත වශයෙන්ම මාත් පන්සල් හදනවා; මාත් චෛත්‍ය හදනවා. මේ දවස්වල බැද්දගානේ උත්තරලංකා විහාරස්ථානයේ චෛත්‍ය වහන්සේ අලුතින්ම ගොඩනඟනවා. ජනතාවගේ බදු මුදල්වලින් රුපියල් ලක්ෂ 15ක් වියදම් කරලායි ඒක කරන්නේ. මේවා අපි ගෙදරින් ගෙනෙන සල්ලි නොවෙයි. අපට එහෙම සල්ලි නැහැ. නමුත්, අපි ඒ කටයුතු සම්බන්ධීකරණය කරගෙන වැඩ කරනවා. අපි සංඝයාවහන්සේලාගේ සුබ සාධනය කරන්න රුපියල් ලක්ෂ දහයක් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කෝට්ටේ ප්‍රදේශයේ පන්සල් 38කට, කතෝලික, ක්‍රිස්තියානි පල්ලි 6කට, කෝවිල් 2කට, මුස්ලිම් පල්ලි 2කට, -මේ සියලු ආගමික ස්ථානවලට- සූර්යබල විදුලි පද්ධති ලබා දෙන්න රුපියල් ලක්ෂ පහ ගණනේ යොදවා තිබෙනවා. මෙවැනි ක්‍රියාකාරකම් අපි කරනවා. ඒක වැරැද්දක්, අපි මේවා නොකළ යුතුයි කියලා ඔබතුමන්ලා කියනවා නම්, ඔබතුමන්ලා ඇත්තටම voice-cut දේශපාලනය කරන්නේ නැතුව කෙළින්ම ඇවිල්ලා කියන්න, "මේක කරන්න එපා, අපි මේකට ඊර්ෂ්‍යායි" කියලා. එක්කෝ, විරුද්ධයි කියලා කියන්න. එහෙම මඩ ගහනවා වෙනුවට, යම් අඩුපාඩුවක් තිබෙනවා නම්, ඊළඟ වතාවේ සදාචාරාත්මකව ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.5.36]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. මම කරුණු කියන්න files ගණනාවක්, තොරතුරු ගණනාවක්

තිබෙනවා. ඒවා ගැන කථා කරන්න විනාඩි පහක කාලය හැරෙන්නත් ප්‍රමාණවත් නැහැ. නමුත්, මේ යෝජනාව ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට දිනයේත් මගේ බිංගිරිය ආසනයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරතැපොල ශ්‍රී සුදර්ශනාරාමයේ, සිසු දහම් සෙවන ගොඩනැඟිල්ල අපේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඇවිල්ලා විවෘත කරනවා. අපේ තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමාගේ පඬුවස්නුවර ප්‍රදේශයේත් එවැනි දෙයක් කළා. මෙතුමන්ලා කියන විධියට, රුපියල් මිලියන අටක් එතැනම විනාශ කරලා, එහෙම නැත්නම් හොරකම් කරලා. හැබැයි, අපේ උඩුබද්දාව, හොරතැපොල විහාරස්ථානයට ගියාම, ඉතාම අලංකාර විධියට SD & CC ආයතනය මඟින් ඉදිකළ, රුපියල් මිලියන හතරක් වටිනා ගොඩනැඟිල්ලක් තිබෙනවා. ගමේ මිනිසුන්ට මේවා හොඳට පෙනෙනවා. ගරුතර මහා සංඝරත්නය අද මහජන ගැලරියේ වැඩ ඉන්නවා. උන්වහන්සේලාට තේරෙන්න ඇති, අද මේ චෝදනා කරන අයගේ සැබෑ අරමුණ මොකක්ද කියන කාරණය. මීට කලින් විරුද්ධ පැත්තේ සිටින ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කථා කළාට වඩා, බිරුවා කිව්වොත් හරි. බිරුවා වාගේ වැඩක් තමයි එතුමා කළේ. ඒ වාගේ අරමුණක් නැතුව එතුමන්ලා කථා කරන්නේ, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් සිදුවන වැඩ කටයුතු එක්ක මේ ගොල්ලෝ අද වියරු වැටිලා ඉන්න නිසා. ඒ වියරුවත් එක්ක තමයි අද මෙවැනි කටයුතු කරමින් යන්නේ. මම කනගාටු වනවා, මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මා ඉතාම ගරු කළ - "ගරු කරන" කියලා දැන් කියන්න අමාරුයි - අපේ ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා අද දින ගෙනෙන ලද බූමරංගය ගැන. එතුමාටම අද ඒක පත්තු වෙලා තිබෙනවා.

ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, අකමැත්තෙන් වුණත් මේ කාරණය ඔබතුමාට කියන්න සිද්ධ වෙනවා. "Cultural Conservation and Construction Company (Pvt.) Limited" යනුවෙන් company එකක් ඔබතුමාගේ කාලයේ හදලා, සේවකයා බඳවා ගෙන තිබෙනවා. මේක තනිකර පෞද්ගලික සමාගමක්. බොහොම පැහැදිලිවම අපි දන්නවා, අපේ යාපහුව රාජධානි භූමි භාගයේ, දඹදෙණිය, පඬුවස්නුවර වැනි ප්‍රදේශවල ඒ සේවකයන් වැඩ කළ බව. මේ එක් සේවකයෙකුට මධ්‍යම සංස්කෘතික අරමුදලින් රුපියල් 1,200ක මුදලක් ගෙව්වා. හැබැයි, මේ සමාගමට ඒ ගණන ගෙවද්දී, සේවකයාට ගියේ රුපියල් 700යි. රුපියල් 500ක් හොරකම් කළා. මම කියන්නේ නැහැ, ඔබතුමා හොරකම් කළා කියලා. නමුත් කවුරු හෝ හොරකම් කරලා තිබෙනවා. ඉතින් මේ විධියට තමයි අර ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට ඔබතුමන්ලාගේ කාලයේ මධ්‍යම සංස්කෘතික අරමුදල අවභාවිත කළේ. අවභාවිතයකුත් නොවෙයි, හොරකම් කිරීමක් තමයි කරලා තිබෙන්නේ. ඒ නිලධාරින්ගේ නම් තිබෙනවා; අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් තිබෙනවා. ඔබතුමාගේ පෞද්ගලික ලේකම්, බන්දුල විතානාරච්චි මහතා කළමනාකරණ අධ්‍යක්ෂවරයා විධියට ඒ කාලයේ කටයුතු කර තිබෙනවා. ඉතින් ඔබතුමාටත් පොඞ්ඩ පොඞ්ඩ හෝ ගෑවෙනවා. ඒ අයුරින් තමයි කටයුතු කෙරුණේ. [බාධා කිරීමක්] ඔව්, ඔබතුමා පැහැදිලි කළා කියලා කිව්වා. ඔබතුමා ඒ දවස්වල ප්‍රසිද්ධ වුණා, එක කාරණයකට. ඔබතුමාගේ අර ලෝක ප්‍රසිද්ධ වූ සපත්තු දෙක නිසා ඔබතුමා ප්‍රසිද්ධ වුණා. අඩිය නැති සපත්තු දෙක නිසා ඔබතුමාට රටේ ලොකු ප්‍රසිද්ධයක් ලැබුණා; ලෝකයේත් ප්‍රසිද්ධියක් ලැබුණා. මම හිතුවා, ලංකාවේ ණය ටික ගෙවා ගන්න පුළුවන් වේවි කියලා ඔබතුමාගේ සපත්තු දෙක විකුණලා. අන්තිමට බලන කොට ඒකෙනුත් ඔබතුමා රවටලා. අද ඔබතුමා ප්‍රසිද්ධ වෙනවා, සජිත් ප්‍රේමදාස මැතිතුමා කරගෙන යන ශාසනමාමක, ශාසන හිතෛෂී, බුද්ධ ශාසනයට ලොකු ශක්තියක් දෙන, විශේෂයෙන්ම අපේ දුප්පත් වෙහෙර විහාරස්ථාන, දහම් පාසල් ගොඩනඟමින් යන මේ වැඩසටහනට විරුද්ධව ඔබතුමා ගෙනාපු යෝජනාව මඟින්. දෙව්දත් තෙර බුදුරජාණන් වහන්සේට ගල් පෙරළුවා වාගේ ඔබතුමාත් ශාසනයට වැඩ කරගෙන යන සජිත් ප්‍රේමදාස මහත්මයාට ගලක් පෙරළා තිබෙනවා. එහි අරමුණ විශේෂයෙන්ම අපේ රටේ ඉන්න මහා සංඝ රත්නයට අද පැහැදිලි වෙන්නට ඇති. ඒ වාගේම, අනෙකුත් බෞද්ධ ජනතාවටත් පැහැදිලි වෙන්න ඇති. සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් අද free hit එකකට අවස්ථාවක් දුන්නා කියලා තමයි මම හිතන්නේ. එතුමා බොහොම කනගාටු වුණා, අද ව්‍යාපෘති ගණනාවක් විවෘත කරන්න, මුල් ගල් තියන්න තිබියදී මේ මොකක්ද ආපු ප්‍රශ්නය කියලා. බලන කොට ඒක free hit එකක්. මොකද, මේ යෝජනාව හරහා මේ මාස කිහිපය ඇතුළත එතුමා මේ අමාත්‍යාංශය තුළින් කරගෙන ආපු වැඩ කටයුතු පාර්ලිමේන්තුවට, රටට, ලෝකයට කියන්න අවස්ථාවක් උදා කර දුන් නිසා, මා හිතවත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපේ ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා. ඒ සම්බන්ධව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. "ලෙව්කේ මැතිඳු අද තනියම වෙල මැද්දේ" කිව්වා වාගේ "ටී.බී. මැතිඳු අද තනියම පාර්ලිමේන්තුවේ" කියලායි මට කියන්න තිබෙන්නේ. අද ඔබතුමා වෙනුවෙන් කථා කරන්න කවුරුත් නැහැ. ටිකක් එහාට වෙන්න කවුද මන්ත්‍රීතුමෙක් ඉන්නවා. මට පෙනෙන්නේ නැහැ ඒ කවුද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ, දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙක්.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඔව්, ඒ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙක්. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මුළා කරලා, ඔබතුමාට ලණුවක් දීලා, ඔබතුමාට ටොෆියක් දීලා ඔබතුමා තනි කරලා අද අනෙක් අය ගිහිල්ලා.

බුද්ධ ශාසනයේ දියුණුව වෙනුවෙන් අපි වැඩ කරන්නේ, සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශය හරහා විතරක් නොවෙයි. ගම්පෙරළිය වැඩසටහන යටතේ, වෙහෙර විහාරස්ථානවලට කෝටි 209ක් මුදල් වියදම් කරලා තිබෙනවා. දැන් ඒවාටත් කියාවි, අවභාවිත කළායි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ ආසනයේ තිබෙන පන්සල්වලින් දෙකකට හැර, අනෙක් සියලු පන්සල්වලට -පන්සල් 82කට- මම සල්ලි දීලා තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මගේ ආසනයට අයත් නොවන පන්සල් සියයකට වැඩි ප්‍රමාණයකට මම සල්ලි දීලා තිබෙනවා, අපට ගම් පෙරළියෙන් සල්ලි හම්බ වුණු නිසා. ඒ නිසායි අපට වැඩ කරන්න පුළුවන් වුණේ. [බාධා කිරීමක්] සමා වෙන්න, මගේ අමාත්‍යාංශය භාර ගරු අමාත්‍ය, මලික් සමරවික්‍රම මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. බිංගිරිය ආසනයේ හැර අනෙක් පන්සල්වලට එතුමා තමයි සල්ලි දුන්නේ. ඒකත් කියන්න එපායැ. මට විතරක් නොවෙයි, අපේ රෝහිණී මන්ත්‍රීතුමියට මුදල් දුන්නා; බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට මුදල් දුන්නා. එහෙම මුදල් ලැබුණු අය ගොඩක් මෙතැන ඉන්නවා. චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමියටත් දුන්නා. විශාල පිරිසකට දුන්නා. එතුමාට හම්බ වූ මිලියන 300න්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

වැඩි ප්‍රමාණයක් දුන්නේ පන්සල්වලටයි. මම එතුමාගේ නියෝජ්‍ය ඇමතිවරයා නිසා මට වැඩියෙන් හම්බ වුණා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මේ ගමනට අපි ආශීර්වාද කරනවා විතරක් නොවෙයි, එතුමා හරි තැන තියන්නත් කටයුතු කරනවාය කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.42]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනේ! බලන්න මගේ සහෝදර, මිත්‍ර ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා ඉන්නේ තනියම. ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා අනාථ කරලා කුරුණෑගලට ගෙනාවේ තමුන්නාන්සේයි. කෝ, ඔබතුමාගේ සගයෝ? අව කවුරුවත් නැහැ, මේ යෝජනාව ගැන කථා කරන්න. ඔබතුමාට බැට් කරන්න, බෝල් කරන්න ඉන්නේ දැන් මේ පැත්තේ අය විතරයි.

මම මේ අවස්ථාවේ බුද්ධ ශාසනය වෙනුවෙන් යමක් කියන්න ඕනෑ. ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කිව්වා, බුද්ධ ශාසනය රැක ගැනීම මගේ රාජකාරිය කියලා. නැහැ, බුද්ධ ශාසනය රැකෙන්නේ ඉතිහාසයත් එක්ක යන ගමනක් තුළින්, අවුරුදු දෙදහස් ගණනක ඉතිහාසයත් එක්ක, තිබෙන පුරාවිද්‍යා සංස්කෘතික දායාදයත් එක්ක.

අපේ නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමා ශාසනය වෙනුවෙන් දැවැන්ත වැඩ කොටසක් කරනවා. මම කෙළින්ම ඒක කියනවා. මම ඒකටයි නැඟී සිටියේ. ඒ වාගේම ජනාධිපති අරමුදලින් කිසිම දවසක මේ වාගේ මුදලක් ශාසනයේ වර්ධනය සඳහා, ශාසනය ආරක්ෂා කිරීම සඳහා වියදම් කරලා නැහැ. මම භය නැතිව කියනවා, ඒ පිළිබඳව මා එක්ක විවාදයකට එන්න කියලා. ඒ කටයුතුවලට ජනාධිපති අරමුදලින් මුදල් දෙනවා, අගමැති අරමුදලින් මුදල් දෙනවා. නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමාත් දෙනවා. මගේ අමාත්‍යාංශයෙනුත් දෙනවා.

දැන් අපි ගරුතර ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් පටන් ගත්තා. වනවාසී ස්වාමීන් වහන්සේලාටත් සහය දෙනවා. නිකාය භේදයක් නැහැ. අපි 16වන දා පටන් ගන්නවා, ස්වාමීන් වහන්සේලාගේ අහිංසක මාපියන්ට නිවාසයක් නැත්නම් නිවාසයක් හදලා දෙන වැඩ පිළිවෙළ. 16වන දා සිට සංස්කෘතික ඇමතිතුමා එක්ක එකට හවුල් වෙලා අපේ ශාසන බල මණ්ඩලය ඒ කටයුත්ත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටී.බී. ඒකනායක මැතිතුමාත් සභා ගර්භයෙන් පිට වෙලා ගියා. අනේ! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කරන්නේ පුටුවලට නේ. මේ සභාවේ කවුරුවත් නැහැ. ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා විතරක් ඉන්නවා, අනාථ වෙලා. මේ තත්ත්වය ගැන අපට කනගාටුයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාත් නැහැ නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එතුමාත් නැද්ද? අයියෝ, අනිච්චාවත සංඛාරා!
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය කියන්නේ, මේ රටේ තිබෙන පරණම පක්ෂ දෙක නේ. මම කියන මේ කාරණය ලියලා තියාගන්න. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පටන් ගත්තා. එදා "රාජාලියා" ලකුණෙන් පක්ෂයක් ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂය විනාශ කළා. එදා අපේ නායකයන් ඔක්කෝම ජීවිතක්ෂයට පත් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අද ඒ දේ කරන්න හදන පොහොට්ටුවට අනාගතයේදී වෙන්නේත් විනාශයක් තමයි. අන්න ඒක මම කිව්වා කියලා ලියා තියා ගන්න. මම ගාමිණී ජයවික්‍රම පෙරේරා. නිකම් නොවෙයි මම මේවා කියන්නේ. මේක මට පෙනෙන දෙයක්. ඒ විනාශය ස්ථිරවම එනවා; අසුබ විධියට එනවා. අන්න, හිටපු ඇමතිතුමාත් නැඟිටලා සභාවෙන් එළියට ගියා. අනේ, අනිච්චාවත සංඛාරා! අපේ හාමුදුරුවනේ, බලන්න. මෙතැන කවුරුවත් නැහැ නේ. මම පුටුවලට නේ කථා කරන්නේ. මේ ඇති වෙලා තිබෙන ඛේදනීය තත්ත්වය මොකක්ද?

ඔය ගෝඨයිම්බරලා, ගෝඨලා කවුරු ආවත්, පොහොට්ටුවේ මලත් පර වෙලා, විනාශ වෙනවා. අපි ශාසනය වෙනුවෙන් වැඩ කරන්නේ අවංකවයි. ඒ වැඩ කරන්නේ රට වෙනුවෙන්. අපි මේ රට හදනවා. ශාසනය ආරක්ෂා කරනවා. සංස්කෘතික ඇමතිතුමා වැඩ කටයුතු කරන්නේ මාත් එකක් එකතු වෙලායි. ඒකට හොඳ සාක්ෂියක් මම කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට පැවැති, භික්ෂු රක්ෂණ ඔප්පු ලබා දීමේ උත්සවයට අපි ගියා. තිස්සමහාරාම රජමහා විහාරයේ අපේ නායක ස්වාමීන් වහන්සේ, ඒ විහාර භූමිය ඒ උත්සවයට දුන්නා; ඒ ඓතිහාසික රාජධානි භූමිය දුන්නා. ඒ උත්සවයේදී නායක හාමුදුරුවෝ කිව්වා, "මේ උත්සවයට විහාර භූමිය දුන්නේ ඇයි කියලා මට බලපෑම් ආවා" කියලා.

අපේ ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා කළ සේවය ගැන, ඒ වෙලාවේ උන්වහන්සේ කිව්වා. එතුමා තිස්සමහාරාම රජමහා විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලක්ෂ 3,000කට වඩා දීලා තිබෙනවා. එතුමා ශාසනයට එවැනි වැඩ කරද්දී, මෙවැනි දේවල් කියන්නේ මොකද කියලා උන්වහන්සේ ඇහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙක තුනක් දෙන්න.

බුදුරජාණන් වහන්සේ කියලා තිබෙනවා, දිට්ඨධම්මවේදනීය කර්මය ගැන. සංඝ භේදය පාප කර්මයක්. පන්සලට ගිහිල්ලා දේශපාලනය කථා කරන්නේ කවුද? ඒ, පොහොට්ටු පක්ෂයයි. සංඝ භේදයක් කරනවා; එතැන කිලිටි කරනවා. එතකොට, සංඝයා භේද කිරීමේ ශාපය වදිනවා.

එක්සත් ජාතික පක්ෂයේ තීරණය මොකක්ද? පළාත් සභාවලට, ප්‍රාදේශීය සභාවලට, පාර්ලිමේන්තුවට තරග කරන්න අපි කවදාවත් කිසිම ආගමික පූජකයෙක් දමන්නේ නැහැ. ඒක, 1990දී අපි තීරණය කළ දෙයක්. ඒ තුළ සිටිමින් තමයි අපි කටයුතු කරන්නේ. ශාසනයට පුදුම සේවයක් අපි කරනවා. බුද්ධාගම වෙනුවෙන් කරන මේ සේවය අපහාසයට පත් කරන්න සමහර මන්ත්‍රීතුමන්ලා උත්සාහ කරනවා. මා ළඟ තිබෙනවා, එතුමන්ලා සඳහන් කළ ගණන් පිළිබඳ විස්තර. එතුමන්ලා ටිකයි කිව්වේ. නමුත් ඒ ඔක්කෝම මම දන්නවා. මම දන්නවා, ඒ කාලයේ කළ

දේවල්. ඒ දේවල් මම දැන් කියන්නේ නැහැ. මට කියන්න ඕනෑත් නැහැ. ඒ කාලයේ කළ දේවල්වලින් කොහොමද සංඝ භේදය ඇති වුණේ, ඒ තුළින් කොහොමද ශාසනය විනාශ වුණේ කියන එක මම දන්නවා. මම ඒවා දැන් කියන්නේ නැහැ. මොකද, කාලය නැතිකම ප්‍රශ්නයක් නේ. කියන්න තිබෙන දේවල්වලින් සියයට දෙකයි මම කිව්වේ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඔබතුමා වෙලාවටම කථාව අවසන් කළා, ගරු ඇමතිතුමනි.

මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.5.48]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මට ලැබිලා තිබෙන්නේ විනාඩි පහක කාලයක් නිසා බොහොම කලබලයෙන් කථා කරන්න වෙනවා.

හදිසියේ මෙවැනි යෝජනාවක් ගෙන ඒමේ අරමුණ අපට පැහැදිලියි. ඒ, ඊළඟ ජනාධිපතිවරණ අපේක්ෂකයා සජිත් ප්‍රේමදාස මහත්මයා වෙයි කියන බිය නිසායි. ඒ අය තුළ තිබෙන දේශපාලන බිය තමයි මේ විධියට ප්‍රකාශ කරන්නේ. මේ මුදල් හොයා ගන්නේ කොහොමද කියන එක පැහැදිලි කළා. ඒ මුදල්වලින් කරන්නේ මොනවාද කියන එකත් පැහැදිලි කළා. මේ මුදල්වලින් කරන්නේ බෞද්ධ, කිතුනු, හින්දු, ඉස්ලාම් සිද්ධස්ථාන නඩත්තු සිටුවීමයි. ඒ ගැන අභූත චෝදනා නඟමින්, දේශපාලන පරමාර්ථයක් ඉස්මතු කරගනිමින්, එතුමාගේ කීර්ති නාමය විනාශ කරන්නට මේ දරන ප්‍රයත්නය පිළිබඳව අපේ කනගාටුව සහ අප්‍රසාදය පළ කර සිටිනවා.

මුදල් ලැබෙන්නේ කොහොමද කියන එක අපට පැහැදිලියි. අපේ සිද්ධස්ථාන පෙන්වලා, ඒ ටිකට් විකුණලා ලබා ගන්නා මුදල් තමයි මේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරන්න යොදා ගන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට පවරා තිබෙන වගකීමක් තමයි, බුදු දහම සුරැකීම, පෝෂණය කිරීම සහ වැඩි දියුණු කිරීම. මේ තුළින් කරන්නේත් බුදු දහම පෝෂණය කිරීමයි. මොකද, පෙර රජවරු කළා වාගේ, මේ සිද්ධස්ථාන සංරක්ෂණය කරලා ඉදිරි පරම්පරා වෙනුවෙන් තබාගැනීම වර්තමාන රජයේත් වගකීමයි. මේ අය හිතාගෙන ඉන්නවා, බුදු දහමේ අයිතිකාරයන් රාජපක්ෂ පරම්පරාව කියලා. අපි දන්නේ නැහැ, ඒ අය තමන්ගේ පෞද්ගලික දේපළක් බුදු දහම වෙනුවෙන්, නැත්නම් තමන්ගේ ආගම වෙනුවෙන් පූජා කරලා තිබෙනවාද කියලා. ඔබතුමන්ලා, අපේ පක්ෂයේ ඉතිහාසය අරගෙන බලන්න. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා බුදු දහම වෙනුවෙන් මොන තරම් සේවයක් කරලා තිබෙනවාද? එතුමන්ලා බුදු දහම වෙනුවෙන් තමන් සතු දේවල් පූජා කළා; ඒ වෙනුවෙන් තමන්ගේ කාලය කැප කළා. එවැනි නායකයන් තමයි අපට හිටියේ. මානෙල් වත්ත විහාරය ගැන කථා කළොත්, කැලණිය රජමහා විහාරය ගැන කථා කළොත් ඒ ගැන දැන ගන්න පුළුවන් වෙයි. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් එදා සිට අද දක්වාම එවැනිම සේවයක් බුදු දහම වෙනුවෙන් කරනවා. ආර්. ප්‍රේමදාස මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් සිටි කාලයේ, එතුමා කළ සියලු ගම් උදා වැඩසටහන් අරගෙන බැලුවාම අපට පෙනෙනවා, සිද්ධස්ථාන 7ක් හදා තිබෙන බව. අපට පැහැදිලිව පෙනෙනවා, මේ යෝජනාව තුළ තිබෙන්නේ ඊර්ෂ්‍යාව සහ ක්‍රෝධය බව. එහෙම නැත්නම්, මෙතුමන්ලා තුළ අනාගතයට තිබෙන භයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කළ, ටී.බී. ඒකනායක මැතිතුමාගේ කාලයේ එතුමන්ලා කළ විධියටම තමයි පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව මේ මුදල් පාවිච්චි කර තිබෙන්නේ. ඒ කුමක් සඳහාද කියන එක ගරු ඇමතිතුමා පැහැදිලි කළා. ආර්ථික අපහසුතා සහිත ප්‍රදේශවල දහම් පාසල් ගොඩනැඟිලි ඉදිකිරීම, සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම වැනි කටයුතුවලට තමයි මේ මුදල් යොදවා තිබෙන්නේ. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, අද ඔබතුමා විතරයි මේ සභාවේ ඉන්නේ. මට අහන්න ඕනෑ මේකයි. මේ රටේ, සිංහල-බෞද්ධ ඡන්ද සියයට 70ක් තිබෙනවා. මේ ඡන්ද ගහ හොලවන්න උගුල් අටවන ඔබතුමන්ලා කියන්නේ පන්සල් හදන එක වැරැද්දක් කියලාද? ගෝඨාභය මහත්මයා ඔබතුමාට ඒ විධියට කියන්න කිව්වාද? එහෙම නැත්නම්, ඔබතුමන්ලා කියන්නේ දහම් පාසල් අධ්‍යාපනයට පහසුකම් දෙන්න එපා කියලාද? එහෙමත් නැත්නම්, සංස්කෘතික, ආගමික වටිනාකම් තිබෙන සිද්ධස්ථාන ආරක්ෂා කරලා මතු පරම්පරාව වෙනුවෙන් රැක දෙන්න එපා කියන එකද ඔබතුමන්ලා කියන්නේ? අපි මේ රටේ අධ්‍යාත්මික දියුණුවක් ඇති කරන්න ඕනෑ. පිරිහෙන සමාජයක, දරුවන්ට දහම් අධ්‍යාපනය ලබා දීලා තමයි ඒ කටයුත්ත කරන්න ඕනෑ.

ටී.බී ඒකනායක මැතිතුමනි, ආවරණ අනුමැතියට යටත්ව, මේ මුදල් පාවිච්චි කරලා තිබෙන හැටි ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ප්‍රකාශ කළා නේ. ඔබතුමන්ලා සියලු ඉදිකිරීම්, කොන්ත්‍රාත් දීම් පෞද්ගලික අංශය හරහා කළාට, මේ සියලු ඉදිකිරීම් රාජ්‍ය අංශය මඟින් කරන්න අපේ ගරු ඇමතිතුමා වැඩ කටයුතු යොදා තිබෙනවා.

අදත් චෛත්‍ය ගොඩනඟනවා. හැබැයි, ඒවා කරන්නේ රජයේ මුදල්වලින්. ස්වාමීන් වහන්සේ නමක් අපවත් වුණාම ඒ ආදාහන කටයුතු කරගන්න රුපියල් ලක්ෂයක් දෙන එක වරදක්ද කියලා මම අහනවා. අපේ හාමුදුරුවනේ, ඔබවහන්සේලා දන්නවා ඇති, ආදාහන උත්සවයකදී ගම්වල දායකයන් විඳින දුක; ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා විඳින දුක. ඉතින්, මේ කටයුතු වැරදිද කියලායි අපි අහන්නේ.

අප්‍රේල් 21වන දා සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයේදී ජීවිත අහිමි වූ අයගේ පවුල්වලට, ඒ තුවාලකරුවන්ට, ඒ කිතුනුවන්ට සැලකීම වැරදිද කියලා අපි අහනවා. මුස්ලිම් භක්තිකයන්ගේ දේවස්ථාන හදලා දෙන එක වැරදිද කියලා අපි අහනවා.

මෙතුමන්ලා රාජ්‍ය මුදල් අවභාවිතය ගැන කථා කරනවා නම්, මම මේ කාරණාත් සඳහන් කරන්න ඕනෑ. යෝෂිතට පුහුණුව දෙන්න නාවික හමුදාව මිලියන 21ක් වියදම් කළා. නාමල්ගේ ගුවන් ගමන්වල මිල ලක්ෂ 150යි. මේවාට තමයි රාජ්‍ය මුදල් අවභාවිත කරනවා කියන්නේ. රුපියල් මිලියන 1,600ක ණය ආපහු අය කරගෙන නැහැ. ඒ මුදල් ජනාධිපති කාර්යාලයේ නියමයෙන් දුන් ඒවා. මේ අය,"දැයට කිරුළ" ලෙස නම දීලා පවුලට කිරුළ පළඳපු අය. දැයට කිරුළට වියදම් කළ රුපියල් කෝටි 1,000 ගැන මොනවාද කියන්නේ? මේවාට තමයි රාජ්‍ය මුදල් අවභාවිත කරනවා කියන්නේ.

අවසාන වශයෙන්, මම මේ කාරණයත් කියන්න ඕනෑ. රාමායණයේ, අයෝධ්‍යා කාණ්ඩයේ, 63.7 ඡේදයේ සඳහන්ව තිබෙනවා, "යම් ක්‍රියාවක් කිරීම ආරම්භයේදීම එහි බරපතළ බව හෝ සැහැල්ලු බව යමෙක් නොදනීද, එසේම එහි ගුණ හෝ දොස් හෝ යමෙක් නොදනීද, ඔහු අඥානයෙකි" කියලා. ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා වරදක් කර ගත්තා දෝ කියලා මට හිතෙනවා. ඒ වාගේම අඩුවැඩි වශයෙන් මේකට දායකත්වය සැපයූ සියලු දෙනාම ලොකු වරදක් කර ගත්තා කියලා මට හිතෙනවා. ඒ කරපු වැරැද්ද අද පාරාවළල්ලක් වෙලා තමන්ට ඇවිල්ලා තිබෙනවා. අපේ ගම්වල කථාවක් තියෙනවා, ලී පට්ටලේ ඉඳ ගත්ත වඳුරා කුඤ්ඤය අයින් කළාට පස්සේ ඒ වඳුරාට වෙච්ච දේ මොකක්ද කියලා. මම හිතනවා, අපේ ආණ්ඩුව කරපු වැඩ ටික කියලා දෙන්නට අද ඔබතුමා අපට නොමිලේ අවස්ථාව අරගෙන දීලා තිබෙනවා කියලා. ඒ සඳහා ටී.බී. ඒකනායක මැතිතුමාට ස්තුතිය පුදකරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයකින් තොරව කල් තැබීමේ විවාදය පවත්වාගෙන යෑම පිළිබඳව මූලාසනය වශයෙන් ඇත්තටම මා කනගාටු වෙනවා.

මීළඟට ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පෙර මට විනාඩියක් දෙන්න.

අපේ මැති ඇමතිවරුන්ගේ කථා බොහොමයකදී පැහැදිලි වුණා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට මඩ ගැසීමේ චේතනාවෙන් ගෙනාපු යෝජනාවක් මෙතැන තියෙනවා කියලා. එතුමා මා ගැන දන්නවා. මහාමාර්ග ඇමති වශයෙන් හිටපු කාලයේත් මා එතුමාට උදවු කරලා තිබෙනවා. එතුමා දන්නවා, 1994දී එතුමාගේ යම් යම් කාර්යන්වලට අපි කොච්චර මැදිහත්වෙලා සද්භාවයෙන් කටයුතු කළාද කියන එක.

ඒ වාගේම මේ කාරණයේදී ජනාධිපතිවරණය පටලාගන්න එපා. මොකද, අපේ ජනාධිපති අපේක්ෂකයා අපි තෝරාගෙන ඉවරයි. ඒ නිසා එතුමන්ලාට තියෙන ප්‍රශ්නයක් මේ යෝජනාවට පටලවා ගන්න එපා. ඒ වාගේම තව කථාවලදී පැහැදිලි වුණා, මේ ආගමික මධ්‍යස්ථාන, ඒ වාගේම අනිකුත් මධ්‍යස්ථානවලට මුදල් දීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් තියෙනවා කියලා. පසුගිය ඉතිහාසයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් අපි මේ කාර්යය සඳහා අතිවිශාල මුදලක් දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඊට වඩා ඔබතුමාට වේලාව දෙන්න අමාරුයි. ඔබතුමා පමණක් සභාවේ විරුද්ධ පාර්ශ්වයේ ඉන්න නිසායි මම වේලාව දුන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

[අ.භා.5.55]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ටී.බී. ඒකනායක මැතිතුමා පිළිබඳව මාත් හොඳින් දන්නවා. මම ඉඩම් ඇමති හැටියට ඉන්නකොට එතුමා රාජ්‍ය ඇමති හැටියට කලක් සේවය කළා. ඒ නිසා මම දන්නවා, එතුමා මේ යෝජනාව මඩ ගහන්න ගෙනාපු එකක් නොවෙයි කියලා. මේ යෝජනාව දැක්කාම මට මතක් වුණේ මෙන්න මේ කාරණය. අපේ ගම්වල ප්‍රකට කියමනක් තියෙනවා, "ඵල ඇති රුකටයි ගල් ගහන්නේ" කියලා. ඒ වාගේ දැන් සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉලක්ක කරගෙන එක එක මුහුණුවරින් දිනපතාම චෝදනා එල්ල කරන්නේ මොන හේතුවක් නිසාද කියන එක දේශපාලනඥයන් වූ අපට විතරක් නොවෙයි, ඕනෑම කුඩා දරුවෙකුට වුණත් හොඳට තේරෙන කාරණයක්. මේවා සමහරුන්ට අලුත් වුණාට, ප්‍රේමදාසලාට අලුත් නැතැයි කියන එකත් මා හොඳින් දන්නවා. අපට මතකයි, මෙතුමාගේ පියා දිවංගත අපේ නායක ආර්. ප්‍රේමදාස මැතිතුමා මේ වාගේ හුදු දේශපාලන අවලාදවලට, පදනම් විරහිත චෝදනාවලට, මඩ ප්‍රහාරවලට -ඒ හැම එකකටම- මුහුණ දෙමින් ඒවා දරාගෙන පොදු ජනතාව අතර මතුවෙච්ච හැටි. ඒ නිසා මේ මොන උප්පරවැට්ටි දැම්මත් සජිත් ඇමතිතුමාත් හොඳට තෙම්පරාදු වෙච්ච පුද්ගලයකු හැටියටයි අද රට දකින්නේ. එතුමාගේ පියා වාගේම, මෙතුමාත් වැටි වැටී නැඟිටින්න හොඳට පුරුදු වෙලා තිබෙනවා. තමන්ට ලැබෙන අමාත්‍යාංශ හරහා නිර්මාණශීලිව වැඩ කරන, ජනතාවට සේවය කරන ඇමතිවරයකඅ හැටියට තමයි අපිත්, රටත් සජිත් ඇමතිතුමා දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා නිවාස, ඉදිකිරීම් ඇමතිතුමා හැටියට උදා ගම් හදමින් නිවාස වැඩපිළිවෙළ රට පුරා සාර්ථකව ක්‍රියාත්මක කරන ඇමතිවරයෙක්. හරියට නින්දක් නැතුව, හරියට ආහාරයක් නැතුව, විවේකයක් නැතුව ඉතාම කැපවීමකින් එතුමා ඒ වැඩකටයුතු කරන හැටි අපි දකිනවා. දහස් ගණනකට ගෙවල් හදන ඇමති වුණත්, එක ශතයක්වත්, එක වැලිකැටයක්වත් සාක්කුවට දමාගන්නෙත් නැතුව, අපතේ යවලාත් නැති ඇමතිවරයකු හැටියට අපට මේ විවාදයේදී එතුමා ගැන සඳහන් කරන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, හදන ගෙවල් තමන්ගේ හත්මුතු පරපුරට බෙදා දුන්නු නිවාස ඇමතිවරුත් අපි දැකලා තිබෙනවා. හැබැයි, මෙතුමාට එහෙම බෙදන්න ඉන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව විතරයි කියන එකත් ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. එතුමා ඉතාම කෙටි කාලයක් තුළ -මේ මාස කීපයේ- සංස්කෘතික කටයුතු ඇමතිවරයා ලෙස කැපී පෙනෙන සේවයක් ඉෂ්ට කළා. ඒවා එකින් එක අපේ මන්ත්‍රීවරු සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගස් යට දහම් අධ්‍යාපනය ලබන දරුවන් ගැන කල්පනා කරපු සංස්කෘතික ඇමතිවරයා කවුද කියලා බලන්න. හැම විහාරස්ථානයකටම දහම් පාසල් ගොඩනැඟිලි දෙන්න දැන් කටයුතු කරගෙන යනවා. මේ වෙලාවේ මට කාරණයක් මතක් වෙනවා. මා එය සඳහන් නොකළොත් වැරැදියි. දිස්ත්‍රික්ක ගණනාවක චෛත්‍ය හදන කොට එතුමා අපට කිව්වා, "ගාලු දිස්ත්‍රික්කය වෙනුවෙන් සුදුසුම විහාරස්ථානයක් නම් කරන්න. චෛත්‍ය රාජයාණන් වහන්සේ නමක් ඉදි කරලා දෙන්නම්" කියලා. රජයේ සල්ලි සතයක්වත් යොදවන්නේ නැතිව ඒවා ඉදි කරන හැටි අපි අද බලාගෙන ඉන්නවා. නාගොඩ මුලන පන්සලේ චෛත්‍ය දැන් ඉදි වෙමින් පවතින හැටි අපි දැන් දකිනවා. එතුමාට විශාල පිනක් අත් වෙනවා, ඒ වැඩ කටයුතු කරන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පන්සල්, පල්ලි, වෙනත් පූජනීය ස්ථානවල අඩු පාඩු සොයා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරන සංස්කෘතික කටයුතු ඇමතිවරයා හැටියට, අප එතුමා අගය කරනවා. විවිධ විවේචන කරමින් කුමන විධියට පටලන්න හැදුවත්, එතුමා හැම වැඩක්ම කරන්නේ තමන්ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේයි. ඒ නිසා කිසිම තැනකින් රිංගන්න කාටවත් ඉඩක් නැහැ. එතුමාගේ අධීක්ෂණය හැම තැනකම තිබෙනවා. ඒ නිසා චෝදනා නඟන අයට මා කියන්න කැමැතියි, ප්‍රේමදාසලාගේ ක්‍රමයේ වෙනසක් තිබෙන බව මතක තියාගන්න කියලා. ඔවුන් හැම දාම ජීවත් වුණේ සාමාන්‍ය පොදු ජනතාවගේ හදවත් තුළයි. දිවංගත ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා දෙස බලන්න. එතුමා ඉපදුණේ සාමාන්‍ය මිනිසුන් අතරයි. ඒ මිනිසුන්ට සේවය කරලා, ඒ ජනතාව අතරම ජීවිතයට සමු දුන් නායකයෙක් තමයි ආර්. ප්‍රේමදාස මැතිතුමා. සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එතුමාගේ පියා වාගේම සාමාන්‍ය මිනිසුන් අතර ජීවත් වෙමින්, ඔවුන් අතර ආදරණීය නායකයකු බවට අද පත් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට මේ වාගේ අභූත චෝදනා, අවලාද නඟන්න හේතුවක් තිබෙනවා. මා කියන්නේ නැහැ, ටී.බී. ඒකනායක මැතිතුමා එවැනි හැඟීමකින් මේ යෝජනාව ගෙනාවා කියලා. නමුත්, අද කතා කරපු බොහෝ දෙනාගේ කතා අසාගෙන සිටින විට අපි දැක්කා, අපි කවුරුත් දැනගත්තා ඒ අවලාද නඟන්නේ කුමන හේතුවක් නිසාද කියලා. ඒ සියලු චෝදනා නඟන්නේ තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන්. රටේ වර්තමාන වාතාවරණය ගැන හොඳ අවබෝධයක් ඇති වූ නිසා ඉතාම සාධාරණ බියක් ඒ අයට ඇති වෙලා තිබෙන නිසායි මේ චෝදනා සියල්ල ගෙන එන්නේ කියන එක අපට හොඳින් තේරෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි කියලා ඔබතුමා කියනවා නම්, මා මීට වඩා කාලය ගන්නේ නැහැ. පොදු ජනතා පවුරින් ප්‍රේමදාසලා ආරක්ෂා වුණා වාගේම, මේ කරන හැම චෝදනාවකටම සජිත් ප්‍රේමදාස මැතිතුමා පිළිතුරු දුන්නා වාගේම, මේ රටේ ජනතාවටත් ඒ ගැන අවබෝධයක් තිබෙනවා වාගේම, ජනතා අධිකරණයේදී මේ සියලු චෝදනා නිෂ්ප්‍රභ වන බව මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.01]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. සංස්කෘතියට බොහොම සම්බන්ධ, රාජධානි විශාල ප්‍රමාණයක් තිබෙන දිස්ත්‍රික්කයක් තමයි, කුරුණෑගල දිස්ත්‍රික්කය. අපේ හිටපු සංස්කෘතික කටයුතු ඇමතිතුමා වන ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා තමයි අද මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. අද කතා රාශියක් කෙරුණා. හදිස්සි වෙන්නේ නැතිව, නිසි වග විභාගයක් ඇතිව මේ යෝජනාව ඉදිරිපත් කළා නම් තමයි වඩාත් හොඳ, ගරු ටී.බී. ඒකනායක හිටපු ඇමතිතුමනි. මේ යෝජනාව මේ හදිස්සියේ ගෙන ආවේ මොකද කියලා මම කියන්න ඕනෑ. මේ හදිසි ෆයිල්, හදිසි දේවල් එළියට එන්නේ, මේ දවස්වල මේ රටේ සිටින ජනප්‍රියම පුද්ගලයා හැටියට, මඩ ගැසිය යුතුම පුද්ගලයා හැටියට, මඩ තැවරිය යුතුම පුද්ගලයා හැටියට එතුමා සලකන නිසාය කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. 2015 වර්ෂයේදී අපේ ආණ්ඩුව බලයට පැමිණි පසු තමයි සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කියන එක රටට දැනෙන අමාත්‍යාංශයක් බවට පත් වුණේ. ගරු මන්ත්‍රීතුමනි, මා තමුන්නාන්සේට අගෞරව කරනවා නොවෙයි. හැබැයි, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය අපේ කවුරුන් හෝ වියපත් ඇමතිවරයකුට තමයි එදා දුන්නේ. කාට හෝ දෙන "සමුපකාර" කියන විෂය වාගේ පැත්තකට දමා තිබුණු විෂයයක්, එය. හැබැයි 2015 අවුරුද්දෙන් පසුව තමයි සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කියන අමාත්‍යාංශය බොහොම ජනප්‍රිය අමාත්‍යාංශයක් බවට පත් වෙන්න විශේෂයෙන් හැකියාවක් ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මා මේ අහන්න හදන ප්‍රශ්නයට උත්තරය දුන්නා කියලා ටී.බී. ඒකනායක මැතිතුමා කිව්වා. ඒ වුණාට, ඒ ප්‍රශ්නයට උත්තරය මට හරියටම ලැබුණේ නැහැ. සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදි කිරීම් පෞද්ගලික සමාගම තමුන්නාන්සේලාගේ එකක්. කොන්ත්‍රාත් පදනම මත ශ්‍රමිකයන් ලබා ගැනීම සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්නය අහන්නේ. මේ කාරණය මම දන්නවා. මොකද, මම පඬුවස්නුවර ආසනයේ සංවිධායකයා නිසා. මම, දඹදෙණිය නගරයට බොහොම ආසන්න පදිංචිකරුවෙක්. යාපහුව, කුරුණෑගල කියන රාජධානිත් මට බෙහෙවින් සමීපයි. තමුන්නාන්සේලාගේ ඒ මැන්පවර් ආයතනය මඟින් බඳවා ගත් සේවකයන් විශාල පිරිසක් ඒ රාජධානිවල රැකියා කළා.

පඬුවස්නුවර අහල-පහළ ජනතාවත් මේ වන විට තමුන්නාන්සේලා බොහෝ දෙනෙකුට හෙණ ඉල්ලනවා. මොකද, මධ්‍යම සංස්කෘතික අරමුදල එක් සේවකයෙක් වෙනුවෙන් රුපියල් 1,200 බැගින් ඒ manpower ආයතනයට වෙන් කළත්, රුපියල් 700 බැගින් තමයි හැම සේවකයකුටම ගෙවලා තිබෙන්නේ. මධ්‍යම සංස්කෘතික අරමුදලින් ඒ මුළු මුදල අරගෙන තිබෙනවා. හැබැයි, එක් සේවකයකුට ගෙවලා තිබෙන්නේ රුපියල් 700යි. ගරු හිටපු අමාත්‍යතුමනි, ඔබතුමා තවමත් පිළිතුරු දුන්නේ නැති ප්‍රශ්නය තමයි, ඉතිරි රුපියල් 500ට වුණේ මොකක්ද කියන එක. ඒක පොඩි මුදලක් නොවෙයි. එවැනි සේවකයන් 400ක පමණ ඉන්නවා. සීගිරියට 150යි, පොළොන්නරුවට 100යි, දඹුල්ලට 12යි, යාපහුවට 100යි, මොනරාගලට 5යි, තිස්සමහාරාමයට 12යි ආදී වශයෙන් ඔබතුමා සාමාන්‍යයෙන් 400කට ආසන්න පිරිසකට පත්වීම් ලබා දීලා තිබෙනවා. ඒ හැම සේවකයකුගෙන්ම දවසකට රුපියල් 500ක් කපාගෙන තිබෙනවා. එතකොට, නිකම් නොවෙයි, දවසකට රුපියල් ලක්ෂ 2ක්. මධ්‍යම සංස්කෘතික අරමුදලින් එම සේවකයන් 400දෙනා වෙනුවෙන් දවසකට රුපියල් ලක්ෂ 2ක් බැර වෙනවා. පෞද්ගලිකව manpower සමාගමක් පිහිටුවාගෙන තිබෙනවා. එම සමාගමේ සභාපති වශයෙන් ඉන්නේ කපිල ද සිල්වා කියලා මහත්මයෙක්; බන්දුල විතානාරච්චි මහත්මයා තමයි කළමනාකර අධ්‍යක්ෂ. ඔහු ටී.බී. ඒකනායක මැතිතුමාගේ පෞද්ගලික ලේකම්වරයා කියලා තමයි කියන්නේ. ඩබ්ලිව්.ඒ. රණවීර මහතා තමයි අධ්‍යක්ෂ. හැබැයි, ඔහු අධ්‍යක්ෂ වුණත්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ. අපි දන්නවා, ඒවා දේශපාලන පත්වීම්. අමාත්‍යවරයාට ඉතාම සමීප හිතවතුන් තමයි ක්‍රියාකාරි අධ්‍යක්ෂවරු විධියට පත් කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මස්සිනාලා වාගේ කට්ටිය.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මස්සිනාලා, මහප්පලා වාගේ කට්ටිය. විශේෂයෙන් නෑදෑයන් තමයි තමුන්නාන්සේලා පත් කරන්නේ. ගරු හිටපු ඇමතිතුමනි, එතකොට මම අහන්නේ මේකයි. පෞද්ගලික ලේකම් කියන්නේත් තමුන්නාන්සේගේ කෙනෙක්. ඩබ්ලිව්.ඒ. රණවීර කියන්නේත් තමුන්නාන්සේලාගේ දේශපාලන පත්වීමක්. තමුන්නාන්සේලා හදපු manpower ආයතනයෙන් සෑම දවසකටම රුපියල් ලක්ෂ 2ක් අරගෙන තිබෙනවා. ඒක පොඩි වැඩක් නොවෙයි. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මට සමාවෙන්න. ඔබතුමා ඔය විධියට ඉන්නවා දකිනකොට අපට දුකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය දැන් අවසානයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආචාර්ය වී. රාධාක්‍රිෂ්ණන් ඇමතිතුමාට වෙන් කළ විනාඩි 5ක කාලය මට ගන්න කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්න විධියට දකිනකොට මට දුකයි. ඔබතුමාට විශාල ලුණුවක්, විශාල ගුලියක් ගිල්වලා තිබෙනවා. දැන් ඔබතුමාගේ පිහිටට කිසිම කෙනෙක් නැහැ. හැබැයි, මට මේ ටික අහන්න ඕනෑ. මගේ මගේ කාලයෙන් ඔබතුමාට විනාඩියක් දෙන්නම්, කරුණාකරලා ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. දවසකට ඉතිරි වූ රුපියල් ලක්ෂ 2ට මොකද වුණේ? පඩුවස්නුවර අභිංසක සේවකයන්ට රුපියල් 700ක් ලැබෙද්දී, ඉතිරි රුපියල් 500ක් ගසාගෙන කද්දී -ඒ සේවකයන් 400දෙනාගෙන් රුපියල් 500 බැගින් ගනිද්දී- දවසකට රුපියල් ලක්ෂ 2ක් මධ්‍යම සංස්කෘතික අරමුදලින් අතුරුදහන් වුණා. ඒ විධියට ලක්ෂ දෙක බැගින් එකතු වූ මුදල කෝ කියන ප්‍රශ්නයට කරුණාකර මට පිළිතුරක් දෙන්න ගරු හිටපු ඇමතිතුමනි.

ඒ එක්කම මට තව පොඩි කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔබතුමා විනාඩියකින් කියන්න ඕනෑ.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් cadre එකක් නොමැති නිසා මේ කාරණය පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් අනුව ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක වුණා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ උත්තරය හරි. මම අහන්නේ, රුපියල් 500 ඒවා 400ට මොකද වුණේ?

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
නමුත්, පාලක මණ්ඩලයේ නෛතික අයිතිය අනුව තමයි ඒ පිරිස සංරක්ෂණය කරලා, ඔවුන් වෙනුවෙන් සේවක අර්ථසාධක මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඔවුන් සංරක්ෂණය කරලා තිබුණු නිසා මිය ගිය 4දෙනෙකුට රුපියල් ලක්ෂ 8 ගණනේ ගෙව්වා. ඒ නිසා එතැනදී කවුරුවත් මුදල් අවභාවිත කළේ නැහැ. අපි ඒක පැහැදිලි කරන්නට ඕනෑ. මොකද, මේක තමයි ක්‍රමවේදය. පාලක මණ්ඩලයේ අනුමැතියත් එක්ක අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ තමයි ඒක ක්‍රියාත්මක වුණේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අපි අහන්නේ, රුපියල් 500ට මොකද වුණේ?

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ මේ ගොල්ලෝ CID එක කැඳවලා පරීක්ෂණ කළා. නමුත්, වැරැදි එක කාරණයක්වත් ඔප්පු කරන්න බැරි වුණා, ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මේ කාරණය පිළිබඳව දිගින් දිගට,- [බාධා කිරීමක්]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමනි, හතරදෙනෙකුට වන්දි වශයෙන් රුපියල් ලක්ෂ අට ගණනේ ගෙව්වා කියලා දැන් ඔබතුමා කියනවා. හරි, කමක් නැහැ. හතරදෙනෙකුට ලක්ෂ අට ගණනේ ගෙව්වා කියමුකෝ. අටවරක් හතර තිස්දෙකයි. ඒ කියන්නේ තමුන්නාන්සේලා දවස් 16ක් එකතු කරපු මුදල නේ ඒ ගෙවලා තිබෙන්නේ. එතකොට ඉතිරි මුළු කාල පරිච්ඡේදයම එකතු වුණු මුදල-

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අනේ දැන් නම් මගේ වේලාව දෙන්න බැහැ. අඩුම තරමින් තමුන්නාන්සේ සපත්තු දෙකක්වත් ගත්තේ නැද්ද? මම අහන්නේ ඒකයි. එච්චර මුදලක් වියදම් කරලා තමුන්නාන්සේට සපත්තු දෙකක්වත් ගන්න බැරි වුණාද? ඒක කවුරු හෝ පැහැර ගත්තාද? ඒකත් මහින්ද රාජපක්ෂ මහත්මයලා ඉල්ලා ගත්තාද? [බාධා කිරීමක්] සපත්තුව වෙන්දේසි කළා! අනුන්ට මඩ ගහන්න ඉස්සෙල්ලා තමන් හොඳින් ඉන්න ඕනෑ.

හිටපු ජනාධිපතිවරයාගේ ජන්ම දිනය හා පදවි ප්‍රාප්තිය වෙනුවෙන් හිටපු අමාත්‍යවරයාගේ පණිවුඩයක් පුවත් පත්‍රක පළ කිරීම සහ සුබ පැතීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් රුපියල් 109,600ක් වැය කර තිබුණි. තවද, හිටපු අමාත්‍යවරයා මල්වතු - තමුන්නාන්සේලා මේ පිංකම් කරලා තිබෙන්නේ අහිංසක මිනිසුන්ගේ ටිකට්වල සල්ලිවලින්- තමුන්නාන්සේලා වෙසක් කාඩ්, අවුරුදු සුබ පැතුම් කාඩ් බෙදලා තිබෙන්නේ අහිංසක භක්තිවන්තයන් පූජනීය ස්ථානවලට ඇවිත් පින් කැටයට දමන මුදල්වලින්. පන්සලට දෙන ආධාරයෙන් තමයි තමුන්නාන්සේලා ඒ වාගේ පින්කම් කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලා අනුන්ගේ දානේ ගෙවල්වලදීයි දානය බෙදලා තිබෙන්නේ. දානය ලැස්ති කළේ වෙන අය. තමුන්නාන්සේලා ගිහින් තමයි ලොකුවට ඒ දානය බෙදලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හරි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට කියන්න තව කරුණු කාරණා රාශියක් තිබෙනවා. අමාත්‍යවරයාගේ උපදෙස් මත ඔහුගේ මාධ්‍ය ලේකම් විසින් 2015 වර්ෂයේ අලුත් අවුරුදු සුබ පැතුම්පත් 7,500ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් අරමුදලින්, - ලජ්ජයි. ලජ්ජයි. මුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේම මිනිසුන් සන්තෝෂයට පත් වෙන්න ඇති, ඔන්න ටී.බී. ඒකනායක මැතිතුමාගෙන් අලුත් අවුරුදු සුබ පැතුමක් ලැබුණා කියලා. මිනිස්සු පූජනීය ස්ථානවල පින් කැටයට දමපු සල්ලිවලින් තමයි තමුන්නාන්සේ සුබ පැතුම්පත් යවලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියන්නේ, "වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්න එපා" කියලායි. ඔබතුමා මට පෞද්ගලිකව හෝ අර රුපියල් පන්සියයට වුණේ මොකක්ද කියන එකත් කියන්න. ඔබතුමා ඉතාම හොඳ ඇමතිවරයකු හැටියට සිටියා. හැබැයි, අනුන්ගේ ලුණුවක් කාලා අද මේ විධියට අසරණභාවයට පත් වීම ගැන කනගාටුව පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා.6.11]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද ඉතා කනගාටුදායක සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා කියලා මම හිතනවා. මේ බෞද්ධ රටේ බෞද්ධකමක් තිබෙන සංස්කෘතික අමාත්‍යවරයකු විධියට කටයුතු කරපු අපේ ටී.බී. ඒකනායක මැතිතුමා මේ අවස්ථාවේ ඉතා අවාසනාවන්ත ලෙස, අභූත චෝදනා නඟමින්, නිවැරදි විග්‍රහයක් නොකර, යම් යම් තැන්වලින් අහුලා ගත්ත කරුණු කාරණා ටිකක් ගොනු කරලා යෝජනාවක් ගෙනැල්ලා මේ උත්තරීතර පාර්ලිමේන්තු සභා ගැබ කෙළෙසීමට කටයුතු කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා කොච්චර තහවුරු කරන්න හැදුවත්, මේ වන විට එතුමාගේ 'සභායට ඩැනී' කෙනෙක්වත් නැහැ. සභායට ඩැනී කෙනෙක්වත් ඉන්න ඕනෑ. අද එතුමාගේ සභායට එක මන්ත්‍රීවරයෙක්වත් නැහැ. එතුමාට ලුණුව දීලා ඒ අය එතුමා අතරමං කරලා තිබෙන්නේ. අර "ලෙව්කේ මැතිඳු අද තනියම වෙල මැද්දේ" කිව්වා වාගේ, එතුමාත් පාර්ලිමේන්තු සභාව මැද්දේ අද තනි වෙලා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

සාමාන්‍යයෙන් රටක වැඩ නොකිරීම සම්බන්ධයෙන් තමයි චෝදනා ගෙනෙන්න ඕනෑ. යම් රටක මුදල් පාවිච්චි කරලා වැඩ නොකිරීමටයි මුදල් අවභාවිත වෙනවා කියන්නේ. ඇහැට කනට පෙනෙන්න තිබෙන, තැන තැන තිබෙන මහ විශාල බෞද්ධ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම, බෞද්ධ සංස්කෘතික උරුමයේ ප්‍රබෝධය ඇති කිරීමට කටයුතු කිරීම, මේ රටේ වසර 2,500ක බෞද්ධ ශිෂ්ටාචාරයක් තිබෙන බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කිරීම වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි ව්‍යවස්ථාව යටතේ අපට තිබෙන වගකීමක්. පසුගිය දවස්වල තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයට චෝදනා කළේ මේ රටේ බෞද්ධ ආගම නැති කරනවා කියලායි. එහෙම චෝදනා කරලා තමුන්නාන්සේලා දකුණේ ජනතාවගේ ඡන්දය ගත්තා. නමුත් ඔබතුමා පවා මුසාවාද කිව්වා කියලා මම කියන්න කැමැතියි.

මේ අවස්ථාවේදී මට යම් සිද්ධියක් මතක් වුණා. කාලයක් මේ සභාවේත් ඒ ගැන කථා වුණා. ලෝකයේ මිල කළ නොහැකි පාවහන් දෙකක් ඔබතුමා පාවිච්චි කරලා තිබුණා. මිල නොකළ පතුල ගිය සපත්තු දෙකට වටිනාකමක් දුන්නාද? එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ඒ වාගේ පට්ටපල් අසත්‍ය මේ සමාජයට ගෙනැත්, ලෝකයාගෙන් හැල්ලුවට ලක් වෙන තත්ත්වයට මේ රට පත් කළා. එහෙම ඉඳලා අද අල්ලා ගත්තේ වැරදි දෙයක්. අද තමුන්නාන්සේ කෝටි වල්ගයක් අල්ලාගෙන තිබෙනවා. දැන් තමුන්නාන්සේට ඒක අතහරින්න බැහැ, මෙතැන රැඳී ඉන්න සිදු වෙලා තිබෙනවා.

මේ රටේ පසුගිය අවුරුදු හතර තුළ කරපු වැඩ කොටස අපි දන්නවා. තමුන්නාන්සේලා වාගේ අපි අවුරුදු විසි ගණන් රට පාලනය කළේ නැහැ. මේ වන විට ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මගේ ආසනය තුළ තුන්දහසකට, හාර දහසකට නිවාස ණය ආධාර ලබා දීලා තිබෙන බව මම දන්නවා. ඒ විතරක් නොවෙයි. එතුමා විහාරස්ථාන ගණනාවකට උදව් උපකාර කරලා තිබෙනවා. ඓතිහාසික ගාලු පුරවරයේ තිබෙන ඉතාම වැදගත් ස්ථානයක් වන විද්‍යාලෝක පිරිවෙනට ඊයේ-පෙරේදා එතුමා පැමිණ රුපියල් 23,500,000ක් ලබා දෙන්න පොරොන්දු වෙලා, ඒ මුදලින් රුපියල් ලක්ෂ 46ක චෙක්පතක් එවෙලේම දීලා ගියා. මේවා කරන්න තමයි මේ මුදල් අරගෙන තිබෙන්නේ. චක්‍රලේඛනවලට යටවෙලා නොයෙක් විධියේ දේවල් කරලා මේ කටයුතු කල් යවමින්, ප්‍රමාද කරන එක නොවෙයි කරන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඕනෑ කරන්නේ ඒකද? පසුගිය අවුරුදු තුනහමාර තිස්සේ තමුන්නාන්සේලා අපේ කකුලෙන් ඇද්දා. තමුන්නාන්සේලාත් මේ ආණ්ඩුවේ සිටියා. ජාතික ආණ්ඩු කියලා පට්ටපල් බොරු සන්ධානයක් ගොඩ නඟාගෙනයි ඒ කාලයේ අපි වැඩ කළේ. එම නිසා අවුරුදු තුනහමාරක් තිස්සේ අපට වැඩ කරන්න බැරි වුණා. පසුගිය ඔක්තෝබර් 26වෙනි දා ඇති වූ සිද්ධියත් එක්ක තමයි අපට වැඩ කරන්න පුළුවන් වුණේ. වෙස් වලාගත් ආශීර්වාදයක් හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැති හැටියට කොන්ද කෙළින් තියාගෙන තීන්දු ගන්න, සජිත් ප්‍රේමදාස මැතිතුමාට කොන්ද කෙළින් තියාගෙන තීන්දු ගන්න අවශ්‍ය තීරණය අපට ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදීලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා හදපානේ ගෙනැල්ලා අගමැතිකමේ දිවුරුම් දීලා, හොර කැබිනට් මණ්ඩලයක් පත් කර ගෙන මේ රටේ සියලුදේවල් අවභාවිත කළේ ඒ මාස දෙකේදීයි. මේ රටේ හොර කැබිනට් මණ්ඩලයෙන් තීන්දු කරලා ඒ කාලයේ ඔබතුමන්ලා රස්සා පවා දීලා තිබුණා. එහෙම කරද්දී අපි නැවත ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිටෙන් බලයට ඇවිල්ලා පසුගිය මාස කීපය තුළ කෝටි සංඛ්‍යාත මුදලක් මේ රටේ දහම් පාසල් අධ්‍යාපනයට යෙදෙව්වා. භික්ෂූන් වහන්සේනමක් අපවත් වුණාට පස්සේ ආදාහන පූජෝත්සවයට කියලා රුපියල් ලක්ෂයක් චෙක්පතකින් දෙන්න පුළුවන්කමක් තිබෙන නිර්මාණශීලී වැඩ පිළිවෙළක් මේ රටේ ඇති කරලා බෞද්ධ සංස්කෘතික උරුමය වාගේම අනෙකුත් සියලු සංස්කෘතික උරුමය ආරක්ෂා කරන්න අපි කටයුතු කළා. අද පට්ටපල් බොරු කියලා මේ සභාව නොමඟ යවලා සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ ප්‍රතිරූපය කඩා බිඳ දමන්න මේ අය ලෑස්ති වුණාට ජනතාව ඒකට ලෑස්ති නැහැ. ජනතාව එතුමාත් එක්ක ඉන්නවාය කියන පණිවුඩය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු වේලු කුමාර් මැතිතුමා. ඔබතුමාට විනාඩි 05ක කාලයක් වෙන්කර තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

[பி.ப. 6.16]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மத்திய கலாசார நிதியத்தினுடைய நிதிப் பாவனை தொடர்பான இன்றைய ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே என்னுடைய அபிப்பிராயங்களைத் தெரிவிப்பதற்கு வாய்ப்புத் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக, மத்திய கலாசார நிதியத்தினுடைய நிதிப் பாவனையானது ஒரு சீரான ஒழுங்குமுறையில் நடைபெறவில்லை என்ற குற்றச்சாட்டினை முன்னிறுத்தியே இன்றைய ஒத்திவைப்புவேளைப் பிரேரணை கொண்டுவரப் பட்டிருக்கின்றது. ஆனாலும், இது முழுமையாக குறிப்பிட்ட ஓர் அமைச்சரின்மீது அல்லது இந்தத் துறைசார்ந்த அமைச்சராக இருக்கக்கூடிய கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள்மீது ஒரு குற்றச்சாட்டினை முன்வைக்கும் நோக்கிலே கொண்டுவரப் பட்டிருக்கின்றது என்பதை இந்த அவையிலே இருக்கின்ற உறுப்பினர்கள் உட்பட இந்த நாட்டிலே இருக்கக்கூடிய சகலரும் அறிவார்கள். இன்றைய காலகட்டத்திலே எங்களுடைய அரசாங்கத்திலே மிகவும் வினைத்திறனாகச் செயற்படக்கூடிய ஓர் அமைச்சுக்குத் தலைமைதாங்கி, எங்களுடைய அரசாங்கத்துக்கு எடுத்துக்காட்டாகச் செயற்படுகின்ற அமைச்சராக கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் காணப்படுகின்றார். கடந்த அரசாங்கக் காலத்துடன் ஒப்பிடுகின்றபோது, இலங்கையிலே வீடமைப்பு நிர்மாணத்துறையிலே எழுச்சிமிக்கதொரு காலகட்டமாக இந்தக் காலகட்டத்தைக் காணுகின்றோம். ஒவ்வொருநாளும் எங்கேயாவது ஒரு மாவட்டத்தில் ஒன்று அல்லது இரண்டு வீடமைப்புத் திட்டங்கள் அல்லது எழுச்சிக் கிராமங்கள் மக்களிடம் கையளிக்கப்படுவதைக் காணுகின்றோம். "காய்க்கின்ற மரத்துக்குத்தான் கல்லெறி விழும்" என ஒரு பொதுவான கூற்று இருக்கின்றது. அந்த அடிப்படையிலேயே இந்தப் பிரேரணை முன்வைக்கப்பட்டிருக்கின்றது.

எங்களைப் பொறுத்தவரையிலே, ஏனைய அமைச்சுக்களின் செயற்பாடுகளோடு ஒப்பிடுகின்றபோது, அவருடைய அமைச்சினது செயற்றிறனையும் அமைச்சினால் மேற்கொள்ளப்படுகின்ற வேலைத்திட்டங்களினது நேர்த்தித் தன்மையையும் அவர் எந்தளவிற்கு தலைமைத்துவத்திலே முன்னின்று செயற்பட்டிருக்கின்றார் என்பதையும் இந்த அவைக்கும் இந்த நாட்டுக்கும் எடுத்துக்காட்டுவதற்கான ஒரு சந்தர்ப்பத்தை இந்தப் பிரேரணையின்மூலம் எதிர்க்கட்சியினர் ஏற்படுத்தித் தந்திருக்கின்றனர் என்பதனை இந்த இடத்திலே ஞாபகப்படுத்த வேண்டியிருக்கின்றது.

எங்களுடைய நாட்டிலே கடந்த காலங்களிலே சீரழிவுக்குட்பட்டுவந்த கலாசார நிலைமைகளைச் சீர்செய்து கட்டியெழுப்புவதற்கு அடிப்படையாக அமையக்கூடிய "දහම් පාසල්" எனப்படுகின்ற ஞாயிறுப் பாடசாலைகள் - இந்து மதத்தவர்களின் அறநெறிப் பாடசாலைகள், இஸ்லாமியர் களினதும் கிறிஸ்தவர்களினதும் அடிப்படை அறநெறிகளை முன்னெடுப்பதற்குரிய பாடசாலைகள் - தொடர்பிலான ஒரு வேலைத்திட்டம் குறிப்பாக, இந்த மத்திய கலாசார நிதியத்தினைப் பயன்படுத்தி முன்னெடுக்கப்பட்டிருக்கின்றது. தூரநோக்கிலே பார்க்கின்றபோது, உண்மையிலேயே எமது நாட்டினுடைய கலாசார நிலைமைகளைக் கட்டியெழுப் புவதற்குத் தேவையான அடிப்படையான அம்சமாக இது இருக்கின்றது. இந்த நிதிப் பாவனை தொடர்பாகக் குறைபாடுகள் இருக்குமாக இருந்தால், அதற்குரிய கணக்காய்வின்போது அதனை ஆராய முடியும்; கணக்காய்வு அறிக்கையினை ஆராய முடியும். அதேபோல, 'கோப்' குழு முன்னிலையிலே இது தொடர்பாக ஆராய முடியும். இவ்வாறான பல்வேறு வழிமுறைகள் இருக்கின்றபோது, முண்டியடித்துக்கொண்டு இந்த விடயத்தை ஓர் ஒத்திவைப்புவேளைப் பிரேரணையாகக் கொண்டுவந்திருப் பதானது, இன்றைய காலகட்டத்திலே நாடே பேசுகின்ற ஓர் அரசியல் தலைமைத்துவமாக கௌரவ சஜித் பிரேமதாச அவர்கள் காணப்படுவதனால், அவர்மீது எவ்வாறாவது ஒரு கறுப்புப் புள்ளியை வைப்பதற்கான முயற்சியாகும். ஆனாலும், இன்று அது மறுபக்கமாக மாற்றமடைந்து, அவருடைய இந்தக் காலகட்டத்திலே அவர் மேற்கொண்டிருக்கின்ற அமைச்சினது வேலைத்திட்டங்களை வெளிப்படுத்துவதற்கான ஒரு வாய்ப்பாக இது அமைந்திருக்கின்றது என்பதனைக் கூறிவைக் கவேண்டும்.

கண்டி மாவட்டத்திலே கடந்த காலங்களிலே வீடமைப்பு, நிர்மாணத்துறை அமைச்சினுடைய வீட்டுத் திட்டங்களானவை அங்கேயிருக்கின்ற trust நிறுவனத்தினூடாக மேற்கொள்ளப் பட்டிருந்தாலும், தற்போது கௌரவ சஜித் பிரேமதாச அவர்களின் காலப்பகுதியில் அம்மாவட்டத்திலிருக்கின்ற பல தோட்டங்களிலே நேரடியாக இவ்வமைச்சினூடாக இந்த வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. குறிப்பாக, கண்டி ஹந்தானைத் தோட்டத்திலே, பன்விலைப் பகுதியிலே, கெலாபொக்க தோட்டத்திலே, தெல்தெனிய - ரங்கல பிரதேசத்திலே இருக்கின்ற தோட்டங்களிலே வீடமைப்பு, நிர்மாணத்துறை அமைச்சினூடாக அந்த வீட்டுத்

திட்டங்களை நேரடியாகக் கொண்டுசென்று தோட்ட மக்களும் பயன்பெறக்கூடிய வகையிலே அந்த வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்பட்டுவருகின்ற காலகட்டமாக இது இருக் கின்றது. ஆகவே, இதனை முன்மாதிரியான ஒரு செயற்பாடாக, முன்மாதிரியான ஒரு விடயமாக நாங்கள் எடுத்துக்கொள்ள வேண்டியிருக்கின்றது.

வழமையான சம்பிரதாயத்தின்படி, வழமையான வழிகாட்டல் அல்லது அட்டவணையின்படி அதே வேலைகளைச் செய்துகொண்டிருப்பது புதிய தலைமைத் துவத்தையோ தூரநோக்குக்கொண்ட பார்வையையோ எடுத்துக்காட்டப் போவதில்லை. அதனைத் தாண்டி இந்த நாட்டினது இன்றைய தேவை என்ன?சமூகங்களினது இன்றைய தேவை என்ன? எதிர்காலத்திலே இந்தச் சமூகத்தைக் கட்டியெழுப்புவதற்கு எவற்றை நாங்கள் செய்ய வேண்டியிருக்கின்றது? என்பவற்றை முன்கூட்டியே உணர்ந்து செயற்படக்கூடிய ஒரு தலைமைத்துவமாக கௌரவ அமைச்சர் சஜித் பிரேமதாஸ அவர்கள் செயற்பட்டுக் கொண்டிருக் கின்றார். அந்தச் செயற்பாடு தற்போது எதிர்க்கட்சியில் இருக்கின்றவர்களுக்கு வலியை ஏற்படுத்தியிருக்கின்றது; நடுக்கத்தை ஏற்படுத்தியிருக்கின்றது. அதன் வெளிப்பாடாகவே இன்றைய பிரேரணை காணப்படுகின்றது என்பதனை இந்த இடத்திலே ஞாபகப்படுத்த வேண்டும். அந்த வகையில், அமைச்சர் அவர்கள் மேற்கொள்கின்ற இந்தப் பயணம் தொடர்ந்து சீராக முன்நோக்கிச் செல்ல வேண்டும். அதற்கு வலுச்சேர்க்க நாங்கள் தயாராக இருக்கின்றோம் என்பதைக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 05ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 6.23]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් වියදම් කිරීම සම්බන්ධව තමයි අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. මම පළමුවෙන්ම කියන්නට ඕනෑ, හිටපු අමාත්‍ය ගරු ටී.බී. ඒකනායක මැතිතුමා කියන්නේ අපි බොහෝ ගරු කරපු අමාත්‍යවරයෙකු බව. එතුමා ගම ගැන බොහෝ සේ කථා කරපු හිටපු අමාත්‍යවරයෙක්. මම දන්නේ නැහැ, ඔබතුමා මෙහෙම දේකට පෙළඹුනේ ඇයි කියලා. ඔබතුමා කෙනෙකුට ඇඟිල්ල දිගු කරනවා නම්, කෙනෙකුට නිරපරාදේ හේතුවක් නැතිව මඩ ගහනවා නම්, වෛරයෙන් හරි ක්‍රෝධයෙන් හරි කටයුතු කරනවා නම්, ඒක මම හිතන විධියට විශේෂයෙන්ම ඔබතුමා බෞද්ධයකු හැටියට කර ගන්නා මහා පාපයක්. කතෝලිකයකු හැටියට මාත් එහෙම කළොත් ඒක මහා පාපයක්. එවැනි දෙයක් ඔබතුමා කර ගත්තේ ඇයි කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා.

අනෙක් එක තමයි, ඔබතුමන්ලාගේ විපක්ෂයේ කණ්ඩායමම මේ දේ ප්‍රතික්ෂේප කර තිබීම; ඔබතුමාත් එක්කම ප්‍රතික්ෂේප කර තිබීම. එම නිසා තමයි එතුමන්ලා කවුරුත් මේ සභාවට ඇවිල්ලා නැත්තේ. මෙහිදී අපට තවත් ප්‍රශ්නයක් පැන නඟිනවා. ඔබතුමා තනියම මේ තීන්දුව ගත්තාද, නැත්නම් මේ තීන්දුව ගන්න කවුරු හරි ඔබතුමා පෙලඹෙව්වාද, එහෙම කරලා ඔබතුමා අමාරුවේ දැම්මාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අනුව මෙතැන ලොකු ප්‍රශ්නයක් පැන නැඟී තිබෙනවා. මොකද, තනියම මෙවැනි සාවද්‍ය යෝජනාවක් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කරන අවස්ථාවක් මීට පෙර අපි කවදාවත් දැකලා නැහැ. පළමුවෙනි වතාවට තමයි අපි මෙහෙම දෙයක් දැක්කේ. නවක මන්ත්‍රීවරු හැටියට මේ පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළදී අපි එවැන්නක් දැක්කේ නැහැ. පරිණත දේශපාලනඥයකු හැටියට, කාලයක් තිස්සේ වැඩ කටයුතු කරපු දේශපාලනඥයකු හැටියට ඔබතුමා මෙවැනි දෙයක් කළේ ඇයිද කියන එක අපට විශාල ගැටලුවක්.

දැන් විශේෂයෙන්ම ගරු සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමා ගැනත් කියන්න ඕනෑ. අපි එදා බලය නැතුව පළාත් සභා මන්ත්‍රීවරු හැටියට ඉන්නකොට තමයි මෙතුමා "සසුනට අරුණ" වැඩසටහන ආරම්භ කළේ. එදා මෙතුමාට එම වැඩසටහන ක්‍රියාත්මක කරන්න ශත පහක අරමුදලක් තිබුණේ නැහැ. "සසුනට අරුණ" වැඩසටහන යටතේ එක විහාරස්ථානයකට රුපියල් 50,000 ගණනේ දෙනකොට, මාත් මෙතුමාට කථා කරලා කියලා තිබෙනවා, "මටත් විහාරස්ථාන හතරක් සංවර්ධනයට මුදල් අවශ්‍යයයි" කියලා. මෙතුමා ඒ අවස්ථාවේ මට කිව්වා, "ඔබතුමා පටන් ගන්න. මෙන්න දිනය" කියලා. හැබැයි, එතුමා ළඟ ඒ වෙලාවේ අරමුදලක් තිබුණේ නැහැ. මා ළඟ සිටියදී එතුමා දුරකථනයෙන් කථා කරලා මිත්‍රයන්ට කියලා තිබෙනවා, "මෙන්න මේ මේ විහාරස්ථාන සංවර්ධනයට මට රුපියල් 50,000 ගණනේ අවශ්‍යයි. කරුණාකරලා මට ඒ මුදල් ලබා දෙන්න" කියලා. මෙතුමා එදා විපක්ෂයේ ඉඳගෙන, ශත පහක අරමුදලක් නැතුව, එදා පැවැති ආණ්ඩුවෙන් එළව එළවා ගහනකොට, පෞද්ගලිකව අරමුදල් සොයාගෙන තමයි "සසුනට අරුණ" වැඩසටහන යටතේ විහාරස්ථානවලට සල්ලි දීලා, විහාරස්ථානයේ ඒ උත්සවයට ගියේ. එවැනි වැඩකටයුත්තක් කරපු අමාත්‍යවරයකු නිසා තමයි අපි අද එතුමාත් එක්ක අත්වැල් බැඳගෙන ඉන්නේ. එතුමා ඒ විධියට තමයි එදා ඒ වැඩසටහන ආරම්භ කළේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාලයේ ඉඳලා ඒ ගැන හොඳින්ම දන්නවා.

ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදල ගැන කථා කරද්දී, ඔබතුමාගේ කාලයේ විශේෂයෙන්ම ආවරණ අනුමැතිය යටතේ තමයි ඔබතුමාත් කටයුතු කරලා තිබෙන්නේ. ඔබතුමා පාලක මණ්ඩලයේ අනුමැතිය ගන්න පෙර වියදම් කළ ආකාරය පිළිබඳ වාර්තාවක් අපි ළඟ තිබෙනවා. ඒ වාර්තා අමාත්‍යාංශයේ තිබෙනවා. ඔබතුමා කරපු දේම ඉන් පසුව පත් වූ හැම අමාත්‍යවරයෙකුම කරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒකට හේතුව තමයි, පාලක මණ්ඩලය දිනපතා හෝ ආසන්න දිනවල රැස් වන්නේ නැත්නම්, මේ වැඩ කරද්දී ආවරණ අනුමැතියට යටත්ව තමයි කරන්න ඕනෑ. ආවරණ අනුමැතියට යටත්ව කරද්දී හොරකමින් තොරව, ඉතාම අවංකව, පැහැදිලි වැඩ පිළිවෙළක් හා නිශ්චිත වැඩ පිළිවෙළක් ඇතිව ක්‍රියා කරනවා නම් ඒක තමයි වැදගත් වන්නේ; ඒක තමයි රටට අවශ්‍ය වන්නේ. නීති රීති තියාගෙන, අණ පනත් තියාගෙන, ඒවාට යට වෙලා, භය වෙලා, බියගුල්ලෝ වාගේ වැඩ කරන නායකයෝ මේ රටට අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය ඒ වෙලාවට, ඒ වැඩේ කරන මේ වාගේ නායකයෝ. මෙතුමා එලෙස කටයුතු කළේ, රටේ අවශ්‍යතාව හරියට හඳුනාගෙනයි. ඒ නිසා තමයි විහාරස්ථාන ටික හදන්න, ආගම් භේදයක් නැතිව දහම් පාසල් ටික හදන්න එතුමා කටයුතු කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩියක කාලයක් පමණයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න මට කාලය නැති නිසා මම විශේෂයෙන්ම සිහිපත් කළ යුතු කාරණයක් තිබෙනවා.

අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ මෙතුමා මධ්‍යම සංස්කෘතික අරමුදලින්, කොච්චිකඩේ කතෝලික දේවස්ථානය හදන්න රුපියල් මිලියන 41ක් වියදම් කරලා තිබෙනවා; කටුවපිටිය දේවස්ථානය හදන්න රුපියල් මිලියන 30ක් වියදම් කරලා තිබෙනවා; මඩකලපුවේ සියොන් දේවස්ථානය හදන්න රුපියල් මිලියන 14ක් වියදම් කරලා තිබෙනවා. ඒ කටයුතු සම්බන්ධයෙන් අපි මෙතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. මොකද, අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ මේ රටේ ජනතාව කඩාගෙන වැටුණා. ඒ කඩාගෙන වැටුණු ජනතාව නැවත නැඟිට්ටවන්න අවශ්‍ය කරන ආගමික වැඩසටහන්වලට මෙතුමා අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, මේ කාරණය ගැන කථා කරද්දී අපි ඔබතුමාට නැවත නැවතත් මතක් කරන්නේ මෙයයි. ඔබතුමා හොඳ අමාත්‍යවරයෙක් කියා සිතාගෙන සිටියාට ඔබතුමාගේ කාලයේ සිදු වූ ඒ ගනුදෙනු පුංචි ඒවා නොවෙයි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉතාම අවංකව, විනිවිදභාවයෙන් යුක්තව මෙම කටයුත්ත කරනකොට, ඔබතුමා එදා කරපු හැටි කොහොමද? හරියටම ගණන් හදලා බැලුවොත්, එදා සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගමේ සේවකයකුට ගෙවිය යුතු මුදලින් රුපියල් 500ක් අඩුවෙන් තමයි ගෙවලා තිබෙන්නේ. අපි හිතමු සේවකයන් 400ක් ඉන්නවා කියලා. රුපියල් 500 ගණනේ ඒ, 400ට එක මාසයකට බැලුවොත් ලක්ෂ 50යි. එම සේවකයන් හය මාසයකට වඩා වැඩ කරලා තිබෙනවා. මතක තියා ගන්න, හය මාසයකට ගණන් හදපුවාම ලක්ෂ 300ක් මධ්‍යම සංස්කෘතික අරමුදලින් -අර අහිංසක මිනිසුන් පුණ්‍ය කර්මයක් හැටියට කරපු කටයුත්තෙන්- ගසා කලා තිබෙනවා. ගසා කාපු ලක්ෂ 300ක් වූ මුදලින් සජිත් ප්‍රේමදාස මැතිතුමා හදන විධියට දහම් පාසල් ගොඩනැඟිලි අටක් හදන්න පුළුවන්. එහෙම නම්, "මෙතුමා දහම් පාසල් ගොඩනැඟිලි අටක් හදපු එක වැරැදියි. තමුන්නාන්සේලා ලක්ෂ 300ක් හොරකම් කරපු එක හරි"යි කියන යෝජනාව තමයි අද තමුන්නාන්සේලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමා දේශපාලන වශයෙන් මඩ ගහන්න හිතාගෙන මේ යෝජනාව ඉදිරිපත් කළා නම් අවසානයේ වුණේ, ඔබතුමාගේ වැරදි ටික එළියට ඇවිල්ලා ඇඳගෙන ඉන්න ඇඳුමෙත් මොනවා හෝ ගැවිලා ගෙදර යන්න වෙච්ච එකයි. ඒ ගැන අපි කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.6.29]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදල සම්බන්ධයෙන් ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය කාලය පුරාම, මේ ආණ්ඩුවට විරුද්ධව මෙවැනි යෝජනා ගෙනාවා. මම දැකපු විධියට, මේ වකවානුව තුළ එසේ ගෙනා යෝජනාවකට අදාළ විවාදය අවසන් වෙනතුරු මේ ගරු සභාවේ රැඳී සිටි, යෝජනාව ඉදිරිපත් කළ එකම මන්ත්‍රීතුමා තමයි, ටී.බී.ඒකනායක මන්ත්‍රීතුමා. එතුමාගේ පක්ෂයේ කවුරුවත් මේ ගරු සභාවේ නැති වුණත්, සභාවේ කටයුතු අවසාන වෙනතුරු මෙහි රැඳී සිටිමින්, අඩුම ගණනේ අපි කියන දේ අහගෙන ඉන්න එක ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, සාමාන්‍යයෙන් සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවාම, ඒ යෝජනාවෙන් ආණ්ඩුවට පහර දීලා, ඊළඟට ආණ්ඩුව විසින් ඒකට උත්තර දෙන කොට, ඒ යෝජනාව ගෙනා මන්ත්‍රීවරු බොහෝ අය පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ ඉන්නේ නැහැ, එතුමන්ලා නැඟිටලා යනවා. මොකද, ඒ ගොල්ලන්ගේ වැරදි කියන කොට අහගෙන ඉන්න බැරි නිසා. කෙසේ නමුත්, එතුමා අද මේ සභාවේ කටයුතු අවසාන වෙනතුරු ඉන්නවා නේ. ඒක ලොකු දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය පුරාම, විශේෂයෙන්ම අපේ රජය බලයට පත් වුණාට පසුව, රටේ ආගමික පුනර්ජීවනය සඳහා, ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා විශාල උනන්දුවකින් කටයුතු කරමින්, ඒ සඳහා විශාල මුදලක් වෙන් කළාය කියන කාරණය මම මුලින්ම මතක් කරන්න කැමැතියි. "ගම්පෙරළිය" වැඩසටහන යටතේත් අපි විශාල වැඩ කොටසක් කරනවා. ඊළඟට, මධ්‍යම සංස්කෘතික අරමුදල තුළින් සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඉතා විශාල වැඩ කොටසක් කරනවා. විශේෂයෙන්ම, බෞද්ධ පන්සල් දියුණු කරන්න, ඉස්ලාම් ආගමික මධ්‍යස්ථාන දියුණු කරන්න, ක්‍රිස්තියානි, හින්දු ආදී වශයෙන් හැම ආගමකටම අදාළ සිද්ධස්ථානවල සංවර්ධන වැඩ කටයුතු සහ ඒවා දියුණු කරන්න මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා එතුමා විශාල දායකත්වයක් ලබා දෙනවා.

ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ගෙනාවේ යම් දේශපාලන අරමුණකින් බව අපට පැහැදිලියි. එතුමාගේ කථාව තුළින් ඒක මනාව පැහැදිලි වෙනවා. එතුමා අද ඉදිරිපත් කළ චෝදනා එකක්වත් මේ සභාව තුළදී ඔප්පු කරගන්න, සනාථ කරගන්න සාක්ෂි හෝ වෙනත් කිසිම දෙයක් එතුමන්ලාට තිබුණේ නැහැ. ඒ යෝජනාව තුළින් සිදු වුණේ, එතුමන්ලාගේ කාලයේ සිදු වුණු වංචා, දූෂණ රාශියක් හෙළිදරව් කරන්න එතුමා අපට උදව් කළ එකයි. මොකද, එතුමන්ලා හිතා ගෙන හිටියා, මේ යෝජනාව ගෙනැල්ලා, ඒ තුළින් ආණ්ඩුවට ප්‍රහාරයක් එල්ල කරලා, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඉලක්ක කර ප්‍රහාරයක් එල්ල කරලා, අපේ ආණ්ඩුව දූෂණ, වංචා සිදු කරන මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් සිටින ආණ්ඩුවක් කියන කාරණය ඉස්මතු කරන්න. එහෙම කරන්න පුළුවන් වෙයි කියලා එතුමා විශ්වාස කළා. නමුත්, ඒ වෙනුවට සිද්ධ වුණේ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදල තුළ සිද්ධ වුණු වංචා, දූෂණ හෙළිදරව් කරන්න අපට අද අවස්ථාව ලැබුණු එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පසුව, ඒ ක්‍රිස්තියානි පල්ලි ටික නඩත්තු කරන්න, ඒවා සංවර්ධනය කරන්න විශාල මුදලක් වෙන් කළ බව අපි දන්නවා. මෙන්න මේ කාරණයත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. අපි දන්නවා, පාස්කු ප්‍රහාරයෙන් පසුව මේ රටේ සිංහල, මුස්ලිම් ගැටුම් නිර්මාණය කරන්න, විශේෂයෙන්ම ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ එතුමා නියෝජනය කරන දේශපාලන පක්ෂයට සම්බන්ධ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, ඒ සමහර පාක්ෂිකයන් සෘජුවම සම්බන්ධ වෙලා කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාම ඉතාම සංවිධානාත්මකව මුස්ලිම් විරෝධයක් ඇති කරමින් මුස්ලිම් පල්ලි ගණනාවකට ප්‍රහාර එල්ල කළ බව. පල්ලි 21කට පමණ ප්‍රහාර එල්ල කරලා, අලාභ හානි සිද්ධ කළා. ඒ සමහර සිද්ධිවලට අදාළව කළ පරීක්ෂණවලදී

ඔබතුමාගේ පක්ෂයේ සිටින ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් පොලිස් අත්අඩංගුවට පත් වුණා; පාක්ෂිකයන් අත්අඩංගුවට පත් වුණා ගරු මන්ත්‍රීතුමනි. එම උසිගැන්වීම් කළේ, තමුන්නාන්සේලා නියෝජනය කරන ඒ දේශපාලන පක්ෂවල සිටින නායකයන් බව තමුන්නාන්සේ දන්නවා. එසේ අලාභ හානි කළ, තමුන්නාන්සේලාගේ පාක්ෂිකයන්ගේ ප්‍රහාරවලට ලක් වූ ඒ මුස්ලිම් පල්ලි නැවත සකස් කිරීම සඳහා ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලක්ෂ 58කට වැඩි මුදලක් එතුමා ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ ජාතිවාදී ප්‍රහාර හමුවේ, ජාතිවාදීන්ගේ උසිගැන්වීම් හමුවේ මොකක්ද සිද්ධ වුණේ? තමුන්නාන්සේලාගේ ආධාරකරුවන් ඒ ප්‍රධාන පංගුකාරයන් හැටියට ගිහින්, ඒ දේවස්ථානවලට අලාභ හානි කරනකොට, ඒවා ආරක්ෂා කරනවා වෙනුවට, ජාතික සමගිය ආරක්ෂා කරනවා වෙනුවට තමුන්නාන්සේලා මොනවාද කළේ කියලා හිතා බලන්න. ඒ දේවල්වලට උල්පන්දම් දුන් තමුන්නාන්සේලාගේ නායකයන්ගේ කථා අහලා, ඒ අයගේ කීම් අහලා ඒ දේවස්ථානවලට ප්‍රහාර එල්ල කරලා ඒවාට අලාභ හානි සිද්ධ කළාම, ඒවා නැවත පුනරුත්ථාපනය කරන්න මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලක්ෂ 58කට වැඩි මුදලක් ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ලබා දුන්නා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අවභාවිත කළාය කියලා මේ ආණ්ඩුවට චෝදනා එල්ල කරන්න පසුගිය කාලය පුරාම මෙතුමන්ලා උත්සාහ කළා; නොයෙකුත් දූෂණ, වංචා ගැන චෝදනා එල්ල කළා. පසුගිය ආණ්ඩුව කාලයේ සිදු වූ දූෂණ හා වංචා මොනවාද කියලා අපි දන්නවා නේ. "මිග්" ගනුදෙනුව ගැනත් ඔබතුමන්ලා දන්නවා නේ. තමන්ගේ අම්මා තාත්තාගේ සොහොන් කොත් හදන්න රටේ මුදල් අවභාවිත කළ හැටි අපි දන්නවා. ඒවා ගැන අද උසාවි ගණනේ නඩු අහනවා. මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරුන්ට අද නඩු කීයක් පවරා තිබෙනවාද? ඒ කටයුතු අද උසාවිය ඉදිරියේ පරීක්ෂාවට ලක් වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ මෙච්චරයි. කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා වාගේ, කාගේ හෝ කොන්ත්‍රාත් එකක් ඉෂ්ට කරන්න එතුමා ඉස්සරහට ආවාද කියන්න මම දන්නේ නැහැ. නමුත්, මෙය පිටුපස දේශපාලන අරමුණක් තිබෙනවාය කියන එක නම් පැහැදිලි වුණා. ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉෂ්ට කරගන්න හැදූ ඒ දේශපාලන අරමුණ, මේ සභාව තුළදී අපේ අදහස් ඉදිරිපත් කරමින් පරාජය කරන්න අපට හැකියාව ලැබුණා.

ස්තුතියි.

[අ.භා. 6.36]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විරුද්ධ පාර්ශ්වයෙන් අද ඉදිරිපත් කර තිබෙන, මධ්‍යම සංස්කෘතික අරමුදල ගැන වූ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන්, විරුද්ධ පාර්ශ්වය කල්තැබීමේ විවාදයක් ගෙනාවොත්, එම විවාදයේදී එතුමන්ලා මෙම පාර්ලිමේන්තු සභා ගර්භය තුළ රැඳී සිටිය යුතුයි. අඩුම තරමින්, ගණපූරණයවත් රැඳී සිටින්න ඕනෑ. නමුත් අපි මේ වෙලාවේ ඉතාම කනගාටු වෙනවා, යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා හැරෙන්නට, එතුමාට සහයෝගය දක්වන්න විරුද්ධ පාර්ශ්වයේ කිසිම කෙනකු නැතිවීම ගැන. එයින්ම පෙනෙනවා, විපක්ෂයේ බංකොලොත්භාවය සහ මේ යෝජනාවේ තිබෙන දුර්වලතාව. මෙම යෝජනාව අතිශයින් දුර්වල යෝජනාවක් හැටියටයි අපි දකින්නේ. මොකද, මේක කිසිම අතකින් සාධාරණ යෝජනාවක් නොවෙයි. එතුමන්ලා ඉතාම ද්වේෂ සහගතව ගෙනා යෝජනාවක් ලෙසයි අපි මෙය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදලට මුදල් ලැබෙන ආකාරය පිළිබඳව මම මතක් කර දිය යුතුමයි. මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා පාලනය වන යම් යම් පෞරාණික වටිනාකම් තිබෙන අපේ ඓතිහාසික සිද්ධස්ථාන හා සංචාරක උරුමවලට ලැබුණු ආධාරවලට පසුගිය ආණ්ඩුව කාලයේ මොකද වුණේ කියලා අපි එදා සිටම දැනගෙන හිටියා. සීගිරිය වැනි ස්ථානවලට ලැබුණු ආදායම්වලට මොකද වුණේ? මෙම අරමුදලට ලැබෙන මුදල් සම්පූර්ණයෙන්ම එක්තරා පිරිසකගේ, නැත්නම් හිටපු ඇමතිවරයාගේ යහළු මිත්‍රයන් බෙදා ගන්නා ක්‍රමවේදයක් තමයි තිබුණේ. නමුත් අපේ ආණ්ඩුව මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන මුදල් මනා ලෙස කළමනාකරණය කර ගෙන, ඒ මුදල් අපේ සංස්කෘතිය රැක ගැනීම සඳහා වියදම් කරන්න අවසර ලබා ගෙන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනවා. ඒක ඉතාම නිවැරදි, පැහැදිලි, විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක්. එම නිසා අද ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව, එසේ නැත්නම් ඔබතුමන්ලා කරන චෝදනාව පිළිබඳව කථා කරනකොට ඒ ගරු මන්ත්‍රීතුමාට අපි මේ කාරණය මතක් කර දෙන්න ඕනෑ. ඔබතුමා සංස්කෘතික ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ, සපත්තු වෙන්දේසියක් කළා අපට මතකයි නේ. මේ යෝජනාවත් ඒ කාලයේ කළ එම සපත්තු වෙන්දේසිය හා සමාන යෝජනාවක්ද කියලා අපි අහනවා. හිටපු සංස්කෘතික ඇමතිතුමනි, ඔබතුමාගේ සපත්තුවට මෙන්න මෙච්චර වටිනාකමක් තිබෙනවා කියලා, විදේශ රටවල මෙන්න මෙහෙම වෙනවා කියලා එදා ඔබතුමාගේ නිලධාරීන් ඔබතුමා කඩේ ඇරපු හැටි අපට මතකයි. එවැනි ආකාරයේ කටයුතු කරපු නිසාම, ඔබතුමා වංචා සහගත විධියට නැත්නම් උපක්‍රමශීලීව කවුරුන් හෝ යොදා ගත්තා කියන හැඟීම තමයි අපටත් තිබෙන්නේ. මේ සභාව කල් තැබීමේ යෝජනාව ඔබතුමා වැටහීමක් නැතිව ගෙනාපු යෝජනාවක්ද කියලා මට හිතෙනවා. 'සපත්තු වෙන්දේසිය' වාගේ යෝජනාවක් ඔබතුමා මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා විශේෂයෙන් අපේ නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමති සජිත් ප්‍රේමදාස මහතාට විරුද්ධව ගෙනැල්ලා තිබෙන බවයි මම දකින්නේ. එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව හැටියට අපට එල්ල වන ඕනෑම චෝදනාවක් හමුවේ නොබියවම, එකමුතුව, එකට සිට ගෙන මුහුණ ආණ්ඩුවක් තමයි එක්සත් ජාතික පෙරමුණේ ආණ්ඩුව කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ආණ්ඩුව හැටියට අපි විපක්ෂයට මේ කාරණයත් කියන්න කැමැතියි. ඉදිරියේදී අපේ මන්ත්‍රීවරු 107දෙනාම එකට, එක මිටට ඉඳගෙන, අනාගතයේ එන සියලු මැතිවරණ ජයග්‍රහණය කරන්න පෙනී සිටිනවා. ඒක තමයි අපට තිබෙන ශක්තිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ඒ "දින 52 කාලයේදී" අපේ මන්ත්‍රීවරු 107 දෙනාම එකට ඉඳගෙන, අපට ලබා දුන් අභියෝග ජයග්‍රහණය කළ බව අපි මතක් කරලා දෙන්න කැමැතියි. ඒ වාගේම, අපේ මැති ඇමතිවරුන්ට බොරු චෝදනා එල්ල කරලා, අපහාස කරන්න ඔබතුමන්ලාට බැහැ. ඒකට අපි ඉඩ දෙන්නේත් නැහැ, ඉඩ තියන්නේත් නැහැ. අපි අතීතයේදී පෙන්නුවා වාගේ ඒ සියලු තැන්වලදී එක්සත් ජාතික පෙරමුණ එක මිටට ඉන්නවා. ඒ හරහා තමයි අපට අපේ අනාගත ජයග්‍රහණ සියල්ල ලබා ගන්න පුළුවන් වන්නේ. අපි ඒ ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ඉදිරියටම යනවා.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

පසුගිය කාලයේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා කැඩී බිඳී ගිය දේවස්ථාන ආරක්ෂා කරන්න -ප්‍රතිසංස්කරණය කරන්න- සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඒ ස්ථානවලට ගිය හැටි අපි දැක්කා. එතුමාට ඒ සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වනවා. එතුමා ඒ සියල්ල අධීක්ෂණය කරලා, ඉතාම ඉක්මනින් ඒ ප්‍රතිසංස්කරණ කටයුතු කරලා දුන්නා. කිසිම ආධාරයක් නොලබා අපේ රටේ සමහර ගම් නියම් ගම්වල තිබුණු පුරාණ විහාරස්ථාන සහ නටබුන් වී ගිය ස්ථාන සියල්ල ආරක්ෂා කරන්න මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා අපට හැකියාවක් ලැබුණා. අනාගතයේදීත් මධ්‍යම සංස්කෘතික අරමුදල තවතවත් ශක්තිමත් කරලා, අපි අපේ පූජනීය ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා හරියට කළොත් අපට ඉදිරියට යන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ලෝකයේ රටවල් අතුරින් අපේ රට ඉදිරියේදී සංචාරකයන් වැඩියෙන්ම එන රට බවට පත්වීමට අවශ්‍ය ඒ ආකර්ෂණීය බැල්ම අපේ රටට තිබෙනවා. අපේ රට දිහා බලා ඉන්න දෙවි දේවතාවුන්ගේ බැල්ම, ත්‍රිවිධ රත්නයේ බැල්ම -මේ සියල්ල- නිසා ඉදිරියේදීත් අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කරගෙන, ඒ අවස්ථා පුළුල් කර ගන්න අපට හැකියාව ලැබෙනවා. සංස්කෘතික උරුමය ආරක්ෂා කරන්න මේ සංස්කෘතික අරමුදල හරහා වැඩි වැඩියෙන් අරමුදල් සම්පාදනය කර ගන්න අවශ්‍ය වනවා. ඒ සඳහා අපි සියලුදෙනාම එකමුතුව පෙනී සිටිනවා. ඒ ශක්තිය අපි එතුමාට සහ ආණ්ඩුවට ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.43ට, 2019 සැප්තැම්බර් 05වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.43 மணிக்கு பாராளுமன்றம், 2019 செப்ரெம்பர் 05, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.43 p.m. until 10.30 a.m. on Thursday, 05th September, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.